# මව්බිම

ඉරිදා
2022 ජනවාරි 16
කාණ්ඩය 11
09 වැනි කලාපය
පිටු 64
රු. 80/-




## දොඩම්පෙ මුදලාලි වගේ අප්සරා මැණිකෙත් 4 වැනි තට්ටුවෙන් වැටිල මැරුණෙ කොහොමද?

14 පිටුවට



## සියවස් ගණනක් පොළොවට වැළලුණු ලාහුගල බුදු පිළිමය යළි වඩින්න වරම්

12 පිටුවට



## ශිෂ්‍යත්ව විභාගයට පිටත් වෙන්න ජයගාමී සුබ පැතුමක් -තරුපති

# විදුලියේ ලොකු පුටුව යුගදනවියේ හිරවෙයි

2 පිටුවට

බිඟුන් මේනක ගමගේ

වසර 52ක ඉතිහාසයේ කවදාකවත් නොවුණු දෙයක්



# ඉදිරි සති 2 රටම අඳුරේ

විදුලි ඒකාබද්ධ වෘත්තීය සමිති සන්ධානය

## අර්බුදයක් තියෙනවා: විසඳුම් සොයනවා

අමාත්‍යාංශ අතිරේක ලේකම්

ජේ.ටී. ද සිල්වා, චාමර අමරසූරිය

02 පිටුවට

## රබර්-සහල් ගිවිසුම සමරන්න චීනයෙන් දෙන තෑග්ග

නිපුනි ඒකනායක

02 පිටුවට







## ඩුබායි සිට එතනෝල් ජයලත් ලංකාවට ගෙනාපු රාජ්‍ය ඇමැති කවුද?

02 පිටුවට

## එජාපයත් සන්ධානයකට අරඅඳී

2 පිටුවට

## ශ්‍රීලනිපය පක්ෂ 48ක් සමඟ කතා කරලා

සවනි ශේශාදි

2 පිටුවට



## දිනේෂ් කට අරී


ජේ. ටී. ද සිල්වා

02 පිටුවට

## බන්දුලගේ සහන මල්ල මෙන්න

2 පිටුවට

නිපුනි ඒකනායක



## කැබිනට් වෙනසකින් අමුතු සෙතක් නෑ

අනුරාධා හේරත්

02 පිටුවට



## කෝටි 100ක කුඩුවලට කරපු වැඩේ

අමිල අබේරත්න

2 පිටුවට

## උතුරේ ලිපිය අනිද්දා මෝදිට

එම්.එස්. ෆාරුක්

2 පිටුවට



## පාස්කු අපරාධකරුවන් හෙළිවනවාට ආණ්ඩුව බයයි

නිර්මාණී ගුණරත්න

02 පිටුවට






1>>

## විදුලියේ ලොකු පුටුව...

විදුලිබල කප්පාදුවෙන් රටම අඳුරට යන තත්ත්වයක් නිර්මාණය වී තිබියදීත් ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී ධුරයේ පුරප්පාඩුව පුරවාගත නොහැකි අර්බුදයක් නිර්මාණය වී තිබේ.

ලංකා විදුලිබල මණ්ඩලයේ ඉන්ජිනේරුවන් හා දේශපාලන බලධාරීන් අතර හටගත් කඹ ඇදිල්ලක් ඊට හේතුවී ඇත.

අඩ සියවසකට අධික ලංකා විදුලිබල මණ්ඩල ඉතිහාසයේ එහි ප්‍රධාන පරිපාලන පුටුව මෙසේ පුරප්පාඩු තත්ත්වයෙන් පවත්වාගෙන ගොස් නැතැයි ලංවිම ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවෙක් 'මව්බිම' ට පැවැසීය.

යුගදනවි ගිවිසුමට පක්ෂ වීම හා විපක්ෂ වීම යන ස්ථාවර මත මෙම පුරප්පාඩුවට සුදුස්සා තේරීම ගැන මතභේදය නිර්මාණය වී ඇති බව කියැවේ.

ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී ධුරයෙන් ඉන්ජිනේරු එම්. ආර්. රණතුංග පසුගියදා විශ්‍රාම ගිය අතර ඉන්ජිනේරු ඩී. සී. ආර්. අබේසේකර මහතා එම පුරප්පාඩුවට පත්කිරීමට විදුලිබල ඇමැති ගාමිණී ලොකුගේ අනුමැතිය පළ කළත් එය ක්‍රියාත්මක වූයේ නැත.

ජ්‍යෙෂ්ඨ විදුලි ඉන්ජිනේරු සංගමය එම පත්කිරීමට විරෝධය පළ කිරීම ඊට හේතු වී ඇතැයි ලංවිම ප්‍රකාශකයකු කීය.

මේ අතර හිටපු සාමාන්‍යාධිකාරී ඉන්ජිනේරු එම්. ආර්. රණතුංග නැවතත් ඒ සඳහා පත්කිරීමටද ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලයට යෝජනාවක් කෙරී ඇති නමුත් ලංවිම ඉන්ජිනේරු සංගමය ඊට විරෝධය පළ කර තිබේ.

ඒ අනුව ආචාර්ය ප්‍රසන්න පෙරේරාගේ නම ලංවිම සාමාන්‍යාධිකාරී ධුරයට යෝජනා වී ඇති අතර ඒ ගැනද විදුලි ඉන්ජිනේරුවන්ගේ ඒකමතික එකඟතාවක් පළ වී නැත.

මෙම මතභේදකාරී තත්ත්වය නිසා පෙරේදා (14දා) වනවිටත් ලංවිම සාමාන්‍යාධිකාරී ධුරයට කිසිවකුත් පත් කරගත නොහැකිව දැඩි අර්බුදකාරීත්වයක් නිර්මාණය වී තිබිණි.

තෙල් සහ ගල් අඟුරු මිලදී ගැනීම සඳහා ප්‍රමාණවත් තරම් ඩොලර් නොමැති තත්ත්වයකදී ලංකා විදුලිබල මණ්ඩලය අර්බුදයකට තල්ලු වී ඇති මෙවැනි අවස්ථාවක එහි ප්‍රධාන පරිපාලන පුටුව මෙසේ පුරප්පාඩු කර තැබීම නිසා ගැටලු ගණනාවක් මතුව ඇතැයි එහි අභ්‍යන්තර ආරංචි මාර්ග සඳහන් කරයි.

මේ අතර නොරොච්චෝලේ ලක්විජය විදුලි බලාගාරය සඳහා අවශ්‍ය ගල් අඟුරු මිලදී ගැනීමට මුදල් අමාත්‍යාංශය ඇමෙරිකානු ඩොලර් මිලියන 180ක් පෙරේදා (14දා) නිදහස් කර තිබිණි.

ඊට අමතරව ඉන්ධන නැව් දෙකක් සඳහාද මුදල් නිදහස් කළ බව ප්‍රකාශකයෙක් කීය.

## ඉදිරි සති 2...

ඉදිරි සති දෙක තුළ විදුලිය නොමැතිකමින් මුළු රටම අඳුරේ පවතින තත්ත්වයක් අනිවාර්යයෙන්ම නිර්මාණය වීම නොවැළැක්විය හැකි යැයි ලංකා විදුලිබල මණ්ඩලයේ ඒකාබද්ධ වෘත්තීය සමිති සන්ධානයේ කැඳවුම්කරු රන්ජන් ජයලාල් මහතා 'මව්බිම' ට පැවැසීය.

ජනතාවට අඛණ්ඩව විදුලිය සැපයීමට අවශ්‍ය පියවර නොගෙන, විදුලිබල මණ්ඩලය, විදුලිබල පනත උල්ලංඝනය කරමින් සිටින බවද රන්ජන් ජයලාල් මහතා සඳහන් කළේය.

ඉදිරියේදී ඇති විය හැකි මෙම තත්ත්වය මත කොවිඩ් වසංගතය නිසා රට වසා දැමීමෙන් රටේ ආර්ථිකයට සිදුවූ හානියට වඩා වැඩි හානියක් ඇතිවන බව පැවසූ රන්ජන් ජයලාල් මහතා කර්මාන්තශාලා, රජයේ කාර්යාල, පෞද්ගලික අංශයේ ආයතන සියල්ල අකර්මණ්‍ය වී සේවකයන්ට නිවෙස්වල ගතකිරීමට සිදුවන බවද පැවැසීය.

1969 අංක 16 දරන පනත යටතේ ලංකා විදුලිබල මණ්ඩලය ජනතාවට අඛණ්ඩව විදුලිබලය සැපයීමට බැඳී සිටින බව පෙන්වා දෙන ජයලාල් මහතා, විදුලිබල මණ්ඩල බලධාරීන්, එය නොසලකා කටයුතු කරමින් සිටින බවද පැවැසීය.

ජනතාව පාවිච්චි කරන විදුලියට බිල ගෙවනවා නම් මණ්ඩලය විදුලිය කපන වෙලාවට ජනතාවට වන්දි මුදලක් ගෙවිය යුතුව ඇතැයිද හෙතෙම සඳහන් කළේය.

මේ තරම් දරුණු විදුලි අර්බුදයක් පවතිද්දීත්, විදුලිබල මණ්ඩලයේ ටෙන්ඩර් වංචා තවමත් සිදුවෙමින් පවතින බවටද ජයලාල් මහතා චෝදනා කළේය.

මේ ගැන කළ විමසීමේදී විදුලිබල අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සුගත් ධර්මකීර්ති පැවැසුවේ පැය 24ක විදුලි කප්පාදුවක් ගැන පළ කරන අනාවැකි මුළුමනින්ම ප්‍රතික්ෂේප කරන බවයි.

විදුලි බලයේ අර්බුදයක් ඇති බවත් අවශ්‍යතාව අනුව විදුලි කප්පාදුවක් සිදු කරන අතරම එය විසඳාගැනීමට ක්‍රමානුකූලව පියවර ගන්නා බවද ධර්මකීර්ති මහතා සඳහන් කළේය.

## භූ කැණීම්...

භූ සම්පත් ගවේෂණය සඳහා බලපත්‍ර ලබාගත් පිරිස් දීර්ඝ කාලයකට පසු ඒවා ඉහළ මිලකට අලෙවි කිරීමේ ජාවාරමක් ගැන පරිසර අමාත්‍යාංශයට කරුණු වාර්තා වී ඇත.

මෙසේ බලපත් ලබාගෙන වසර දහයක් පමණ කාලයක් තිස්සේ කිසිදු ගවේෂණයක් නොකළ පිරිස් ගැන ද පරිසර අමාත්‍යාංශයට කරුණු වාර්තා වී ඇතැයි එහි ප්‍රකාශකයෙක් 'මව්බිම'ට පැවැසීය.

බලපත් මෙසේ වැඩි මිලට අලෙවි කරන පාර්ශ්ව අතර ව්‍යාපාරිකයන්, වෛද්‍යවරු, ආචාර්ය මහාචාර්යවරු, ඇතුළු සමාජයේ ප්‍රභූ පිරිස්ද සිටින බව එම ප්‍රකාශකයා කීය. ජාවාරම නිසා වැඩි මිලට අතින් අතට බලපත් යෑම හැර ගවේෂණ නොකිරීම නිසා රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ භූ සම්පත්වලින් ලැබිය හැකි ප්‍රයෝජන කිසිවක් ලබා ගත නොහැකි තත්ත්වයක් උද්ගතව ඇතැයිද පැවසූ හෙතෙම මේ සඳහා හොඳම උදාහරණය සේරුවිල රන් නිධිය බවද සඳහන් කළේය.

එම නිධිය සඳහා වසර දහයකට පෙර බලපත්‍ර ලබාගත් අය පවා මේ වනතුරුත් කිසිදු කැණීමක් කර නැතැයිද අනාවරණය වී ඇති බවත් මෙම නිධිය වෙනුවෙන් නිකුත් කළ බලපත්‍ර ද අතින් අත යන බවද හෙතෙම කීය.

ඉතා වටිනා රන් නිධියක් සේ සැලකෙන සේරුවිල නිධිය රන්වලට අමතරව තඹ හා ප්ලැටිනම් ලෝහය පවතින බව විද්‍යාඥයන් විශ්වාස කරන බවද ඔහු සඳහන් කළේය.

ඉකුත්දා භූ විද්‍යා හා පතල් කාර්යාංශයේ නිලධාරීන් හා පැවති සාකච්ඡාවකදී පරිසර අමාත්‍ය මහින්ද අමරවීර, ගවේෂණ නොකර ගවේෂණ බලපත්‍ර ළඟ තබාගෙන සිටින අය පිළිබඳ වාර්තාවක් ලබාදෙන ලෙසද එහිදී නිලධාරීන්ට උපදෙස් දී ඇත.

## බන්දුලගේ...

අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ 20කින් සමන්විත භාණ්ඩ මල්ලක් රුපියල් තුන්දහස් නවසියඅනූඅටක (3,998) සහන මිලකට ලංකා සතොසෙන් නිකුත් කිරීමට වෙළෙඳ අමාත්‍යාංශයෙන් කටයුතු කර ඇත.

සෙසු සුපිරි වෙළෙඳසල්වලට වඩා රුපියල් එක්දහස් හත්සිය පනහක වාසියක් ලැබෙන පරිදි මෙම භාණ්ඩ මල්ල සකස් කර ඇති බව වෙළෙඳ ඇමැති බන්දුල ගුණවර්ධන මහතා පැවැසීය.

සුපිරි සම්බා කිලෝ 10ක්, සුදු සීනි කිලෝවක්, රතු පරිප්පු කිලෝවක්, ඉඳි ආප්ප පිටි කිලෝවක්, හාල් මැස්සන් ග්‍රෑම් 500ක්, නූඩ්ලස් ග්‍රෑම් 400ක්, මේස ලුණු ග්‍රෑම් 400ක්, පොල් ගෙඩි දෙකක කිරි (මිලිලීටර් 330ක පැකට්ටුවක්) ඊට ඇතුළත් වේ.

ඊට අමතරව මිරිස් කුඩු ග්‍රෑම් 100ක්, ගම්මිරිස් කුඩු ග්‍රෑම් 100ක්, තුනපහ කුඩු ග්‍රෑම් 100ක්, කහකුඩු ග්‍රෑම් 100ක්, STC තේකොළ ග්‍රෑම් 100ක්, සුවඳ සබන් ග්‍රෑම් 80 කැටයක්, සතොස සඳුන් සබන් කැටයක්, දැත් සෝදන දියර මිලිලීටර් 100ක්, සෝයාමීට් ග්‍රෑම් 90ක්, සතොස TFM අගය සහිත රෙදි සෝදන සබන් කැටයක්, පපඩම් පැකට් 1ක්, ශල්‍ය මුහුණු ආවරණ 10ක්ද ඇතුළත් වේ.

ලංකා සතොස අලෙවිසල් නොමැති ප්‍රදේශවල ජනතාවට ක්ෂණික ඇමතුම් අංක 1998 ඇමැතීමෙන් මෙම භාණ්ඩ මල්ල නිවෙසටම ගෙන්වා ගත හැකි බවද ඇමැතිවරයා පැවැසීය.

වෙළෙඳපොළ සමීක්ෂණයකට අනුව අනෙකුත් සුපිරි වෙළෙඳසල් ජාලවලින් මෙම භාණ්ඩ වර්ග 20 මේ ප්‍රමාණයෙන්ම ලබා ගන්නා විට රුපියල් හයදහස් පන්සියවිසිඑකක් (6,521), රුපියල් පන්දහස් අටසියතිස්හතරක් (5,834), රුපියල් පන්දහස් හත්සියහැත්තෑඑකක් (5,771) වශයෙන් ගෙවීමට සිදුවන බවද ඇමැතිවරයා අවධාරණය කළේය.

## දිනේෂ්...

ඇතුළත කතා කර විසඳගත යුතු කරුණු පිටතදී ප්‍රකාශ කිරීම හේතුවෙන් යම් යම් ඉරිතැළීම් වන බවත්, ජනතාව බිහි කළ ආණ්ඩුව ආරක්ෂා කිරීමේ වගකීම එහි සියලු පාර්ශ්වකරුවන්ට ඇති බවත්, මහජන එක්සත් පෙරමුණේ නායක, අධ්‍යාපන ඇමැති දිනේෂ් ගුණවර්ධන "මව්බිම" ට පැවැසීය.

පසුගිය යහපාලන ආණ්ඩුව විසින් රටේ ආර්ථිකය බිංදුවට වට්ටා තිබුණු මොහොතක, ජනතාව විසින් මේ ආණ්ඩුව තෝරා පත්කර ගත්තේ විශාල බලාපොරොත්තු සහිතව යැයිද ඇමැතිවරයා අවධාරණය කළේය.

රටේ ආර්ථිකය නිසි මාවතේ ගමන් කරවමින් ශක්තිමත් කිරීමට, ආණ්ඩුවේ සියලු පාර්ශ්වයන් එක්ව රට සාමාන්‍ය තත්ත්වයට ගමන් කරවා, ශක්තිමත් ආර්ථිකයක් ගොඩනඟා ජනතා අභිලාෂ ඉටු කළ යුතුව ඇතැයිද ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා වැඩිදුරටත් පැවැසීය.

## ශ්‍රීලනිපය...

ඉදිරි මැතිවරණවලදී තරග කිරීමට දේශපාලන සන්ධානයක් පිහිටුවා ගැනීම සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ වන විටත් කටයුතු ආරම්භ කොට තිබේ.

එසේ සන්ධානගතව තරග කිරීම සඳහා ශ්‍රීලනිපය දේශපාලන පක්ෂ 48ක් සමඟ සාකච්ඡා කළ බව එහි ජ්‍යෙෂ්ඨ ප්‍රකාශකයකු 'මව්බිම'ට කීය.

සාකච්ඡාව සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දේශපාලන මණ්ඩලය නියෝජනය කරන ජ්‍යෙෂ්ඨයන් ඇතුළු පක්ෂ මධ්‍යම කාරක සභිකයන් සහභාගී වූ බවද එම ප්‍රකාශකයා පැවැසීය.

ඒ අනුව එළඹෙන මැතිවරණයකදී ශක්තිමත්ව කටයුතු කිරීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හැකි බව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨ උප සභාපති මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස 'මව්බිම'ට පැවැසීය.

ඒ සඳහා පක්ෂ ප්‍රතිසංවිධාන ක්‍රියාවලිය වඩාත් තීව්‍ර මුහුණුවරකින් යුතුව ආරම්භ කර ඇති බවද ප්‍රකාශ කළ මහාචාර්යවරයා අධ්‍යාපනය, කෘෂිකර්මය, ආර්ථිකය, ජාත්‍යන්තර කටයුතු පිළිබඳව පක්ෂයේ වෘත්තීයවේදීන් ඒකාබද්ධව සැලැස්මක් සකස් කිරීමේ කටයුතුද මේ වන විට ආරම්භ කොට ඇතැයිද කීය.

මේ හරහා රට ගමන් කරන්නේ කෙසේද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වන බවද වර්තමාන ආර්ථික අර්බුදය, ජාත්‍යන්තර දේශපාලනය පිළිබඳව විද්වත් සාකච්ඡා මණ්ඩපයකට ඉඩ විවර කරමින් 'පන්නරය' නමින් සෑම දිස්ත්‍රික්කයකටම වැඩමුළුවක් පැවැත්වෙන බවද මහාචාර්යවරයා පැවැසීය.

දිස්ත්‍රික් සංවිධායකවරු, මන්ත්‍රීවරු, පළාත් සභා හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු, කළමනාකරුවන්, ඇතුළු පාක්ෂිකයන් මේ වැඩමුළු සඳහා සහභාගී වීමට නියමිත අතර ගාල්ල, පුත්තලම, මාතර, රත්නපුර යන දිස්ත්‍රික්කවල වැඩමුළු අද (16දා) පැවැත්වේ.

සෑම වැඩමුළුවක්ම අවසානයේදී පක්ෂ සභාපති හිටපු ජනපති මෛත්‍රීපාල සිරිසේනගේ ප්‍රධානත්වයෙන් සහතික පත්‍රයක් පිරිනැමෙන බවද මහාචාර්යවරයා පැවැසීය.

## කෝටි 100ක...

රුපියල් කෝටි සියයකට අධික වටිනාකමින් යුතු හෙරොයින් මත්කුඩු කිලෝ 95.88ක් විනාශ කරන ලෙස කොළඹ කොටුව මහෙස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ මහතා පසුගියදා නියෝග කළේය.

පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ ස්ථානාධිපති සී.අයි. ජයසේකර මහතා අධිකරණයෙන් සිදුකළ ඉල්ලීමකට අනුව කොටුව මහෙස්ත්‍රාත්වරයා අදාළ නියෝගය ලබා දුන්නේය.

2019 වසරේ ජනවාරි මස 22දා මත්කුඩු කිලෝ 95.88ක තොගයක් සමඟ කොල්ලුපිටියේදී විදේශීය ජාතිකයන් තිදෙනෙක් ඇතුළු පස්දෙනෙක් පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය විසින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ අතර නීතිපතිවරයාගේ උපදෙස් මත 2021 සැප්තැම්බර් මස 27 වැනිදා අදාළ සැකකරුවන් පිරිස නිදහස් කරනු ලැබිණි.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් විදේශීය ජාතිකයන් වන චට්සා දුෂාන් කවුඩා නමැති ඇමෙරිකානු ජාතිකයා, ෆර්නාඩ් පකීර් නමැති ඇෆ්ගනිස්තානු ජාතිකයා සහ පවුන් ඇන්තනි මාර්ෂල් යන ඇමෙරිකානු ජාතිකයා අධිකරණයේ නියම පරිදි පිටුවහල් කරන තෙක් විදේශිකයන් රඳවා තබන මිරිහාන රැඳවුම් කඳවුරට යොමු කිරීමෙන් පසු පිටුවහල් කරනු ලැබූ අතර මෙරට සැකකරුවන් දෙදෙනා නිදහස් කරනු ලැබිණි.

මෙලෙස විනාශ කිරීමට නියෝග නිකුත් වූයේ ඩයිසැටටයිල් මෝෆින් හෙවත් හෙරොයින් කිලෝ 95යි ග්‍රෑම් 88ක් පොලිස් විශේෂ කාර්ය බළකායට ලැබුණු තොරතුරක් මත කොල්ලුපිටියේ ලිබර්ටි ප්ලාසා ගොඩනැගිල්ලේ විදුලි සෝපානය අසලදී මොවුන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර තිබිණි.

# ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට ඩොලර් මිලියන 900ක්



අමෙරිකානු ඩොලර් මිලියන 900ක මූල්‍ය පහසුකමක් ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට ලබා දෙනු ලැබ තිබේ. ට්විටර් පණිවුඩයක් නිකුත් කරමින් ශ්‍රී ලංකාවේ ඉන්දිය මහ කොමසාරිස් කාර්යාලය සඳහන් කළේ, මෙම පියවර ශ්‍රී ලංකාවේ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමට සහ ආර්ථික වර්ධනය වෙනුවෙන් ඉන්දියාවේ කැපවීම පිළිබිඹු කරන බවය.

ඒ අනුව, එම මූල්‍ය පහසුකම සඳහා ආසියානු නිෂ්කාශන සංගම් රාමුව යටතේ ඉන්දියාවට ගෙවීමට තිබූ අමෙරිකානු ඩොලර් මිලියන 500ක ණය මුදල ගෙවීමේ කාල සීමාව දීර්ඝ කිරීම සහ අමෙරිකානු ඩොලර් මිලියන 400ක විනිමය හුවමාරු පහසුකම ඇතුළත් වනු ඇත.

ශ්‍රී ලංකාවේ ඉන්දිය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා ශ්‍රී ලංකා මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා හමුවූ අවස්ථාවේදී ඉන්දීය සංචිත බැංකුව මඟින් ලබාදුන් ඇ.ඩො. මිලියන 900කට අධික පහසුකම යන සන්දර්භය තුළ ශ්‍රී ලංකාවට ඉන්දියාවේ ශක්තිමත් සහයෝගිතාව අවධාරණය කළ බව මහ කොමසාරිස් කාර්යාලය නිකුත් කළ එම ට්විටර් පණිවුඩයේ වැඩිදුරටත් සඳහන් වේ.

ආසියානු නිෂ්කාශන සංගමය යනු (ACU) කලාපීය සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ ආසියා සහ පැසිෆික් කලාපය සඳහා වන ආර්ථික හා සමාජ කොමිෂන් සභාවේ මූලිකත්වයෙන් 1974 දෙසැම්බර් 9 වැනි දින ඉරානයේ ටෙහෙරාන් නුවර මූලස්ථානය සමඟ පිහිටුවන ලද්දකි.

එහි ප්‍රධාන අරමුණ වන්නේ, බහුපාර්ශ්වික පදනමක් මත සුදුසුකම් ලත් ගනුදෙනු සඳහා සාමාජික රටවල් අතර ගෙවීම් සඳහා පහසුකම් සැලසීම, එමඟින් විදේශ විනිමය සංචිත භාවිතය සහ හුවමාරු වියදම් පිරිමැසීම මෙන්ම සහභාගි වන රටවල් අතර වෙළෙඳ සහ බැංකු සබඳතා ප්‍රවර්ධනය කිරීමය.

# පාස්කු ප්‍රහාරයට දින 1000ක් පිරෙනදා ජාතික කන්නලව්ව





පාස්කු ප්‍රහාරය වී දින 1000ක් ගතවී ඇතත් තවමත් වින්දිතයන්ට යුක්තිය ඉටු නොවීමට විරෝධය පා කොළඹ අගරදගුරු පදවිය මඟින් සංවිධානය කළ 'ජාතික කන්නලව්ව' යාච්ඤා දේව මෙහෙය ඉකුත්දා (14දා) රාගම, ජාතික බැසිලිකා දෙව් මැඳුරේදී පැවැත්විණි.

අගරදගුරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්, ප්‍රධාන අගරදගුරු හිමිවරු, පියතුමන්ලා, කන්‍යා සොයුරියන් ඇතුළු බැතිමතුන් බොහෝ පිරිසක් දේව මෙහෙය සඳහා එක්ව සිටියහ.

## උතුරේ ලිපිය...

දෙමළ ජනතාවගේ ප්‍රශ්නවලට දේශපාලන විසඳුමක් ලබාගැනීම සඳහා ඉන්දීය සහාය ගැනීමේ අරමුණෙන් දෙමළ ජාතික සන්ධානය ඇතුළු පක්ෂ කිහිපයක් ඒකාබද්ධව සැකැසූ ලිපිය ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි වෙත අනිද්දා (18දා) භාරදෙන බව දෙමළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ. සුමන්තිරන් 'මව්බිම'ට පැවැසීය.

ජාතික ගැටලුවට විසඳුමක් ලෙස නැවත පවරාගත නොහැකි අයුරින් අර්ථාන්විත බලය බෙදාහැරීමක් කිරීම එහි මූලික ඉල්ලීමක් හැටියට සඳහන් කර ඇතැයිද සුමන්තිරන් මහතා කීය.

සුමන්තිරන් මහතා මෙසේද කීය.

එම ලිපිය ලබන 18 වැනිදා භාරදීමට නියමිතයි. එම අවස්ථාවට සහභාගි වන්නැයි මටත් ආරාධනා ලැබී තිබෙනවා. නමුත් එයට සහභාගිවීමට හැකිවේදැයි මම තවම දන්නේ නැහැ.

එම ලිපිය 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය ක්‍රියාත්මක කරන්නැයි ඉල්ලමින් ඉදිරිපත් කරන ලිපියක් නොවෙයි. එම ලිපියේ දෙමළ ජනතාවගේ දේශපාලන අභිලාෂයන් සඳහන් වෙනවා. ඉන්දු - ලංකා ගිවිසුමෙන් පසුව ඒ වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සිදුවූ ප්‍රගතිය කවරේද ශ්‍රී ලංකාව දිගින් දිගටම ඉන්දියාවට ලබාදුන් පොරොන්දු මොනවාද යන්නත් මෙම ලිපියේ සවිස්තරාත්මකව සඳහන් වෙනවා.

13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යළි පණගන්වා බලය බෙදා හැරීමක් කරන බවට ඉන්දියාව විසින් අපට මෙන්ම ලෝකයට ලබාදී ඇති පොරොන්දුව වී තිබෙනවා. මෙම ලිපියෙන් කියැවෙන්නේ එයයි. ජාතික ගැටලුවට විසඳුමක් ලෙස අර්ථාන්විත බලය බෙදා හැරීමක් කළ යුතු බවත් බෙදා දෙන එම බලතල නැවත පවරා ගත නොහැකි ආකාරයේ විය යුතු බවත් එම ලිපියෙන් ඉල්ලා තිබෙනවා. එක්සත් රාජ්‍ය සංකල්පයේදී එම කාරණය වැදගත් කරුණක් වෙනවා.

ජාත්‍යන්තර නීතියට අනුව මෙරට දෙමළ ජනතාවත් ජන කොට්ඨාසයක් වශයෙන් හඳුනාගෙන තිබෙනවා. එබැවින් අපට ස්වයං තීරණ අයිතිය තිබෙනවා. එම අයිතිය මෙරට තුළ භාවිත කිරීමට අප එකඟ වී තිබෙනවා. ඒ වෙනුවෙන් මෙම ලිපියෙන් වැඩිදුරටත් ඉල්ලා තිබෙන්නේ එක්සත් රාජ්‍යයක බලය බෙදාහැරීමේ විසඳුමක් වඩාත් ප්‍රශස්ත බවයි.

## පාස්කු අපරාධකරුවන්...

ජනාධිපති කොමිසමේ නිර්දේශ අනුව නීතිය ක්‍රියාත්මක නොකරන්නේ මෛත්‍රීපාල සිරිසේන මහතාගේ සහ පොලිස් නිලධාරීන්ගෙන් පාස්කු ප්‍රහාරයේ අපරාධකරුවන් කවුරුන්ද යන්න හෙළි වන බිය නිසා බව සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී මනුෂ නානායක්කාර පැවැසීය.

ප්‍රහාරය වී දින දාහක් ගත වුවත් එයට සම්බන්ධ සැකකරුවන් ආණ්ඩුව තවමත් ආරක්ෂා කරන්නේ ඇයිදැයි ප්‍රශ්න කළ මන්ත්‍රීවරයා පාස්කු ප්‍රහාරය මතින් බලයට පැමිණි ආණ්ඩුවම ප්‍රහාරය යට ගැසීමට කටයුතු කරන බවද සඳහන් කළේය.

මන්ත්‍රීවරයා වැඩිදුරටත් මෙසේද කීය.

පාස්කු ප්‍රහාරය වෙලා දවස් දහසක් සම්පූර්ණ වෙනවා. ඊට සම්බන්ධ අය හිරේ දාන කාලයක් ඇවිත්. ඒ හරහාම බලයට පත් ආණ්ඩුව ඒ ගැන තීන්දුවක් නොගෙන පාස්කු ප්‍රහාරයට දින දහසක් සම්පූර්ණ වන දවසේ තේවත්තේ පල්ලියේ තියෙන ආගමික වතාවත්වලට ජනතාව සහභාගිවීම වැළැක්වීම සඳහා ඉතාමත් සූක්ෂ්ම උපක්‍රම භාවිත කරමින්, කාදිනල්තුමන් කියන ආකාරයට ඉතාමත් කැත විදිහට පල්ලියක බෝම්බයක් ඇටවීමක් පවා වෙලා තියෙනවා.

## කැබිනට් වෙනසකින්...

ලංකාවේ දේශපාලනය යළි ගොඩනැඟීමට අවශ්‍ය මේ මොහොතේ ඇමැති වරප්‍රසාද හා ඇමැති මණ්ඩල සංඛ්‍යාව සමාජය පිළිගත් පරිදි අඩු කිරීමට ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් තුළින් නිසැකවම ක්‍රියාත්මක කරන බව එහි විධායක සභික, කේ. ඩී. ලාල්කාන්ත ඉරිදා "මව්බිම" ට පැවැසීය.

කැබිනට් මණ්ඩලය හා අයුතු ලෙස ඔවුන් භුක්ති විඳින සැප පහසුකම් පිළිබඳ අද වනවිට ප්‍රගතිශීලී ජනතාව කරන විවේචන මෙහිදී ඉතා වැදගත් බවද ඒ මහතා පෙන්වා දුන්නේය.

කැබිනට් වෙනසක් කළ යුතු යැයි මතයක් මේ මොහොතේ කරළියට පැමිණ ඇති නමුත් රටේ කැබිනට් වෙනසක් කළා හෝ නොකළා ඉන් ජනතාවට අමුතු සෙතක් අත්නොවන බවද ලාල්කාන්ත මහතා සඳහන් කළේය.

විශේෂයෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්ගේ ඊළඟ ඉලක්කය කැබිනට් ඇමැතිවරයෙක් වීම බවත් කැබිනට් ඇමැතිවරයකු වූ පසුව ඔහුට හෝ ඇයට සැප පහසුකම් සහිත සුපිරි නිල නිවෙසක් එමෙන්ම වාහන තුන හතරක් ලැබෙන අතර ඇමැතිවරුන්ගේ පවුලේ හිතවතුන්ට හා කාර්ය මණ්ඩලයටත් මෙම වරප්‍රසාද භුක්ති විඳීමට හැකි සේම අයථා ලෙස මුදල් රැස් කිරීමට, විවිධ ව්‍යාපාර ගොඩනැඟීමේ බලය ලැබීමත් මෙමඟින් වන බැවින් ජාතික ජන බලවේග ආණ්ඩුවක් තුළ මෙම ක්‍රමය වෙනස් කිරීමට සූදානම් බවද ඒ මහතා සඳහන් කළේය.

විශේෂයෙන්ම කැබිනට් ඇමැතිවරයකු වූ පසු ආණ්ඩුවත් සමඟ එක්වී ව්‍යාපාර කර විශාල ලෙස ධනය ඉපයීම ආරම්භ කිරීම ඔවුන්ගේ පළමු ඉලක්කය වී ඇති බවද පවසන ඒ මහතා පෙන්වා දුන්නේ ආණ්ඩුකරණය හා රට ගොඩනැඟීම යන දෙකම සැලකිල්ලට ගනිමින් කරන කැබිනට් මාරු කිරීමක් තුළ පමණක් එය විද්‍යාත්මක යැයි හැඳින්විය හැකි නමුත් ආණ්ඩුකරණය වෙනම හෝ රට ගොඩනැඟීම වෙනම ක්‍රියාත්මක කිරීමට යෑම කිසිසේත්ම ප්‍රායෝගික නොවන බවය.

කෙසේ නමුත් ආණ්ඩුකරණයත්, රට ගොඩනැඟීමත් යන කාරණා දෙකේදීම නිසි කළමනාකාරීත්වයක් සහිතව කටයුතු කිරීමට මහින්ද රාජපක්ෂ හා ගෝඨාභය රාජපක්ෂ මහත්වරුන් අසමත් වී ඇති හෙයින් මේ මොහොතේ එහි විපාක ජනතාව ඇති තරම් භුක්ති විඳිමින් සිටින බවද ලාල්කාන්ත මහතා වැඩිදුරටත් පැවැසීය.

## එජාපයත්...

රටේ සිදුවන ව්‍යසනයන්ට මුහුණ දෙමින් විසඳුම් ලබාදීම සඳහා ජාතික සැලැස්මක් යටතේ දිගුකාලීන විසඳුමක් ජනතාව වෙත ඉදිරිපත් කිරීමට පුළුල් දේශපාලන සන්ධානයක් පිහිටුවා ගැනීමේ සාකච්ඡා වටයක් එක්සත් ජාතික පක්ෂය දේශපාලන පක්ෂ රාශියක් සමඟ ආරම්භ කොට තිබේ.

මෙම සාකච්ඡා වටයේ එක් හමුවක් පසුගිය 13 වැනිදා සවස එජාප මූලස්ථානය වන සිරිකොතේදී පැවැත්විණි. එජාප නියෝජ්‍ය නායක රුවන් විජේවර්ධන, සභාපති වජිර අබේවර්ධන, ලේකම් රංගේ බණ්ඩාර සහ සාගල රත්නායක මහත්වරුන්ගේ මූලිකත්වයෙන් පැවැති මෙම සාකච්ඡාවට ලියාපදිංචි දේශපාලන පක්ෂ හා සංවිධාන පහළොවක නායකයන් ඇතුළු ප්‍රධානීන් සහභාගි වී ඇත.

වර්තමානයේ රට පවතින තත්ත්වයෙන් ගොඩ ගැනීමට නායකත්වයක් එජාපය තුළ තිබෙන බව මෙම සාකච්ඡාවේ පක්ෂ නායකයන් හා නියෝජිතයන් අදහස් දක්වමින් ඒ සඳහා සුදුස්සා රනිල් වික්‍රමසිංහ බව බහුතරය ප්‍රකාශ කොට ඇතැයි වාර්තා වෙයි.

ඉරිදා "මව්බිම" ට වාර්තා වන අන්දමට මෙම සාකච්ඡාවට එක්සත් ජාතික පෙරමුණ, ප්‍රජාතන්ත්‍රවාදී ජාතික පෙරමුණ, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ විකල්ප කණ්ඩායම, ශ්‍රී ලංකා පාරම්පරික කලාකරුවන්ගේ සම්මේලනය, ජාතික මිතුරෝ, ජාතික ජනතා ව්‍යාපාරය, නව සම සමාජ පක්ෂය, ජාතික කලා පෙරමුණ, එක්සත් වෙළෙඳ සංගමය, ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ ඇතුළු පක්ෂ 15ක නියෝජිතයන් සහභාගි වී ඇත. සහභාගි වූ පක්ෂ නායකයන් හා නියෝජිතයන් අතර ආචාර්ය සිරිමසිරි හපුආරච්චි, නීතිඥ සාමිලා පෙරේරා, ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න, ආර්යවංශ දිසානායක, රාජා උස්වැටකෙයියාව, සුන්දරම් මහේන්ද්‍රන්, පරාක්‍රම විජේසිංහ ඇතුළු පිරිසක් සහභාගි වූ අය අතර වූහ.

පැය තුනකට ආසන්න කාලයක් සාකච්ඡාව පැවැති බවද වාර්තා වේ.

## රබර්-සහල් ගිවිසුම...

චීන- ශ්‍රී ලංකා රබර් - සහල් ගිවිසුමට වසර 70ක් පිරීම නිමිත්තෙන් චීනය විසින් ශ්‍රී ලංකාවට සහල් ප්‍රදානයක් ලබාදීමට කටයුතු කරමින් සිටින බව වෙළෙඳ අමාත්‍යාංශයේ ප්‍රකාශකයකු සඳහන් කළේය.

ශ්‍රී ලංකාවේ චීන තානාපති කාර්යාලයේ වාණිජ අංශ ප්‍රධානී ලී ගුවැන්ජුන් අතර පැවැති සාකච්ඡාවකදී ඇමැති බන්දුල ගුණවර්ධන කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාර දක්වමින් චීන තානාපති කාර්යාලය මේ වනවිට මෙම ප්‍රදානයට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.

ඒ අනුව මෙරට ජනතාව විසින් පරිභෝජනය කරනු ලබන සහල් වර්ග හා ප්‍රමාණය චීන තානාපති කාර්යාලය වෙත ලිඛිතව දැන්වීමටද වෙළෙඳ අමාත්‍යාංශය කටයුතු කර ඇත.

වෙළෙඳ අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා චීන තානාපති කාර්යාලය අතර සම්බන්ධීකරණයෙන් මෙම කටයුතු සිදුකරනු ලැබේ.

1952දී එවක වෙළෙඳ ඇමැතිව සිටි ආර්.ජී. සේනානායක මහතාගේ මූලිකත්වයෙන් රබර් - සහල් ගිවිසුමට අස්සන් තැබිණි.



### දවසේ පද 4

අස්කොට පැයක්වත් ගතවී ගියේ නැතී
පත්කොට තිබේ ලිට්රෝවෙහි සභාපතී
තනතුරු අතැර යන උදවිය පොළේ ඇතී
තනතුරු රකින්නට කවුරුත් කඩේ යතී

විදුර අබේනායක




# සියලු ශාන්තුවරයන්ගෙන් අසා දැනගත යුතු බොරැල්ල පල්ලියේ බෝම්බ හුටපටය

**බොරැල්ලේ ආනන්ද රාජකරුණා මාවතේ සියලු ශාන්තුවරයන්ගේ දෙව්මැඳුරේ සුරුවමක් මත තිබී හමුවූ ජීව අත්බෝම්බය සම්බන්ධයෙන් කෙරෙන විමර්ශන මේ වනවිට ගැටලු සහගත තත්ත්වයකට පත්ව තිබේ. ඒ ඉකුත් 13 වැනිදා කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් මාධ්‍ය හමුවේ කළ ප්‍රකාශයක් හේතුවෙනි.**

දෙව් මැඳුරේ තිබී හමුවූ ජීව අත්බෝම්බය සම්බන්ධයෙන් පොලිසිය ගත් ක්‍රියාමාර්ග සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරන බව සඳහන් කළ උන්වහන්සේ මෙය කතෝලික ජනතාව තුළ බියක් ඇති කිරීමට සිදුකළ කුමන්ත්‍රණයක් බවද කීහ.

දේවස්ථානය තුළ බෝම්බයක් තබා තිබෙන බව ඉකුත් 11 වැනිදා සවස් කාලයේ බොරැල්ල පොලිස් ස්ථානාධිපතිවරයා වෙත තොරතුරක් ලැබී තිබිණි. ඒ අනුව වහා ක්‍රියාත්මක වූ බොරැල්ල පොලිස් ස්ථානාධිපතිවරයා ඇතුළු කණ්ඩායමක් අදාළ ස්ථානයට ගොස් විමර්ශන ආරම්භ කළහ. දේවස්ථානයේ සුරුවමක් මත ජීව අත්බෝම්බයක් තිබෙන බවට නිරීක්ෂණය වූ අතර එහි ආරක්ෂිත උගුල ඉවත්කර බෝම්බය වටා රබර් පටි, සෙලෝටේප්, හඳුන්කූරු හා ගිනිකූරු රැසක් අමුණා එය නිර්මාණය කර ඇති බවත් හෙළිදරව් කර ගන්නා ලදී. එමෙන්ම යම් ගිනි ඇවිළීමක් වූ අවස්ථාවක පුපුරා යන ආකාරයට මෙම බෝම්බය අටවා ඇති බව විමර්ශන නිලධාරීන්ට ඒත්තු ගොස් තිබිණි.

මේ සම්බන්ධයෙන් එම අවස්ථාවේම පුද්ගලයන් හතරදෙනකු පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන තිබුණු අතර කොළඹ අපරාධ කොට්ඨාසයද විමර්ශන සඳහා එක්කරගෙන තිබිණ.

අත්අඩංගුවට ගත් පුද්ගලයන් අතර සිටි 56 හැවිරිදි මරදාන ප්‍රදේශයේ පදිංචි පුද්ගලයකු එම බෝම්බය දේවස්ථානය තුළ තබා තිබූ බව අනාවරණය වූ බව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා සඳහන් කළේය. එමෙන්ම එම සැකකාර පුද්ගලයා වසර 16කට ආසන්න කාලයක සිට දේවස්ථානය සමඟ සම්බන්ධකම් පවත්වන අයකු බවත්, දැනට මාස 09 කාලයක සිට ඔහු ස්ථිරවම දේවස්ථානයේ රැඳී සිටිමින් සේවය කරන්නකු බවටද අනාවරණය වූ බවත් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කීවේය. සැකකරු දේවස්ථානය අසල පදිංචි නිතර දේවස්ථානයට පැමිණෙන වයස අවුරුදු 13ක දරුවකුද බෝම්බය සුරුවම මත තැබීමට යොදවාගෙන ඇති බවද හෙතෙම අවධාරණය කෙරිණි.

එමෙන්ම ප්‍රධාන සැකකරු බෝම්බය ඇටවීම සඳහා යොදාගත් ගිනිකූරු, සෙලෝටේප් ඇතුළු ද්‍රව්‍යවල කොටස් ඔහු රැඳී සිටි කාමරයේ තිබී සොයා ගැනීමටද කොට්ඨාස අපරාධ විමර්ශන පරීක්ෂකවරුන්ට හැකිවිය.

මේ අතර ප්‍රධාන සැකකරු ජීව අත්බෝම්බය සුරුවම මත තැබීමට සහාය ලබාගත් දරුවා අලුත්කඩේ අංක 2 මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට කොළඹ අපරාධ කොට්ඨාසය ක්‍රියා කළේය. ඒ සිද්ධිය සම්බන්ධයෙන් සාක්ෂියක් ඉදිරිපත් කිරීම සඳහාය.

දරුවා ජීව අත්බෝම්බය පිළිබඳ වැදගත් කරුණු කිහිපයක් අනාවරණය කරන බවත්, ඒ සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරිය ඉදිරියේ රහස් ප්‍රකාශයක් ලබාදීමට ඔහු කැමැත්ත පළ කළ බවත් කොළඹ අපරාධ කොට්ඨාසය අධිකරණයට කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කළේ ඒ අතරය. මේ අතර ප්‍රධාන සැකකරු කුමන අරමුණක් සඳහා දේවස්ථානය තුළ අත්බෝම්බය තැබුවේද ඔහුට මෙම අත්බෝම්බය ලැබුණේ කෙසේද එම අත්බෝම්බය දේවස්ථානය තුළ තැබීමට තවත් කවුරුන් හෝ ආධාර අනුබල දුන්නේද යන කරුණු අනාවරණය කර ගත යුතු බැවින් එය හෙළිකර ගැනීම සඳහා සැකකරුගෙන් වැඩිදුර ප්‍රශ්න කර තොරතුරු ලබාගැනීමට රැඳවුම් නියෝග ලබාගැනීමටද අපේක්ෂා කරන බව මේ සම්බන්ධයෙන් කළ විමසීමකදී පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිහාල් තල්දූව මහතා කීවේය.

මේ අතර කොළඹ අතිරේක මහෙස්ත්‍රාත්වරිය දරුවා තමන් හමුවට කැඳවා රහස් ප්‍රකාශයක් ලබාගෙන තිබිණි. මේ අතර මේ සම්බන්ධයෙන් බොරැල්ල පොලිසියත් කොළඹ අපරාධ කොට්ඨාසයත් එක්ව විමර්ශන ආරම්භ කර තිබිණි.

තත්ත්වය මෙසේ තිබියදී අගරදගුරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ පොලිසිය විසින් කරන ලද විමර්ශන දෝෂාරෝපණයට ලක් කළහ.

"මේ සිද්ධියෙන් පස්සේ අපේ පල්ලියේ අවුරුදු ගාණක් වැඩකරපු "සන්ක්‍රිස්තියන්" කියන තනතුර දරපු මහත්මයාට සහ ඔහුට සහාය දුන් තවත් හතර දෙනෙක් පොලිසියට කැඳවා ගෙන ගියා. ඊට පස්සේ පොලිස් මාධ්‍ය ප්‍රකාශකතුමා නිකුත් කරලා තිබුණු ප්‍රකාශයේ සඳහන් වුණා, ඒකට කටයුතු කළේ සන්ක්‍රිස්තියන් ධුරය දරපු මුනි කියන කෙනා කියලා. මම ඊයේ හවස අපේ පියතුමාට කිව්වා කරුණාකරලා උදේ වරුවේ ඉඳලා සී.සී.ටී.වී. දර්ශන නරඹන්න කියලා. මොකද පොලිසිය කිව්වේ අපිට හැන්දෑවේ තුනෙන් පස්සේ තිබුණු දර්ශන නැරඹුවාම ඇති කියලා. පියතුමාලා අපි උදය වරුවේ ඒවත් පෙන්නන්නද කියලා ඇහුවම ඒගොල්ලෝ ඒකට එච්චර කැමැත්තක් පෙන්නලා තිබුණේ නැහැ.

ඒ අනුව අපිට පේනවා එදා උදේ 9.52ට පුද්ගලයෙක් දේවස්ථාන භූමියට ඇතුළු වෙනවා. සිලිසිලි බෑග් එකක් අරගෙන කළුපාටට හුරු කලිසමකුයි බුෂ් ෂර්ට් එකකුයි ඇඳගෙන ටිකක් නොණ්ඩි ගහමින් පල්ලිය ඇතුළට එනවා. පල්ලියේ අන්තිම බංකු දෙකතුනකින් මෙහා බංකුවකින් ඇතුළු වෙනවා. එයා හරියට කතෝලිකයෙක් නොවන බව පැහැදිලි වුණා. ඒ පිටාපුත්‍රයා ලකුණ දාගැනීමේ ක්‍රමය වැරදි.

"දොරකඩ ළඟ ඉඳලා කෙළවරේ මුල්ලේ ප්‍රතිමාවක් තියලා තියෙනවා. එතනට යනවා පේනවා. එතැනට ගිහින් ඒ පුද්ගලයා මොනවා හරි කරනවා. නැමෙනවා. ඒ වගේම අපිට පේනවා ඒ පුද්ගලයා කලිසම ඇතුළෙන් හරි සාක්කුවෙන් හරි මොකක් හරි එකක් එළියට ඇදලා ගන්නවා. ඊට පස්සේ නැවිලා මොනවාදෝ කරනවා පේනවා. පල්ලියේ තවත් සැරසිලි වගයක් කරමින් හිටපු කෙනෙක් එතැනින් යන්න ගියාම මේ පුද්ගලයා කඩිමුඩියේ කලබලෙන් වටපිට බල බල පැනලා දුවනවා පල්ලියෙන්. මේ දර්ශන පොලිසිය බලලා නැහැ. ඉස්සෙල්ලා නොණ්ඩි ගහ ගහ ආව එක්කෙනා හොඳට ඇවිදගෙන යනවා එළියට. නොණ්ඩි ගහ ගහ ආවේ. එයාගේ සාක්කුවේ හරි එයාගේ ඇඟ ඇතුළේ හරි මොකක් හරි එකක් උස්සගෙන ආවද කියන හැඟීමක් අපිට ලැබෙනවා.

>>13

■ කීර්ති මෙන්ඩිස්



පාස්කු වේදනාවේ දින 1000 සමරද්දී බොරැල්ල පල්ලියට රිංගුවේ කවුද?

## ඇත්ත හොයනවට වැඩිය බොරු කතන්දර ගොතනවා



කාදිනල් මැල්කම් රංජිත්

## තොරතුරු මාධ්‍යයට දැන්වීම පරීක්ෂණවලට බාධාවක්



ඇමැති සරත් වීරසේකර





# යූඇන්පීයට ආයෙ නැඟිටින්න පුළුවන් ද?

ජ්‍යොතිෂයෙන් විග්‍රහයක්



## යළි බලයට පත්වීම මිරිඟුවක් පමණයි

1946 සැප්තැම්බර් මස 06 වැනි දින සවස 5.00ට කොල්ලුපිටියේ ෆාම්කෝට් මැඳුරේදී "එක්සත් ජාතික පක්ෂයේ" සමාරම්භක රැස්වීම පවත්වා ජාතීන් එක්සත් කිරීම සඳහා දේශපාලන පක්ෂයක් යන අරමුණින් එක්සත් ජාතික පක්ෂය ආරම්භ කර තිබේ. මෙම යෝජනාව ද්‍රවිඩ ජාතික එස්. නඩේසන් මහතා ඉදිරිපත් කළ අතර මුස්ලිම් ජාතික ටී. බී. ජයා මහතා විසින් ස්ථිර කරන ලදී. එවැනි පුළුල් අරමුණකින් ඇරඹූ පක්ෂයේ නායකත්වය ජාතියේ පියා වශයෙන් ගෞරවයට පාත්‍ර වූ ඩී. එස්. සේනානායක මහතාට හිමිවිය.

රටට එළදායී මෙහෙවරක් ඉටු කරමින් වසර හැත්තෑපහකට අධික ඉතිහාසයක් උරුම වූ එක්සත් ජාතික පක්ෂයට විවිධ නායකත්ව යටතේ කටයුතු කිරීමේ භාග්‍යය හිමිවුවත් වර්තමානයේ මෙම පක්ෂය ඛේදනීය ඉරණමකට මුහුණ දෙමින් සිටී. එම තත්ත්වය ජ්‍යොතිෂමය වශයෙන් විශ්ලේෂණය කරමු.

එක්සත් ජාතික පක්ෂය ආරම්භ කරන අවස්ථාවේදී පක්ෂ කේන්දරයෙහි රාජ්‍ය කාරක රවි ග්‍රහයා ස්වක්ෂේත්‍ර බලයෙන් යුතුව මිත්‍ර බලය තිබූ බුධ හා යෝග වී සත්වැන්නේ සිටීමෙන්ද චන්ද්‍රයා පුර බලයෙන් යුතුව එකොළොස්වැන්නේ සිටීමෙන්ද වාද භේදවලින් තොරව අධිරාජ්‍යවාදීන්ගෙන් ලංකාවට නිදහස ලබාගැනීම සඳහා නායකත්වය දීමට හැකිවිය.

සිකුරු මහ දශාවෙන් ආරම්භ වූ එක්සත් ජාතික පක්ෂයට සෑම අවස්ථාවකම එරෙහි වූයේ පීඩිත පන්තියයි. එයට හේතුව ලග්නාධිපති සෙනසුරු ග්‍රහයා සතුරු බලයෙන් යුතුව පක්ෂ කේන්දරයේ සතුරු ස්ථානය වූ හයවැනි භාවයේ සිටීමයි. මෙවැනි පිහිටීමක් පැවැති නමුදු එක්දහස් නවසිය හැත්තෑහත වර්ෂයේ ලංකා ඉතිහාසයේ දේශපාලන වශයෙන් වාර්තා සහගත ජයග්‍රහණයක් ලැබූ එක්සත් ජාතික පක්ෂය අඛණ්ඩව වසර දාහතක් බලයේ රැඳී සිටියේය.

එහෙත් වර්තමාන තත්ත්වය අනුව මෙම පක්ෂය යළි බලයට පැමිණීම මිරිඟුවක් බවට පත්වෙමින් තිබීම ජ්‍යොතිෂ විද්‍යාවට අනුව සනාථ වන කරුණකි.

මෙම කාල වකවානුවේදී එක්සත් ජාතික පක්ෂය ලග්න සහ ජන්ම වශයෙන් ඒරාෂ්ටක දෙකක් ගෙවමින් සිටින අතර සෙනසුරු මහ දශාවේ රවි අන්තර් දශාව ලබා තිබේ. පක්ෂයේ වර්තමාන නායකත්වය දරන රනිල් වික්‍රමසිංහ මහතාගේ උප්පත්ති කේන්දරයේ සෙනසුරු ග්‍රහයා මූඪ වී සිටීමත් ලග්නාධිපති වූ ගුරු ග්‍රහයා නීච වී අයස්ථානයේ සිටීමත් හේතුවෙන් එතුමාට මහජන ආකර්ෂණය ලබා ගැනීම අපහසු වේ.

වර්තමාන ග්‍රහබලය අනුව දෙදහස් විසිදෙක වසරේ මැයි මස ආරම්භයේදී සෙනසුරු ග්‍රහයා එක්සත් ජාතික පක්ෂ කේන්දරයේ ලග්නගත වේ. මෙම ග්‍රහ ගෝචරය මත මහජනතාව පක්ෂය පිළිබඳ කලකිරුණු ස්වභාවයකට පත්වීමෙන් පක්ෂ සාමාජිකත්වය අතහැර දැමීමට පෙලඹෙනු ඇත.

මෙම අවස්ථාවේදී පක්ෂ නායකත්වය දරන රනිල් වික්‍රමසිංහ මහතාට කේන්දරයේ එකොළොස්වැනි භාවයේ සෙනසුරුගේ ගෝචරයෙන් නිර්මාණය වී තිබූ නීචභංග රාජයෝගය සෙනසුරු ග්‍රහයා වැයස්ථානගත වීමෙන් බිඳී යයි. ඒ අනුව පක්ෂය අභ්‍යන්තරයේ එතුමාගේ බලය තව දුරටත් හීනවීමට පටන් ගනී. මෙයින් පෙනී යන්නේ මෙවැනි ග්‍රහචාරයක් පවතින අවස්ථාවකදී එක්සත් ජාතික පක්ෂය යළි බලයට පත් කිරීමට දරන උත්සාහය ප්‍රබල රළ පහරක උඩුගං බලා පිහිනීම වැනි නිරර්ථක උත්සාහයක් බවයි.

■ කිවිපති ජ්‍යොතිර්වේදිනි කල්‍යාණී හේරත් මැණිකේ



## පක්ෂය දෙකට කැඩෙන්නත් සෙනසුරු අපලෙ බලපෑවා

ශ්‍රී ලංකාවේ පැරණිතම දේශපාලන පක්ෂයක් වන එක්සත් ජාතික පක්ෂයේ උපත සිදුවූයේ 1946 සැප්තැම්බර් 06 වැනි සිකුරාදා ප.ව. 5.00ට කොළඹ 'ඇල්බට් ක්‍රසන්ට්'හිදීය. තිඹිරිගෙය වූයේ 'ෆාම්කෝට්' මන්දිරයයි. එම ශුභ මොහොත උදාවන විට හිරු රද තෙම, බටහිර මුහුදේ සැඟවී යන්නට සූදානම් වූ අතර සෙනසුරුට අයත් 'කුම්භ' රාශිය නැඟෙනහිර ක්ෂිතිජයෙන් මෝදු වෙමින් තිබිණි.

මහාමාන්‍ය ඩී.එස්. සේනානායකයන්ගේ නායකත්වයෙන් අරඹන ලද එක්සත් ජාතික පක්ෂයේ ජන්ම නක්ෂත්‍රය වූයේ සිකුරු ග්‍රහයාට අයත් පුවසල නැකැතයි. සිකුරු මහ දශාවෙන් ඇරැඹි එජාපයේ දිගුගමන් මඟෙහි වසර හතක්ම ගෙවුණේ සිකුරුගේ අණසකට නතුවය. එම කාලය එක්සත් ජාතික පක්ෂයට වාසනාවන්ත කාලයක් විය.

1947 සිට පැවැති මැතිවරණවලදී එක්සත් ජාතික පක්ෂ පෙරමුණේ සිටිමින් ඡන්දදායකයන්ගේ විශ්වාස ගොඩනඟා ගත් බව පැහැදිලිව දක්නට තිබිණි.

1970 මැයි 27 පැවැති පාර්ලිමේන්තු මැතිවරණයෙන් එජාපය පරාජය වූ අතර ලැබුණේ ආසන 17කි. පක්ෂයේ නායකත්වය දරමින් අගමැතිව සිටි ඩඩ්ලි සේනානායකයන් එම පරාජයේ හීතියෙන් වෙව්ලා ගිය අතර 1973දී ඩඩ්ලි සේනානායකයන් අභාවප්‍රාප්ත විය.

1970දී ලද අන්ත පරාජය වෙනස් කර එක්සත් ජාතික පක්ෂය නව මාවතකට ගෙන යෑමට ජේ.ආර්. ජයවර්ධන කටයුතු කළ අතර එහි මාහැඟි ඵලයක් ලෙස 1977දී එජාපය හයෙන් පහක ජනතා බලයක් ලැබ නව එජාප රජයක් පිහිටුවීය. එහි අගමැතිවරයා වූයේ ජේ.ආර්. ජයවර්ධන නමැති මහා මොළකරුය. ඔහු බුධට අයත් කන්‍යා ලග්නයෙන් උපන්නෙකි.

ඔහු විසින් ඇති කරන ලද නව ප්‍රතිසංස්කරණයන් රැසක් වූ අතර නව පිබිදීමක් රට තුළ ඇති වූ බව එක හෙළා පිළිගත හැකි සත්‍යයකි. 1977න් ආරම්භ වූ එජාප පාලන කාලය, එක්සත් ජාතික පක්ෂයේ කීර්තිමත්ම යුගය වූ බව නොරහසකි. ඒ වන විට එජාපයට රාහු මහ දශාව ලබා තිබිණි.

1989දී එජාපය භාරගනු ලැබුවේ මේෂ ලග්නයෙන් උපන් දැඩි මතධාරී පාලකයකු වූ ආර්. ප්‍රේමදාසයන්ය. රාහු මහ දශාවේ සිකුරු අන්තරයෙන් ආරම්භ වූ ඔහුගේ පාලන කාලය තුළ රටත් ජනතාවත් විවිධ හැලහැප්පීම්වලට භාජන විය.

1993දී සිදු වූ ජනපති ප්‍රේමදාසයන්ගේ ඝාතනයෙන් පසු එජාපයේ නායකත්වයට පත්වුණේ රනිල් වික්‍රමසිංහයන්ය. ඔහු ගුරුට අයත් මීන ලග්නයෙන් උපත ලද බුද්ධිමතකු වූ අතර 'ක්ලීන් මාස්ටර්' යනුවෙන් ඔහුව හඳුන්වනු ලැබීය. කිහිප වරක්ම ජනපති පුටුව අසලටම ගොස් නැවත හැරී අගමැති පුටුවේම නතර වූ රනිල් වික්‍රමසිංහ මහතා තවදුරටත් ගත කරමින් සිටිනුයේ සෙනසුරු මහ දශාවයි. එය 2030 දක්වා පවතී.

පසුගිය මහ මැතිවරණයෙන් එජාපය එක් ආසනයකට පමණක් සීමා කිරීමට රනිල් වික්‍රමසිංහගේ සෙනසුරු මහ දශා අපලය සමත් වූ අතර එජාපයෙන් කොටසක් කඩාගෙන නව පක්ෂ යක් හදාගැනීමටද සජිත් ප්‍රේමදාස ප්‍රමුඛ කණ්ඩායම පොලඹවන ලද්දේද සෙනසුරු විසින් බව සහතිකය. කවුරු විශ්වාස කළත් නොකළත් රනිල් වික්‍රමසිංහයන් එජාප නායකත්වයෙන් අයින් වී ජේ.ආර්. ගේ වැනි ග්‍රහ බලයක් ඇති අයකුට පක්ෂයේ නායකත්වය පවරා දීමෙන් හැර එක්සත් ජාතික පක්ෂය නැවත නැඟිටවීමට නොහැකි බව අවධාරණයෙන් පැවැසිය හැකිය.

■ පාරම්පරික ජ්‍යොතිෂවේදී කොටදෙණියාවේ ඩග්ලස් ගුණවර්ධන



## නායකත්වයේ අසුබ ග්‍රහ යෝග පක්ෂයේ අනාගතයට අවාසියි

1946 සැප්තැම්බර් මස 06 වැනි දින කුම්භ ලග්නය සහ සිකුරුට අයත් පුවසල නැකැත පැවැති මොහොතක දැවැන්ත එ.ජා. පක්ෂය අලියා ලකුණෙන් පටන් ගත්තේය.

එදා මෙදා තුරා දක්ෂ දේශපාලන නායකයන් මේ තුළින් බිහි විය. බොහෝ අවස්ථාවල පක්ෂයේ නායකත්වය ලබාගැනීමට සටන් කළ අයගේ ක්‍රියා කලාපය නිසා කිහිප වතාවක්ම පක්ෂය බින්දුවටම වැටිණි.

එහෙත් මෙම පක්ෂයට නායකත්වය දුන් ජේ.ආර්. ජයවර්ධන, ආර්. ප්‍රේමදාස වැනි නායකයන්ගේ ග්‍රහ බලය බලවත් වීම තුළ ජනතා ආකර්ෂණය ලබා ගනිමින් පක්ෂය ඉහළටම ඔසවා තැබීය.

පක්ෂයක් ඉදිරියට ගෙනයන්න නායකත්වයේ බලයත් ක්‍රියාකාරීන්ගේ බලයත් තිබිය යුතුමය. පක්ෂයට නායකත්වය දෙන නායකයාගේ බලය ක්‍රියාත්මක වන්නේ කෙසේදැයි හිටපු ජනාධිපති ප්‍රේමදාස මහතාගේ කේන්දරය තුළින් විමසා බැලීම වැදගත්ය.

මේෂ ලග්නයෙන් උපන් ඔහුගේ කේන්දරයේ ලග්නාධිපති කුජ 11 වැන්නේය. එහි අධිපති සෙනසුරු 'සස' යෝගය උදා කරමින් උච්ච බලයෙන් දිග්බලව 7 වැන්නේ තැම්පත්ය. එසේම සෙනසුරු වර්ගෝත්තමය. පර්වත යෝග බලය පැවැතිණි. පීඩිත ජනතාව නියෝජනය කරන සෙනසුරුගේ බලය නිසා දේශපාලනයේ ඉහළම තනතුරට පත්විය. එදා එ.ජා පක්ෂය ජනප්‍රිය වීමට නායකයාගේ බලය ක්‍රියාත්මක වූ බව මෙයින් පැහැදිලිය.

ජේ.ආර්. ජයවර්ධන මහතාගේ කේන්දරයෙද මේ හා සමාන බලයක් තිබිණි. එ.ජා.ප.ය බින්දුවට වැටුණු අවස්ථාවක 2/3 බලයක් ලබා ගනිමින් එ.ජා පක්ෂය ඉහළටම ඔසවා තැබීමට හැකි විය.

මීන ලග්නයෙන් උපන් රනිල් වික්‍රමසිංහ මහතාගේ කේන්දරයේ ලග්නාධිපති ගුරු සෙනසුරුට අයත් 11 වැන්නේ නීච රාශි ගතව තැම්පත්ය. එහි අධිපති සෙනසුරු සතුරු රාශි ගත වෙමින් 6 වැන්නේ තැම්පත්ය. එහි අධිපති වගේම ගුරු ගමන් කළ නැකැත අධිපති රවි ලග්න ගතව සිටීමත් කුජගෙන් පීඩාවට පත්ව ඇත. ඔහු බුද්ධිමත් නායකයෙකි. රටට වැඩක් කළ හැකි නායකයෙක් මෙන්ම හොර බොරු නැති අයෙකි. මේ සියලු යහපත් පුවත් මා මුලින් පෙන්වා දුන් ග්‍රහචාරය අනුව ඔහුට මහජන කැමැත්ත ලබා ගැනීම අසීරුය. හොඳ මුහුණ පෙන්නන අය යටින් ඔහු කෙරෙහි වෛරයක් පෙන්වයි. මෙම පවතින ග්‍රහ තත්ත්වය තුළ එතුමාට මහජන ප්‍රසාදය නොලැබෙන බැවින් එ.ජා. පක්ෂය කෙරෙහිද ජනතාවගේ අප්‍රසාදයට පත්වේ.

එ.ජා. පක්ෂයේ නායකත්වය වෙනස් වී රාජයෝග පවතින නායකයෙක් නායකත්වයට පත්වූදාට එ.ජා. පක්ෂය නැඟිටිනු ඇත.

■ සාම විනිසුරු දේශබන්ධු එස්. ජේ. සමරකෝන්



## නායකයා දක්ෂයෙක් වුණත් ගත කරන දශා පල සුබ නෑ

ඩී.එස්. සේනානායක මහතාගේ මූලිකත්වයෙන් 1946 සැප්. 06වැනිදා ඇරැඹි එක්සත් ජාතික පක්ෂය රටේ ප්‍රබලතම පක්ෂයක් විය. ප්‍රබල දේශපාලන චරිත බිහි කරමින් රටේ කිහිප වතාවක්ම ආණ්ඩු බලය පිහිටුවූයේය. මෙරට ප්‍රථම විධායක ජනාධිපතිවරයා වූ ජේ.ආර්. ජයවර්ධන මහතාද ප්‍රබල ජනාධිපතිවරයකු වූ ආර්. ප්‍රේමදාස මහතාද යූඇන්පීයේ දැවැන්ත චරිත බව අමුතුවෙන් කිව යුතු නැත.

පක්ෂය ආරම්භ වූ මොහොතේ සිටම වර්තමානය දක්වාම පක්ෂයේ සලකුණ වන අලියා සහ වර්ණය නොවෙනස්ව පැවැතීම විශේෂත්වයකි.

පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයෙන් කවුරුත් නොසිතූ ආකාරයට යූඇන්පීය අන්ත පරාජයකට පත් විය. නැවතත් පක්ෂයට නැඟිටීමට හැකිවේද යන වග තීරණය වන්නේ පක්ෂයට පවතින ග්‍රහචාරයත් පක්ෂ නායකතුමාගේ ග්‍රහචාරයත් මතයි. යූඇන්පීය ආරම්භ කළ මොහොතේ පත් තත්කාල ලග්නය ලංකා කේන්දරයට සමානවීම විශේෂත්වයකි. කුම්භ ලග්නය වූ ලංකා කේන්දරයට 2020 ජනවාරි 24දා සෙනසුරු මාරුවත් සමඟම අප රටට ලග්න ඒරාෂ්ටක අපලයක් ආරම්භ විය. ඒ සමඟම යූඇන්පීයටත් කණකොකා හැඬුවේ පක්ෂය නරක කලදශාවක් ගත කරන බැවිනි.

යූඇන්පීය ආරම්භ කළ අවස්ථාවට අනුව වර්තමානය තුළද ගත වෙන්නේ සෙනසුරු මහ දශා කාලයයි. පක්ෂය ආරම්භක මොහොතේ සෙනසුරු තදබල ලෙසම සතුරු රාශියක පිහිටීම යූඇන්පීය කඩා වැටීමට ප්‍රබල හේතුවකි.

යූඇන්පීයේ සිටි ප්‍රබල චරිතයක් වූ සජිත් ප්‍රේමදාස මහතා පසුගිය ජනාධිපතිවරණයට තරග කිරීමේදී පක්ෂයේ සහයෝගය ලැබුණත් අලියා සලකුණ නොදී කටයුතු කිරීම එතුමාගේ පරාජයට එක් හේතුවක් විය. නමුත් ලංකාවට වර්තමානයේ ඇති වී තිබෙන ඉරණම අනුව ඒ පරාජය ජයග්‍රහණයක් බව නම් පැහැදිලිය. වත්මන් ජනාධිපතිතුමා ජය ලැබුවත් අද වනවිට දැඩි අභියෝගවලට මුහුණදීමට සිදුවී තිබේ.

සජිත් ප්‍රේමදාස ප්‍රමුඛ සමගි ජන බලවේගය පක්ෂය ගොඩනඟමින් ටික කලක් ඇතුළත පාර්ලිමේන්තු මැතිවරණයෙන් විශිෂ්ට ජයග්‍රහණයක් අත්කර ගැනීම යූඇන්පීයට ප්‍රබල අභියෝගයක් විය.

අන්ත පරාජයකට පත් වූ යූඇන්පීය නැවත නැඟිටීම සිහිනයකි. පක්ෂයේ නායකත්වය දරන රනිල් වික්‍රමසිංහ මහතා ගත කරන දශා කාලය හොඳ නැත. බුධ මහ දශාව ගත කරන අතර එතුමාට 2022 පෙබරවාරි සිට කේතුගේ අතුරු දශාවක් ලබයි. ලග්න ඒරාෂ්ටක අපල ගත කරන නිසා කාලය හොඳ නැත. සැබවින්ම ඔහු දක්ෂයෙකි. දේශපාලන ක්ෂේත්‍රය තුළ පරිණතභාවයක් ඇති චරිතයකි. නමුත් ගත කරන දශාවලට අනුව පක්ෂයේ දියුණුවක් ඉදිරියට දැකිය නොහැකිය.

■ ජ්‍යොතිෂවේදී සරත්චන්ද්‍ර බෝතලාගේ

■ තිස්ස කොරතොට

# අධිවේගයෙන් අයාලේ ගිය පොලිස් නීතියේ තිත්ත කතාවක්

එක් පොලිස් නිලධාරියකුගේ නොමනා ක්‍රියා කලාපයන් නිසා සමස්ත පොලිස් දෙපාර්තමේන්තුවම නින්දාවටත් ලැජ්ජාවටත් පත්වූ අවස්ථා බොහෝය. නිලධාරීන් ගන්නා ඇතැම් වැරදි තීන්දු තීරණ නිසා පොලිස්පතිවරයා පමණක් නොව මුළු රජයද අපහසුතාවට පත්වූ අවස්ථා මෑත පොලිස් ඉතිහාසයේ ඕනෑ තරම් දැකිය හැකිය. දේශපාලන බලපෑම් මත නුසුදුසු නිලධාරීන් පොලිස් ස්ථානාධිපතිවරුන් ලෙස පත්කිරීම මෙවන් තත්ත්වයක් ඇති කරලීමට හේතුවී ඇති බව සමාජය තුළ කතිකාවක්ද ඇතිවී ඇත්තේ ඒ නිසාය.

මීට සති කිහිපයකට කලින් පොලිස් නිල ඇඳුමින් සිටි ආධුනික පොලිස් කොස්තාපල්වරියක් සිය නිල නිවස්නයට කැඳවා අතවර කිරීමේ සිද්ධියක් සම්බන්ධයෙන් ගන්දර පොලිස් ස්ථානාධිපතිවරයා අත්අඩංගුවට පත්විය. ඒ සම්බන්ධයෙන් ඇතැම් මාධ්‍ය වාර්තා කර තිබුණේ එම නිලධාරියාට එරෙහිව චෝදනා රැසක් තිබියදී ඔහු පළපුරුදු දක්ෂ නිලධාරියකු ලෙස වත්මන් පොලිස්පතිවරයා හා මහජන ආරක්ෂක අමාත්‍යවරයා නිර්දේශ කර ඔහු ගන්දර පොලිස් ස්ථානාධිපතිවරයා ලෙස පත්කර ඇති බවය.

මෙම සිදුවීමෙන් පොලිසියට ලැබුණු අපකීර්තිය සුළුපටු නැත. එම සිදුවීමෙන් මසක් ඉක්ම යන්නටත් පෙර තවත් පොලිස් ස්ථානාධිපතිවරයකු කළ නොමනා ක්‍රියාවක රූපරාමු සහිත වීඩියෝවක් ඉකුත්දා සමාජ මාධ්‍ය ජාලා තුළ සංසරණය වූයේ පොලිස් දෙපාර්තමේන්තුවට තවත් කළු පැල්ලමක් එක්කරමින්ය.

එම වීඩියෝවේ දැක්වෙන ආකාරයට රාත්‍රියේ ඉමදුව අධිවේගී මාර්ග පිවිසුම හරහා ගාල්ල දෙසට ගමන් කිරීමට පැමිණි CE 0075 දරන මෝටෝ රිය පිවිසුමේ රාජකාරි කළ පොලිස් කොස්තාපල්වරයකුගේ නිරීක්ෂණයට ලක්විය.

"කොහේටද යන්නේ මහත්තයෝ" කොස්තාපල්වරයකු රියැදුරාගෙන් විමසීය.

"ගාල්ලට...."

"කොහේ ඉඳන්ද එන්නේ ඔබතුමා" ඊට පිළිතුරු දෙමින් වාහන රියැදුරා කීවේ මෙවැන්නකි.

"ඕ. අයි. සී. මහත්තයත් එක්ක ඉඳලා එන්නේ"

"බීලද ඉන්නේ"

"ඔව්..."

"චමිලි මහත්තයත් එක්ක මේ එනගමන්..." කොස්තාපල් එවිට ඔහුගෙන් විමසුවේ කොහේ චමිලි මහත්තයාද යනුවෙනි. ඊට පිළිතුරු නොදුන් රියැදුරා සිය ජංගම දුරකථනය අතට ගෙන චමිලි මහත්තයා අමතන්නවිය.

"බීල වාහනේ එළවන්න බැහැනේ. කොයි වෙලාවෙද බිව්වේ."

"දැන් දැන්"

"ස්පීකර් දාන්න ෆෝන් නම් අතට ගන්නේ නැහැ."

"කොහේද මහත්තයාගේ ගෙවල්"

"ගාල්ලේ"

"ගාල්ලේ කොහේද." "හපුගල."

ඉන් අනතුරුව චමිලි මහත්තයා දුරකථනයෙන් ඇමතූ රියැදුරා සිය ජංගම දුරකථනය ඔහුව නතර කළ කොස්තාපල්වරයාට දුන්නේය.

"කවුද"

"සර්. මම පියුමන්ත"

"හලෝ කියලද කතා කරන්නේ" යැයි අසමින් චමිලි මහතා පියුමන්තට පරුෂ වචනයෙන් බැන වදින්නට විය.

"සර් කියලා දන්නේ නැහැ සර් ඒකයි..."

"හරි ඕක යවන්න..."

"හරි... සර්ගේ යාළුවෙක්ද."

"යවන්න කිව්වම යවන්න යාළුවෙක්ද මොකක්ද කතාවක් වැඩක් නැහැනේ."

"හා... සර්.... හා හරි"

ඒ සැණින් පියුමන්ත බීමත්ව සිටි රියැදුරා අමතා කීවේ" හරි... මහත්තයා යන්න" ලෙසය.

කෙසේ වෙතත් තම ප්‍රධානියාගේ නියෝගයෙන් අසරණ වූ කොස්තාපල් පියුමන්ත බීමත් රියැදුරාව අත්අඩංගුවට ගෙන නඩු පවරනු වෙනුවට ඔහු මුදා හැරීමට කටයුතු කළේය. ඒ කෙසේ වෙතත් පියුමන්ත හා බීමත් රියැදුරා අතර ඇතිවූ කතාබහ ඔහුගේ ජංගම දුරකථනයේ පැහැදිලිව පටිගත වී තිබිණි. ඒ බව ස්ථානාධිපතිවරයාට මතකයක් තිබුණේ නැතත් පියුමන්තගේ ආරක්ෂාව සඳහා තිබූ එකම වස්තුව එය විය.



සිදුවීමෙන් පසු පියුමන්තට ඇතිවූයේ බියකි. ඒ තම ප්‍රධානියාගෙන් ඉදිරියට හිරිහැර වෙතැයි යන සැකය නිසාය. දින පහකට පසු නිවාඩු ලබාගෙන පියාගේ නිවෙසට ගියද පියුමන්ත සිටියේ දැඩි අවුලකිනි. ඒ මීට පෙරද ස්ථානාධිපතිවරයා හා ඔහු අතර ඇතිවූ නොයෙකුත් ප්‍රශ්න හේතුවෙනි. නිවෙස තුළට වී ඔහු ඒ ගැන කල්පනා කරමින් ඉකි ගසන්නට විය. මෙය පියුමන්තගේ පියාගේ නෙත ගැටිණි.

"ඇයි පුතේ මොකක් හරි ප්‍රශ්නයක්ද?"

"මට තාත්තගේ වැඩ ටික කරලා දෙන්න විදිහක් නැහැ. ඒ නිසයි හැඬුණේ තාත්තේ."

පියාටද පුතුගේ හැඬීම ප්‍රහේලිකාවක් විය. ඔහු සිදුවූ දේ හාරමින් විමසුවේය. පියුමන්ත එකක් නෑර පියාට කීවේය.

එච්. ඩබ්ලිව්. සුමිල් විශ්‍රාමික පොලිස් සැරයන්වරයෙකි. වසර 33ක් පමණ පොලිසියේ රාජකාරි කොට වයස අවුරුදු 60 සම්පූර්ණ වීම නිසා 2017.09.10 වැනි දින ඔහු පොලිස් සේවයෙන් විශ්‍රාම ගියේය. ඔහුට දරුවන් සිවුදෙනෙකි. එක් දියණියක් හා පුතාලා තිදෙනෙකි. දුව විවාහ වී නුවරඑළිය ප්‍රදේශයේ පදිංචිව සිටි අතර පුතාලා දෙන්නාද නිවෙසින් බැහැරව වෙනත් ප්‍රදේශවල ජීවත් වෙති. ඔවුන් දෙදෙනා නාවික හමුදාවට අනුයුක්තව රාජකාරි කරති. සුධීර පියුමන්ත සුමිල්ගේ බාල පුතාය. ඔහු පොලිසියට බැඳී තිබුණේ 2016.12.15 දාය. කොස්තාපල්වරයකු ලෙස පත්වීම ලැබූ ඔහු පුහුණුවෙන් පසු කඳාන හා මන්නාරම පොලිසිවල සේවය කර තිබිණි.

විශ්‍රාම යෑමට මාස දෙකක කාලයක් තිබියදී සුමිල් පිළිකා රෝගයෙන් පෙළෙන්නට විය. කලක් කරාපිටිය රෝහලේ පිළිකා වාට්ටුවේ ප්‍රතිකාර ලැබූ ඔහුට සිදු කළ සැත්කමකින් පසුව අතුරු ආබාධ රැසක් ඇතිවිය. මේ නිසා එදිනෙදා වැඩකටයුතු තනිව කර ගැනීමට ඔහුට නොහැකි විය.

පියුමන්ත අවිවාහකයකු වූ බැවින් ඔහු තමාගේ උදව්වට ගෙන්වා ගත්තොත් දැඩි පහසුවක් බව දත් සුමිල් දන්නා හඳුනන පොලිසියේ මහත්වරුන්ගේ සහායෙන් පියුමන්තව ඉමදුව අධිවේගී මාර්ගයේ පිවිසුමට ස්ථාන මාරුවක් සාදා ගත්තේ පියුමන්තගේද කැමැත්ත මතය. 2020.08.20 සිට පියුමන්ත ඉමදුව අධිවේගී මාර්ග පිවිසුමේ රාජකාරියේ නිරත විය.

■ කීර්ති මෙන්ඩිස්

11 >>



# මිනිස් පපු කුහරයක ගැහෙන ලොව පළමු සූකර හදවත



ඩේවිඩ් බෙනෙට් (දකුණේ) සහ වෛද්‍ය ග්‍රිෆිත්

**මාරාන්තික හෘද රෝගයකින් පෙළුණු 57 හැවිරිදි පුද්ගලයකුට ඌරකුගේ හෘදය වස්තුවක් බද්ධ කළ අපූරු සැත්කමක් ගැන පසුගිය සතියේ ඇමෙරිකාවෙන් වාර්තා විය. මෙවැනි සැත්කමක් සිදු කෙරුණේ වෛද්‍ය ඉතිහාසයේ පළමු වතාවට වීම විශේෂත්වයක් වූ අතර මේ ගැන ලොව පුරා විශාල අවධානයක් යොමු වූයේය.**

මෙම ඉතිහාස ගතවන සැත්කම සිදු කරන ලද්දේ ඇමෙරිකාවේ මේරිලන්ඩ් විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථානයේදීයි. සැත්කම කළ වෛද්‍ය කණ්ඩායමට නායකත්වය දුන්නේ වෛද්‍ය බාට්ලි ග්‍රිෆිත්ය. සැත්කමට මුහුණ දුන්නේ ඩේවිඩ් බෙනෙට් නමැති හෘද රෝගියෙකි.

ජීවිතයේ වැඩි කාලයක් නිරෝගීව ගත කළ බෙනෙට්ට පළමුවරට රෝගී තත්ත්වයක් දැනෙන්නට පටන්ගෙන තිබුණේ පසුගිය වසරේ ඔක්තෝබර් මාසයේයි. පපුවේ කැක්කුම මෙන්ම අධික වෙහෙස ගතියක්ද හෘද ස්පන්දනයේ යම් අක්‍රමවත් බවක්ද හුස්ම ගැනීමේ අපහසුතාවක්ද ඔහුට දැනෙන්නට පටන්ගෙන තිබිණි. පඩි දෙක තුනක් නඟින්නට පවා අපහසු තත්ත්වයකින් ඔහු පෙළුණු බව සඳහන් වේ. බෙනෙට් පරීක්ෂා කළ වෛද්‍යවරුන්ට දැකගත හැකි වූයේ ඔහු මාරාන්තික හෘද රෝගයකින් පෙළෙන බවයි. මෙය සුව කිරීම සඳහා හදවත් බද්ධයක් කළ යුතු වුවත් ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය ඉතා දුර්වල අඩියක පැවැති නිසා මිනිස් හදවතක් බද්ධ කිරීම සඳහා සුදුසුකම් නොලැබූ බව සඳහන් වේ.

පසුගිය සති හයක කාලයක් පුරා ඔහුට ඇඳෙන් බසින්නටවත් හැකියාවක් තිබී නැත. එම කාලය තුළ බෙනෙට් ජීවත්ව ඇත්තේ යන්ත්‍රයක ආධාරයෙන් බවද සඳහන් වේ. ඌරකුගේ හදවතක් බද්ධ කිරීම පිළිබඳ අදහස වෛද්‍ය ග්‍රිෆිත් ඔහු වෙත ඉදිරිපත් කර ඇත්තේ පසුගිය දෙසැම්බරයේයි. වෛද්‍ය ග්‍රිෆිත් පවසන්නේ එය අමුතුම ආකාරයේ සංවාදයක් වූ බවයි. 'ඔහුට මිනිස් හදවතක් ලබා දිය නොහැකි බවත්, ඒ සඳහා ඔහුට සුදුසුකම් නොමැති බවත් මම කිව්වා. නමුත් සතකුගේ, ඌරකු වැනි සතකුගේ හදවතක් යොදාගත හැකි බව මම ඔහුට පැවැසුවා' වෛද්‍යවරයා සඳහන් කරයි. 'මෙය මීට පෙර කවදාවත් කරපු දෙයක් නෙවෙයි. නමුත් මේක කරන්න පුළුවන් කියලා අපි හිතනවා' යැයිද වෛද්‍යවරයා බෙනෙට් සමඟ පවසා තිබුණේය. 'නමුත් ඔහුට මං කියන දේ හරියට තේරුණාදැයි මට සැකයක් තිබුණා. කොහොම නමුත් ටිකකට පසු ඔහු හිනාවෙලා මගෙන් ඇහුවා මමත් ඌරෙක් වගේ කෑ ගහයිද කියලා' වෛද්‍ය ග්‍රිෆිත් මාධ්‍ය සමඟ කියා තිබිණි.

ඩේවිඩ් බෙනෙට්ට කරන ලද මෙම අපූරු සැත්කම සඳහා පැය 9ක කාලයක් ගත වූ බවද සඳහන් වේ. සමහර අවස්ථාවල මේ ආකාරයෙන් බද්ධ කරන අවයව රෝගියාගේ සිරුර විසින් ප්‍රතික්ෂේප කරනු ලබන තත්ත්වයක් ඇති වේ. එවැන්නක් සිදුවීම වැළැක්වීම සඳහාද මෙම කණ්ඩායම පියවර ගෙන තිබිණි. මෙහිදී හෘදය වස්තුව ලබාගෙන තිබුණේ ජානමය නවීකරණයකට බඳුන් කළ ඌරකුගෙනි. ඉහත කී ආකාරයෙන් හෘදය වස්තුව ප්‍රතික්ෂේප කරනු ලැබීමට බලපාන ජානයක් ඒ හරහා ඉවත් කර තිබූ බව පැවසේ.

"මෙම සැත්කම කරන ලද්දේ අත්හදා බැලීමක් ලෙසිනි. එවැනි අනතුරුදායක අත්හදාබැලීමක් සඳහා ඩේවිඩ් බෙනෙට් යොදා ගැනීම ගැටලුවක් නොවූයේ ඔහු කොහොමටත් මියයෑමට නියමිතව සිටි බැවිනි. 'මරණය හෝ මෙම සැත්කම යන දෙකෙන් එකක් මා තෝරාගත යුතුව තිබුණා' බෙනෙට් මෙසේ පවසා තිබුණේ සැත්කමට පෙර දිනයේය. 'මේක අඳුරේ වෙඩි තියනව වගේ වැඩක් බව මම දැනගෙන හිටියා. නමුත් මේක තමයි මට ලැබෙන අවසන් අවස්ථාව'.

මෙම අත්හදාබැලීම සඳහා මේරිලන්ඩ් ප්‍රාන්තයේ බලධාරීන් ඉහත වෛද්‍ය කණ්ඩායමට අවසරය ලබාදී තිබුණේ බෙනෙට් කොහොමටත් මිය යෑමට නියමිතව සිටි රෝගියකු වූ නිසාය.


අවයව බද්ධ කිරීමේ අවශ්‍යතාවෙන් පෙළෙන රෝගීන් මුහුණ දෙන ලොකුම ගැටලුවක් වන්නේ ඒ සඳහා මිනිස් අවයව සොයා ගැනීමේ ගැටලුවයි. ඒ එවැනි අවයවල විශාල හිඟයක් පවතින බැවිනි. මේ නිසා බොහෝ රෝගීන්ට ඉතා දිගු කාලයක් තිස්සේ පොරොත්තු ලේඛනවල රැඳී සිටින්නටද සිදු වේ. නිසි වේලාවට අවයව නොලැබීම නිසා ලොව පුරා මියයන සංඛ්‍යාවද අති විශාලය. ඇමෙරිකාව තුළ පමණක් දිනකට විසිදෙනකු පමණ මෙම ගැටලුව නිසා මරණයට පත්වන බව සඳහන් වේ. මෙම ගැටලුවට විසඳුමක් ලෙස සතුන්ගේ අවයව මිනිසුන්ට බද්ධ කළ හැකිද යන්න සම්බන්ධයෙන් දැන් කලෙක සිටම විද්‍යාඥයෝ සොයා බලමින් සිටිති. පසුගියදා මේරිලන්ඩ්හි වෛද්‍යවරුන් කළ සැත්කම වැදගත් වන්නේ මෙම පසුබිම තුළය. මෙය මේ සම්බන්ධයෙන් කෙරෙන පර්යේෂණවල කූටප්‍රාප්ති අවස්ථාවක් ලෙස අවධානයට ලක් වේ.

මෙම සටහන ලියන අවස්ථාව වනවිට පළවී තිබූ වාර්තාවලින් පැවැසුණේ ඩේවිඩ් බෙනෙට් සැත්කමෙන් පසු කෙමෙන් සුව අතට හැරෙමින් සිටින බවයි. සැත්කමට පෙර බෙනෙට්ගේ ජීවිතය රැකුණේ ඔහුගේ සිරුරට සම්බන්ධ කර තිබූ යන්ත්‍රයක් නිසාය. නමුත් සැත්කමෙන් පසු ඔහුට තනිවම හුස්ම ගැනීමට හැකිව තිබූ බැව් සඳහන් විය. එසේ වුවත්, වෛද්‍යවරුන් සිටින්නේ ඔහු ගැන දැඩි පරීක්ෂාවෙනි. සති ගණනාවක් ඇඳටම වී ගත කර තිබූ ඔහු සැත්කමට පෙර පවසා තිබුණේ සුවය ලැබීමෙන් පසු ඇඳෙන් බැසීමට බලා සිටින බවය.

■ සනත් වික්‍රමගේ







# මව්බිම

සිලෝන් නිවුස්පේපර්ස් (පෞද්:) සමාගම,
101, රොස්මිඩ් පෙදෙස,
කොළඹ 07.

- **දුරකතන, කර්තෘ මණ්ඩලය** 011-7566511 011-7566512
- **ෆැක්ස්** 011-7566514
- **වෙබ් අඩවිය** www.mawbima.lk
- **ඊ.මේල්** news@mawbima.lk
- **බෙදාහැරීම්** 011-7566583 011-7566584
- **ෆැක්ස්** 011-7566587
- **දැන්වීම්** 011-7566568 011-7566572
- **ෆැක්ස්** 011-7566569


## ණය කන්දට උඩින් හඳ පායන්නේ නැත

ශ්‍රී ලංකාව මුහුණදී සිටින දැවැන්ත ආර්ථික අර්බුදය සමාජ දේහය තුළ විවිධාකාරයෙන් නිරූපණය වෙමින් තිබේ. දැනට රට තුළ දකින්නට ලැබෙන පෝලිම් සංස්කෘතිය එහි එක පැත්තකි. තවත් පැත්තකින් අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟය හා භාණ්ඩ මිල ඉහළ යෑම නිසා ජන ජීවිතය අර්බුදයට පත්ව තිබේ.

මුදල් ඇමැති බැසිල් රාජපක්ෂ ලබාදුන් සහන පැකේජය රජයේ සේවකයන්ගේ ජනවාරි වැටුපට එකතු වනු ඇත. පෞද්ගලික අංශයේ සහන සම්බන්ධයෙන් කම්කරු ඇමැතිවරයා හා හාම්පුතුන්ගේ සම්මේලනය සමඟ කරන ලද සාකච්ඡා සාර්ථක නොවීය. ඒ අනුව පෞද්ගලික අංශයේ සේවකයන්ගේ පඩි පැකට්ටුවට කීයක්වත් වැටෙන්නේ නැත.

එදිනෙදා කුලී වැඩක් කරගෙන ජීවත්වන අඩු ආදායම් සහිත පීඩිත ජන කොටසද සහන පැකේජයෙන් ආවරණය වන්නේ නැත. දේශපාලනීකරණය වූ සමෘද්ධි වැඩපිළිවෙළින්ද ඔවුන් සිටින්නේ අත්හැරුණු ජන කොට්ඨාසයක් ලෙසය. ඔවුන් ගැනද බලන්නට රජයට වගකීමක් තිබේ.

මේ වසරේ ගෙවීමට ඇති මුළු විදේශ ණය ප්‍රමාණය ඇමෙරිකන් ඩොලර් බිලියන 6.9කි. පෙබරවාරි 18 වැනිදා වන විට ඇමෙරිකන් ඩොලර් මිලියන 500ක විදේශ ණය ගෙවිය යුතුව තිබේ. මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් කියන්නේ එය ගෙවීමට කිසිදු ප්‍රශ්නයක් නැති බවය. නමුත් මෑතකදී චීනයෙන් සහ ඉන්දියාවෙන් ලැබුණු ණය පහසුකම් සමඟ විදේශ විනිමය තිබෙන්නේ ඇ.ඩො බිලියන 3.1කි. පසුගිය අවුරුදු දෙක ඇතුළත විදේශ විනිමය සංචිත බිලියන 7 සිට බිලියන 1.5 දක්වා පහළ වැටුණි.

පසුගිය කාලය තුළ ලංකාව රන් සංචිතද විකුණා දමා තිබේ. 2013 වසරේ ඩොලර් මිලියන 985ක රත්රන් සංචිත ලංකාව සතුව තිබූ අතර මේ වන විට ඉතිරිව පවතින්නේ ඩොලර් මිලියන 175.4ක රන් සංචිත පමණි.

බොහෝ ආර්ථික විශේෂඥයන් සහ විපක්ෂය කියන්නේ මේ අසීරු අවස්ථාවේදී විදේශ ණය ගෙවීම කෙරෙහි බර නොතැබිය යුතු බවය. විදේශ ණය නොගෙවීම නිසා වන හානියට වඩා වැඩි හානියක් ණය ගෙවා විදේශ සංචිත අහිමි කර ගැනීම තුළ ඉදිරියේදී සිදුවිය හැකි බවට ඔවුහු අනතුරු අඟවති. නමුත් ස්වෛරී බැඳුම්කර සඳහා ගෙවිය යුතු ණය අනිවාර්යෙන් ගෙවන බවට ආණ්ඩුව දැඩි තීරණයක සිටී. එහෙත් එම ණය හිමිකාර පාර්ශ්වයන් කවරහුදැයි ආණ්ඩුව හෙළි කර නැත.

ශ්‍රී ලංකාව හිරවී සිටින ණය උගුලෙන් විතැන් වීම සඳහා දැනට ගත හැකි එකම ක්‍රියාමාර්ගය සමස්ත විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීම බව බොහෝ පාර්ශ්වයන් පවසති. එහෙත් එයද ඉක්මන් ප්‍රතිඵල ළඟා කරගත හැකි විසඳුමක් නොවන බව පැහැදිලිය.


ශ්‍රී ලංකාව සිරවී සිටින්නේ ආකාර කිහිපයක විදේශ ණය ගනුදෙනුවලය. බහුපාර්ශ්වීය ණය ඩොලර් බිලියන 24කි. ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ආසියානු බැංකුව වැනි ජාත්‍යන්තර ආයතනවලින් ලබා ගත් ණය බිලියන 30කි. කඩිනමින් ගෙවිය යුතු ද්විපාර්ශ්වික ණය බිලියන 6කි. ඊට අමතරව රාජ්‍ය ආයතනද විශාල වශයෙන් ණය ලබාගෙන තිබේ. විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීම දීර්ඝ කාලයක් ගත වන අතිශය සංකීර්ණ වැඩ පිළිවෙළකි.

විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමට ප්‍රථම අප විසින් ගතයුතු පියවර රාශියක් තිබේ. ලංකාණ්ඩුව රඟපාමින් සිටින්නේ නාස්තිකාර පුත්‍රයාගේ භූමිකාවය. ප්‍රමුඛ පෙළේ රාජ්‍ය ආයතන කිහිපයක දෛනික පාඩුව මිලියන 389කි. විදුලි බල මණ්ඩලය, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, එයාර් ලංකා ගුවන් සමාගම, ජල සම්පත් මණ්ඩලය ඒ අතර ඉදිරියෙන්ම සිටී. ප්‍රථමයෙන් කළ යුත්තේ අපේ ගැටලු අප විසින් විසඳා අවසන් කර ගැනීමය.

රාජ්‍ය ආයතන බහුතරයක් අතිශයින් නාස්තිය හා දූෂණයෙන් යුතු බව රහසක් නොවේ. අපි විසඳුම් හොයන්නේ රාජ්‍ය ආයතනවල සභාපතිවරු කාඩ් කුට්ටම අනන්නා සේ වරින් වර මාරු කිරීමෙනි. ඔවුන් හොරකම හෝ දූෂණය නතර කරන්නේ නැත. වැටුපට අමතරව විශාල පහසුකම් ප්‍රමාණයක් වරප්‍රසාද හැටියට භුක්ති විඳිමින් ඔවුහු ජනතා මුදල් කාබාසිනියා කරති.

ප්‍රථමයෙන් ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්තිය හා බදු ප්‍රතිපත්තිය ප්‍රතිව්‍යුහගත කර නොගෙන අපට ලෝකය ඉදිරියට යා නොහැක. තවමත් අපේ බදු ප්‍රතිපත්තිය සකස් වී තිබෙන්නේ 85%ක් දුගී ජනතාව මත පැටවෙන වක්‍ර බදු සහ 15%ක් සෘජු බදු මතය. වැට් බද්ද පවතින්නේ 8%ක් වශයෙනි. බදු අය කරගත හැකි සමාජ කොට්ඨාස තවමත් සිටින්නේ බදු බරින් නිදහස්වය.

ජාත්‍යන්තරය ඉදිරියට ගිය විට ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා බොහෝ කොන්දේසි ඉදිරිපත් වන්නට ඉඩ තිබේ. පාලකයන් හා රාජ්‍ය ආයතන පමණක් නොව රටේම ජනතාවද මේ කාලකණ්ණි ණය බරට කර ගැසිය යුතු බව ඔවුන් නිර්දේශ කරනු ඇත. එබැවින් අප හිතන තරම් පහසුවෙන් ලෙහෙසියෙන් ණය කන්ද උඩින් හඳ පායන්නේ නැති බව කවුරුත් තේරුම් ගත යුතුය.



# වත්ත බද්දට දී මවුබිම ගලවා ගැනීම

රට සංවර්ධනය කරගැනීම අපගේ ඉලක්කයකි. අඩුම තරමින් අපගේ දරුවන්ට හෝ හෙටක් ගොඩනඟාගන්නට බරපතළ උත්සාහයක් ඇත. තවත් සති දෙකකින් ලංකාවට ලැබුණ නිදහස සමරන උත්සව පවත්වන්නට නියමිතය. පසුගිය දශක හතකට වැඩි කාලය තුළ රට ඉදිරියට ගෙන යන්නට දරන ලද ප්‍රයත්නය ගැන සෑහීමකට පත්විය හැකිද? ආණ්ඩු බලයට පත්කරන පොදු ජනතාව හැමදාමත් පෝලිම්වලය. එදිනෙදා ප්‍රශ්නවල අවසානයක් නැත. යුද්ධයේ දීත්, සාමයේ දීත් කැපවෙන්නට සිදුව ඇත්තේ පොදු ජනතාවටය. දේශපාලනයට එන පිරිසට සරුය. පක්ෂය හෝ විපක්ෂය යන භේදයක් අපට නොපෙනේ. සියලුම දේශපාලනඥයෝ ඡන්දවලටත් ලොකු වියදමක් කර සැපසේ ජීවත්වෙති.

දුප්පත් ජනතාවට ලැබෙන්නේ බය හා වේදනාව පමණකි. නාළිකාවලින් ඇහෙන, මාධ්‍යවලින් කියැවෙන එකම කාරණයක් ඇත. රට විකුණා දමමින් සිටී. සම්පත් ඩැහැගැනීමට බලවත් රටවල් මාන බලාගෙන ඇත. දිවි හිමියෙන් රට ආරක්ෂා කරගත යුතුය. ශ්‍රී ලංකාවට පමණක් නොවේ, ලෝක සිතියම දෙස බලන විට බලවත් රටවලට පවා ගැටලු ඇත. ඒවා නිරාකරණය කර ගැනීම සඳහා දැවැන්ත ප්‍රයත්නයකය. ප්‍රතිසංස්කරණ සිදුවෙයි. ඇමෙරිකානු ඩොලරයකට මඳක් වැඩි විදේශ වත්කමක් සහිත අධික ණය බරකින් යුතු රටක් ඔප්පුවකින් ලියා දුන්නත් එපා කියන වග නිසැකය. බලය වෙනුවෙන් මිථ්‍යාව වපුරවමින් සිටී. මෙහි අභ්‍යන්තරය අපට කියාදෙන පාඩමක් ඇත.

### තෙල් ටැංකි පැවරීමට එරෙහිව අධිකරණයට

ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි සංකීර්ණය රටට විශාල සම්පතකි. විවාදයක් නැත. තෙල් ටැංකි සංකීර්ණයෙන් නිසි ප්‍රයෝජන ගැනීමටද අපට හැකියාවක් ලැබී නැත. 1940දී බ්‍රිතාන්‍ය ඉදිකරන මෙම ටැංකි දෙවැනි ලෝක යුද්ධයේදී මිත්‍ර රටවල අවශ්‍යතා සඳහා තෙල් ගබඩා කර ඇත. නිදහස ලැබුණ පසු මෙම ටැංකි ලංකාවට අයත් දේපොළක් බවට පත්වූ නමුත් එහි ගබඩා කරන්නට තරම් තෙල් ආර්ථිකයක් රටට නැත. අක්කර 850ක් පුරා විහිදී ඇති මෙම ප්‍රදේශය සංවර්ධනය කරන්නට නොහැකි වූයේ ඇයි?

කොටි ත්‍රස්තවාදීහු උතුරු නැගෙනහිර තිබුණ සියලු රජයේ හා පෞද්ගලික අංශයේ වත්කම් පැහැර ගත්හ. කන්කසන්තුරේ ලුණු ලේවාය, සිමෙන්ති කම්හල, කඩදාසි සංස්ථාව සහ පුල්මුඩේ ඛනිජ වැලි ආයතනවලට අයත් දේපොළ විනාශ කළේය. ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය ත්‍රස්තවාදීන්ගේ ග්‍රහණයට ළංවූයේ නැත. 2003 අවුරුද්දේ තෙල් ටැංකි ඉන්දියාවට පවරන ලද අතර එම ගිවිසුම සමඟ එල්.ටී.ටී.ඊ ය ගැටෙන්නට සූදානම් නොවුණ බව පෙනේ. එවැනි ආරක්ෂාවකින් තොර පසුබිමක් තුළ මෙම භූමිය කොටි කඳවුරක් විය හැකිව තිබුණ අතර මෙම සංකීර්ණය ගුවන් ප්‍රහාරවලින් විනාශ වෙන්නටද ඉඩ තිබිණි.

සිවිල් සංවිධාන නියෝජිතයෝ සහ ඇතැම් භික්ෂුන් වහන්සේලා තෙල් ටැංකි සංකීර්ණයෙහි ආයෝජනයට එකඟ නැත. අධිකරණයෙහි නඩු දෙකක් පවරා තිබේ. දැනට අස්සන් කර ඇති ගිවිසුම අහෝසි කරන තීන්දුවක් ඉල්ලා ඇත. ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර ගිවිසුමක් අස්සන් කිරීමේදී ඉතාම වැදගත් ලියැවිලි ඉදිරිපත් කර නැති බවට තර්කයක් මතුකර තිබේ. අධිකරණය මෙම නඩු සම්බන්ධ තීරණය ප්‍රකාශයට පත්කරනු ඇත. ආර්ථික සංවර්ධනය සඳහා තීන්දු ගැනීම සහ අධිකරණය කරුණු සලකා බලන නීති වගන්ති යනු සම්පූර්ණයෙන්ම වෙනස් පැති දෙකකි.

### ටෙක්සාස් සිට ඉන්දියන් ඔයිල් දක්වා ගමන

ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසය තුළ ත්‍රිකුණාමලය තෙල් ටැංකි බරපතළ මාතෘකාවකි. 1981දී මෙම ටැංකි සමූහයේ ආයෝජනයට ඇමෙරිකාවේ ටෙක්සාස්හි තෙල් සමාගමක් ඉදිරිපත් විය. විරෝධතා මත එය අත්හැර දමන ලදී. 1984 වසරේදී සිංගප්පූරුවේ තෙල් නිෂ්පාදන සමාගමක් මෙම ටැංකි ප්‍රයෝජනයට ගැනීමේ උත්සාහයක නිරත වී ඇත. එයද ව්‍යර්ථ වූ බව ඉතිහාසය දක්වයි. දශක හතරකට පමණ කලින් ටෙක්සාස් තෙල් සමාගමට තිබුණ උනන්දුව අනුව තීරණයක් ගෙන තිබිණි නම් අද තත්ත්වය වෙනස්ය. අවුරුදු තිහ හතළිහක බදු කාලය අවසානයේ රටට ආදායමක් සමඟ හොඳින් නඩත්තු කරන ලද ටැංකි අපට ඉතිරිවෙනු ඇත. ත්‍රිකුණාමලය වරාය සංවර්ධනයක්ද සිදුවෙයි. මන්නාරම ද්‍රෝණියේ තෙල් කැණීම්ද යුහුසුලු වෙන අවස්ථාවක් නොතිබුණා නොවේ. මේවා පැරණි මතක වශයෙන් ඉතිරිවී ඇති අතර පටු දේශපාලනයෙන් රටට අහිමි වූ අවස්ථාය. බොරතෙල් කර්මාන්තයේ අලුත් ආයෝජනයක් කළේ නම් අද මෙරට ශ්‍රමිකයන් මැදපෙරදිග රටවල සේවයට නොයන තත්ත්වයක්ද ඇතිවිය හැකිව තිබිණි.

1987 වසරේ ඉන්දු-ලංකා ගිවිසුම අස්සන් කරනවිට මෙම තෙල් ටැංකි දියුණු කරන සංකල්පයක්ද ඇතුළත්ව තිබිණි. බලය බෙදන අතරවාරයේ කර්මාන්ත හා ආයෝජනවලට ඉඩදෙන ව්‍යුහයකි. පලාබඩා අපට එපා යැයි සටන් පාඨ අවුළුවන ලද අතර නොගැළපෙන ක්‍රමය රටට ඇතුළු කරගත් මෙරට දේශපාලනය ආර්ථික සංවර්ධනයේ වඩාත් වැදගත් සංකල්ප පැත්තකට විසි කර තිබේ. පළාත් සභා ක්‍රමය විශාල ව්‍යාකූල තත්ත්වයක් නිර්මාණය කර ඇත. ආයෝජන අවස්ථා මඟහැරුණි. ශ්‍රී ලංකාව නිවැරදි මොහොතේ හරි තීරණ ගෙන ඉදිරියට ගමන් කරන්නට සමත් වූයේ නම් අද බරපතළ විනිමය හිඟයකින් පීඩා විඳින්නේ නැත.

### ලෝකයේ තෙල් හසුරුවන සිංගප්පූරුව


සිංගප්පූරුවට තෙල් ළිං නැත. කුඩා භූමි ප්‍රමාණය තුළ හෝ සාගරයේ තෙල් ගවේෂණය අසාර්ථක වී තිබේ. එහෙත් ආසියාවේ විශාලතම තෙල් අපනයනකරු බව සඳහන් කළ යුතුය. ලෝකයේ ප්‍රකට තෙල් සමාගම් ගණනාවක් සිංගප්පූරු වරාය ආශ්‍රිතව බොර තෙල් පිරිපහදුව හා තෙල් ආශ්‍රිත කර්මාන්ත පවත්වාගෙන යයි. 2019 වසරේ ලෝක තෙල් වෙළෙඳාමෙන් සියයට 21ක් මෙහෙයවන්නේ එහි සිට බව දැක්වේ. එම වසරේ තෙල් මෙට්‍රික් ටොන් මිලියන 253ක් හසුරුවා ඇත. එයින් උපයන ලද ආදායම එරට ආර්ථිකයේ විශාලතම කොටසකි. මෙම තෙල් ව්‍යාපාර අරඹන්නේ 1981 අවුරුද්දේ දීය. හරියටම ටෙක්සාස් තෙල් සමාගමක් ලංකාවට පැමිණ ත්‍රිකුණාමලය තෙල් ටැංකි ආයෝජනයට කැමැති වූ කාලයේ ය. ටොකු ඇනගත යුතු අදටත් වහසිබස් දොඩන දේශපාලනඥයෝය.

ඛනිජ තෙල් ගවේෂණය 1970 වසරේ සිට ශ්‍රී ලංකාව කරගෙන යන බව සඳහන් කළ යුතුය. පේසාලේ තෙල් එකල මාධ්‍යයෙහි ප්‍රධාන පුවත්ය. වසර පනහක් එකම සෙක්කුවේ තෙල් හිඳින ශ්‍රී ලංකාව මෙහි යථාර්ථය හැඳිනගත යුතුව ඇත. මන්නාරම් ද්‍රෝණිය හා ඒ අවට තෙල් සහ ස්වාභාවික ගෑස් තිබේ. එහෙත් එම තෙල් පොළොව මතු පිටට ගෙන ප්‍රයෝජනයට ගැනීම ආර්ථික වාසි ඇති ව්‍යාපාරයක් නොවේ. තෙල් කැණීමේ බලපත්‍ර ලබාගත් සමාගම් මූලික පරීක්ෂණවලින් පසු ඒවා අත්හැර දැමීය. තෙල් කැණීමට කරන ආයෝජනය අවදානමක් බව ප්‍රකාශ වෙයි. බොරතෙල් නිෂ්පාදනය සීමා වන අතර විකල්ප බලශක්තිය කරා යොමුවෙන යුගයකි. තෙල් ළිං පමණක් නොව තෙල් ටැංකිද අනාගතයේ වැදගත් දේපොළක් නොවේ. ආර්ථික පර්යේෂකයෝ අනාවැකි පළ කර ඇති අතර යුරෝපා රටවල්, චීනය, ඉන්දියාව වසර 2040 වැනි විට පොසිල ඉන්ධන භාවිතය හරි අඩකින් අඩුකරන සැලැස්මක සිටී. දැන් කරන ආයෝජනය නොකළහොත් තවත් වසර විස්සකින් ත්‍රිකුණාමලයේ තෙල් ටැංකිවලින් කිසිම ප්‍රයෝජනයක් නැති විය හැකිය. තෙල් වෙනුවට වෙනත් ආර්ථික ව්‍යුහ කරා ලෝක ප්‍රජාව ගමන් කරන අතර එම අවස්ථා ගැන අවධානය යොමු කිරීම මෙරට ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ වගකීමකි.

### වත්තේ බද්දත්-ගෙඩියේ ඇස්සත් අපට නැත

ශ්‍රී ලංකාව අවස්ථා අහිමි කරගත් සමාජයකි. වත්ත බද්දට දී ඇස්සට දත නියවන බව කියන නමුත් අපට වත්ත නඩත්තු කරගන්නට නොහැක. ඇස්සක් ගහගන්නවත් අස්වැන්නක් නැත. පුරසාරම් දේශපාලනය අන්තිමට තල්ලු කරන ලද ආගාධයක තරම දැනගත යුතුය. ශ්‍රී ලංකාව ගෙවිය යුතු මුළු විදේශ ණය බර ඇමෙරිකානු ඩොලර් බිලියන තිස් පහකි. මෙයින් සියයට හතළිස් හතක් වාණිජ ණය බව දැක්වෙයි. අවුරුද්දකට සියයට හය ඉක්මවන පොලියක් වාණිජ ණයවලට ගෙවිය යුතුව ඇත. එම ණය ගෙවාගත නොහැකි තරමට විනිමය සංචිත හිඳී ඇති අතර ණය අවදානම් රටක් වශයෙන් ජාත්‍යන්තර ශ්‍රේණිගත සමාගම් නම් කරමින් සිටී. මූල්‍ය අරමුදල, ආසියානු සංවර්ධන බැංකුව වැනි ආයතන සියයට එකට අඩු පොලියකට ණය දෙන්නට සූදානම්ය. ඒවා ප්‍රතික්ෂේප කරන අතර ආයෝජනයත්, සංවර්ධන අවස්ථාත් බරපතළ ලෙස පැහැර හරිමින් සිටින කාලයකි. අපට අලුතින් හිතන්නට සිදුවී තිබේ. ආර්ථික ක්‍රමය තුළ බරපතළ වැරදි තීරණ ගෙන ඇත. ජනතාව නොමඟ යවා තිබේ. බුද්ධිමත් රටක්, බුද්ධිමත් ජනතාවක් බව කියැවෙන නමුත් සුළු පිරිසක් නඟන මහා ඝෝෂාව ඉදිරියේ ජනමතය වෙනස් වී ඇත. එය අභාග්‍යයකි.

2003 වසරේ සිට අද දක්වා ලංකා ඉන්දියන් ඔයිල් සමාගම ත්‍රිකුණාමල තෙල් ටැංකිවල ඇතැම් කොටස් සංවර්ධනය සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 40ක් ආයෝජනය කර ඇති බව දක්වේ. දැනටත් එහි ටැංකි සඳහා බදු කුලියක් ගෙවයි. ඛනිජ තෙල් සංස්ථාව හා ඉන්දියන් ඔයිල් සමාගම සමඟ අස්සන් කරන ලද ගිවිසුමෙහි වගන්තියක් පාසා ඉතාම නිවැරදි සිද්ධි අපේක්ෂා කළ යුතු නැත. ඉතාම පුදුමාකාර ප්‍රාතිහාර්යයකින් ආර්ථිකය ජවයක් ඇති නොවේ. එහෙත් අද ගන්නා තීරණ අනුව අනාගතයේ පැවැත්ම සකස් විය හැකිය. ආණ්ඩුවක් ගන්නා තීරණවලින්, අද කරන ආයෝජනයකින් ප්‍රතිඵල ලැබෙන්නේ මතු පරපුරටය. කලින් ලබාගත් ණයවලට පොලිය ගෙවන අප සියලුම දෙනා අනාගයේ ණය නොගෙවන රටක් බවට හැරෙන්නේ කෙසේද යන්න සාකච්ඡා කළ යුතුව තිබේ. එම සාකච්ඡාව කරගෙන යන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් අපට ඇත. පාර්ලිමේන්තුවේ බහුතර මතය විමසිය හැකිය. ආණ්ඩු පක්ෂය තුළද නොයෙක් මත තිබෙන බව පෙනේ. සමාජය කලඹා බයක් ඇති කර රටක් නාස්ති කිරීම ප්‍රශ්නයකි. මෑත කාලය තුළ රට වනසන තීරණ බවට නැඟුණ හඬ අවසානයේදී අපට ඉතිරි කරන ලද වාසිය කුමක්ද?



**ශාමින්ද වත්තේගෙදර**

# සුමිත්‍රා පීරිස්ට කැලණිය සරසවියෙන් ගෞරව ආචාර්ය උපාධියක්



සිනමා කලාවේ උද්දීප්තිය සහ ප්‍රවර්ධනය උදෙසා මෙන්ම ශ්‍රී ලාංකේය සිනමා කලාවේ 'ලාංකේය නාමය' සමස්ත ලෝකය පුරා විහිදුවාලන්නට කැපවූ සුවිශේෂී කාන්තාවක් ලෙස සුමිත්‍රා ගුණවර්ධන පීරිස් මහත්මිය හැඳින්විය හැකිය. ඇය සිනමා ක්ෂේත්‍රය වෙනුවෙන් සිදුකළ අනුපමේය සේවය වෙනුවෙන් හා ලලිත කලා ක්ෂේත්‍රයේ ඇයට හිමි වූ අපූර්ව භූමිකාව නිසා දෙස් විදෙස් රටවල සිනමා ක්ෂේත්‍රය තුළ ඇයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. කලා ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරන විශ්වවිද්‍යාලයක් වශයෙන් කැලණිය විශ්වවිද්‍යාලය විසින් කලාකීර්ති සුමිත්‍රා ගුණවර්ධන පීරිස් මහත්මියට සාහිත්‍ය චක්‍රවර්ති ගෞරව ආචාර්ය උපාධිය පිරිනැමීය.

සුමිත්‍රා ගුණවර්ධන පීරිස් මහත්මිය සිනමාවට සිදුකළ අනුපමේය සේවය සම්බන්ධව ඇය පිදුම් ලැබූ සාහිත්‍ය චක්‍රවර්ති ගෞරව සම්මාන ආචාර්ය උපාධිය සම්බන්ධව කැලණිය විශ්වවිද්‍යාලයීය මානව ශාස්ත්‍ර පීඨයේ, ලලිත කලා අධ්‍යයන අංශයේ මහාචාර්ය පැට්‍රික් රත්නායක මහතා කියන්නේ මෙවැන්නකි.

"ශ්‍රී ලාංකිකයන් දෙස ලෝකය දැකපු චිත්‍රය වෙනස් කරන්න ඇය ගොඩක් කැප වුණා සහ සිනමා නිර්මාණ තුළින් ඇය ඊට පිළිතුරක් ගොඩනැඟුවා. ඒ ඔස්සේ ශ්‍රී ලංකාව පිළිබඳ වෙනම හැඩයක් හා වෙනම සන්නාමයක් ලෝකයට රැගෙන ගියා. ඒ අනුව මීට පෙර ලාංකේය සිනමා නිර්මාණවලින් ලෝකය හමුවේ හුවා දැක්වුණු හුදු දරිද්‍රතාවයේ සහ අර්බුදකාරී යුද වාතාවරණය තේමා කරගත් ස්වභාවය වෙනස් කරන්නත්, ශ්‍රී ලාංකේය බෞද්ධ ආගමික සංස්කෘතියත්, මධ්‍යම පාන්තික ජීවිතයත්, ශ්‍රී ලාංකේය රදළ වැඩවසම් පන්ති සමාජයේ සිනමාත්මක ප්‍රකාශනය මඟින් ඔප්නැංවීමට හා සෞන්දර්යාත්මක මාධුර්යය ජාත්‍යන්තර තලයේ ශ්‍රී ලංකාවට ගෞරවාන්විත හැඩයක් හා පිළිගැනීමක් ඇති කිරීමද ඉතා අගයකොට සලකන්න කැමැතියි. ලෝකයේ පැතිර ගියපු නව තාත්විකවාදී, සිනමාත්මක ලක්ෂණ ශ්‍රී ලංකාවේ සිනමාව තුළත් ඇති කරන්න ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා සහ සුමිත්‍රා පීරිස් දෙපළගේ විශාල දායකත්වයක් සිනමාවට ලැබුණා. එය ප්‍රශස්ත අන්දමින් අගය කළ යුතුමයි.

**ශෂී ගමගේ**
**සන්නිවේදන හා මාධ්‍ය ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය.**

# ස්වර්ණහංස පදනම තුළින් මහඟු මෙහෙවරක් කළ ගාල්ලෙගේ පුණ්‍යවර්ධන



ස්වර්ණහංස පදනම තුළින් මහඟු මෙහෙවරක් කළ ගාල්ලෙගේ පුණ්‍යවර්ධන මහතා උපත ලැබුවේ 1941 ජුනි මාසයේදී දකුණු ලක අහංගමදීය. ගුරුවරයකු ලෙස ජීවන වෘත්තීය ඇරැඹූ ඔහු පේරාදෙණිය සරසවියෙන් ශාස්ත්‍රවේදී (බී.ඒ.) උපාධිය හිමිකර ගත්තේය. තමා උපන් දේශයට හා තම ජාතියට සේවය කිරීමට උපතින්ම තිබූ ආශාව නිසාම ගුරු සේවයේ සිටියදීම 1958දී ශ්‍රමදාන් (සර්වෝදය) ව්‍යාපාරයට සහභාගි වූයේ එය එකල තැපැල් හා ගුරු සේවා මට්ටමින් පැතිරී ගිය සමාජ සේවාවක් වූ නිසාය.

අනතුරුව උපාලි සේනානායක (ආර්.ජී. සේනානායකයන්ගේ සොහොයුරු) සමඟ ගම් වැව් ප්‍රතිසංස්කරණ කටයුතුවලට මූලිකව ක්‍රියා කළේය. ස්වර්ණහංස පදනම ස්ථාපිත වූයේ මෙම අවධියේදීය.

පසුව විවාහ දිවියටද ඇතුළත්ව දරුවන්ද හදා වඩා ගන්නා අතර දිගටම ජාතික කටයුතුවල නිරතව සිටියදී 1980දී ජූලි වර්ජනයට සහභාගිවීමෙන් රැකියාව අහිමිවුවද දරු පවුලද කෙසේ හෝ රැකගෙන පූර්ණකාලීන ස්වේච්ඡා සේවකයකු ලෙස ස්වර්ණහංස පදනම වැඩි දියුණු කරගෙන ව්‍යවස්ථාපිත පුණ්‍යායතනයක් බවට පත් කිරීමට පුණ්‍යවර්ධන මහතා කටයුතු කළේය. අනතුරුව රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස නඟා සිටුවමින් විදෙස් ආධාරද ලබාගනිමින් වැව් ප්‍රතිසංස්කරණය, අසරණ ගැමි ජනතාවට ළිං හා වැසිකිළි සාදාදීම, තරුණයන්ට ගොවි කටයුතු පුහුණුව මෙන්ම ජාතික ඇඳුමට හුරු කිරීම ආදී වූ සමාජ හා ජාතිකමය වටිනාකමකින් යුතු කර්තව්‍යයන් රැසකට දීර්ඝකාලීන දායකත්වයක් ලබාදෙමින් සිය ජීවිතය ගත කළේය.

1985-95 දශකයේදී මෙරට ප්‍රමුඛ පෙළේ සංවිධානයක් ලෙස පිළිගැනීමක් ස්වර්ණහංස පදනමට හිමිව තිබිණි. 1995දී පාප්තුමාගේ ලංකා ගමනට විරෝධය පා මාතරදී ප්‍රසිද්ධ රැස්වීමක් පැවැත්වීමට දායක වීම නිසා ස්වර්ණහංස පදනමට ලැබෙන විදේශ ආධාර නතර විය. ඉන්පසුව වැව් ප්‍රතිසංස්කරණය කෙරුණේ සිංහල බෞද්ධ දානපතියන්ගේ ආධාරයෙනි.

පසුගිය විසි අවුරුද්දක පමණ කාලය පුරා පුණ්‍යවර්ධන මහතා රජය සමඟ පොර බැදුවේ සිංහ කොඩිය ප්‍රවර්ධනය කර සමාජගත කිරීමටය. රජයෙන් සහ ඇතැම් අයගෙන් එම වෑයමට බරපතළ සතුරුකම් එල්ල විය. සිංහ කොඩියට එරෙහිව නඩු දෙකක් පැවැරුණද ඒවාට වූ දෙයක් දැනගන්නට නැත. මේ සියල්ල මෙසේ සිදුවී මාස දෙකක් පමණ රෝගාතුරව සිටි ගාල්ලෙගේ පුණ්‍යවර්ධන මහතා 2022 ජනවාරි 04 වැනිදා සවස් භාගයේදී අභාවප්‍රාප්ත වූයේ තමා උපන් රටට සහ ජාතියට ණය නැති පුද්ගලයකු ලෙසටය.

**ආචාර්ය සූරිය ගුණසේකර**

# සියළු අස්ථි රෝග සුව කරගැනීමටත් කැන්ගන් ජලය පානය කිරීම සුදුසුයි

**විශ්මිත වතුරක් 7වන කොටස**





''ජීවියෙකු ලෙස මෙලොවට බිහි වෙන කිසිදු මනුෂ්‍යයෙකු හෝ සත්වයෙකු සදාකාලිකව ජීවත්වීමට පැමිණෙන්නේ නොවේ. එහෙත් තමන් රැගෙන එන ආයුෂ ප්‍රමාණය නිදුක් නිරෝගීව, යහපත් මනසකින් යුතුව හමාර කිරීමට හැකිනම් ඔහු හෝ ඇය බුද්ධිමත්ව ජීවත්වුනු සාර්ථක අයෙකු බවට පත්වෙයි.
නිරෝගීව මේලොව එළිය දකින බොහෝ අය දැනුම් තේරුම් අවධිය වන විට තමන් ගන්නා වැරදි ආහාරපාන, අයහපත් සිතුවිලි සහ තම ශරීරය මෙහෙයවන වැරදි පරිපාලන රටාවන් නිසා ශරීරය තුළ ඇති ප්‍රතිශක්තිකරණ ක්‍රියාවලියට මහත් ලෙස පීඩා ගෙන දෙමින් ප්‍රතිශක්තිකරණය දුර්වල කරගනී. එසේ දුර්වල ප්‍රතිශක්තිකරණ ඇති ශරීර ඕනෑම විෂබීජයකට, බැක්ටීරියාවකට, වෛරසයකට පැලපදියම් වීමට සුදුසු තෝතැන්නක් බවට පත්වෙයි. අනතුරුව සිදුවන්නේ විවිධ වු රෝග මෙන්ම නිධන්ගත රෝග ද ශරීරය තුළ හටගැනීමයි.''
මෙම අදහස් ඉදිරිපත් කරන්නේ නිරෝගී ජීවිතයක් ගත කිරීම සඳහා සැමදා පානය කිරීමට ඉතාම සුදුසු කැන්ගන් පානීය ජලය මෙරටට හඳුන්වා දුන් මාතර රාහුල රහස් පාරේ වෛද්‍ය එල්. ගුණරත්න මහතායි.
ඔබගේ ශරීරයේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය සවිබලගැන්වීම, ශරීරයේ නිදහස් ඛණ්ඩක මගින් සෛල වලට සිදුවන හානිය වැළැක්වීම, ශරීරය ආම්ලික වීම වැළැක්වීම, ශරීරයේ ඇති කෝටි ප්‍රකෝටි ගණන් සෛල වලට අවශ්‍ය කරන ජල ප්‍රමාණය ලබාදීම සහ ශරීරයේ ඇති විෂ පිටකිරීම ඇතුළු සුවිශේෂී ක්‍රියාවන් රාශියක් මගින් ශරීරය නිරෝගී කිරීම සලසන, කැන්ගන් වතුර, ජපානයේ නිෂ්පාදිත නියම ලෙවලුක් වර්ගයේ ජල අයනීකාරක යන්ත්‍රවලට විනා එවන් හැඩැති වෙනත් ආයතන මගින් නිෂ්පාදිත අනුකරණ යන්ත්‍රවලට නොහැකි බවත් වෛද්‍ය ගුණරත්න මහතා පෙන්වා දෙයි .
එමෙන්ම කැන්ගන් ජල පානයට යොමු වීමත් සමගම කළ යුතු තවත් වැදගත්ම කාරණාවක් වන්නේ, සර්වාංග රෝග හඳුනාගත හැකි ඩී.එන්.ඒ. ස්කෑන් පරීක්ෂණය වෛද්‍ය ගුණරත්න මහතා ලවා කරවා ගෙන එමගින් ශරීරයේ පවතින සියලු රෝග හඳුනාගෙන එම යන්ත්‍රයෙන්ම සිදුකරන සුවකිරීමේ ප්‍රතිකාරය ලබාගෙන මූලික සුව වීම ආරම්භ කර ගැනීමයි. ඒ සුව වීම ඒ මොහොතේම දැනෙනවා. එහිදී සිදුවන්නේ රෝග යට නොව ඊට පාදක වුණු හේතුවට අදාළ යන්ත්‍රයෙන් සුව කිරීමේ ප්‍රතිකාර කිරීමයි. ඩී.එන්.ඒ. ස්කෑන් පරීක්ෂණයෙන් සහ එමගින් සුව කිරීමේ ප්‍රතිකාරයෙන් අදාළ රෝග වලට ගැළපෙන සුදුසු කැන්ගන් ජල ප්‍රභේද ඉතාම නිවැරදිව හඳුනාගත හැකියි. එහිදී වෛද්‍ය ගුණරත්න මහතා රෝගියාට අදාළ ජල ප්‍රභේදයන් මෙන්ම පානය කරන ජල ප්‍රමාණයන් සහ වෙනත් ජල ප්‍රතිකාර ක්‍රම පිළිබඳව නිවැරදිව වටහා දෙනවා. එම ක්‍රමවේදය මගින් එම රෝගයන් ඉතාම කෙටි කාලයකින් සම්පූර්ණයෙන්ම සුවපත් වන බව වෛද්‍ය ගුණරත්න මහතා පවසන අතර අප විසින් මෙසේ සුවපත් වූ අයවළුන් විශාල පිරිසක් සමග දුරකථනයෙන් මෙන්ම හමුවී කථාබහ කර ලබාගත් තොරතුරු පාඨක හවතුන්ගේ දැනගැනීමට එළිදක්වමින් සහ එළිදැක්වීමට සූදානමින් සිටින බව ද පැවසිය යුතුයි.
අප මීට පෙර ලිපියක පාඨක හවතුන්ගේ දැනගැනීමේ පිණිස නොකඩවා කැන්ගන් ජලය පානය කරන්නන්ගේ ශරීරය තුළ සිදුවෙනවායි සැලකෙන සිද්ධාන්ත මොනවා ද යන්න ඉදිරිපත් කළා.
එසේ අපගේ සිරුරේ ප්‍රතිශක්තිකරණය නිවැරදිව පවතී නම්, '' ආසන්න වශයෙන් පළමු දින පහේදී ආමාශය අභ්‍යන්තරයේ මතුපිට පෘෂ්ඨය නිරෝගීව අළුත්වීමේ සිට දින 30 කදී, 45 කදී, 49 කදී, 60 කදී සහ 120 කදී(මාස හතරකදී) ශරීරයේ සියළු පද්ධති තුළ සිදුවන සුවපත්වීම් සහ අළුත්වීම් පැහැදිලි කිරීම සිදු කළා.
දින 120 කදී (මාස හතරකදී) සිදුවන්නේ ශරීරයේ අස්ථි පද්ධතිය (ඇටසැකිල්ල) නිවැරදිව නඩත්තු වී අළුත්වීමයි. '' ඩී.එන්.ඒ. සුවකිරීමේ ප්‍රතිකාරය මගින් සහ කැන්ගන් ජල පානයෙන් මාස දෙකකට අඩු කාලයකදී බරපතල අස්ථි රෝග සහිත වු අයෙක් සුවපත් වු ආකාරයයි අද අප ඔබට ඉදිරිපත් කරන්නේ.
මහරගමට නුදුරුව වාසය කරන 53 හැවිරිදි එක් මහත්මියක් (ඇය තම අනන්‍යතාවය හෙළි කිරීමට කැමැත්තක් නොදක්වන්නේ ඇය සේවය කරන්නේ බටහිර වෛද්‍ය ප්‍රතිකාරක මධ්‍යස්ථානයක බැවිනි.) මීට වසර 7 ක පමණ කාලයක සිට ආතරයිටිස් රෝගයෙන් පෙළමින් සිට ඇති අතර බටහිර වෛද්‍ය ප්‍රතිකාර දිගින් දිගටම ලබා ඇත. ඒ සඳහා ගන්නා ඖෂධ නිසා ඇයට වෙනත් රෝග ද හටගෙන තිබේ. පසුව දේශීය වෙදකම් කළ ද ඉන් යම් පහසුවක් දැනුනත් ඇයගේ ඔස්ටියෝපොරෝසිස් රෝග තත්ත්වය උත්සන්න වී ඔස්ටියෝ ආතරයිටිස් තත්ත්වයට ඇය පත්වී සිටි බව ද පැවසීය. ඇගේ දෙපා ඇදවීම, උර සන්ධි හා උකුල් සන්ධියක් දැඩි වේදනාවක් ඇති වීම, ඇවිදීමත්, සිටගෙන සිටීමත් ඉතාම අපහසුකාරී සහ වේදනාකාරී බව මත සිදු වූ බව ඇය පවසන්නීය.
ඊට අමතරව අස්ථි වේගයෙන් ගෙවීම සිදුවන බවත් එක් පාදයක් කොට වී ඇති බව දැනෙන බවත් ඊට අමතරව ශරීරයේ ඇති වේදනා සහ කැක්කුම් නිමක් නැති බවත් පවසන ඇය වැඩිදුරටත් පැවසුවේ වේදනා නාශක පෙති ඉතා විශාල ප්‍රමාණයක් දිනපතා ගන්නා බවයි.
කැන්ගන් ජල ප්‍රතිකාර ක්‍රමයත් ඩී.එන්.ඒ. ස්කෑන් පරීක්ෂණ ක්‍රමයත් ගැන දැනගන්නා ඇය වෛද්‍ය ගුණරත්න මහතා සම්බන්ධ කරගෙන අදාළ ඩී.එන්.ඒ. ස්කෑන් පරීක්ෂණයට සහභාගී වී සියළු ලෙඩ රෝග පිළිබඳව නිවැරදිව හඳුනාගෙන මුලින්ම ඩී.එන්.ඒ. ස්කෑන් යන්ත්‍රයෙන් සුව කිරීමේ ප්‍රතිකාරය කරගන්නීය.
ඇය පවසන්නේ.... ''ඇත්තටම මට කාලයකට පස්සේ එදා තමයි ඇඟට ලොකු සුවයක් ලැබුණේ. වෛද්‍ය ගුණරත්න මහතා කියපු විදිහටම මම නැවත සතියකින් ඩී.එන්.ඒ. සුව කිරීමේ ප්‍රතිකාරයත් දිගින් දිගටම කැන්ගන් ජලය පානය කිරීමත් සිදුකළා. මේ වන විට මම 90% ඉක්මවා සුවපත් වී සිටිනවා. මම දැන් කැන්ගන් යන්ත්‍රයක් නිවසේ සවි කරගෙන අපේ පවුලේ සියළු දෙනාටත් අසල්වැසියන්ටත් ජලය ලබාදෙනවා.
වසර හතකට අධික කාලයත් ඉතා අවාසනාවන්ත ජීවිතයක් ගත කළ මා මාස එකහමාරක් පමණ කාලයකදී ලැබූ සුවය පිළිබඳව වෛද්‍ය ගුණරත්න මහතාට අනේකවාරයක් මම පිං දෙනවා. සැක බය නැතුව රෝග සුව කරගැනීමට එතුමාගේම පර්යේෂණාත්මක සොයාගැනීමක් වන ඩී.එන්.ඒ. ස්කෑන් යන්ත්‍රයෙන් සුව කිරීමේ ක්‍රමයත්, කැන්ගන් ජල පානයත් ඉතාම සුදුසු බව මම අත්දැකීමෙන් දැනගත්තා. ''

**0777 362 860**
**යන අංකයෙන් වෛද්‍ය එල්. ගුණරත්න මහතා ඇමතිය හැක (සවස 7 ත් රාත්‍රී 9 ත් අතර කාලය තුලදී වඩාත් පහසුයි).**

**සැකසුම: අමරසිංහ මාලගේ**

The true power of water...for the well-being of all.




වෙළෙඳ අමාත්‍යාංශය

**නව වසරේ**


**සතොස සහන තෑගි මල්ල**

**සුපිරි සම්බා සහල් කි.ග්‍රෑ 10ක් සමඟ භාණ්ඩ වර්ග 20 ක්**

| | | |
|---|---|---|
| සුපිරි සම්බා සහල් | කි.ග්‍රෑ. | 10 |
| සුදු සීනි | කි.ග්‍රෑ. | 1 |
| රතු පරිප්පු | කි.ග්‍රෑ. | 1 |
| ඉඳිආප්ප පිටි | කි.ග්‍රෑ. | 1 |
| හාල්මැස්සන් | ග්‍රෑ. | 500 |
| නූඩ්ල්ස් | ග්‍රෑ. | 400 |
| මේස ලුණු | ග්‍රෑ. | 400 |
| පොල්කිරි | මි.ලී | 330 |
| මිරිස් කුඩු | ග්‍රෑ. | 100 |
| ගම්මිරිස් කුඩු | ග්‍රෑ. | 100 |
| තුනපහ කුඩු | ග්‍රෑ. | 100 |
| කහ කුඩු | ග්‍රෑ. | 100 |
| STC තේ කොළ | ග්‍රෑ. | 100 |
| ඇඟ ගල්වන සුවඳ සබන් | ග්‍රෑ. | 100 |
| සතොස සඳුන් සබන් | ග්‍රෑ. | 100 |
| දැත් සේදුම් දියර | මි.ලී | 100 |
| සෝයා මීට් | ග්‍රෑ. | 90 |
| සතොස නියම රෙදි සෝදන සබන් | ග්‍රෑ. | 80 |
| පපඩම් | ග්‍රෑ. | 60 |
| ශල්‍ය මුහුණු ආවරණ (SLS ප්‍රමිති සහතිකය සහිත) | | 10 ක් |

රු. 3998/= කට

සතොස
ජාතියේ මිල තීරක

# ජනතාව දහදුක් විඳිද්දී විදුලියත් කැපුවොත් කොහොම හිටීවිද?

අහස උසට නඟින භාණ්ඩ මිල මැද ගෑස් මෙන්ම භූමිතෙල් පෝලිම්වලද ලගින්නට සිදුවුණු ජනතාවට කිරිපිටි හිඟය නිසා ඊටත් පෝලිම් ගැහී ළතැවෙන්නට සිදුව තිබෙන කාලයක විදුලි බලය කප්පාදු කරන්නට වන කතා ඇහෙන මොහොතකි. එදා වේල සොයා ගන්නට කුලියක් මලියක් කර ජීවත් වූ මිනිසුන් අන්ත අසරණය. සිමෙන්ති හිඟයෙන් හා මිල ඉහළ යෑමෙන් ඉදිකිරීම් කර්මාන්තයේද රැකියා අහිමිවී ගොසිනි. එහෙව් තත්ත්වයකදී ඇත්තටම විදුලිය කප්පාදුවකට යාවිද යන්න විමසීම අපේ යුතුකමකි.

"විදුලිය කපනවාද? නැද්ද?" යන දෙගිඩියාව පවතිද්දී විදුලිබල මණ්ඩල පාර්ශ්වයෙන් කියැවුණේ "අදියර හතරකින් රට පුරා විදුලිය කපා දමන්නට සැලසුම් කර තිබෙනවා" යන්නය. එම සැලැස්ම විදුලිබල මණ්ඩල නිල වෙබ් අඩවියේද දක්නට ලැබෙයි. නමුත් එය ක්‍රියාත්මක වන දිනයක් සඳහන් වූයේ නැත. විදුලි බල ඇමැති කියන්නේ "විදුලි කප්පාදුවක් නොවන" බවය. එසේ නොකපා මණ්ඩලයට ඉදිරියට යා හැකි බවත් පැවැසීය. කෙසේ වෙතත් යම්කිසි විදිහකින් විදුලි කප්පාදුවක් වෙනවා නම් ජනතාව හොඳින් දැනුවත් කිරීමෙන් පසු එය සිදුවිය හැකි බවත් ඇමැතිවරයා පවසා ඇත. ජනාධිපතිවරයා පවසන්නේද "ජන ජීවිතයට බාධාවක් නොවන පරිදි විදුලිය අර්බුදයට විසඳුම් සෙවීමට ක්‍රියා කළ යුතුයි" යන්නය.

කෙසේ වෙතත් ජනතාවගේ පැත්තෙන් සිටගෙන කල්පනා කළහොත් මේ ප්‍රකාශ අනුව "විදුලිය කප්පාදුවක් විය හැකි සම්භාවිතාව" වැඩිය. රටේ ජනතාව සියලු පාර්ශ්වයන්ගෙන් මහත් සේ පීඩාවට පත්ව ඇති මොහොතක මෙවැනි විදුලි කප්පාදුවක් සිදුවීම ජනතාව තව තවත් අසීරුතාවට පත් වන්නක් වන බැවි රට පුරාම අසන්නට ලැබෙන කතාවකි.

සමස්ත ලංකා විදුලි පොදු සේවක සංගමය කියා සිටින්නේ විදුලි අර්බුදයට විසඳුමක් ලෙස රජය ගෙන එන්නට හදන යෝජනා නිසා ජනතාව තව තවත් පීඩාවට පත්වීම වැළැක්විය නොහැකි බවය.

"රටවල් කිහිපයකින් ටෙන්ඩර් කැඳවලා පාවෙන විදුලි බලාගාර මෙරට වරායවල් ආශ්‍රිතව නැංගුරම් දමා එයින් විදුලිය දෙන්න හදනවා. නමුත් විදෙස් රටවල් විදුලි ඒකකයක් කොයි තරම් මුදලකට දෙයිද දන්නෙත් නෑ. ඒක ජනතාවට දරා ගන්නත් බැරිවේවි. ඩොලර් අර්බුදයෙන් කර මුලටම සිරවී සිටින ආණ්ඩුවට මේ වගේ දෙයක්වත් කර ගන්න ඩොලර් අර්බුදයෙන් බැරි වෙනවා."

උක්ත සංගමය හා වෙනත් ක්‍රියාකාරී සංවිධානද පෙන්වා දෙන පරිදි "පාවෙන තෙල් ගබඩා ස්ථාපිත කර රට පුරා තෙල් බෙදා හරින්නත් පුළුවන්. නමුත් එසේ බෙදා හැරීමට එම පාවෙන තෙල් ගබඩාවල සිට ඊට අවශ්‍ය සම්ප්‍රේෂණ පද්ධති ස්ථාපිත කරන්නත් ඕන. එහෙම දෙයක් මේ වනතුරුම වෙලා නෑ. එහෙම තියෙද්දී මේ අර්බුදය හෙට අනිද්දා විසඳෙන පාටකුත් නෑ" යන්නද කියැවේ.

අප මේ ගැන සොයා බලද්දී විශේෂයෙන් කැලණිතිස්ස, සපුගස්කන්ද, හම්බන්තොට වැනි පද්ධති බලාගාරවලට එවැනි පද්ධති හරහා විදුලිය සැපයුමට අවශ්‍ය සම්ප්‍රේෂණ පද්ධතියක් සැකසීමට අවම වශයෙන් මාස 6ක් වත් කල් ගත විය හැකි වන බැවි කියැවේ.

මීට අමතරව මේ වනවිටත් ගල් අඟුරු බලාගාර නියමිත කාලයට ස්ථාපිත නොකිරීමෙන් අර්බුද රැසකට විදුලි බල මණ්ඩලයද මුහුණ පා සිටින බව නොරහසකි. ත්‍රිකුණාමල ගල් අඟුරු බලාගාරය ස්ථාපිත කිරීමට නියමිතව තිබුණේ 2016 වසරේය. එහෙත් එය මඟහැරී යෑම් කිහිපයක් නිසා එතැන් සිට විදුලිබල මණ්ඩලයේ වාර්ෂික පාඩුව ඩොලර් බිලියන 50ක්ව තිබේ.

වෘත්තීය සමිති මේ පිළිබඳව දක්වන පොදු අදහසට අනුව ආණ්ඩුව මේ අර්බුදය දරුණු වූ පසු වෘත්තීය සමිතිවලින් ඊට විසඳුම් ඉල්ලා සිටීම විහිළුවකි. එය "ලෙඩා මළාට පසු ලෙඩාට නැවත හුස්ම දෙන්නේ කොහොමද?" කියා අසන්නාක් වැනිය.

විදුලිබල මණ්ඩලය අද පත්ව තිබෙන තත්ත්වයට පෙර වෘත්තීය සමිති රැසක් එය එසේ නොවන තැනට අවැසි විසඳුම් ඉදිරිපත් කර තිබුණද ඩොලර් අර්බුදය හමුවේ ඒ එකක්වත් ක්‍රියාත්මක කළ හැකිද යන්න පවා අවිනිශ්චිතය. තත්ත්වය මේ තරම් ඔඩුදුවා ගොස් ඇති මොහොතක දෛනික විදුලි

ඉල්ලුම ගිගාවොට් පැය 43 සිට ගිගාවොට් පැය 46 දක්වා ඉහළ ගොස් ඇත. එහෙත් එම ධාරිතාවෙන් විදුලිය ලබාදීමට විදුලිය නිෂ්පාදන කටයුතු සිදුකිරීම දුෂ්කර කාර්යයක් බවට පත්ව තිබේ.

"විදුලිය කපන්න අවශ්‍යතාවක් නෑ" යැයි විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයා මාධ්‍යයට පවසා තිබුණත් මේ වනවිටත් රටේ විවිධ ප්‍රදේශවල දිනපතා විදුලිය කපා හැරීම් සිදුවන බව අපට වාර්තා වී ඇත. අර්බුදය කොතරම්දැයි කියතොත් තෙල් ගේන්න බලශක්ති ඇමැතිවරයා ඩොලර් මිලියන 200ක් ඉල්ලා ඇති මුත් ආණ්ඩුව සිරවී සිටින ඩොලර් අර්බුදය හමුවේ එය කෙසේ තීරණය වේදෝ යි සිතා ගන්නටවත් බැරි තරම්ය. කෙසේ වෙතත් අදාළ අමාත්‍යවරයාම කියන පරිදි ජනවාරි මාසය තුළ පමණක් මෙරට අවශ්‍යතාවට ඉන්ධන ගෙන්වීම සඳහා ඩොලර් මිලියන 350ක් වත් අවශ්‍යයි. එහෙත් ඛනිජ තෙල් සංස්ථාවේ ඇති බව කියන්නේ ඩොලර් මිලියන 150ක් පමණය. ඒ අනුව අවශ්‍ය හිඟ මුදල ඩොලර් මිලියන 220කි. මෙය නොලැබුණහොත් කුමකින් කුමක් විය හැකිදැයි සිතා ගැනීමට නොහැකිය. එය සැපයීමට ආණ්ඩුවද උපරිම උත්සාහයක යෙදී සිටින බව පෙනෙන්නේ තෙල් නැති වුණොත් විදුලියද උත්පාදනය කරන්නට

පද්ධතියට එකතු කර ගැනීමට පසුබාන මාෆියාවක් විදුලිබල මණ්ඩලය තුළ ඇති බවට වූ මැසිවිලි බොහෝය. මේ පිළිබඳව විදුලිබල මණ්ඩල සේවකයන් කියන්නේද එකම කතාවකි.

"අඩු ගාණට සූර්ය බලය නිපදවලා කවුරු හරි ජාතික පද්ධතියට එකතු කරනවා නම් බොහෝ උසස් නිලධාරීන් ඒකට කැමැති නෑ. ඔවුන්ට ඕනෑ විදුලි අර්බුද මවලා වැඩි ගාණට පෞද්ගලික අංශයෙන් විදුලිය මිලදී ගන්නයි. මේක මාෆියාවක්. ජනතාව වෙනුවෙන් මේ මාෆියාව නැති කරලා සූර්ය විදුලි ව්‍යාපෘති පණ ගැහෙනවා නම් මේ තරම් අර්බුද දිග්ගැහෙන්නේ නෑ."

ඔවුන් බොහෝ දෙනා මහ පොළොවේ විදුලි අර්බුද යථාර්ථය ගැන කියන්නේ එසේය.

රටක් දියුණු කරනවා නම් එහි වේගවත්ම හා වැදගත්ම කාර්යභාරය පවතින්නේ එරට ජාතික ආර්ථිකයට පණ දෙන යටිතල පහසුකම් හරහාය. සිංගප්පූරුවෙත්, මැලේසියාවෙත් වේගවත් සංවර්ධනය වෙනුවෙන් හේතුකාරක වූ ප්‍රධාන සාධකය වූයේ මෙයයි. එයිනුත් ආයෝජකයන් කැඳවන ඔවුන්ට ආයෝජන ඇති කිරීම සඳහා පරිසරයක් ඇතැයි යන්න හැඟවුණු ප්‍රධාන සාධකය වූයේ විදුලිබල සම්පාදනයෙහි පූර්ණතාවයි. එහෙත් අද අප මුහුණ දෙන්නේ ජනතාව අඳුරේ තැබීම යාන්තමින් හෝ බේරා ගන්නා





ග්‍රැෆික් නිර්මාණය ලක්ෂාන් වර්ණකුලසූරිය

නොහැකි වන නිසාවෙනි.

අර්බුදය කොයි තරම් දැයි කියතොත් ගෑස් නැති නිසාවෙන් හා ගෑස් ටැංකි පුපුරන නිසාවෙන් බොහෝ දෙනා මහත් සේ බියට පත්ව භූමිතෙල් ළිප් සොයා වෙන කවරදාකවත් නොවූ තරමේ කඩවල් පීරා ගමන් කරනු අපට දක්නට ලැබේ. පිටකොටුවේ භූමිතෙල් ළිපක් රු. 3000ට ගත හැකිව තිබූ මුත් බලා ඉඳිද්දී එය හිතූ හිතූ ගණන්වලට ඉහළ ගොස්ය. ඇතැම් ළිප් රු. 7000කටත් එහාය. ගෑස් ළිපෙන් උයා ගන්න බැරි මිනිහා භූමිතෙල් ළිපක් සොයාගෙන බතක් උයාගන්නට සිතුවත් තෙල් ගේන්න ඩොලර් නැති වූයේ නම් භූමිතෙලෙන් බතක් උයාගෙනත් හමාරය. ඒ බව දැන හෝ නොදැන බොහෝ දෙනා අතමිට තියෙන හැටියට විදුලි කප්පාදුවක් වේ යැයි සිතා කුඩා ජෙනරේටර් හා භූමිතෙල් ළිප් මිලදී ගන්නා ප්‍රවණතාවක් තවමත් දක්නට ලැබෙයි.

කෙසේ වෙතත් ගල් අඟුරු ගෙන්වීමටද ඩොලර් නැතිවීම නිසා යම් හෙයකින් නියමිත දිනවලට ගල් අඟුරු නොයෙදුවහොත් ගල් අඟුරු බලාගාර සියල්ල වැසී යන අවදානමක්ද පවතී. එම තත්ත්වය සලකා බලා දිනකට පැය දෙකහමාරක්වත් විදුලිය කැපිය යුතු බවත් කියැවෙයි. මේ අනුව

නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයෙන් නිපදවෙන මෙගාවොට් 300 නොලැබී යෑමට ඉඩක් ඇත. එය බරපතළ විදුලි අර්බුදයක් නිර්මාණය කරන්නකි.

රට මේ තරම් විදුලි අර්බුදයකට යද්දී ඉතා හොඳින් හිරු එළිය ලැබෙන රටක් වශයෙන් අප සූර්ය බලයෙන් විදුලිය උත්පාදනය කර ගැනීමේ ක්‍රියාවලියෙන්ද බොහෝ පසුපසිනි. "සූර්ය බල සංග්‍රාමය වැනි ශීර්ෂ පාඨ යටතේ සූර්ය පැනල භාවිතයෙන් රට තුළ විදුලිය උත්පාදනය කිරීමේ ව්‍යාපෘති හා උත්සාහයන් තිබුණද ඒවා තවමත් පණ ගැහී ක්‍රියාත්මක නැති තරම්ය. රට තුළ එවන් ව්‍යාපෘති ඇති කිරීමට පෞද්ගලික අංශයේ පිරිස් ඉදිරිපත්ව කටයුතු කළ අවස්ථා තිබුණද එසේ ඉපැයූ විදුලිය ජාතික විදුලිබල

සටනකටය. ආයෝජන ඇති කිරීම කෙසේ වෙතත් පෝලිමේ ගොස් ලබා ගන්නා ගෑස් සිලින්ඩරයෙන් යාන්තම් බතක් උයා ගන්නට අඳුරේ නොසිටිය යුතුය. එසේ නම් විදුලිය තිබිය යුතුය. ගෑසුත් නැති, කිරිපිටිත් නැති, සහල් හා අවශේෂ භාණ්ඩද ඉහළ ගිය කලෙක අඳුරේද සිටින්නට වේ නම් එය අපූරු සෞභාග්‍යවත් රටක් විය හැකිය.

■ විජිත කේ. පතිරණ

# රත්තරන් ටිකත් විකුණන් කන කබ්රාල් තියරිය හරියිද?



අලුත් අවුරුද්ද ආරම්භයේම හා හා පුරා කියා ශ්‍රී ලංකා මහ බැංකුවේ රන් සංචිතවලිනුත් සෑහෙන ප්‍රමාණයක් රජය විසින් විකුණා දමා ඇති බව වාර්තා වීමෙන් ජනතාව හිසේ අත් ගසා ගත්තේය. පුරවැසියන් එසේ කම්පාවට පත් වන්නේ ඒවා පොදු මහජනයාට අයිති වස්තුව යැයි ඔවුන් සලකන නිසාය. ලංකාව සතු රන් සංචිත විකිණීමේ ආරංචියත් සමඟ රන් සංචිත ගැන අලුත් සංවාදයක් පැනනැඟී තිබේ.

රත්රන් භාණ්ඩ විකුණා දමන්නේ, උකසට තබන්නේ බරපතළ අහේනියකට පත්ව වෙන කර කියාගන්නට දෙයක් නැති තැන බව මිනිස්සු දනිති. මේ වන විට ශ්‍රී ලංකාවේ ආර්ථිකයද එවැනි තත්ත්වයකට පත්ව ඇති බව සැඟවිය නොහැකිය.

රත්රන් සංචිත යනු කුමක්ද? ශ්‍රී ලංකාව සතුව කෙතරම් විශාල රත්රන් සංචිතයක් තිබුණාද? එය විකුණා දැමීමෙන් රටට වන හානිය කුමක්ද? ආදී විවිධ ප්‍රශ්න මතුව තිබේ. ආර්ථික විද්‍යාවට අනුව ඒ පිළිබඳව විමසා බැලිය යුතුය.

ශ්‍රී ලංකා මහ බැංකුව සතුව තිබූ රන් සංචිත ප්‍රමාණය ඉහළම අගය වාර්තා කර තිබෙන්නේ 2013 සැප්තැම්බර් මාසයේය. ඒ ඇ.ඩො. මිලියන 985.636කි. 2021 ඔක්තෝබර් මාසයේදී ඇ.ඩො. මිලියන 384.122 දක්වා අඩු වී ඇත. නොවැම්බර් මාසයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 382.210 දක්වා අඩු විය. දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඇ.ඩො. මිලියන 207ක් වටිනා රත්රන් විකුණා ඇත. මහ බැංකුවේ දත්තවලට අනුව දැනට රත්රන් සංචිතය පවතින්නේ ඇ.ඩො. මිලියන 175.4ක් වශයෙනි.

මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් ප්‍රකාශ කරන්නේ ද්‍රවශීලතාව ඉහළ නැංවීමේ අරමුණින් රත්රන් සංචිත විකිණීම සිදු කළ බවය. නමුත් ද්‍රවශීලතාව ඉහළ දැමීම යන්නෙන් ඔහු අපේක්ෂා කළේ කුමක්ද යන්න පැහැදිලි කර නැත.

"රත්රන් සංචිත එක තැන එක විදිහට තියාගෙන ඉන්නේ නෑ. මිල වැඩිවෙන විට විකුණනවා. ඉදිරියේදී මිල අඩුවූ විට නැවත රත්රන් ලබාගෙන සංචිතය ඉහළ දමනවා. ඒක තමයි ස්වභාවය" යනුවෙන් මහ බැංකු අධිපති පවසා ඇත.

නමුත් අප දන්නා තරමින් ශ්‍රී ලංකා මහ බැංකුව අජිත් නිවාඩ් කබ්රාල්ගේ අධිපති ධුරය යටතේ රත්රන් සංචිත විකුණා දැමුවා මිස මිලදී ගෙන නැත. ග්‍රීසියේ ආර්ථිකය කඩා වැටෙන අවස්ථාවේ ලෝකයේම ආර්ථික විශේෂඥයන් ඒ බව දැනුවත්ව සිටියදී ශ්‍රී ලංකා මහ බැංකුව අර්ථසාධක අරමුදල් ග්‍රීක බැඳුම්කරවල ආයෝජනය කොට සිදු කළ අපරාධයට වගකිව යුත්තේද වර්තමාන මහ බැංකු අධිපති බව අමතක නොකළ යුතුය. මේ පෙන්වන්නේ ඔහුගේ ආර්ථික කළමනාකාරිත්වයේ තරමය.

මිල ස්ථායී උපකරණයක් වශයෙන් රන්වලට ඇත්තේ ඉතා දිගු ඉතිහාසයකි. මුදල් ක්‍රමය ආරම්භයේදීම රන්වලට ඒ කාර්යය පැවැරෙන්නට මූලික වශයෙන් හේතු වූයේ රත්රන්වල දුලබ බවත් එහි වටිනාකම පිළිබඳව පොදුවේ පවත්නා පිළිගැනීමත්ය. එහෙත් කල්ගත වෙද්දී රන් වැනි වටිනා ලෝහ මුදල් වශයෙන් භාවිතයට ගැනීම ගැටලු ඇති කරන්නක් විය. ඒ දුෂ්කරතා මඟහරවා ගැනීමට යෙදු පිළියම පරිසමාප්තියට පත් වූයේ මුදල් භාවිතයට එක් වීමෙනි. එම විසඳුම ගැටලුවක් බවට පත්වූයේ මුදලේ වටිනාකම තීරණය කිරීමේදීය. ඒ අනුව රන් සංචිත භාවිතයට ආවේය. එය කූටප්‍රාප්තියට පත් වූයේ ඊට පොදු එකඟතාව ලැබුණු බැවිනි.

බ්‍රෙටන් වුඩ් (bretton woods) එකඟතාවයට අනුව එක්සත් ජනපද ඩොලර් එකක් රත්රන් ග්‍රෑම් 0.888671ක් මිලට සම කරනු ලැබීය. අනෙක් සියලු ව්‍යවහාරික මුදල් ඩොලරය හා ගැට ගැසිනි.

රත්රන්වල නිසි. වටිනාකම ගැබ්ව ඇත්තේ එය ලෝකයේ හිඟකම තුළය. කාලයත් සමඟ මුදල් ඉදිරියට ආ විට ද එයට පිටුබල වශයෙන් රන් සම්මතයක පිහිට පැතීමට මිනිසා යොමු විය. රන් යනු හිඟ සම්පතක් බව ආර්ථික විද්‍යාව පිළිබඳ මලපොතේ අකුරක් හෝ නොදන්නා අය පවා දනිති.

රන්, රිදී, ප්ලැටිනම් වැනි වටිනා ලෝහ ද්‍රව්‍ය මැනීම සඳහා සම්මත මිනුම් වශයෙන් යොදාගනු ලබන්නේ ට්‍රෝයි අවුන්සය. වර්තමානයේ මිනුම් අනුව ගත්කල troy අවුන්සයක් යනු ග්‍රෑම් 31.1034768කි. එක්සත් එක්සත් ජනපදය 1834 සිට 1934 දක්වා රත්රන් troy අවුන්සයක මිල ඇ.ඩො. 20.67ක් ලෙස පවත්වා ගත්තේය. 2017 අගෝස්තු 16 විවෘත වෙළෙඳපොළේ ට්‍රෝයි අවුන්සයක හෙවත් ග්‍රෑම් එකක මිල ඩොලර් මිලියන 40.2කි. රත්රන් මෙට්‍රික් ටොන් එකක වටිනාකම ආසන්න වශයෙන් ඩොලර් මිලියන 40.2කි. දැනට ගණනය කර ඇති අන්දමට ලොව පවතින රත්රන්වල මුළු වටිනාකම ඩොලර් ට්‍රිලියන 7.5කි.

ලෝකයේ රටවල් කිහිපයක පවතින රත්රන් සංචිත ප්‍රමාණය මෙසේය. (මෙහි සඳහන් වන්නේ මෙට්‍රික් ටොන්වලිනි.) එක්සත් ජනපදය 8133.5, ජර්මනිය 3359.1, ඉතාලිය 2451.8, ප්‍රංශය 2436.4, රුසියාව 2298.5, චීනය 1948.3, ඉන්දියාව 744.8 ශ්‍රී ලංකාව 6.0 (අලෙවි කරන්නට ප්‍රථම) මෙයට අමතරව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සතුව රත්රන් ටොන් 2814.0ක්ද ඇත.

පසුගිය සතියේ හිටපු මහ බැංකු නියෝජ්‍ය සභාපති ආචාර්ය ඩබ්ලිව්.ඒ. විජේවර්ධන ප්‍රකාශ කර තිබුණේ ශ්‍රී ලංකා මහ බැංකුව රන් සංචිත අලෙවි කිරීමේ පරමාර්ථය ආපසු මිලදී ගැනීම නොව ණය ආපසු ගෙවීම සහ අනෙකුත් හදිසි ගෙවීම් සඳහා භාවිත කළ හැකි වන පරිදි මුදල් බවට පත් කිරීම බවය. එය ආණ්ඩුව පත්ව සිටින විදේශ විනිමය අර්බුදයට මුහුණදීම සඳහා ඇති අවසාන විකල්පයයි. ඉන් අනතුරුව ආණ්ඩුව යොමුවනු ඇත්තේ රාජ්‍ය දේපළ විකුණා දැමීම කෙරෙහිය.

■ උදේනි සමන් කුමාර

# සියවස් ගණනක් පොළොවට වැළලුණු ලාහුගල බුදු පිළිමය යළි වඩින්න වරම්



**ශතවර්ෂ ගණනාවක් බිම පතිතව තිබූ මාලිගාවිල බුද්ධ ප්‍රතිමාව නඟාසිටුවීම රණසිංහ ප්‍රේමදාස ජනාධිපති සමයේ සිදු වූ වැදගත් සිදුවීමක් ලෙස ඉතිහාසගතව තිබේ. ඓතිහාසික රාජධානි සමයේ ඉදිකරනු ලැබ සියවස් ගණනාවක් බිම පතිතව තිබූ ලාහුගල බුද්ධ ප්‍රතිමාවද මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් පසුගියදා යළි නඟාසිටුවා ප්‍රතිෂ්ඨාපනය කර තිබේ.**

ලාහුගල පිහිටා තිබෙන්නේ අම්පාර දිස්ත්‍රික්කයේ පානම්පත්තුවේය. මොනරාගල - පොතුවිල් මාර්ගයේ සියඹලාණ්ඩුවේ සිට කිලෝමීටර් 22ක් ඈතින් ලාහුගල පිහිටා ඇති අතර එහි සිට පොතුවිල් දක්වා ඇති දුර කිලෝමීටර් 11කි. ලාහුගල වනෝද්‍යානයට මායිම්ව පුරාණ විහාර භූමිය පිහිටා ඇති අතර පන්සල්ගොඩ හන්දියෙන් හැරී කෙටි දුරක් ගමන් කළ විට එය හමුවේ. මඟුල් මහා විහාරය නමින් හැඳින්වෙන මෙම විහාරාරාම සංකීර්ණය විශාල භූමි ප්‍රදේශයක් පුරා පැතිර පවතී.

ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහන් කරන්නේ රුහුණු මහා විහාරය නමින් හැඳින්වෙන මෙම විහාරය ධාතුසේන රජතුමා විසින් කරවන ලද්දක් බවය. 14 වන සියවසට අයත් පුවරු ලිපි දෙකක් මෙහි පිහිටුවා තිබේ. එක් පුවරු ලිපියක සඳහන් වන්නේ "සිරිලක රජකළ දාසෙන් කැලි රජ දරුවන් කර වූ රුහුණු මහ වෙහෙර" යනුවෙනි. මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරීන් මෙම සෙල් ලිපි දෙක කියවා එහි අක්ෂර 14 වැනි සියවසට අයත් බව පෙන්වාදී ඇත.

සෙල් ලිපියේ සඳහන් වන පරිදි විහාර මහා දේවිය රජවරුන් දෙදෙනකුගේ අග බිසව බවත් ඉන් එක් රජකු පරාක්‍රමබාහු බවත් ඔවුන් රාජ්‍ය කර ඇත්තේ රෝහණයේ බවත්ය. විජයබාහුගෙන් පසුව 1341දී ඔහුගේ පුතුන් දෙදෙනා වූ පස්වැනි පරාක්‍රමබාහු දැදිගමත්, හතරවැනි බුවනෙකබාහු ගම්පොළත් භාරව පාලනය කළ අතර දැදිගමට ආසන්න 14 වැනි සියවසට අයත් කොටගම දෙමළ ලිපියේ කියැවෙන්නේ යාපනයේ ආර්යචක්‍රවර්ති එම ප්‍රදේශය ආක්‍රමණය කර සිංහල පාලකයා පරාජය කළ විජයග්‍රහණයක් පිළිබඳවය.

එම ලිපිය හා මඟුල් මහා විහාර ලිපිය අධ්‍යයනය කළ මහාචාර්ය පරණවිතාන පෙන්වාදී ඇත්තේ මෙම ආක්‍රමණය නිසා 5 වැනි පරාක්‍රමබාහු රෝහණයට අයත් මඟුල් මහා විහාර ප්‍රදේශයට පලාගොස් ඒ ප්‍රදේශය පාලනය කරමින් සිටින සමයක ඔහුගේ භාර්යාව මඟුල් මහ විහාර ලිපිය වන්නට ඇති බවය. කෙසේ වෙතත් එහි ඇති මඟුල් මණ්ඩපය වශයෙන් සැලකෙන ගොඩනැඟිල්ල බෝධිඝරයක් බව පුරාවිද්‍යාත්මක ආචාර්ය රෝලන්ඩ් සිල්වා ඇතුළු පුරාවිද්‍යාඥයන් විසින් තහවුරු කර ඇත. මෙම ලිපියේ විහාර මහා දේවියගේ නම සඳහන් නිසා ජනවහරේ මෙය කාවන්තිස්ස රජුගේ බිසව යැයි සිතන්නට ඇත.

මඟුල් මහා විහාර භූමියේ කැටයම් සහිත බෝධිඝරයක්, ප්‍රතිමා ගෘහයක්, දාගැබක්, භික්ෂු ආවාස, උපෝසථාගාරයක්ද ඇතුළු අතිවිශාල පුරාණ ඉදිකිරීම් රාශියක් පැතිරී පවතී. ප්‍රතිමා ගෘහයට අයත් මෙම බිම හොත් ප්‍රතිමා වහන්සේ හැරුණුවිටද ඉතාමත් සුවිශේෂී අනන්‍යතාවක් සහිත සඳකඩපහණක්ද ඇතුළු විශාල ප්‍රමාණයක් පෞරාණික ඉදිකිරීම් තිබේ. විහාර සංකීර්ණයට අයත් භූමිය අතීතයේදී අක්කර දහසක් පමණ වන්නට ඇතැයි සැලකේ.

ප්‍රතිමා ගෘහය මධ්‍යයෙහි වූ බුද්ධ ප්‍රතිමාව කවර වකවානුවක බිම පතිත වී දැයි නොදනී. එය කැබලි කිහිපයකට බිඳී ඉතා බරපතළ ලෙස හානි වූවකි. සියවස් ගණනාවක් බිම වැටී තිබීම නිසා ප්‍රතිමාවේ හිස අස්ථානගත වී ඇත. දෙඅත්ද බිඳී ඇත. මෙම ඉතා අලංකාර බුද්ධ ප්‍රතිමාව දීර්ඝ කාලයක් තිස්සේ පුරාවිද්‍යාඥයන්ගේ ඇස ගැටුණද එය මේ දක්වා නිසි පරිදි නඟාසිටුවීමට කටයුතු කර නැත. ප්‍රතිමාව නඟාසිටුවීමේදී පුරාවිද්‍යාඥයන් කල්පනා කරන්නට ඇත්තේ බිඳී විසිරුණු කැබලි හා ශීර්ෂය නොමැතිවීම නිසා ප්‍රතිමාව යළි ප්‍රතිෂ්ඨාපනය කිරීමෙන් එහි ඓතිහාසික ශ්‍රී විභූතියට හානි පැමිණෙතැයි යන අදහසය.

ප්‍රතිමාව යළි ප්‍රතිෂ්ඨාපනය කිරීම සම්බන්ධයෙන් මතුව තිබුණු බරපතළම ගැටලුව වූයේ ස්ථානගතව ඇති ප්‍රතිමාවේ ශීර්ෂය සොයා ගැනීමය. මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් පුරාවිද්‍යාඥ මහාචාර්ය ගාමිණී රණසිංහ පැවැසුවේ මෙම අස්ථානගත වූ හිස සොයා ගැනීම සඳහා මඟුල් මහා විහාර භූමියෙහි එක් එක් කාල වකවානුවල කරන ලද පුරාවිද්‍යා කැණීම්වලට අදාළ ලිපි ගොනු තමා විසින් සෑහෙන ප්‍රමාණයක් සමීක්ෂණය කළ බවය.

එහෙත් කිසිදු ලිපි ගොනුවක මෙම අස්ථානගත ශීර්ෂය ගැන සඳහනක් හමු නොවූ බවය. බ්‍රිතාන්‍ය පාලන සමයේ බොහෝ පුරාවස්තු කෞතුකාගාරවල ප්‍රදර්ශනය සඳහා තැන්පත් කර තිබූ බැවින් ලාහුගල ශීර්ෂය කෞතුකාගාරවල එකතුවලට අයත්ව තිබේ දැයි දෙවනුව විමර්ශනය කරන ලදී. අනුරාධපුර, පොළොන්නරුව, කොළඹ ජාතික කෞතුකාගාරය ඇතුළු අනෙක් කෞතුකාගාරයන්හි මේ පිළිබඳව ගැඹුරින් සොයා බැලුවද එවැන්නක් සොයාගත නොහැකි වී තිබේ. කෙසේ වුවද ප්‍රතිමාව යළි නඟාසිටුවිය යුතු බවට මධ්‍යම සංස්කෘතික අරමුදල තීරණය කර ඇත. ඒ අනුව ප්‍රතිමාවේ ශීර්ෂය නිර්මාණය සඳහා දෙවැනි විකල්පයකට යා යුතුව තිබිණ.

> **ප්‍රතිමාව යළි ප්‍රතිෂ්ඨාපනය කිරීම සම්බන්ධයෙන් මතුව තිබුණු බරපතළම ගැටලුව වූයේ අස්ථානගතව ඇති ප්‍රතිමාවේ ශීර්ෂය සොයා ගැනීමය. මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ගාමිණී රණසිංහ පැවැසුවේ මෙම අස්ථානගත වූ හිස සොයා ගැනීම සඳහා මඟුල් මහා විහාර භූමියෙහි එක් එක් කාල වකවානුවල කරන ලද පුරාවිද්‍යා කැණීම්වලට අදාළ ලිපි ගොනු තමා විසින් සෑහෙන ප්‍රමාණයක් සමීක්ෂණය කළ බවය.**

බුද්ධ ශාසන අමාත්‍යාංශය යටතේ පාලනය වන බටලීය අනුරූ මධ්‍යස්ථානයට අදාළ තොරතුරු හා පසුබිම ලබාදී මඟුල් මහ වෙහෙර බුද්ධ ප්‍රතිමාවේ ශීර්ෂ අනුරුවක් නිර්මාණය කිරීමට අවසානයේ තීරණය වී ඇත. ඒ අනුව පුරාණ කැටයම් ශෛලිය සහ අදාළ වකවානුවට අදාළ නිර්මාණයන් හා විධීන්වලට අනුගතව බුද්ධ ප්‍රතිමාවේ ශීර්ෂය නැවත නිර්මාණය කර තිබේ. අදාළ යුගයේදී අනුදැන සිටි ප්‍රතිමා කලාව හා මෝස්තර විධීන් අනුව යමින් ඉතාමත් මනරම් ලෙස ප්‍රතිමා ශීර්ෂය නිමකිරීමට අනුරූ මධ්‍යස්ථානය සමත්ව තිබිණි.

මඟුල් මහා වෙහෙර බුද්ධ ප්‍රතිමාවේ ශීර්ෂය ගලින් නෙලූ ප්‍රතිමාවට ඒකාබද්ධව නොතිබිණි. එය ගලෙහි කපන ලද කත්තුවකින් හිස සහ කඳ සම්බන්ධ කරන ලද්දකි. ප්‍රතිමාව බිම හොත් පසු හිස කොටස ගැලවී යෑමට සම්භාවිතාවක් ඇත. අනාගතයේ කිසියම් දිනෙක මඟුල් මහා වෙහෙර විහාර සංකීර්ණයෙහි සිදුකරන කැණීමකදී මෙම අස්ථානගත වූ බුද්ධ ප්‍රතිමා ශීර්ෂය හමුවුවහොත් එය කිසිදු ගැටලුවකින් තොරව නැවත ප්‍රතිමාවට සම්බන්ධ කළ හැකි බව මහාචාර්ය ගාමිණී රණසිංහ පැවැසීය.

කෙසේ වුවද මෙම පුර පසළොස්වක පොහෝ දින වැඩ නිමාකොට සැදැහැවතුන්ගේ වන්දනාමාන කිරීම පිණිස ඉදිරිපත් කරනුයේ අංගසම්පූර්ණ බුද්ධ ප්‍රතිමාවකි. ඉතා ශක්තිමත් ලෙස නියමිත බරට ගැළපෙන ලෙස යෙදූ පාදමක් මත ප්‍රතිමාව පිහිටුවා තිබේ. ප්‍රතිමාවේ බිඳුණු අත් කොටස සුදු යකඩ යොදා නැවත සම්බන්ධ කරන්නට හැකි වීමද ආශ්චර්යවත් සිදුවීමකි. මධ්‍යම සංස්කෘතික අරමුදලේ සංරක්ෂණ අංශයේ ගාමිණී සමන් ඇතුළු විශිෂ්ට නිපුණතා ඇති සේවක මහත්වරුන් විසින් බුද්ධශාසන ආගමික කටයුතු සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල ගුණවර්ධන මහතා ඇතුළු විෂය භාර ප්‍රධානීන්ගේ මෙහෙයවීමෙන් සියලු වැඩකටයුතු සාර්ථකව අවසන් කරන්නට හැකි වී ඇත.

මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් පුරාවිද්‍යාඥ මහාචාර්ය ගාමිණී රණසිංහ පැවැසුවේ සියවස් ගණනාවක් මිහිතලය සිපගෙන වැතිර සිටි ශෛලමය බුද්ධ ප්‍රතිමා වහන්සේ නැවත ස්ථාපිත කොට බැතිමතුන්ට වන්දනාමාන කරන්නට ඉඩ හසර ලබාදීම මේ වකවානුවේ අසන්නට ලැබෙන ඉතා අසිරිමත් සිදුවීමක් වනු ඇති බවය.

■ උදේනි සමන් කුමාර





# ධනපති පක්ෂ දෙක ජවිපෙට බය ඇයි?

## බොරු බේගල්වලින් රටේ ජනතාව රවටන්න පුළුවන් ද?

**රෝහණ විජේවීර ලියූ ලිපි... 03**

**මෙහි ඉදිරිපත් කරන ලිපි රෝහණ විජේවීර විසින් 1981 - 82 කාලවකවානුවේ ලියන ලියන ලද ඒවාය. ඊට ඇතුළත් වන්නේ එම වකවානුවේ පැවැති දේශපාලන පසුබිමට අයත් කරුණු කාරණාය. ශ්‍රී ලංකාවේ තත් කාලීන දේශපාලන ඉතිහාසය හදාරන්නවුනටද මෙම ලිපි ප්‍රයෝජනවත් වනු නිසැකය.**

**එක්සත් ජාතික පක්ෂ සමුළුවේදී නායක ජේ. ආර්. ජයවර්ධන සිය පාක්ෂිකයන්ට කියා සිටියේ මෙම වසර මැතිවරණ වසරක් හැටියට සලකා ක්‍රියා කරන ලෙසය. එම ප්‍රකාශයෙන් මසක් ගතවත්ම ඔහු බොරැල්ලේ රැලියක් පවත්වා ජනතා විමුක්ති පෙරමුණට එරෙහිව විශාල බොරු ප්‍රචාරයකුත්, අවලාද නැඟීමකුත්, අපහාස කිරීමකුත්, දියත් කරන ලදී. ජවිපෙට එරෙහිව පොලිසිය උසි ගැන්වීමටත්, ජනතාව බියවැද්දීමටත්, ඔහු මහා උත්සාහයක් දරන ලදී.**

දින කිහිපයකට පසුව ජේ. ආර්. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කැඳවා අවවාද අනුශාසනා කිරීමක් ගැනද වාර්තා විය. මෙලෙස අනුශාසනා කිරීමට මන්ත්‍රීන් කැඳවූ මුල් අවස්ථාවේ පැමිණ සිටියේ මන්ත්‍රීවරු 26 දෙනෙක් පමණක් බව දැනගන්නට ඇත. දෙවැනිවර කැඳවා ගත් මන්ත්‍රීන්ට, වඩාත් නිවැරදිව කියනවා නම් ප්‍රාණ ඇපකරුවන්ට ඔහු දී ඇති උපදෙස් මොනවාද?

ජනතා විමුක්ති පෙරමුණ රට පුරා වේගයෙන් ව්‍යාප්ත වෙමින් තිබේ. 1977 ජයග්‍රහණය උදෙසා 1973 සිට 77 දක්වා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විරුද්ධව යූ.ඇන්.පිය වැඩ කළ ආකාරයට දැන් ජවිපෙ නිවෙසින් නිවෙසට යමින් අපට විරුද්ධව වැඩ කරමින් සිටී. ඒ නිසා වහා නින්දෙන් අවදි වී රට පුරා ගොස් ජවිපෙට විරුද්ධව වැඩ කළ යුතුය. යන්න ඔහු එහිදී අවධාරණය කර ඇත. ඒ සමඟම ඔහු එහිදීද ජවිපෙට එරෙහිව ජනතාව නොමඟ යැවීම සඳහා ටී. බී. ඉලංගරත්නගෙන් අත මාරුවට ගත් අවලාද නැඟීමට ද උත්සාහයක් දරා තිබේ.

ජේ. ආර්. ජයවර්ධනගේ මේ හදිසි කලබලය කුමක්ද? අපට එරෙහිව අවලාද නැඟීමටත්, අපහාස කිරීමටත්, අසත්‍ය බොරු ප්‍රචාරය කිරීමටත්, පොලිසිය සහ පාක්ෂිකයන් උසි ගැන්වීමටත්, ජනතාව බියවැද්ද වීමටත් හේතුව කුමක්ද?

පසුගිය අවුරුදු 35 මුළුල්ලේම මේ රට පාලනය කළේ ධනපති එක්සත් ජාතික පක්ෂයත්, ධනපති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් ප්‍රමුඛ වී ගොඩනැඟුණු ධනපති ආණ්ඩු විසිනි. මෙහිදී දක්නට ලැබෙන ප්‍රධාන සාධකයක් නම් ප්‍රධාන ධනපති පක්ෂ දෙක වන යූඑන්පියත්, ශ්‍රීලනිපයත්, පමණක් ජාතික මට්ටමෙන් ගොඩනැඟී තිබුණු අතර ඒවාට සහාය දුන් සුළු ධනපති වමේ පක්ෂ වන මහජන එක්සත් පෙරමුණ, ලංකා සමසමාජ පක්ෂය හා ශ්‍රී ලංකාවේ කොමිනිස්ට් පක්ෂය, ප්‍රාදේශීය සුළුතර පක්ෂ විය. රටේ දිස්ත්‍රික්ක කිහිපයක, ප්‍රදේශ කිහිපයකට පමණක් සීමා වී තිබූ මෙම පක්ෂවලින් ඉතිහාසයේ කවරදාකවත් ධනපති පක්ෂ දෙකට සැබෑ තර්ජනයක් මතු වූයේ නැත.

අනික් අතට මෙම සුළු ධනපති වමේ පක්ෂවලට ඔවුන්ගේ දර්ශනයේත්, නායකත්වයේත්, ප්‍රතිපත්තිවලත්, ක්‍රියාමාර්ගවලත්, උපාය උපක්‍රමයන් ගේත්, පමණක් නොව සංවිධාන ස්වභාවයත් හේතු කොටගෙන කළ හැකි එකම දේ වූයේ ධනපති පක්ෂ දෙකෙන් කොයි එකක හෝ වලිගය බවට පත්වීම පමණි.


ඔවුහු හැමදාමත් ජනතා ද්‍රෝහී පාලනයේ හවුල් කරුවන් පමණක් වූහ. සමසමාජයටත්, කොමියුනිස්ට් පක්ෂයටත්, මහජන එක්සත් පෙරමුණටත්, කවරදාකවත් ධනපති පක්ෂ දෙක වන යූ.එන්.පියත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, වෙනුවට විකල්ප බලවේගයක් ලෙස ඉස්මතු වීමට නොහැකි විය. මේ හේතුවෙන් පැරණි සුළු ධනපති වමේ පක්ෂවලින් යූ.එන්.පී.ය ටත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් තර්ජනයක් නොවූ අතර එම පක්ෂ ධනපති පක්ෂ දෙකේ ආධාරකරුවන් බවට, උපකාරී බලවේගයන් බවට සෑම කල්හිම පත් විය.

> **යූඇන්පියට 5/6 ක බලයක් දුන්නාට රටේ එකම ප්‍රශ්නයක් වත් විසඳුවේ නැත.**

> **ප්‍රශ්න විසඳන්නට නොදී කවුරුවත් ජේ. ආර්. ජයවර්ධනව අල්ලාගෙන සිටියේද නැත.**

> **ජනතාද්‍රෝහී දේශද්‍රෝහී පාලනයෙන් කලකිරුණු යූ.එන්.පී. යේම ඇතැම් කොටස් අද යූ.එන්.පී. ය අතහැර යෑමට පටන් ගෙන ඇත.**

> **විනාශයට හවුල් වී නැති එකම පක්ෂය මෙන්ම ජනතාවට අත්හදා බැලීමට ඉතුරු වී ඇති එකම පක්ෂයද ජනතා විමුක්ති පෙරමුණයි.**



> **ජනතා විමුක්ති පෙරමුණ කිසිම ධනපති පන්තික පක්ෂයක වල්ගය බවට පත්වී නැත. පත්වන්නේද නැත.**

> **වමේ පක්ෂවලට ප්‍රධාන පක්ෂ සඳහා මුක්කු ගසනවා හැරෙන්නට වෙන යමක් කරන්නට අවශ්‍යතාවක් නොවීය.**

නමුත් ජනතා විමුක්ති පෙරමුණ එසේ නොවේ. ලංකා ඉතිහාසයේ පළමුවරට ධනපති පක්ෂ දෙකට එරෙහිව ජාතික මට්ටමෙන් විකල්ප බලවේගයක් බවට පත්වූයේ ජනතා විමුක්ති පෙරමුණයි. එය ප්‍රාදේශීය පක්ෂයක් නොවේ. එය දිස්ත්‍රික්ක කිහිපයකට සීමාවී නැත. මුළු දිවයින පුරාම, දිස්ත්‍රික්ක 24 තුළම සක්‍රිය දේශපාලන බලවේගයක් ලෙස ක්‍රියාත්මක වෙයි. ප්‍රධාන ධනපති පක්ෂ දෙකටත්, ප්‍රාදේශීය ධනපති පක්ෂ වලටත් ඔවුන්ගේ තැරැව්කරුවන් වන සුළු ධනපති පන්තියේ පක්ෂවලටත් එරෙහිව ජාතික මට්ටමින් විකල්ප බලවේගය ලෙස නැඟී සිටී.

ජනතා විමුක්ති පෙරමුණ කිසිම ධනපති පන්තික පක්ෂයක වල්ගය බවට පත්වී නැත. පත්වන්නේද නැත. මෙන්න මේ තත්ත්වය යටතේ ප්‍රධාන ධනපති පක්ෂ දෙකටත්, ධනපති පාන්තික පාලනයටත් ලක් ඉතිහාසයේ පළමුවරට සැබෑ තර්ජනයක් වමේ ව්‍යාපාරයෙන්, කම්කරු පන්ති ව්‍යාපාරයෙන් මතුවී ඇත. යූ.ඇන්.පී.ය ජනතා විමුක්ති පෙරමුණට බිය වී ඇති පළමු හේතුව මෙයයි.

පාර්ලිමේන්තු ක්‍රමය ස්ථාපිතවීමෙන් පසු මෙතෙක් පැවැති දේශපාලනය තුළ ජනතාවට කළ හැකි වූයේ එක් ධනපති පක්ෂයක් එපා වන විට අනෙක් ධනපති පක්ෂය බලයට පත්කිරීම පමණකි. මේ හැර කළ හැකි අන් යමක් නොවීය. සුළු ධනපති පන්තික වමේ පක්ෂ ප්‍රාදේශීය සුළු පක්ෂ වීම නිසා ප්‍රධාන පක්ෂවලට මුක්කු ගසනවා හැරෙන්නට ඔවුන්ට වෙන යමක් කරන්නට අවශ්‍යතාවක් නොවීය. ධනේශ්වර පන්තියට, ධනේශ්වර පාන්තික පක්ෂ දෙකට මෙතෙක් ඉතා හිතකරව තිබූ මේ තත්ත්වය ජනතා විමුක්ති පෙරමුණේ බිහිවීම හා වර්ධනය සමඟ අහෝසි වී ගොස් තිබේ. ප්‍රථම වරට ධනපති පන්තියටත් ධනපති පක්ෂවලටත් අහිතකර අලුත් තත්ත්වයක් නිර්මාණය වී ඇත. ධනපති පාලකයන් ඉන් මහත් සේ තැතිගෙන ඇති බවක් පෙනේ.

පැරණි සුළු ධනේශ්වර වමේ පක්ෂවල ප්‍රතිසංස්කරණවාදී ධනපති ප්‍රතිපත්තිවලින් ධනපති ක්‍රමයට හානියක් නොවේ. ධනපති පක්ෂ වෙනුවට එම පක්ෂ විකල්පය ලෙස නැඟී ආවානම් ධනපති පන්තියට එතරම් තැති ගැනීමට හේතුවක් නොවනු ඇත. නමුත් ජනතා විමුක්ති පෙරමුණ ප්‍රතිසංස්කරණවාදී ප්‍රතිපත්තිවලින් යුක්ත පක්ෂයක් නොවේ. සැබෑ නිර්ධන පන්ති සමාජවාදී ප්‍රතිපත්ති වලින් යුත් විප්ලවකාරී පක්ෂයකි. ජනතා විමුක්ති පෙරමුණ පවතින අයුක්ති සහගත හා අසාධාරණ ධනපති සමාජ ක්‍රමය මුළුමනින්ම වෙනස් කර ඒ වෙනුවට අලුත් සමාජයක්, යුක්තිගරුක සාධාරණ සමාජවාදී සමාජයක් ගොඩනැඟීමට ඇප කැප වී සිටින පක්ෂයකි.

අධිරාජ්‍යවාදී ධනේශ්වර ග්‍රහණයෙන් රට මුදාගෙන නව මාවතක රට සංවර්ධනය කිරීම සඳහා කැපවී සිටින පක්ෂයකි. ඒ සඳහා ප්‍රතිපත්ති මාලාවක්, වැඩපිළිවෙළක්, ක්‍රියාමාර්ගයක්, ඉදිරි දර්ශනයක්, උපාය මාර්ගයක්, සංවිධානයක්, හා නායකත්වයක් ඇති රටේ තිබෙන එකම පක්ෂය ජනතා විමුක්ති පෙරමුණයි. ඉතින් මේ පක්ෂය ජාතික මට්ටමෙන් ධනපති පක්ෂ දෙකට තරඟකරුවකු ලෙස පෙරට ඒම ගැන ධනපති යූ.ඇන්.පී.යත්, ධනපති පන්තියත්, අධිරාජ්‍යවාදීනුත් මහත් සේ බියවීම පුදුම සහගත කරුණක් නොවේ.

ප්‍රධාන ධනපති පක්ෂ දෙක තුළ ඇති වී ඇති අභ්‍යන්තර අර්බුදයන්හි වාසිදායක තත්ත්වයෙන් සහ පීඩිත පන්ති ජනතාව තුළ අලුතින් යළි ඇති වී ඇති බලාපොරොත්තු සහගත තත්ත්වයෙන් උපරිම ප්‍රයෝජන ගනිමින් ජනතා විමුක්ති පෙරමුණ මහත් වේගයෙන් ඉදිරියට ගමන් කරමින් සිටී. රටේ මුළුමහත් ජනතාව සිය ධජය වටා පෙළ ගස්වමින්, ප්‍රධාන දේශපාලන ප්‍රවාහය බවට පත්වෙමින් තිබේ.

ජවිපෙ හැර අන් හැම දේශපාලන පක්ෂයක්ම එනම් ධනපති යූ.ඇන්.පී.යත්, ශ්‍රීල.නි.ප.යත්, දෙමළ එක්සත් විමුක්ති පෙරමුණත්, සුළු ධනපති පන්තික සමසමාජය, කොමියුනිස්ට් පක්ෂය, මහජන එක්සත් පෙරමුණ යන මේ සියලු පක්ෂ ගෙවුණු 35 වසර තුළ මේ රටේ පාලන බලය හොබවා ඇත. රටේ පාලනයට හවුල් වී ඇත. මොවුහු සියලු දෙනාගේම අදූරදර්ශී, ජනතාද්‍රෝහී, විදේශ ප්‍රතිපත්තිය නිසා මේ රට විනාශ මුඛය කරා ගමන් කර ඇත. පවතින සෑම ප්‍රශ්නයකටම ඔවුන් වගකිවයුතු බව ජනතාව හොඳාකාරවම දනී.

විනාශයට හවුල් වී නැති එකම පක්ෂය ජනතා විමුක්ති පෙරමුණයි. ජනතාවට අත්හදා බැලීමට ඉතුරු වී ඇති එකම පක්ෂයද ජනතා විමුක්ති පෙරමුණයි. එසේම මේ විනාශයෙන් මුදාගැනීමටත් ගොඩ ගැනීමටත්, ප්‍රතිපත්තිමය ඉදිරි දර්ශනයක්, සංවිධානයක් හා නායකත්වයක් ඇති එකම පක්ෂය ජනතා විමුක්ති පෙරමුණයි. අල්ලස්, දූෂණ, හොරකම්වලට හවුල් වී නැති එකම පක්ෂය ජනතා විමුක්ති පෙරමුණයි. මේ බව හොඳාකාරවම දන්නා පීඩිත පන්තියේ ජනතාව දස දහස් ගණනින් ඒකරාශි වීම නිසා ධනපති පන්තියට ජවිපෙ තර්ජනයක් වී තිබේ.

එය කතන්දරයේ එක් පැත්තකි. මෙහි තවත් පැත්තක් තිබේ. ඒ පැත්ත කුමක්ද? ධනපති පක්ෂ දෙකේ හා ඔවුන් පසුපස දුවන සුළු ධනපති පක්ෂවල නායකයන්ගේ බොරු පොරොන්දුවලින් අට වතාවක් නොමඟ ගිය පීඩිත පන්ති ජනතාව අද තවදුරටත් එම පොරොන්දුවලින් රැවටිය නොහැකි තත්ත්වයට පත්වී ඇත. වසර පහකට පෙර වර්තමාන යූඑන්පී නායකත්වය දක්ෂකම් සුදුසුකම් අනුව සැමට රැකියා දෙන බවට, බඩු මිල පහත දමන බවට, ජීවන තත්වය නඟා සිටුවන බවට, ධර්මිෂ්ඨ සමාජයක් ගොඩනඟන බවට, ධාන්‍ය රාත්තල් අටක් දෙන බවට. පවුල් බලය බිඳ දමන බවට, පොරොන්දු දෙමින් ජනතාව රැවටීම ගැන ජයවර්ධන අද කියන්නේ කුමක්ද?

ඔවුන් පසුගිය වසර පහ තුළ රට ඇමෙරිකන් අධිරාජ්‍යවාදීන්ට බිලිදෙමින්, ජාවාරම්කාරයන්ට සහන පිට සහන සලසමින්, ජනතාව පීඩනයට පත්කරමින්, ගෙනගිය ජනතාද්‍රෝහී දේශද්‍රෝහී පාලනයෙන් කලකිරුණු යූ.එන්.පී. යේම ඇතැම් කොටස් අද යූ.එන්.පී. ය අතහැර යෑමට පටන් ගෙන ඇත. අද පාලක යූ.එන්.පී. යද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මෙන් මහත් අභ්‍යන්තර අර්බුදයකට ගොදුරු වී සිටී. බේද බින්න වීම ඉතිහාසයේ කවරදාවත් නැති තරම් උග්‍ර වී ඇත. ධනපති පක්ෂ දෙකේ අභ්‍යන්තර අරගල තවදුරටත් වසන් කර ගත නොහැකි වී ඇත.

යූඇන්පියට 5/6 ක බලයක් දුන්නාට රටේ එකම ප්‍රශ්නයක් වත් විසඳුවේ නැත. ප්‍රශ්න විසඳන්නට වුවමනාව තිබ්බා නම් ඊට හොඳටම ඉඩකඩ තිබිණි. ප්‍රශ්න විසඳන්නට නොදී කවුරුවත් ජේ. ආර්. ජයවර්ධනව අල්ලාගෙන සිටියේද නැත.

ඒත් එකම ප්‍රශ්නයක්වත් විසඳුවේ නැත. හැම ප්‍රශ්නයක්ම උග්‍ර විය. රට ඇමෙරිකන් කාරයන්ගේ තිප්පළක් බවට පත් විය. රට දෙකඩ කිරීමේ තර්ජනය උග්‍ර විය. ප්‍රජාතන්ත්‍රවාදය වල්වැදී තිබේ. ජනතාව ණය බරින් මිරිකී සිටිති. ඉතින් යළිත් වතාවක් බලය ඉල්ලා ජනතාවට කීමට ඇත්තේ කුමක්ද? කිසිවක් නැත. යූ.එන්.පී. ජනතා විමුක්ති පෙරමුණට බිය අන්කිසිවක් නිසා නොව ඔවුන් රටටත් ජනතාවටත් වින කළ නිසාය.

■ උදේනි සමන් කුමාර

C M Y K

# මව්බිම 5 ශිෂ්‍යත්ව අවසාන සම්මන්ත්‍රණය හොරණදී

ගෝනපල සිංහ සමාජයේ මෙහෙයවීමෙන් හා 'මව්බිම' පුවත්පත අනුග්‍රහයෙන් වාර්ෂිකව පවත්වනු ලබන ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණය මෙවරද ජනවාරි 16 වැනි දින පැවැත්වේ. කුඹුක - නැගෙනහිර ප්‍රසන්ති උත්සව ශාලාවේදී උදෑසන 08 සිට මෙම සම්මන්ත්‍රණයේ දේශනය ජාතික රූපවාහිනියේ නැණ මිහිර අධ්‍යාපන වැඩසටහනේ ගුරුවරුයා වන 'මව්බිම' පුවත්පත් සම්පත්ධාරී රුවන් පී. කුමාර මහතා මෙහෙයවනු ලැබේ.

නොමිලේ පැවැත්වෙන මෙම සජීවී ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණය සමඟ ඔන්ලයින් තාක්ෂණය ඔස්සේද දිවයිනේ සියලු සිසු දරුවන්ට සම්බන්ධ වීමට අවස්ථාව සලසා ඇත. 076- 3287892 දුරකථන අංකය වෙත දරුවාගේ නම සහ පාසල සඳහන් කර whatsapp පණිවුඩයක් යොමු කිරීම මඟින් මවුබිමේ දරුවන් වෙනුවෙන් පිදෙන ශිෂ්‍යත්ව අත්වැල සමඟ සම්බන්ධ විය හැකිය.


# සමන්ත යහම්පත්ට ප්‍රතිභාපූර්ණ කලා අභිමානී සම්මානය



කලා සිත් රූ කලා පදනම හා අතුරුගිරිය ප්‍රජා පොලිස් ඒකකය එක්ව සංවිධානය කළ 'කලා සිත් රූ කලා සම්මාන - 2021' උළෙලේදී දශක තුනකටත් වැඩි කාලයක් පුවත්පත් කලාවටත්, සිනමා හා කලා ක්ෂේත්‍රයටත් සිදුකරන ලද මෙහෙවර උදෙසා 'ලංකාදීප' පුවත්පතේ විශේෂාංග කර්තෘ හා සිනමා කලා අතිරේකයේ සංස්කාරක සමන්ත යහම්පත් මහතාට 'ප්‍රතිභාපූර්ණ කලා අභිමානී' සම්මානය බස්නාහිර පළාත් නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා අතින් ලබාගත් අයුරු.

15 වැනි වරටත් කලා සිත් රූ කලා පදනමේ සභාපති දේශමාන්‍ය, රෝහණ කොස්තා මහතා සංවිධාන කළ මෙම සම්මාන උළෙල පසුගියදා ශාන්තා ලෝකගම අභයාරාම විහාරස්ථ ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

# ඌව පළාත් රාජ්‍ය සේවා සංගමයේ හිටපු සභාපති කලුරිය කරයි



ඌව පළාත් රාජ්‍ය සෞඛ්‍ය සේවා සංගමයේ හිටපු සභාපති, මුළු දිවයිනටම සාමවිනිසුරු, විශ්‍රාමලත් රෝහල් උපස්ථායක එච්.ටී. සිරිසේන මහතා අභාවප්‍රාප්ත විය.

දේහය පිළිබඳ අවසන් කටයුතු 15දා බදුල්ල පොදු සුසාන භූමියේදී සිදුකෙරිණි.

# එම්.එම්.බී.එල් පාත්ෆයින්ඩර් වසර 2022 සඳහා දීර්ඝ සේවා තිළිණලාභීහු



එම්.එම්.බී.එල් පාත්ෆයින්ඩර් සමූහ ව්‍යාපාරය සිය කාර්ය මණ්ඩලයේ දීර්ඝ සේවා කාලයක් ගත කරන ලද පිරිස අගය කරමින් තිළිණ ප්‍රදානය කරයි. පෞද්ගලික අංශයේ ආයෝජන මෙහෙයවන සමූහ ව්‍යාපාරයක් වන ආයතනය, දෙස් විදෙස් ප්‍රමුඛ සමාගම් සමඟ එකතුවී තරගකාරී නොවන සහ අනෙක් අංශවල අවධානයට ලක් නොවූ ක්ෂේත්‍ර ගණනාවක කටයුතු කරගෙන යයි. මූල්‍ය සේවා, ව්‍යාපාර යටිතල පහසුකම්, වෙළෙඳාම සහ බෙදාහැරීම, දේපොළ කළමනාකරණය, ඛනිජ තෙල් ආශ්‍රිත ක්‍රියාකාරකම්, තත්ත්ව සහතික නිකුත් කිරීම, ගුවන් සේවා, කෘෂිකර්ම හා සංචාරක කටයුතුවල නිරත සමාගම් ජාලයක් ව්‍යාපාරයට අයත්ය.

ප්‍රේමරත්න විදානපතිරණ, (ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරී - වසර 20) ගයනි පෙරේරා (ලේකම් - වසර 15) බර්නා ගුණතිලක (සමූහ ව්‍යාපාරයේ අධ්‍යක්ෂ - වසර 10) කේ.ඩී. ලියනගේ (නීති අධ්‍යක්ෂ - වසර 10) සහ එස්.ජේ.ඒ. නිමල් (ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරී - වසර 10) වසර 2022 සඳහා තිළිණ ලබාගත්හ. බර්නාඩ් ගුණතිලක මහතා එම්.එම්.බී.එල්. පාත්ෆයින්ඩර් සමූහ ව්‍යාපාරයේ නිර්මාතෘ මිලින්ද මොරගොඩ මහතා වෙතින් සිය දස වසරක සේවාව අගයමින් පිරිනමන ලද තිළිණ ලබාගත් අවස්ථාව ඡායාරූපයේ දැක්වේ.

# බූස්ටර් නොගත්තොත් තවත් රැල්ලක්

දිවයිනේ ප්‍රදේශ රැසකින් ඔමික්‍රෝන් ආසාදිතයන් වාර්තා වීමේ සංඛ්‍යාව ඉහළ ගොස් පැවැතීම හේතුවෙන් යළිත් කොරෝනා රැල්ලක් ඇතිවීමේ දැඩි අවදානමක් ඇති බවට ජාතික බෝවන රෝග විද්‍යායතනයේ කායික රෝග විශේෂඥ වෛද්‍ය ආනන්ද විජේවික්‍රම සඳහන් කරයි.

ඔමික්‍රෝන් ප්‍රභේදයේ සංකූලතා අවම වුවද පුද්ගලයන් අතර පැතිර යෑමේ හැකියාව ඉතාමත් ඉහළ බැවින් එන්නත්කරණයට යොමුවීම වැදගත් බවද වෛද්‍යවරයා කීය.

මෙතෙක් එන්නත්කරණයට ලක් නොවූ පුද්ගලයන් හැකි ඉක්මනින් එන්නත් ලබා ගත යුතු බවත් පළමු සහ දෙවන මාත්‍රා ලබා ගැනීම ඉතාමත් වැදගත් බව සහ තෙවැනි මාත්‍රාව පිළිබඳ පවතින මිථ්‍යා මත පසෙකලා බූස්ටර් එන්නත ලබා ගන්නැයිද වෛද්‍යවරයා ජනතාවගෙන් ඉල්ලීමක් කළේය.

පසුගිය 13 වැනිදා පැවැති මාධ්‍ය හමුවකට සහභාගි වෙමින් එන්නත් මාත්‍රා ලබා ගැනීමෙන් දරුණු ආබාධ ඇතිවූ බවට කිසිවකු වාර්තා වී නැතැයිද වෛද්‍යවරයා පැවැසීය.

ඇතැම් විද්‍යාඥයන්ගේ දත්තවලට අනුව කොරෝනා වයිරසය ආසාදනය වීමෙන් පසු යම් කාල සීමාවක් ඇතුළත මඳසරුභාවය වැනි තත්ත්වයන් ඇති විය හැකි බවට සොයාගෙන ඇතැයිද ඒ මහතා කීය.

■ තරිඳු නානායක්කාර


දිනුම් අදින ලද දිනය 2022.01.13 බ්‍රහස්පතින්දා www.nlb.lk නිල ප්‍රතිඵල NLB National Lotteries

මහජන සම්පත — දිනුම් වාරය : 4646 — දිනා ඇති මුළු මුදල රු.11,154,090.00
ජයග්‍රාහී අක්ෂරය S — ජයග්‍රාහී අංක 4 2 8 5 0 9
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 25,489,784.00

ගොවිසෙත — දිනුම් වාරය 2941 — දිනා ඇති මුළු මුදල රු.5,316,740.00
ඉංග්‍රීසි අක්ෂරය B — ජයග්‍රාහී අංක 05 10 63 64
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 66,263,738.40

මෙගා පවර් — ත්‍රිපල් ජැක්පොට් කෝටි 10 — දිනුම් වාරය 994 — දිනා ඇති මුළු මුදල රු.4,209,800.00
මීළඟ මෙගා සුපිරි ත්‍යාගය රු.167,002,597.20
මීළඟ පවර් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00
මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00
ඉංග්‍රීසි අකුර Y — සුපිරි අංකය 03 — ජයග්‍රාහී අංක 01 21 31 52

ධන නිධානය — දිනුම් වාරය 676 — දිනා ඇති මුළු මුදල රු. 2,813,400.00
ඉංගිසි අක්ෂරය D — ජයග්‍රාහී අංක 29 30 42 81
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 92,563,036.80

සුපිරි වාසනා — දිනුම් වාරය 1666 — දිනා ඇති මුළු මුදල රු.2,160,220.00
සුපිරි අංකය 15 — ජයග්‍රාහී අංක 19 47 48 51
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු.2,554,707.20

සෙවණ — දිනුම් වාරය 343 — දිනා ඇති මුළු මුදල රු.2,103,860.00
ඉංගිසි අක්ෂරය L — ජයග්‍රාහී අංක 13 44 68 86
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු.14,166,342.40

ජාතික ලොතරැයි මණ්ඩලය National Lotteries Board අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ.මුදලිගේ මාවත, කොළඹ 01. දු.ක.: 011-4607000, 011 - 4607001 - 2 ෆැක්ස් : 011-4669475


# 03 >> සියලු ශාන්තුවරයන්ගෙන් අසා දැනගත යුතු....

එතකොට අපිට තියෙන ප්‍රශ්නය පොලිසිය ඇයි හැන්දෑවේ තුනේ ඉඳලා පමණක් ඒ දර්ශන බලමුයි කිව්වේ කියන එකයි. උදේ ඉඳලම බලන්න තිබුණේ නැද්ද? හැන්දෑවේ තුනකුත් ගාණට තමයි අනිත් අය හතරදෙනාගේ දර්ශන එතැන සම්බන්ධව අපි දැක්කේ. එයින් අර මුනි කියන කෙනා තමයි දැන් ඔය අත්අඩංගුවට අරන් තියෙන්නේ. ඒ තැනැත්තාට තමයි සන්ක්‍රිස්තියන් පල්ලියේ ආරක්ෂාවට ශුද්ධ පවිත්‍ර කරන්න පැවරිලා තියෙන්නේ. එයා කොස්සක් අරගෙන ශුද්ධ පවිත්‍ර කරමින් කොරිඩෝවේ අයින දිගේ යන කොට මේ මනුස්සයා ඒ මුල්ලට ඇවිත් බිමට නැමිලා මොකක් හරි එකක් අරගෙන උඩින් තියන දර්ශනය පේනවා. අපි හිතනවා උදේ වරුවේ ආ මනුස්සයා අතන තියලා ගිය දේ තමයි මේ මනුස්සයා අරන් උඩින් තියන්නේ කියලා මුනි ඒ කියන මනුස්සයා ඒක තියලා ගැස්සිලා වගේ බලන් ඉන්නවා. බයවෙලා වගේ එතැනින් දුවලා එනවා. උදවු කරන කෙනාට දන්වන බව පේනවා. ඉන් පස්සේ දෙන්නම ගිහින් බලනවා වගේ පේනවා. පස්සේ පියතුමාට දැනුම්දෙන තත්ත්වයක් අපට දකින්නට ලැබෙනවා. මුනි කියන මනුස්සයා මේක තිබ්බා නම් ඒ මනුස්සයා ඕක අල්ලන්න ආයෙත් එතනට යයිද? ගිහිල්ලා ඉවර වෙලා ඕක අරන් උඩින් තියයිද? මේ කාරණා කිහිපයක් තියෙනවා මේ පොලිසිය ගෙනයන කතාව සත්‍යයෙන් තොරයි කියලා පෙන්නුම් කරන. කවුද මේක ගෙනල්ලා තිබ්බේ? ඒක හොයන්නේ නැතිව කොස්සෙන් අතුගාන බය වෙන මිනිහව අල්ලලා ඇතුළට දාන එක තමයි පොලිසිය කරලා තියෙන්නේ. සත්‍යය හරියට හෙළිදරව් කිරීමේ උත්සාහයක් එතන නැහැ. උත්සාහයක් තියෙනවා නම් උදය වරුවේ ඉඳලම දර්ශන බලන්න එපැයි! ඇයි කිව්වේ තුනෙන් පස්සේ විතරක් බැලුවම ඇති කියලා. අපිට පේනවා මේකේ ඇත්ත හොයනවට වැඩිය කතන්දරයක් ගොතන්න හදන වැඩක් හැටියට අපිට පේනවා. ඒ නිසා අර පොලිසියේ මේ ක්‍රියාදාමය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා. අහිංසක මිනිස්සුන්ව බිල්ලට දීලා මේකේ පිටිපස්සේ තියෙන කුමන්ත්‍රණය වහන්න අපේ ඉතිහාසය පුරාවටම පොලිසිය කරලා තියෙන දේවල් දිහා බලනකොට මේකත් ඒ වගේ එකක්ද කියලා අපිට ප්‍රශ්නයක් මතුවෙනවා. පොලිස්පතිතුමාත් මාධ්‍ය ප්‍රකාශත් ලොකු ස්ටේට්මන් දෙනවනේ එක එක චෝදනා කර කර. අවංක වෙන්න ඕන නිලධාරීන් පළමුව. දේශපාලන නායකයන්ට ගැතිකම් කරන්න නොවේ පොලිසිය තියෙන්නේ. මේක කුමන්ත්‍රණයක් හැටියටයි මම දකින්නේ. කතෝලික පල්ලිවල බයක් ඇති කරන්න කරපු වැඩක් හැටියටයි මම දකින්නේ. ඒ නිසා බොරු කරන්න එපා! ඔය යුනිෆෝම් එක ගලවලා ගෙදර යන්න. යුනිෆෝම් එකෙන් වැඩක් නැහැ ඇත්ත වෙනුවෙන් කතා කරන්න පොලිසියට බැරිකමක් තියෙනවානම් ..."

අගරදගුරු මැල්කම් රංජිත් හිමිපාණන්ගේ එම ප්‍රකාශයත් සමඟ පොලිස් විමර්ශනවලටද ගැටලු මතු වී ඇතැයි පොලිස් නිලධාරීහු පවසති.

අගරදගුරු හිමිපාණන්ගේ ප්‍රකාශය සම්බන්ධයෙන් මහජන ආරක්ෂක අමාත්‍ය රියර් අද්මිරාල් සරත් වීරසේකර මහතා ප්‍රකාශ කළේ සිද්ධිය සම්බන්ධයෙන් කෙරෙන විමර්ශන වැරැදියි කියන එක ඉතාම වැරැදි ප්‍රකාශයක් බවයි.

"ඇපලෝ රෝහලෙත් මේ වගේම සිද්ධියක් වුණා. වැසිකිළියේ බෝම්බයක් තියලා. ඒ බෝම්බය තියපු පුද්ගලයා තමයි රෝහල් අධිකාරියට වාර්තා කළේ. මෙතනත් බෝම්බය තියපු පුද්ගලයා තමයි පියතුමන්ට කියලා පොලිසියට දැන්වුව හැටියේ පොලිසිය එතනට ගියේ. පොලිසිය එතනට ගිහින් විමර්ශන කළා. හතර දෙනෙක්ව අත්අඩංගුවට ගත්තා. එතැන හිටියා අවුරුදු 13ක ළමයෙක්. ඒ ළමයා මහෙස්ත්‍රාත්වරිය ඉදිරියේ තමයි සාක්කි දුන්නේ මෙතන වැඩ කරන දෙමළ ජාතික මුනි කියන පුද්ගලයා ගැන. ඔහු ඒ බෝම්බය අඩංගු මල්ල දුන්නා කියලා කියනවා. ඒ පුද්ගලයා පිළිගන්නවා බෝම්බය තිබුණ මල්ල බිම තියලා මම තමයි බෝම්බය අරගෙන අල්තාරය උඩින් තිබ්බේ කියලා."

බෝම්බයකට හයිකරලා තියෙන පින් එක ගලවලා හඳුන්කූරක් දාලා ගිනිකූරු වට්ට දාලා රබර් පටියක් දාලා හඳුන්කූරු පත්තු වුණාට පස්සේ බෝම්බය පිපිරෙන විදියට තමයි හදලා තිබුණේ. ඒ පුද්ගලයාගේ පල්ලියේ කාමරය බලකොට එතන තියෙන ගිනිකූරු ගිනිපෙට්ටිය තියෙනවා. ගිනිපෙට්ටියේ ගිනිකූරු අඩුයි, පහළොවක් විතර. හඳුන්කූරු තියෙනවා ටේප් තියෙනවා. ඒක තමයි ඔහු අත්අඩංගුවට ගත්තේ. ඒක වැරැදියි කියලා කවුරු හරි කියනවා. නම් ඒක ඉතාම වැරැදි ප්‍රකාශයක්. තවත් නොණ්ඩි ගහන පුද්ගලයෙක් ඉන්නවා. එයාවත් හොයනවා. එකම දේ තමයි මේ වගේ තොරතුරු තියෙනවා නම් පල්ලියේ ඉන්න පියතුමන්ලගේ වගකීම තමයි ඒක පොලිසියට භාරදෙන එක. ඒක මාධ්‍යයට දුන්නට පස්සේ වෙන්නේ ඒකේ ඉන්න පුද්ගලයන්ට පුළුවන් හැංගිලා ඉන්න. එතකොට අපිට හොයන්න හම්බවෙන්නේ නැහැ. ඇපලෝ එකේ බෝම්බ තිබ්බ පුද්ගලයයි මේකේ බෝම්බ තියපු කෙනයි පිටිපස්සේ ඉන්න මහ මොළකාරයා කවුද කියලා හොයන්න ඇත්ත වශයෙන්ම ඒක සම්පූර්ණයෙන්ම රජයට සහ පොලිසියට අපකීර්තිමත්දායක තත්ත්වයක් ඇති කරන්නට තියෙන කුමන්ත්‍රණයක් හැටියටයි අපි දකින්නේ."

මේ අතර පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න මහතාද දේවස්ථානයෙන් අත්බෝම්බයක් හමුවීමේ සිද්ධියේ විමර්ශන ප්‍රගතිය සම්බන්ධයෙන් ප්‍රකාශයක් නිකුත් කරමින් කියා සිටියේ සිද්ධියට සම්බන්ධ සියලු පුද්ගලයන් කඩිනමින් නීතිය ඉදිරියට ගෙන ඒමට කටයුතු කරන බවයි.

"මේ සම්බන්ධයෙන් ප්‍රකාශ 14ක් සටහන් කරලා තියෙනවා. සියලු සාක්ෂි රැස්කරමින් විශ්ලේෂණය කරමින් තවදුරටත් විමර්ශන කරනවා මෙම සිද්ධියට අදාළ විමර්ශන මෙතෙක් අවසන් කරලා නැහැ."

සී.සී.ටී.වී. දත්ත සහ පරිවේෂණීය සාක්ෂි මඟින් පුද්ගල සාක්ෂි මඟින් අනාවරණය තොරතුරු මත වැඩිදුරටත් විමර්ශන සිදුකරමින් පවතිනවා. මේ විමර්ශන තවමත් තියෙන්නේ මූලික අදියරේ. අත්බෝම්බය දේවස්ථානය වෙත රැගෙන ආ පුද්ගලයා හෝ පුද්ගලයන් කවුරුන්ද? කුමන ප්‍රදේශයක සිට කුමන අරමුණක් සඳහා මෙය රැගෙන විත් තිබේද? මේ සඳහා යම් පිරිසක් කුමන්ත්‍රණය කර තිබේද? ආධාර අනුබල දුන් තැනැත්තන් කවුරුන්ද යන්න පිළිබඳවත් පූර්ණ විමර්ශනයක් සිදුකරනවා."

එමෙන්ම සිද්ධියට අදාළව මේ වන විටත් අධිකරණය වෙත කරුණු වාර්තා කර තිබෙන බවත් විමර්ශනවල ප්‍රගතිය සම්බන්ධයෙන් වැඩිදුර වාර්තා මඟින් අධිකරණය වෙත දැනුම් දීමටද කටයුතු කරන බවත් පොලිස්පතිවරයා අවධාරණය කළේය.

පොලිසිය ගැන විශ්වාසය නැතිවන ආකාරයෙන් ප්‍රකාශ නිකුත් කිරීම නිසා පොලිස් පරීක්ෂණ පවත්වාගෙන යෑම මහත් ගැටලුවක් වනු ඇතැයිද අමාත්‍යවරයා වැඩිදුරටත් සඳහන් කළේය.


ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර

(එක්සත් ජනපද ඩොලර් වලින් නාමනය කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර)

නිකුතුව සඳහා වන වෙන්දේසිය

ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව

ලංසු ඉදිරිපත් කිරීම : 2022 ජනවාරි මස 13 වන දින පෙ.ව. 11.00 සිට 2022 ජනවාරි මස 20 වන දින පෙ.ව. 10.00 දක්වා

මුදල් ගෙවීම : 2022 ජනවාරි මස 24 වන දින

- මුදල් වර්ගය ➢ එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩො.)
- නිකුතුවේ ප්‍රමාණය* හා පරිණත කාලය ➢ එ. ජ. ඩොලර් මිලියන 100; මාස 5, මාස 9, වසර 1 මාස 2, වසර 2 මාස 3 සහ වසර 4 මාස 6
- පොලී අනුපාතිකය ➢ ස්ථාවර අනුපාතිකය (සියළු පරිණත කාලයන් සඳහා) } තරගකාරී ලංසු මගින් තීරණය වූ ස්ථාවර පොලී අනුපාතිකය
- පොලී ගෙවීම ➢ අර්ධ වාර්ෂිකව
- අවම ආයෝජනය ➢ එ.ජ.ඩො. 10,000 සහ එ.ජ.ඩො. 10,000 හි ගුණිතයන්ගෙන්
- පැවරීම ➢ පිටසන් කර භාරදී ලියාපදිංචි කිරීම මගින්
- සුදුසුකම් ලත් ආයෝජකයින්** ➢ ආමුඛ ආයෝජන ගිණුම් (IIAs) හරහා ඔවුන්ගේ නේවාසික තත්ත්වයන් නොසලකා හරිමින් විදේශීය පුරවැසියන්,ආමුඛ ආයෝජන ගිණුම් හරහා අනේවාසික ශ්‍රී ලාංකිකයන්,පුද්ගලික විදේශ මුදල් ගිණුම් හිමියන්, ව්‍යාපාර විදේශ මුදල් ගිණුම් හෝ අක්වෙරළ බැංකු ඒකක,ආමුඛ ආයෝජන ගිණුම් හරහා ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගම් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචිව ඇති හවුල් ව්‍යාපාර,ආමුඛ ආයෝජන ගිණුම් හරහා ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවා ඇති රාජ්‍ය අරමුදල්, කලාපීය අරමුදල්, අන්‍යොන්‍ය අරමුදල්, ඒකකභාර සහ අනෙකුත් ආයතනික ආයෝජකයින්,ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලයලත් අලෙවි නියෝජිතයන් ලෙස පත් කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකු,විදේශ මුදල් තැන්පත් භාරගැනීමට අවසර දී ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්
- බදු ➢ ශ්‍රී ලංකාව තුළ පවතින බදු නීතීන්ට යටත්ව
- නිකුත් කරන කාර්යාලය ➢ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව
- බැඳුම්කර මිලදී ගැනීම සඳහා පත්කළ නියෝජිතයින් ➢ පහත දක්වා ඇති තෝරාගත් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන්
- ගෙවීම් නියෝජිත ➢ ලංකා බැංකුව
- බලපාන නීතිය ➢ ශ්‍රී ලංකාවේ බලපවත්නා නීති

'fopdd@cbsl.lk' යන විද්‍යුත් තැපැල් ලිපිනයට මුරපද සහිත pdf ආකෘතියෙන් ලංසු ඉදිරිපත් කළ යුතුය. එම මුරපද ලංසු භාරගන්නා අවසන් වෙලාවේ සිට මිනිත්තු 30ක් ඇතුළත 'fopdd@cbsl.lk' යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කළ යුතුය. (එනම් 2022.01.20 දින පෙ.ව. 10.00 සිට පෙ.ව. 10.30 දක්වා).

* පිළිගන්නා ප්‍රමාණය අමතරව 1.5 වාරයකින් ඉහළ නැංවීමේ හැකියාව ඇත.

** කොන්දේසි සහිතයි. කරුණාකර අදාල ඉදිරිපත් කිරීමේ ලියවිල්ල සලකා බලන්න.

*ඉහත නිකුතුව පිළිබඳ විස්තර 2022 ජනවාරි 12 දිනැති ඉදිරිපත් කිරීමේ ලියවිල්ලෙහි සඳහන් වේ.*

පත්කළ නියෝජිතයින්


**ඇකියුටි සෙකියුරිටීස් ලිමිටඩ්,** 4 වන මහල, ඇකියුටි නිවස, 53, ධර්මපාල මාවත, කොළඹ 3, දුර. 2206297, ෆැක්ස් 2206290, **ලංකා බැංකුව**, 7 වන මහල, ලංකා බැංකු ප්‍රධාන කාර්යාලය, ලංකා බැංකු මාවත, කොළඹ 1., දුර. 2448830, ෆැක්ස් 2448207, **කැපිටල් එලයන්ස් ලිමිටඩ්**, 5 වන මහල, ''මිලේනියම් හවුස්'', 46/58, නවම් මාවත, කොළඹ 2, දුර. 2317777, ෆැක්ස් 2317788, **කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී,** 21, සර් රසික් ෆරීඩ් මාවත, කොළඹ 1, දුර. 2330406, ෆැක්ස් 2384650, **ඩොයිෂ් බැන්ක් ඒ ජී කොළඹ ශාඛාව,** 86, ගාලු පාර, කොළඹ 3, දුර. 2447062, ෆැක්ස් 2449589, **ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී,** 73/5, ගාලු පාර, කොළඹ 3, දුර. 2442442, ෆැක්ස් 2440376, **ෆස්ට් කැපිටල් ට්‍රෙෂරිස් පීඑල්සී,** 2, ඩීල් පෙදෙස, කොළඹ 3, දුර. 2639898, ෆැක්ස් 2639899, **හබීබ් බැන්ක් ලිමිටඩ්,** 70 A, ධර්මපාල මාවත, කොළඹ 03. දුර. 2370390, ෆැක්ස් 2370389, **හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී,** එච්එන්බී ටවර්, 21 මහල, 479, ටී.බී. ජයා මාවත, කොළඹ 10, දුර. 2664664, ෆැක්ස් 2662832, **ඉන්දියන් බැන්ක්,** 356, ගාලු පාර, කොළඹ 3, දුර. 2447163, ෆැක්ස් 2447562, **ඉන්දියන් ඕවර්සීස් බැන්ක්,** 139, කෙලින් වීදිය, කොළඹ 11, දුර. 5324422, ෆැක්ස් 2447900, **එම්සීබී බැන්ක් ලිමිටඩ්,** 8, ලේඩින් බැස්ටියන් පාර, කොළඹ 1, දුර. 2448765, ෆැක්ස් 2448764, **නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී,** 40, නවම් මාවත, කොළඹ 2, දුර. 2448448, ෆැක්ස් 2440262, **නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී,** නො. 242, යූනියන් පෙදෙස, කොළඹ 2, දුර. 4711411, ෆැක්ස් 2370854, **එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්,** 400, ගාලු පාර, කොළඹ 3, දුර. 2425010, ෆැක්ස් 2574387, **පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී,** 450, ගාලු පාර, කොළඹ 3, දුර. 4667702, ෆැක්ස් 2565558, **මහජන බැංකුව**, 13 වැනි මහල, 75, මහජන බැංකු ප්‍රධාන කාර්යාලය, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 2, දුර. 2206783, ෆැක්ස් 2458842, **පබ්ලික් බැන්ක් බර්හාඩ්**, කොළඹ ශාඛාව, 340, ආර් ඒ ද මැල් මාවත, කොළඹ 3, දුර. 2576289, ෆැක්ස් 2573958, **සම්පත් බැන්ක් පීඑල්සී,** 110, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, කොළඹ 2, දුර. 2305841/2, ෆැක්ස් 2314940, **සෙලාන් බැන්ක් පීඑල්සී**, 3 වන මහල, සෙලාන් ටවර්ස්, 90, ගාලු පාර, කොළඹ 3, දුර. 2456337, ෆැක්ස් 4716111, **යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී**, 64, ගාලු පාර, කොළඹ 3, දුර. 2374100, ෆැක්ස් 2370593 **වෙල්ත් ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ්,** 102/1, ආචාර්ය එන් එම් පෙරේරා මාවත, කොළඹ 8, දුර. 2675091/4, ෆැක්ස් 2689605,

ආචාර්ය එම්. ඉසෙඩ්. එම්. ආසිම්
රාජ්‍ය ණය අධිකාරී / ලේඛකාධිකාරී
රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

30, ජනාධිපති මාවත, කොළඹ 01.

දුරකථන : 2477011 ෆැක්ස් : 2477687, 2477718 / 9
http:// www.cbsl.gov.lk


C M Y K




# දොඩම්පෙ මුදලාලි වගේ අප්සරා මැණිකෙත් 4 වැනි තට්ටුවෙන් වැටිල මැරුණෙ කොහොමද?

**"විවිධ සැක සංකා මතුවී තිබිණි. අප්සරාගේ මරණයට අදාළ පශ්චාත් මරණ පරීක්ෂණය කොළඹ පොලිස් මෘත ශරීරාගාරයේදී සිදුවුණු අතර එහිදී තීරණය වූයේ ඉහළක සිට පහළකට වැටීමෙන් සිදුවූ බාහිර හා අභ්‍යන්තර තුවාල හේතුවෙන් ඇගේ මරණය සිදුව ඇති බවය.**

**අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පිහිටා ඇත්තේ කොළඹ කොටුව යෝර්ක් වීදියේ පිහිටි මහ ලේකම් කාර්යාල ගොඩනැඟිල්ලේය. තට්ටු හයකින් සමන්විත වුවද මෙම ගොඩනැඟිල්ල ප්‍රසිද්ධියක් උසුලන්නේ හතරවැනි තට්ටුව කී විටය.**

පොලිස්පතිවරයාගේ සෘජු නියෝග මත මෙම ආයතනය විසින් සිදුකළ හා සිදුකෙරෙන විමර්ශන බොහෝය. සාමාන්‍ය පොලිසියක හා වෙනත් විමර්ශන ඒකකයන්ට විසඳිය නොහැකි අපරාධ විමර්ශනය කිරීම සඳහා රහස් පොලිසිය ස්ථාපිතය.

කාලයේ වැලි තලාවෙන් වැසී ගිය අපරාධ රැසක සුලමුල සොයා ගැනීමටත් ඊට සම්බන්ධ වූවන් කුමන තරාතිරමක බලපුළුවන්කරුවන් වුවද ඔවුන් නොයෙකුත් ක්‍රමවේද මඟින් කොටු කර ගැනීමටත් රහස් පොලිසිය අති දක්ෂය.

හෙළිකරගත නොහැකි සිදුවීම් සියුම් ලෙස විමර්ශනය කරමින් අනාවරණය කර ගැනීමට රහස් පොලිසියේ නිලධාරීන් දක්වන දක්ෂතාව හා පළපුරුදු බව නිසාදෝ රහස් පොලිසියේ සමහර නිලධාරීන්ගේ නම් කී පමණින් ඇතැම් පිරිස් අදත් ඔවුනට දක්වන්නේ කිසියම් බියකි. බලපුළුවන්කරුවන්, ව්‍යාපාරිකයන්, දේශපාලනඥයන් මෙන්ම ඉහළම තනතුරු හෙබවූ පොලිස් ලොක්කන් පවා රහස් පොලිසිය හමුවේ අසරණ වූ අවස්ථා එමටය.

කිසියම් පුද්ගලයකු අත්අඩංගුවට ගෙන විමර්ශනය කොට ඔවුන් නීතිය හමුවට ගෙන ඒමට අවශ්‍ය කරුණු කාරණා සොයා ගැනීමටත් අදාළ සාක්කි අධිකරණය හමුවේ ඉදිරිපත් කරමින් වරදකරුවන්ට නිසි දඬුවම් ලබාදීමටත් රහස් පොලිසිය විසින් සිදුකරන ලද විමර්ශන බෙහෙවින් බලපා තිබිණි. ඒ නිසා හතර වැනි තට්ටුව කී සැණින් වරදකරුවන්ට අදත් ඇත්තේ කිසියම් බියකි.

ඉකුත් 10 වන දින මෙවන් විමර්ශනයක යෙදුණු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන අංශය විසින් වයස අවුරුදු 46ක කාන්තාවක් අත්අඩංගුවට ගෙන තිබිණි.

2016 වසරේ සිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟහරිමින් තැන තැන සැඟව සිටි ඇය ඉකුත් 10 වැනිදා කළුබෝවිල ප්‍රදේශයේ රැඳී සිටින බවට නිලධාරියකුට ලැබුණු තොරතුරක් මත එසේ අත්අඩංගුවට ගැනිණි.

පන්නිපිටිය නියඳගල ප්‍රදේශයේ පදිංචිකාරියක් වූ ඇය රාජපක්ෂ මුදියන්සේලාගේ අප්සරා මැණිකේ නම් වූ තැනැත්තියකි. 10 වැනි දින දහවල් කාලයේදී රහස් පොලිස් නිලධාරීන් විසින් ඇය අත්අඩංගුවට ගෙන තිබුණේ මූල්‍ය වංචා රැසක් සිදු කොට වසර ගණනාවක් පොලිසියට කට්ටි පනිමින් සිටින මොහොතකය. එමෙන්ම එම මූල්‍ය වංචාව සම්බන්ධයෙන් ඇයට එරෙහිව පැමිණිලි 45ක්ද ලැබී තිබීම ඇය අත්අඩංගුවට ගැනීමට තවත් හේතුවක් විය.

ඉන් අනතුරුව රහස් පොලිසියේ 5 වැනි තට්ටුවේ පිහිටි විශේෂ විමර්ශන ඒකකය වෙත රැගෙන ගිය ඇයගෙන් නිලධාරීන් දීර්ඝ ලෙස ප්‍රශ්න කරන්නට විය. ඒ වැල්ලම්පිටිය, අංගොඩ, රාජගිරිය යන ප්‍රදේශවල දුප්පත් කාන්තාවන් සඳහා ණය දෙන සමිති ආරම්භ කරමින් ඔවුනට රුපියල් 50,000ක ණය මුදලක් උකස් හා ආයෝජන බැංකුවෙන් ලබාගත හැකි බව පවසමින් මුදල් වංචා කිරීම සම්බන්ධයෙන් කරුණු කාරණා විමසමින්ය. මෙම ණය මුදල් ලබා ගැනීම සඳහා ඇය ව්‍යාජ ලිපි ලේඛන සකස් කර ඇති බවත් එම ලේඛන ඉදිරිපත් කොට අදාළ බැංකුවෙන් රුපියල් ලක්ෂ 10, 12 හා 15 ආදී වශයෙන් මුදල්ද ඇය ලබාගෙන තිබිණි. ණය ඉල්ලුම් කරන ඉල්ලුම්කාරියන්ට එම මුදලින් රුපියල් 50,000ක් පමණක් ලබාදී ඉතිරි මුදල ඇය වංචා කිරීම සම්බන්ධයෙන්ද රහස් පොලිසිය ඇගෙන් ප්‍රශ්න කරන්නට විය.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන අංශයට කරන ලද පැමිණිල්ලකට අනුව සිදු කළ දීර්ඝ විමර්ශනයකින් පසු කූට ලේඛන සකස් කර අන් අයකු ලෙස පෙනී සිටිමින් රුපියල් 68,340,000ක මුදලක් වංචා කිරීම සම්බන්ධයෙන් ඇයට චෝදනා එල්ල වී තිබූ අතර මේ සඳහා ඇය නම් තුනකින් පෙනී සිට ඇති බවද අනාවරණය වී තිබේ.

10 වැනිදා දහවල් කාලයේදී අත්අඩංගුවට ගැනුණු අප්සරා ප්‍රශ්න කොට ප්‍රකාශ ලබා ගැනීමෙන් පසු 11 වැනි දින කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමේ බලාපොරොත්තුවෙන් ඇය රහස් පොලිස් ගොඩනැඟිල්ලේ පස්වැනි තට්ටුවේ රඳවා තැබීමට විමර්ශන නිලධාරිහු පියවර ගනු ලැබූහ. ඒ කාන්තා පොලිස් කොස්තාපල්වරියන් දෙදෙනකුගේ ආරක්ෂාව යටතේය.

රාත්‍රී කාලය උදා වෙද්දී ඇය නිතර නිතර එම නිලධාරිනියන්ට පවසා ඇත්තේ මුත්‍රා ආසාදනයක් ඇති බැවින් තමාට වැසිකිළි යෑමට අවශ්‍ය බවය. මධ්‍යම රාත්‍රිය ගෙවීයන විට ඇය පස් හය වතාවක්ම වැසිකිළියට ගොස් තිබුණාය. කෙසේ වෙතත් 11 වැනිදා අලුයම තුනට පමණ නැවතත් ඇයට මුත්‍රා ආසාදනය ඇතිවී ඇය ඒ බව ආරක්ෂාවට සිටි පොලිස් කාන්තාවන්ට කියා ඇතැයිද වාර්තා වේ.

සැකකරුවන් හා සැකකාරියන් සඳහා රහස් පොලිස් ගොඩනැඟිල්ල තුළ වෙනම වැසිකිළි ඇතත් දැන ගන්නට ඇති පරිදි ඇයගේ ආරක්ෂාවට සිටින පොලිස් නිලධාරිනියන් ඇය එවර රැගෙන ගොස් ඇත්තේ නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා භාවිත කරන වැසිකිළියක් වෙත යැයි කියවේ. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර පොලිස් අධිකාරිවරුන් සඳහා වෙන් කර තිබූ වැසිකිළියක් වෙත අප්සරා රැගෙන ගිය නිලධාරිනියන් ඇය සිය කර්තව්‍ය නිමා කොට පිටතට පැමිණෙන තුරු වැසිකිළිය අසලම රැඳී සිට ඇතැයිද කියති.

මොහොතක් ගත විය. වැසිකිළිය තුළට ගිය අප්සරාගේ හාවක් හූවක් නැති තැන එක් නිලධාරිනියක් වැසිකිළි දොර විවර කළද අප්සරා වැසිකිළිය තුළ නොසිටියාය. මින් කලබලයට පත් නිලධාරිනියන් ඒ සමඟම අප්සරාට වූ දේ සොයන්නට උත්සුක වෙද්දී ඇය පස්වැනි තට්ටුවේ වූ එම වැසිකිළියේ ජනේලයෙන් බිමට පැන ඇති බව අනාවරණය කර ගත හැකිවිය.

ඒ සමඟම රහස් පොලිසියේ ඉහළ නිලධාරීන්ද දැනුවත් කෙරිණි. ඒ වනවිටත් අප්සරාගේ සිරුර රහස් පොලිස් ගොඩනැඟිලි බිම සිපගෙන තිබිණි. ඒ අනුව රහස් පොලිස් නිලධාරීන් මෙන්ම පොලිස් මූලස්ථානයද නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේ අප්සරා පස්වැනි තට්ටුවෙන් බිමට පැන දිවි හානි කරගෙන ඇති බවය.

බිම වැටී සිටි අප්සරා මියගොස් ඇති බව අනාවරණය වීමත් සමඟ ඇගේ සිරුර රෝහල් මෘත ශරීරාගාරයේ තැන්පත් කෙරිණි. ඒ ඉදිරි විමර්ශන සඳහාය.

සිද්ධිය සැලවීමත් සමඟ රහස් පොලිසියේ උසස් නිලධාරීන්ද ඒ මොහොතේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණ සිටි අතර ඔවුන්ට අවශ්‍ය වූයේ අප්සරා කෙලෙස පස්වැනි තට්ටුවෙන් බිමට පැන්නේද යන්න දැන ගැනීම පමණි.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්ද අප්සරාගේ මරණය සම්බන්ධයෙන් පොලිස් අධිකාරිවරයකුගේ මෙහෙයවීමෙන් පරීක්ෂණයක් ඇරඹූ අතර ඊට අමතරව කොටුව පොලිසියද තවත් විමර්ශනයක් ආරම්භ කළේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාගෙන් ලද උපදෙස් අනුවය.

රහස් පොලිසියේ අධ්‍යක්ෂ ඇතුළු විශේෂ විමර්ශන ඒකකයේ නිලධාරිනියන් මෙන්ම අප්සරාගේ ආරක්ෂාව සඳහා යොදවා සිටි කාන්තා පොලිස් නිලධාරිනියන්ගෙන්ද ප්‍රකාශ සටහන් කරගනු ලැබිණි.

අප්සරා වැටී සිටි ස්ථානයටත් මෘත ශරීරාගාරයටත් ගොස් මහෙස්ත්‍රාත් පරීක්ෂණ සිදු කළ අතර ඉන් අනතුරුව අප්සරා මියගියේ කෙසේද යන්න දැන ගැනීම සඳහා පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදුකරන ලෙසද මහෙස්ත්‍රාත්වරයා අධිකරණ වෛද්‍යවරයාට දැනුම් දී ඇත.

කෙසේ වෙතත් අප්සරා රහස් පොලිසියේ පස්වැනි තට්ටුවෙන් බිමට පැන්නේද නැතහොත් ඇය බිමට වැටුණේද යන්න ගැන නිශ්චිත තීන්දුවක් තවමත් ලැබී නැත. මේ නිසා අප්සරාගේ මරණය ගැනද රටේ සමහරුන් තුළ

විවිධ සැක සංකා මතුවී තිබිණි. අප්සරාගේ මරණයට අදාළ පශ්චාත් මරණ පරීක්ෂණය කොළඹ පොලිස් මෘත ශරීරාගාරයේදී සිදුවුණු අතර එහිදී තීරණය වූයේ ඉහළක සිට පහළකට වැටීමෙන් සිදුවූ බාහිර හා අභ්‍යන්තර තුවාල හේතුවෙන් ඇගේ මරණය සිදුව ඇති බවය.

එම තීන්දුව කෙසේ වෙතත් අප්සරාගේ මරණය සැක සහිත බව සඳහන් කරමින් ඇගේ ස්වාමිපුරුෂයා සහ වැඩිමහල් සහෝදරයා නීතිඥවරියන් දෙදෙනකු අධිකරණයට ඉදිරිපත් කර තිබූ අතර එය සලකා බැලූ මහෙස්ත්‍රාත්වරයා මරණ පරීක්ෂණයේ සාක්ෂි විමසීම සඳහා ස්වාමිපුරුෂයා හා සහෝදරයා අධිකරණයට කැඳවන ලෙසටද නියෝග කර තිබිණි.

ඒ අනුව මෙම දෙදෙනාට අමතරව අප්සරා අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ සිටි පුද්ගලයන්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ අප්සරා රඳවා සිටි අවස්ථාවේ ඇය භාරව සිටි නිලධාරිනියන් හා රහස් පොලිසියේ වෙනත් ස්ථානවල රඳවා සිටි රැඳවියන්ද මරණ පරීක්ෂණය සඳහා සාක්ෂි ලබාදීමට අධිකරණයට කැඳවන ලෙස කොළඹ කොටුව මහෙස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ මහතා නියෝග කර තිබිණි.

කෙසේ වෙතත් මරණයට පත් අප්සරාගේ ආරක්ෂාව වෙනුවෙන් යොදවා සිටි පොලිස් නිලධාරිනියන් දෙදෙනාගේ සාක්ෂි විමසීම පැය 2ක කාලයක් පුරා සිදුකෙරිණි. ඒ අනුව මේ වන විට එම නිලධාරිනියන්ගේ සාක්ෂි විමසීම අවසන් බවද වාර්තාවේ. වැඩිදුර මරණ පරීක්ෂණ සාක්ෂි විමසීම් සහ වැඩිදුර වාර්තා සඳහා සිද්ධියට අදාළ නඩුව ලබන 21 වැනිදා කැඳවීමට නියම කෙරිණි.

අප්සරාගේ මරණය ගැන ඇතිව තිබෙන සැක සංකා තවමත් පහවී ගොස් නැත. ඇය සිය දිවි හානිකරගත් බවට ඇතැම් පාර්ශ්ව පිළිගන්නේද නැත. කෙසේ වෙතත් ඒ සම්බන්ධයෙන් නිවැරැදි නිගමනයක් ඉදිරි විමර්ශනවලදී දකින්නට ලැබෙතැයි අපේක්ෂා කෙරේ.

අත්අඩංගුවට පත්වූ පුද්ගලයන් පොලිස් භාරයේ සිටියදී මෙලෙස මියයෑම බරපතළ ගැටලුවකි. සාමාන්‍ය පොලිස් ස්ථානවලදී මෙවන් සිදුවීම් දකින්නට අහන්නට ඇතත් රහස් පොලිස් ගොඩනැඟිල්ලෙන් බිමට වැටී පුද්ගලයකු මරණයට පත්වීම එතරම් සුළු කොට තැකිය හැක්කක් නොවේ.

අත්අඩංගුවට පත්වන පුද්ගලයන් රහස් පොලිසිය තුළ රඳවා සිටින්නේ දැඩි ආරක්ෂාව සහිතවය. ලෙහෙසි පහසුවෙන් රහස් පොලිසියෙන් මිදී පලායෑමට හෝ දිවි තොර කර ගන්නටද ඒ නිසා ඇති ඉඩකඩ ඉතාමත් අල්පය. ඒ තරම් ආරක්ෂිත ස්ථානයක් වූ රහස් පොලිස් ගොඩනැඟිල්ලේ 4, 5, 6 තට්ටුවකින් පුද්ගලයකු බිමට පැන දිවි තොරකර ගැනීම දැඩි මත භේදයට තුඩු දෙන්නකි.

එමෙන්ම මෙහිදී තවත් ගැටලුවක් මතුවී ඇත. ඒ සැකකාරියන්ට නියමිත වැසිකිළි තිබියදීත් සහකාර පොලිස් අධිකාරිවරුන් ප්‍රයෝජනයට ගන්නා වැසිකිළියකට මෙම සැකකාරිය රැගෙන යෑමට ඇයගේ ආරක්ෂාවට සිටි නිලධාරිනියන් ක්‍රියා කළේ ඇයිද යන්නය. එමෙන්ම රහස් පොලිසියේ ජනේලයකින් බිමට පැනීමද එතරම් ලෙහෙසියෙන් කළ හැක්කක් නොවේ. එමෙන්ම මෙහි තවත් ගැටලුවක් වනුයේ කාන්තාවක් මෙලෙස බිමට පැන දිවි හානිකර ගන්නට තරම් සැහැසි වූයේ මන්ද යන්න සොයා බැලීමය.

ඒ කෙසේ වෙතත් රහස් පොලිසියේ පස්වැනි තට්ටුවෙන් බිමට පැන හෝ බිමට වැටී මරණයට පත්වූ ප්‍රථම කාන්තාවද අප්සරාය. රහස් පොලිසිය ගැන යළිත් සමාජය තුළ නොයෙකුත් කතිකා ඇති වූයේද අප්සරාගේ මරණයත් සමඟිනි.

එහෙත් රහස් පොලිසිය හතර වැනි තට්ටුව ලෙස කරළියට ආවේ අද ඊයේ නොවේ. ඒ 1966 වසරේදී රහස් පොලිස් අත්අඩංගුවට සිට මරණයට පත් දොඩම්පේ මුදලාලිගේ මරණයත් සමඟිනි. ඒ අදින් වසර 56කට පෙරාතුවය. දොඩම්පේ මුදලාලි රහස් පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන තිබුණේ එවකට පැවැති එක්සත් ජාතික පක්ෂ රජය පෙරළීම සඳහා කුමන්ත්‍රණයක් කළේ යැයි කියමිනි. එවිට රහස් පොලිසියේ ප්‍රධානියා ලෙස කටයුතු කළේ ආනා සෙනෙවිරත්න මහතාය.

1966 අප්‍රේල් 15 වැනි දින රත්නපුර ප්‍රදේශයේදී අත්අඩංගුවට ගැනුණු එල්.පී. පොඩි අප්පුහාමි නොහොත් දොඩම්පේ මුදලාලි ප්‍රශ්න කිරීම සඳහා ගෙන ආවේ හතර වැනි තට්ටුවටය.

රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණය සම්බන්ධයෙන් තොරතුරු දැන ගැනීම සඳහා දොඩම්පේ මුදලාලිගෙන් ප්‍රශ්න කළ එක් නිලධාරියකු වූයේ පොලිස් අධිකාරි කොන්රඩ් වීරතුංගය. අනෙක් නිලධාරියා රාහුල සිල්වාය. රාහුල බෙලිඅත්ත පොලිස් ස්ථානාධිපතිවරයා ලෙස සේවය කරමින් සිටියදී රහස් පොලිසිය වෙත කැඳවා තිබිණි.

රාහුල සිල්වා එවකට ප්‍රසිද්ධව සිටියේ නොයෙකුත් වධහිංසා දෙමින් සැකකරුවන්ගෙන් දක්ෂ ලෙස ප්‍රශ්න කරන නිලධාරියකු ලෙසය. රාහුල දොඩම්පේ මුදලාලිගෙන්ද එලෙස ප්‍රශ්න කරන්නට විය.

කෙසේ වෙතත් පහළොස්වැනිදා රහස් පොලිසියට ගෙනා දොඩම්පේ මුදලාලි ඊට පසුවදා හතර වැනි තට්ටුවෙන් බිමට පැන දිවි නසාගෙන ඇති බව රහස් පොලිසිය වාර්තා කළේය. මෙම සිදුවීම එකල පුවත්පත්වල පොල් ගෙඩි අකුරින් පළවිය. එම පුවත ලැව් ගින්නක් සේ පැතිර ගිය අතර දොඩම්පේ මුදලාලිගේ මරණය රට තුළ මහත් ආන්දෝලනයක් ඇති කරලීමටද සමත් විය.

දොඩම්පේ මුදලාලිගේ මරණය කෙසේ සිදුවිණිදැයි දැන ගැනීමට මේ නිසා ජනතාව තුළ මහත් උනන්දුවක් ඇති විය. කොටුව මහෙස්ත්‍රාත්වරයාද හතර වැනි තට්ටුවට ගොස් දොඩම්පේ මුදලාලි වැටුණු ස්ථානය නිරීක්ෂණය කළේය. ඉන් අනතුරුව මහෙස්ත්‍රාත්වරයා ගියේ කොළඹ මහ රෝහලේ මෘත ශරීරාගාරයටය.

දොඩම්පේ මුදලාලිගේ මුඛයෙන් ලේ ගලන බව දුටු මහෙස්ත්‍රාත්වරයා ඉන්පසු අධිකරණ වෛද්‍යවරයාට නියෝග කළේ පශ්චාත් මරණ පරීක්ෂණයක් පවත්වන ලෙසටය.

ඉන් අනතුරුව සාක්ෂි සටහන් කිරීම ඇරැඹිණි. එහිදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උප පොලිස් පරීක්ෂක එස්.ජී. සේනානායක මහතා පැවැසුවේ එවකට පැවැති රජය නෙරපීම සඳහා කුමන්ත්‍රණය කිරීමේ වරදට රත්නපුරේ සිට කොළඹ ගෙන ආ දොඩම්පේ මුදලාලිගෙන් 15 වැනිදා රාත්‍රියේ 11 සිට ප්‍රශ්න කිරීම් ආරම්භ කළ බවය.

ප්‍රශ්න කරමින් සිටි අවස්ථාවේ විවෘත කර තිබූ ජනේලයක් වෙත පැමිණ මුදලාලි එහි අගට කකුලක් තබා පිටතට පැන්න බවත් එය වළකා ගැනීමට නොහැකි වූ බවත් ඔහු පැවසීය.

"මුදලාලි මුලින්ම වැටුණේ ඇස්බැස්ටෝස් දමපු වහලයක් උඩට... ඒත් එක්කම වහලත් කඩාගෙන මුදලාලි බිමට වැටුණා. පුළුවන් ඉක්මනට මුදලාලි අරගෙන එක්සිඩන්ඩ් වෝඩ් එකට ගියා. ඒ වෙනකොටත් මුදලාලිට පණ තිබුණා. මොකද වුණේ කියලා ඩොක්ටර් අහද්දී මුදලාලි මුකුත් කිව්වේ නැහැ. වතුර ටිකක් ඉල්ලුවා."

මෙහිදී අධිකරණ වෛද්‍යවරයා සාක්ෂි දෙමින් කියා සිටියේ තට්ටු හතරකට උඩින් ඇස්බැස්ටෝස් වහලයට වැටීමෙන් පසුත් යළි වහල කඩාගෙන බිමට වැටීමෙන් ඇතිවූ තුවාල නිසා කම්පනය සහ අධික රුධිර වහනය වීමෙන් දොඩම්පේ මුදලාලිගේ මරණය සිදුව ඇති බවයි.

ඉන් අනතුරුව දොඩම්පේ මුදලාලිගෙන් ප්‍රශ්න කිරීම සිදුකළ පොලිස් අධිකාරිවරයාගෙන්ද සාක්ෂි විමසූ අතර ඔහු එවිට ප්‍රකාශ කළේ මුදලාලි පහළට පනින අයුරු තමා නොදැක්ක බවත් ඒ මොහොතේ තමා සිටියේ වෙනත් සැකකරුවකුගෙන් ප්‍රශ්න කරමින් බවත්ය.

අවසානයේ මහෙස්ත්‍රාත්වරයා නිගමනය කළේ දොඩම්පේ මුදලාලි හතර වැනි තට්ටුවක ජනේලයකින් බිමට පැන ඇති බවය. ඒ අනුව මුදලාලිගේ මරණය සියදිවි හානිකර ගැනීමක් බවට තීන්දු කෙරිණි.

කෙසේ වෙතත් සමාජය පිළිගත් මතය වූයේ මුදලාලි පැන්නා නොව තල්ලු කර දැමූ බවකි. මෙවන් සැකසංකා මතුවීමත් සමඟ ඊට වසර තුනහමාරකට පසු 1966 අගෝස්තු 3 වැනිදා දොඩම්පේ මුදලාලිගේ සොහොයුරකු වන සී.වී. ස්ටීවන් නමැත්තා දිවුරුම් ප්‍රකාශයක් අධිකරණයට ඉදිරිපත් කරමින් කියා සිටියේ දොඩම්පේ මුදලාලිගේ මරණය සැක සහිත බැවින් ඒ පිළිබඳ යළි මරණ පරීක්ෂණයක් පවත්වන ලෙසය. ඔහු ඒ සඳහා සාක්ෂි දීමට කැමැති අයගේ නම් ලැයිස්තුවක්ද අධිකරණයට ඉදිරිපත් කර තිබිණි.

ඒ අනුව 1966 සැප්තැම්බර් 22 වැනිදා යළි සාක්ෂි විමසීම ඇරැඹිණි. මෙහිදී සාක්ෂිකරුවන් දෙදෙනකුම පැවැසුවේ පොලිස් අධිකාරිවරයා තමන්ගෙන් ප්‍රශ්න කරද්දී දොඩම්පේ මුදලාලි යාබද කාමරයක මර ළතෝනි දෙන හඬ ඇසුණු බවය.

ටික වේලාවකට පසු තමන් රැඳුණු කාමරයේ දොර විවෘත කළ විට ඊට යාබද කාමරයේ දොඩම්පේ මුදලාලි නිරුවතින් උඩුබැලි අතට වැටී සිටින අයුරු දුටු බවත් ඔවුහු සාක්ෂි දෙමින් කීහ.

ඒ අවස්ථාවේ පොලිස් අධිකාරිවරයා රාහුල සිල්වාට දොඩම්පේ මුදලාලි මියගොස් දැයි බලන ලෙස නියම කළ බවත් නිලධාරීන් මුදලාලිව පුටුවක් මත වාඩි කිරීමට උත්සාහ ගත්තද ඔහුගේ බෙල්ල කඩා වැටී කෙළින් සිටගත නොහැකිව සිටි මුදලාලිට නිලධාරියකු පයින් පහර දුන් බවත් සාක්ෂිකරුවන් පවසා තිබිණි.

සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මත දොඩම්පේ මුදලාලිගේ මරණය ගැන සැකයක් ඇතිකර ගත් මහෙස්ත්‍රාත්වරයා දොඩම්පේ මුදලාලිගේ මරණය සියදිවි හානිකර ගැනීමක් නොව අනියම් මිනීමැරුමක් බවද ඉන් අනතුරුව තීන්දු කෙරිණි.

සිද්ධියෙන් පසු දොඩම්පේ මුදලාලිගෙන් ප්‍රශ්න කළ නිලධාරීන් දෙදෙනාම පොලිස් සේවයෙන් ඉවත්ව ගියහ. පසු කාලයේදී මුදලාලිට දස වධ දෙමින් ප්‍රකාශ ලබාගත් බව කියන පොලිස් නිලධාරියෙක් වූ රාහුල සිල්වාගේ මනස විකල් වී ගිය අතර ඔහු පැරැණි ගිටාරයක් ගෙලේ එල්ලාගෙන සුනඛයෙක් සමඟ මහමඟ ඇවිදමින්, අගුපිල්වල නිදාගනිමින් මරණයට පත්වූ අතර පොලිස් අධිකාරි කොන්රඩ් වීරතුංගට හටගත් රෝගයක් සුවපත් කර ගැනීමට නොහැකිව රට හැර ගොස් කලකට පසු ජීවිතක්ෂයට පත්වුණු බව වාර්තා විය.

මේ අනුව හතර වැනි තට්ටුවේ සිට පහළට වැටී මියගිය පළමු වැනි පිරිමි පුද්ගලයා ලෙස දොඩම්පේ මුදලාලි පොලිස් ඉතිහාසයට එක්වෙද්දී රහස් පොලිසියේ පස්වැනි තට්ටුවෙන් පැන සියදිවි හානිකරගත් බව කියන අප්සරා මැණිකේ පළමු වැනි කාන්තාව ලෙසද රහස් පොලිස් ඉතිහාසයට එක්විණි.

■ **කීර්ති මෙන්ඩිස්**

# ශාන්ත තෝමස් - ගේට්වේ තෙවැනි වාර්ෂික පාපන්දු තරගය



වමේ සිට දකුණට සිටගෙන තිලකා ජිනදාස, කණ්ඩායම් නායක - ක්‍රීඩා සංවර්ධන ගේට්වේ විද්‍යාලය, විනිටා ෂෙනොයි - විදුහල්පති ගේට්වේ විද්‍යාලය, ආචාර්ය හර්ෂ අලස් - සභාපති ගේට්වේ සමූහය, නිවෙන් නානායක්කාර - ශාන්ත තෝමස් විද්‍යාල කණ්ඩායමේ නායක, ඇලන් ප්‍රනාන්දු - ගේට්වේ විද්‍යාලයේ නායක, ශාන්ත තෝමස් විද්‍යාලයේ අධිපති පූජ්‍ය මාර්ක් බිල්ලිමෝරියා, එම විද්‍යාලයේ උප අධිපති අසංක පෙරේරා සහ එම විද්‍යාලයේ ප්‍රධානි චමින්ද බාලචන්ද්‍ර යන මහත්ම මහත්මීහු.



අභියෝගතා කුසලානය සමඟ විද්‍යාල දෙකේ නායකයන් - ශාන්ත තෝමස් විද්‍යාලයේ නායක නිවෙන් නානායක්කාර සහ ගේට්වේ විද්‍යාලයේ නායක ඇලන් ප්‍රනාන්දු.

**නෙවිල් ද අල්විස් - රැල්ෆ් අලස් අභියෝගතා කුසලානය සඳහා තරග වදින ශාන්ත තෝමස් විද්‍යාලය සහ ගේට්වේ විද්‍යාලය අතර පාපන්දු තරගයට සියල්ල සූදානම්ව ඇත. කීර්තිමත් අධ්‍යාපනඥයන් දෙපළකගේ නාමයන්ගෙන් නම් වූ මෙම කුසලානය ඔවුන් පෙනී සිටි මිත්‍රශීලීත්වය, ක්‍රීඩාශීලීත්වය සහ සමාන අවස්ථා යන සියලු දේ සිහිපත් කරවන්නකි. මෙම උත්සවයේ ගෞරව සම්භාවනීය ආරාධිතයා ලෙස ඒෂියා පියර්සන් එඩෙක්සෙල් ආයතනයේ කලාපීය අධ්‍යක්ෂ ප්‍රෙමිලා පෝල්රාජ් මහත්මියද ප්‍රධාන ආරාධිතයා ලෙස ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයට ඡන්දයෙන් තේරී පත්වූ නව සභාපතිවරයාද සහභාගි වනු ඇත.**

රත්මලානේ පිහිටි ගේට්වේ ආයතනයේ නව පාපන්දු ක්‍රීඩාංගණයේදී මෙම තෙවැනි වාර්ෂික තරගය ජනවාරි 22 සෙනසුරාදා පැවැත්වෙයි. 16න් පහළ සහ 20න් පහළ ශාන්ත තෝමස් සහ ගේට්වේ විද්‍යාලය අතර තරග සඳහාද 20න් පහළ ගේට්වේ විද්‍යාලය සහ කොළඹ ඕවර්සීස් ජාත්‍යන්තර පාසල අතර බාලිකාවන්ගේ සුහද තරගයකටද පළමු වරට මෙම වසරේදී ඇරඹෙන ශාන්ත තෝමස් සහ ගේට්වේ ආදි සිසුන් අතර තරගයටද සියලු කටයුතු සූදානම් බව ඒකාබද්ධ සංවිධායක කමිටුව සඳහන් කරයි.

පසුගිය තරගාවලි දෙකම ගේට්වේ විද්‍යාලය විසින් ජයග්‍රහණය කරන ලද්දේ ක්‍රීඩා පුහුණුකරු වන ජේම්ස් හීත් මහතාගේ මඟපෙන්වීම යටතේයි. ශාන්ත තෝමස් විද්‍යාලය ක්‍රීඩා පුහුණුකරු සිද්දික් මහතාගේ මඟපෙන්වීම යටතේ දෙවැනි තරග වාරයේදී වර්ධනයක් පෙන්විය. නිවෙන් නානායක්කාරගේ නායකත්වය යටතේ තරග වැදුණු ශාන්ත තෝමස් කණ්ඩායමත්, ඇලන් ප්‍රනාන්දුගේ නායකත්වය යටතේ තරග වැදුණු ගේට්වේ කණ්ඩායමත් යන කණ්ඩායම් දෙකම තාක්ෂණික ලෙස නිවැරදි හා සහජ දක්ෂතාවයෙන් පිරිපුන් ක්‍රීඩකයන්ගෙන් සමන්විත වන අතර මිත්‍රශීලී සටනක් සමඟ නරඹන්නන් වෙත ආස්වාදජනක ක්‍රීඩා තරගයක් දැක බලා ගැනීමේ පොරොන්දුව දෙයි.

ශාන්ත තෝමස් සහ ගේට්වේ විද්‍යාලයන් දෙකම මෙරට ක්‍රීඩාව වර්ධනය කිරීම සඳහා අඛණ්ඩව උත්සාහ ගනී. මෙම විද්‍යාල දෙක ඔවුන්ගේ ක්‍රීඩකයන් සඳහා කරන ආයෝජන තනි පුද්ගලයන් ලෙස ඔවුන්ට පමණක් ප්‍රතිලාභ හිමි කර දෙනවා නොව, ඔවුන්ගේ පාසල සහ ඔවුන්ගේ අභිමානවත් රට සාඩම්බර ලෙස නියෝජනයටද හේතුවෙයි. තම දීර්ඝ ඉතිහාසය තුළ ශාන්ත තෝමස් විද්‍යාලය ලෝක මට්ටමේ ක්‍රීඩකයන් බිහිකර ඇති අතර සාපේක්ෂව අඩු වයසක පසුවන ගේට්වේ විදුහලද ශ්‍රී ලංකාව නියෝජනය කරමින් රටට අභිමානය ගෙනා මලල ක්‍රීඩකයන්, පිහිනුම් ශූරයන්, පැසිපන්දු ක්‍රීඩකයන්, දැල් පන්දු ක්‍රීඩකයන් සහ පාපන්දු ක්‍රීඩකයන් ගණනාවක් බිහිකර ඇත.




ප්‍රධාන අනුග්‍රාහකයා විසින් චෙක්පත් ප්‍රදානය-ශාන්ත තෝමස් විද්‍යාලයේ අධිපති පූජ්‍ය මාර්ක් බිල්ලිමෝරියා, ඒෂියා ෆෝර් පියර්සන්හි කලාප අධ්‍යක්ෂ ප්‍රෙමිලා පෝල්රාජ් සහ ගේට්වේ සමූහයේ සභාපති ආචාර්ය හර්ෂ අලස්.



නිල ආහාර හවුල්කරු ලෙස මන්චි ආයතනයෙන් චෙක්පත ප්‍රදානය කොළඹ ශාන්ත තෝමස් විද්‍යාලයේ අධිපති මාර්ක් බිල්ලිමෝරියා, සිලෝන් බිස්කට් සමාගමේ අලෙවි කළමනාකරු රොමේෂ් ජයතිලක සහ ගේට්වේ සමූහයේ සභාපති ආචාර්ය හර්ෂ අලස්.






# සැබවින්ම ශ්‍රී ලාංකේය බැංකුව, පෑන් ඒෂියා බැංකුව බම්බලපිටිය ශාඛාව නවීනතම පහසුකම්වලින් සමන්විත නව නිවහනකට පිවිසෙයි



ජාතියේ අනන්‍යතාව අභිමානයෙන් ප්‍රකාශ කරන සැබවින්ම ශ්‍රී ලාංකේය බැංකුව වන පෑන් ඒෂියා බැංකුව එහි බම්බලපිටිය ශාඛාව, නවීන ශාඛාවක් බවට පත්කරන ලදී. නවීන පහසුකම්වලින් සමන්විත නව ශාඛාව උත්සවාකාරයෙන් විවෘත කිරීම පසුගියදා සිදුවිය. මෙම ගෞරවනීය අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස පෑන් ඒෂියා බැංකුවේ සභාපති ජයන්ත එස්.බී. රංගමුව මහතා සහභාගී වූ අතර ආරාධිත අමුත්තා ලෙස පෑන් ඒෂියා බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී නලින් එදිරිසිංහ මහතා ද සහභාගි විය. මෙම සුවිශේෂී අවස්ථාවට බැංකුවේ ඉහළ කළමනාකාරීත්වයේ සාමාජිකයන්, කාර්ය මණ්ඩලය සහ සේවා ලාභීන් රැසක් ද පැමිණ සිටියහ. පෑන් ඒෂියා බැංකුව ගෙන ඇති මෙම ප්‍රගතිශීලී ස්ථාවරය අගය කරමින් බැංකුවේ සභාපති ජයන්ත එස්.බී.රංගමුව මහතා සහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී නලීන් එදිරිසිංහ මහතා විශේෂ අවස්ථාව පිළිබඳව සිය අදහස් බෙදා ගත්හ. පැමිණ සිටි සියලු දෙනාගේ සුබ පැතුම් මධ්‍යයේ පළමු දින තැන්පතු භාර ගැනීමද එහිදී සිදුවිය.

මෙම අවස්ථාවට අදහස් දක්වමින් පෑන් ඒෂියා බැංකුවේ සභාපති ජයන්ත එස් බී.රංගමුව මහතා පැවසුවේ, "සැබවින්ම ශ්‍රී ලාංකේය බැංකුව ලෙස අපගේ ගමනේ නව පියවරක් සනිටුහන් කරන මෙම නවීනතම ශාඛාව විවෘත කිරීමට ලැබීම පිළිබඳව වඩාත් ආඩම්බර වන බවත්, එය බැංකු ක්ෂේත්‍රයේ ප්‍රමුඛස්ථානයට අපව ගෙන යාමට ඉවහල්වනු ඇති බවත්ය.එ මෙන්ම පෑන් ඒෂියා බැංකුව සැබවින්ම ශ්‍රී ලාංකේය බැංකුව ලෙස එහි අනන්‍යතාව ස්ථාපනය කිරීමත් සමඟින් පරිවර්තනීය ගමනක් ආරම්භ කර ඇති අතර,එය පෑන් ඒෂියා බැංකු ක්ෂේත්‍රයේ සුවිශේෂී අනන්‍යතාවක් ගොඩනැගීමට ඉවහල්වනු ඇත. එසේම සේවා ලාභීන්ට ඉහළ සේවා අත්දැකීමක් ලබා දීම සඳහා අනෙකුත් ශාඛා අති නවීන ශාඛා බවට පරිවර්තනය කිරීම සහ නව ශාඛා විවෘත කිරීම බැංකුවේ අරමුණ බවද සභාපතිවරයා මෙහිදී වැඩිදුරටත් පැවසීය. පෑන් ඒෂියා බැංකුව 2021 වසර තුළ ඉහළ මූල්‍ය කාර්ය සාධනයක් පෙන්නුම් කළේ, බැංකු අංශයට සහ රටට කෝවිඩ් 19 වසංගතයෙහි බලපෑම් වලට එරෙහිව සටන් කිරීමට සිදුවූ වටපිටාවක් තුළය. "සැබවින්ම ශ්‍රී ලාංකේයබැංකුව"ලෙස එහි ඇති සුවිශේෂී අනන්‍යතාව, සිය 26 වැනි වසර තුළ අද්විතීය මූල්‍ය විසඳුම් සහ උසස් පාරිභෝගික සේවාවක් ලබාදෙමින් රටපුරා සිටින සේවාලාභීන් රැසකට අපගේ සේවාවන් ලබා දීමට පෑන් ඒෂියා බැංකුවට හැකිවිය. පෑන් ඒෂියා බැංකුවේ නවීනතම ශාඛාව කොළඹ 04, ගාලු පාරේ අංක 343 දරන ස්ථානයේ පිහිටා ඇත.මෙම ශාඛාව පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා ව්‍යාපාරික කටයුතු සඳහා ඔබ වෙනුවෙන් විවෘතව පවතී.

## ලග්න වාසනාව

දිනය : 2022-01-13
දිනුම් වාරය : 3335 | වර්ණය : දුඹුරු
සුපිරි ජයමල්ල රු. 3,634,181.80

දිනුම් අංක: 09 11 50 53 — මේෂ

| තෑග රටාව | ජයග්‍රාහකයින් සංඛ්‍යාව | තෑග මුදල රු. | මුළු තෑග මුදල රු. |
|---|---|---|---|
| අංක 4 ක් සහ ලග්නය | - | 3,634,181/- | - |
| අංක 4 ක් | 2 | 500,000/- | 1,000,000/- |
| අංක 3 ක් සහ ලග්නය | 32 | 10,000/- | 320,000/- |
| අංක 3 ක් | 411 | 1,000/- | 411,000/- |
| අංක 2 ක් සහ ලග්නය | 1,561 | 200/- | 312,200/- |
| අංක 2 ක් | 17,330 | 100/- | 1,733,000/- |
| අංක 1 ක් සහ ලග්නය | 19,390 | 60/- | 1,163,400/- |
| එක් අංකයට | 216,516 | 20/- | 4,330,320/- |
| ලග්නයට | 67,764 | 20/- | 1,355,280/- |
| මුළු එකතුව | 323,006 | | 10,625,200/- |

දිනා ඇති මුළු මුදල රු. 10,625,200/-

ජයග්‍රාහී ටිකට් පත් මාස 6 ක් වලංගුවේ.

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය www.dlb.lk
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
අංක 356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 2,
ක්ෂණික ඇමතුම් : 011 4 824 824
ප්‍රතිඵල ක්ෂණික ඇමතුම : 011 2 333 778
ස්වයංක්‍රීය තොරතුරු අංකය : 011 4 825 825

## ශනිදා

දිනය: 2022.01.13
දිනුම් වාරය: 3784
රතු
බ්‍රහස්පතින්දා

ජයග්‍රාහී අංක: 03 06 29 64 — ඉංග්‍රීසි අක්ෂරය: E

| තෑග රටාව | ජයග්‍රාහකයින් සංඛ්‍යාව | තෑග මුදල රු. | මුළු තෑග මුදල රු. |
|---|---|---|---|
| ජය අංක 04 සමග ඉංග්‍රීසි අක්ෂරයට | - | 47,620,767.60 | - |
| ජය අංක 04ට | - | 1,000,000/- | - |
| ජය අංක 03ක් සමග ඉංග්‍රීසි අක්ෂරයට | 3 | 100,000/- | 300,000/- |
| ජය අංක 03කට | 103 | 2,000/- | 206,000/- |
| ජය අංක 02ක් සමග ඉංග්‍රීසි අක්ෂරයට | 234 | 1,000/- | 234,000/- |
| ජය අංක 02කට | 6,029 | 100/- | 602,900/- |
| ජය අංක 01ක් සමග ඉංග්‍රීසි අක්ෂරයට | 3,703 | 100/- | 370,300/- |
| ජය අංක 01කට | 92,130 | 20/- | 1,842,600/- |
| ඉංග්‍රීසි අක්ෂරයට | 15,643 | 20/- | 312,860/- |

දිනා ඇති මුළු මුදල රු. 3,868,660/-

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය ප්‍රතිඵල සඳහා වෙබ්අඩවිය www.dlb.lk
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02. දුරකථන: 0112 333 546-47
ක්ෂණික: 0114 824 824, 0112 333 778 හෝ 1919
SMS: DLB<space>LOT<space>SF යොදා 1919 ට යොමු කරන්න
ස්වයංක්‍රීය හඬ සම්බන්ධතා සඳහා 0114 825 825 අමතන්න

## සුපර් බෝල් (SUPER BALL)

දිනුම් වාරය 1623
දිනය 2022.01.13
වර්ණය කොළ
දවස බ්‍රහස්පතින්දා

ජයග්‍රාහී අක්ෂරය සහ අංක: M 01 06 08 19

| තෑග රටාව | ජයග්‍රාහකයින් ගණන | තෑග මුදල (රු.) | මුළු තෑග මුදල (රු.) |
|---|---|---|---|
| අංක 4 සමඟ ඉංග්‍රීසි අක්ෂරයට | - | 54,195,532/- | - |
| අංක 4 කට | - | 1,000,000/- | - |
| ඕනෑම අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අක්ෂරයට | 1 | 100,000/- | 100,000/- |
| ඕනෑම අංක 3 කට | 93 | 2,000/- | 186,000/- |
| ඕනෑම අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අක්ෂරයට | 149 | 1,000/- | 149,000/- |
| ඕනෑම අංක 2 කට | 4,711 | 100/- | 471,100/- |
| ඕනෑම අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අක්ෂරයට | 3,059 | 40/- | 122,360/- |
| ඕනෑම අංක 1 කට | 75,048 | 20/- | 1,500,960/- |
| ඉංග්‍රීසි අක්ෂරයට | 13,159 | 20/- | 263,180/- |
| මුළු ගණන | 96,220 | | 2,792,600/- |

දිනා ඇති මුළු මුදල රු. 2,792,600/-

ජයග්‍රාහී ටිකට්පත් මාස 6ක් වලංගු වේ.

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02.
ප්‍රතිඵල සඳහා වෙබ් අඩවිය: www.dlb.lk
දුරකථන: 0112 333 546-47 ක්ෂණික: 0114 824 824, 0112 333 778 හෝ 1919
SMS: DLB<space>LOT<space>SB යොදා 1919 ට යොමු කරන්න.
ස්වයංක්‍රීය හඬ සම්බන්ධතා සඳහා 0114 825 825 අමතන්න.

## අද කෝටිපති (ADA KOTIPATHI)

කෝටි 5 ඇරඹෙන සුපිරි ජයමල්ල
බ්‍රහස්පතින්දා
දිනුම් වාරය: 1449
වර්ණය: තද නිල්
දිනය: 2022.01.13

ජයග්‍රාහී අංක: 01 36 44 75 — ඉංග්‍රීසි අක්ෂරය: C

| තෑග රටාව | ජයග්‍රාහකයින් සංඛ්‍යාව | තෑග මුදල රු. | මුළු තෑග මුදල රු. |
|---|---|---|---|
| අංක 4 සහ ඉංග්‍රීසි අක්ෂරය | - | 51,798,388/- | - |
| ඕනෑම අංක 4කට | - | 1,000,000/- | - |
| අංක 3ක් සහ ඉංග්‍රීසි අක්ෂරය | 8 | 100,000/- | 800,000/- |
| ඕනෑම අංක 3කට | 113 | 2,000/- | 226,000/- |
| අංක 2ක් සහ ඉංග්‍රීසි අක්ෂරය | 255 | 1,000/- | 255,000/- |
| ඕනෑම අංක 2කට | 6,490 | 100/- | 649,000/- |
| අංක 1ක් සහ ඉංග්‍රීසි අක්ෂරය | 4,056 | 100/- | 405,600/- |
| ඕනෑම අංක 1කට | 102,047 | 20/- | 2,040,940/- |
| ඉංග්‍රීසි අක්ෂරයට | 17,873 | 20/- | 357,460/- |

දිනා ඇති මුළු මුදල රු. 4,734,000/-

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය ප්‍රතිඵල සඳහා වෙබ්අඩවිය www.dlb.lk
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02.
දුරකථන: 0112 333 546-47 ක්ෂණික: 0114 824 824, 0112 333 778 හෝ 1919 ට යොමු කරන්න
ස්වයංක්‍රීය හඬ සම්බන්ධතා සඳහා 0114 825 825 අමතන්න

## කෝටි 12 කප්රුක (KAPRUKA)

දිනුම් වාරය: 799 | වර්ණය: තැඹිලි
දිනය: 2022.01.13 | බ්‍රහස්පතින්දා

ඉංග්‍රීසි අක්ෂරය, සුපිරි අංකය සහ ජයග්‍රාහී අංක: W 22 (සුපිරි අංකය) 06 42 68 76

| තෑග රටාව | ජයග්‍රාහකයින් සංඛ්‍යාව | තෑග මුදල රු. | මුළු තෑග මුදල රු. |
|---|---|---|---|
| අංක 4 සමඟ ඉංග්‍රීසි අක්ෂරය සහ සුපිරි අංකය | - | 203,502,967/- | - |
| අංක 4 සහ ඉංග්‍රීසි අක්ෂරය | - | 10,000,000/- | - |
| අංක 4 සහ සුපිරි අංකය | - | 5,000,000/- | - |
| ඕනෑම අංක 4 කට | - | 1,000,000/- | - |
| අංක 3 ක් සහ ඉංග්‍රීසි අක්ෂරය | 04 | 100,000/- | 400,000/- |
| ඕනෑම අංක 3 කට | 101 | 2,000/- | 202,000/- |
| අංක 2 ක් සහ ඉංග්‍රීසි අක්ෂරය | 228 | 1,000/- | 228,000/- |
| ඕනෑම අංක 2 කට | 5,494 | 100/- | 549,400/- |
| අංක 1 ක් සහ ඉංග්‍රීසි අක්ෂරය | 3,519 | 100/- | 351,900/- |
| ඕනෑම අංක 1 කට | 88,622 | 20/- | 1,772,440/- |
| ඉංග්‍රීසි අක්ෂරයට | 15,456 | 20/- | 309,120/- |

දිනා ඇති මුළු මුදල රු. 3,812,860/-

මීළඟ සුපිරි ජයමල්ල රු. 203,802,787/-

ජයග්‍රාහී ටිකට් පත් මාස 6 ක් පමණක් වලංගු වේ.

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය ප්‍රතිඵල සඳහා වෙබ් අඩවිය www.dlb.lk
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02.
දුරකථන: 0112 333 546-47
දුක: 0114 824 824, 0112 333 778 හෝ 1919
SMS: DLB<space>LOT<space>KK යොදා 1919 ට යොමු කරන්න.
ස්වයංක්‍රීය හඬ සම්බන්ධතා සඳහා 0114 825 825 අමතන්න.

## සංවර්ධන වාසනාව

දිනුම් වාරය : 476
පාට : නිල්
දිනය : 2022-01-13

ඉංග්‍රීසි අක්ෂරය: M — ජයග්‍රාහී අංක: 10 19 13 — දෛව අංකය: 1

| තෑග රටාව | ජයග්‍රාහකයින් සංඛ්‍යාව | තෑග මුදල රු. | මුළු තෑග මුදල රු. |
|---|---|---|---|
| ජය අංක 3 සමග දෛව අංකය සහ ඉංග්‍රීසි අක්ෂරයට | - | 12,526,644/- | - |
| ජය අංක 3 සමග දෛව අංකයට | - | 500,000/- | - |
| ජය අංක 3 සමග ඉංග්‍රීසි අක්ෂරයට | - | 100,000/- | - |
| ජය අංක 3ට | 6 | 50,000/- | 300,000/- |
| ජය අංක 2ක් සමග දෛව අංකය සහ ඉංග්‍රීසි අක්ෂරයට | 2 | 10,000/- | 20,000/- |
| ජය අංක 2ක් සමග දෛව අංකයට | 116 | 500/- | 58,000/- |
| ජය අංක 2ක් සමග ඉංග්‍රීසි අක්ෂරයට | 49 | 500/- | 24,500/- |
| ජය අංක 1ක් සමග දෛව අංකය සහ ඉංග්‍රීසි අක්ෂරයට | 156 | 200/- | 31,200/- |
| ජය අංක 1ක් සමග දෛව අංකයට | 3,636 | 100/- | 363,600/- |
| ජය අංක 2කට | 876 | 100/- | 87,600/- |
| ජය අංක 1ක් සමග ඉංග්‍රීසි අක්ෂරයට | 1,137 | 100/- | 113,700/- |
| දෛව අංකයට | 26,403 | 20/- | 528,060/- |
| ජය අංක 1කට | 29,342 | 20/- | 586,840/- |
| ඉංග්‍රීසි අක්ෂරයට | 9,509 | 20/- | 190,180/- |
| එකතුව | 71,232 | | 2,303,680/- |

මීළඟ සුපිරි ජයමල්ල රු. 12,639,524/-

2022 ජනවාරි මස 15 වෙනි සෙනසුරාදා
මීළඟ දිනුම් ඇදීමට වලංගු වන්නේ රතු පැහැති ටිකට් පත්‍ය.
ජයග්‍රාහී ටිකට් පත් මාස 6 ක් වලංගුවේ.

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය www.dlb.lk
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
අංක 356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත. යූනියන් පෙදෙස, කොළඹ 2,
දුරකථන: 011 2 333 546-47 ක්ෂණික ඇමතුම්: 0114 824 824
ප්‍රතිඵල ක්ෂණික ඇමතුම: 011 2 333 778
ස්වයංක්‍රීය තොරතුරු අංකය: 011 4 825 825

C M Y K

# සුපිරි පොලිස් මෙහෙයුමකින් ඝාතකයා බෙල්ලෙන්ම ඇල්ලූ හැටි

## අවුරුදු 5ක අබිරහසක්

## නින්ජා පන්නයේ අපරාධයක්

**කිනම් ප්‍රදේශයක මිනිස් ඝාතනයක් සිදුවූ වහාම ඊට වගකිවයුත්තන් සොයා විමර්ශන ඇරැඹීම අදාළ වසමේ පොලිසිය සතු කාර්ය භාරය වුවද සමහරක් උසස් නිලධාරීන් ඒ සඳහා වෙනත් විමර්ශන කණ්ඩායම්ද පත්කරති. කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකයද එවන් විමර්ශන ඒකකයකි. උසස් නිලධාරීන් මෙවන් විමර්ශන ඒකකවලට එවන් විමර්ශන පවරන්නේ වසම්වල පවත්වාගෙන යන පොලිසිවල ඇති කාර්යබහුල බව හේතුවෙනි.**

මේ සඳහා දිවයිනේ සෑම පොලිස් කොට්ඨාසයක් භාරව කොට්ඨාස අපරාධ විමර්ශන ඒකක ස්ථාපිතව පවතී. එම ඒකකය වෙත විමර්ශන භාර කිරීම කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාගේ නියෝග මත සිදුකෙරේ.

ඉකුත්දා අත්තනගල්ලේ කෝටිපති ව්‍යාපාරිකයකු පැහැරගෙන යෑමට උත්සාහ කළ අපරාධ කල්ලියක සාමාජිකයන් පැය දෙකක් ඇතුළත හඳුනාගෙන ඔවුන් නීතිය ඉදිරියට ගෙන ඒමට දායක වෙමින් සාර්ථක විමර්ශනයක් සිදුකළ ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකය තවත් මිනිස් ඝාතනයක සුළ මුල අනාවරණය කරගන්නේ එම ඝාතනය සිදුකළ කණ්ඩායමේ මහ මොළකරුද කොටුකර ගනිමිනි.

එම මිනීමැරුම වසර පහකට ආසන්න කාලයක් පොලිස් පොත්වල සටහන් වී තිබුණේ නොවිසඳුණු අපරාධයක් ලෙසය. ඒ සම්බන්ධයෙන් අවධානය යොමුකළ ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඉන්දික ද සිල්වා මෙම නොවිසඳුණු මිනිස් ඝාතනය ගැන කරුණු යළි අධ්‍යයනය කර ඊට සම්බන්ධ වූවන් අත්අඩංගුවට ගන්නා ලෙස ඔහු යටතේ පවත්වාගෙන යන ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සුමිත් ගුණවර්ධන ඇතුළු කණ්ඩායමට පැවරුවේ සුමිත්ගේ විමර්ශන සම්බන්ධයෙන් පැහැදීමක් තිබූ නිසාය.

ඒ අනුව එම මිනිස් ඝාතනය සිදුව තිබුණේ 2017 ඔක්තෝබර් මස 31 වැනිදාය. සිද්ධියෙන් මිය ගොස් සිටියේ ත්‍රිරෝද රථ රියැදුරකු වූ රුවන් කුමාර නමැති 35 හැවිරිදි දෙදරු පියෙකි. ඔහු මරා දමා තිබුණේ පිහි පහර එල්ල කරමිනි.

රුවන් කුමාරගේ ඝාතනය සම්බන්ධයෙන් විමර්ශන සිදුකළේ මීරිගම පොලිසිය විසිනි. මීරිගම පොලිස් අපරාධ විමර්ශන අංශය මේ සම්බන්ධයෙන් විමර්ශන සිදුකරමින් රුවන් කුමාරගේ බිරිය ඇතුළු ඔහුගේ ඥාතීන්ගෙන් ප්‍රකාශ ලබාගෙන තිබිණි. රුවන් කුමාරට පිහියෙන් ඇනින මොහොතේ සිද්ධිය ඇසින් දැක තිබුණේ ඇගේ බිරිය හා නිවෙසේ සිටි සෙසු පාර්ශ්වය විසිනි. එහෙත් මේ කිසිවකුට රුවන් කුමාරගේ ඝාතකයන් හඳුනාගත නොහැකි වූයේ ඝාතකයන් මුහුණු ආවරණය කර සිටි බැවිනි.

රුවන් කුමාර ඝාතනයට ලක්වූයේ ඔහු පදිංචි ගම්පහ, වේවැල්වත්ත ප්‍රදේශයේ නිවෙස තුළදීය. සිය නිවෙසට ආසන්නයේ ඔහු නව නිවෙසක් ඉදිකරමින් සිටියේය. තිස්වැනිදා රාත්‍රියේ පැරැණි ගෙදර ඔහු නින්දට ගියේ බිරිය හා දරු දෙදෙනාද සමඟිනි. ඊට යාබද කාමරයක රුවන් කුමාරගේ සොහොයුරා නින්දට ගියේ නව නිවෙසේ තැනීම් කරන පෙදරේරුවන් දෙදෙනාද සමඟිනි. නිවෙසේ තවත් කොනක රුවන්ගේ බිරියගේ මව නිදාගෙන සිටියාය. ඒ වනවිට ධාරානිපාත වර්ෂාවක් පතිත වෙමින් තිබිණි. වේලාව රාත්‍රි දොළහට ආසන්න වී තිබිණි. එහෙත් රුවන් කුමාරගේ සොහොයුරා නින්දත් නොනින්දත් අතර කාලය ගත කළ අතර ඒ මොහොතේ නිවෙසට ඇතුළු වූ ඝාතකයන් මුලින්ම සිදුකළේ රුවන් කුමාරගේ සොහොයුරාට හා පෙදරේරුවන්ට කාමරයෙන් පිටතට පැමිණීමට නොහැකි වනසේ එහි අගුළු ලණුවලින් බැඳ දැමීමය. ඒ සමඟම නිවෙසේ විදුලිය විසන්ධි විය. ඉන් අනතුරුව නිවෙස තුළට කඩා වැදුණු අපරාධකරුවෝ බිරිය හා දරුවන් සමඟ නිදා සිටි රුවන් නිවෙසින් පිටතට ඇදගෙන යන්නට උත්සාහ කළහ. මින් බියට පත් බිරිය සිය සැමියා බේරාගන්නට දැඩි උත්සාහයක යෙදුණද බිරියටද පිහි පහර එල්ල කළ අපරාධකරුවෝ රුවන් කුමාර නිවෙසින් පිටතට ගෙන යෑමට උත්සුක වූහ. තම සැමියා ඝාතකයන් අතට හසුවූ බව දත් බිරියත්, නැන්දම්මාත් වහා යාබද කාමරයේ නිදා සිටි රුවන්ගේ සොහොයුරා අවදි කරගන්නට උත්සාහ කළහ. එහෙත් ඒ මොහොතේ රුවන් කුමාරගේ සොහොයුරා හා පෙදරේරුවන්ටද නිවැසියන් කෑකෝ ගසන හඬ ඇසී ඔවුන්ද අවදිව සිටියහ. එහෙත් ඔවුන්ට කාමරයෙන් පිටතට ඒමට නොහැකිවිය. ඒ ඔවුන් සිටි කාමරයේ දොරගුළු පිටතින් ලණුවලින් බැඳ දමා තිබූ හෙයිනි.

කෙසේ හෝ රුවන් කුමාරගේ බිරිය හා නැන්දම්මාගේ උත්සාහයෙන් රුවන් කුමාරගේ සොහොයුරා හා පෙදරේරුවන් කාමරයෙන් පිටතට ආවද ඒ වනවිටත් පැමිණි පිරිස් පලාගොස් සිටියහ. පිහි ඇනුම් කෑ රුවන් කුමාර ඒ වනවිටත් නිවෙස ඉදිරිපිට මිදුලේ ලේ විලක් මැද වැටී සිටියේය. රුවන් කුමාර ඔසවා ගත් නිවැසියෝ ඔහු වතුපිටිවල රෝහලට රැගෙන ගියහ. එහෙත් ඊට පසුදා රුවන් රෝහලේදීම මිය ගියේය.

මීරිගම පොලිසිය රුවන්ගේ ඝාතනය සම්බන්ධයෙන් නිවැසියන්ගෙන් ප්‍රකාශ ලබාගෙන විමර්ශනයක් ඇරැඹුවද පස් වසරක් ගත්වන තුරුම ඝාතකයන් කොටුකර ගැනීමට මීරිගම පොලිසියට නොහැකි විය.

රුවන් කුමාරගේ සම්බන්ධයෙන් යළි විමර්ශන ආරම්භ කළ ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන නිලධාරීන් මුලින්ම කළේ රුවන් කුමාරගේ වතගොත සොයා බැලීමය.

එහිදී නිලධාරීන් අනාවරණය කරගත්තේ රුවන් කුමාර ත්‍රිරෝද රිය පැදවීමට අමතරව 'බූරු' ගැසීමේද නිරත වන බවයි. 'බූරු' ගැසීම සිය නිවෙස තුළද කරගෙන ගොස් ඇති මොහු 'සුදු' ක්‍රීඩාව සඳහා වෙනත් පළාත්වලටද යන බව නිලධාරීන් අනාවරණය කර ගත්තේය. මේ නිසා ඔහුගේ අතමිට සරුවී තිබූ අතර එම මුදලින් අතේ කරේ රන් ආභරණද ඔහු පැලඳ ගෙන සිට ඇත. ඒ නිසා පොලිසිය සැකකළේ අපරාධකරුවන් ඔහු සතුව ඇති මුදල් හෝ රන් ආභරණ කොල්ලකෑමේ අරමුණෙන් ඔහුගේ නිවෙසට පැමිණියේද යන්නය. 'සුදු' ක්‍රීඩාවට අමතරව මුදල් පොලියට දීමද ඔහු සිදුකර ඇති බැවින් නිලධාරීන්ගේ සැකය ඒ වෙතම එල්ල වී තිබිණි.

"මේ නිසා අපි මුලින්ම රුවන් කුමාර ළඟින්ම ඇසුරු කළ අය කවුද කියලා හොයලා බැලුවා. මොකද ඒ දවස්වල මිනිහා දිගටම බූරුවා ගහලා දිනලා තිබුණා. මේ නිසා අන්තිම දවස් දෙක තුනේ රුවන් එක්ක බූරුවා ගහපු අය කවුද කියලත් හොයලා බැලුවා."

"එතකොට අපිට දෙතුන් දෙනකුගේ නම් ගම් හොයාගන්න පුළුවන් වුණා. ඉන් පස්සේ අපි හොයලා බැලුවා ඒ දෙතුන් දෙනාගෙන් අපරාධවලට සම්බන්ධ අය ඉන්නවද කියලා. ඔන්න ඔතනදී අපිට හොයා ගන්න පුළුවන් වුණා මීට කලින් මිනීමැරුම් දෙකක් කරලා තියෙන ප්‍රියන්ත කියලා පුද්ගලයෙක් මේ කට්ටිය අතර ඉන්නවා කියලා."

ප්‍රධාන පොලිස් පරීක්ෂක සුමිත් ගුණවර්ධන විමර්ශන ඇරැඹූ ආකාරය එසේ සඳහන් කළේය.

"ඉන් පස්සේ අපි හොයලා බැලුවා ප්‍රියන්ත කරපු මිනීමැරුම් මොනවද කියලා. ඒ මිනීමැරුම් කරලා තියෙන ආකාරය හොයලා බැලුවා. එකක් වෙඩි තියලා. අනෙක පිහියෙන් ඇනලා. තවත් කොල්ලකෑමකටත් මෙයා සම්බන්ධ වෙලා තිබුණා. ඒ සිද්ධීන්වලට මෙයා අවුරුදු ගණන් හිරේ ගිහින් තිබුණා. ඒ නිසා අපිට මිනිහා ගැන සැකයක් ආවා. මොකද මිනිහත් හොඳටම බූරු ගහන කෙනෙක්. පසුගිය දවස්වල මිනිහා ඔය රුවන් කුමාර එක්කත් බූරු ගහලා තිබුණා."

මේ අනුව කොට්ඨාස අපරාධ විමර්ශන නිලධාරීන්ට ප්‍රියන්ත ගැන තදබල සැකයක් ඇතිවිය. එහෙත් ප්‍රියන්ත රුවන් කුමාර ඝාතනයට නිශ්චිත වශයෙන්ම පැමිණියේදැයි නිලධාරීන්ට තහවුරු කර ගත නොහැකි වූයේ නිවැසියන් කියන පරිදි රුවන් කුමාර මරාදැමීමට පැමිණි තිදෙනාම මුහුණු ආවරණය කර සිටි නිසාය.

කෙසේ වෙතත් ප්‍රියන්ත පිළිබඳ තිබූ සැකය අත්නොහළ නිලධාරීන් ප්‍රියන්ත පදිංචිව සිටි ගම් පළාත සොයා ගත්තේය. කිරිඳිවැල, තිඹිරිගම ඔහු උපන් ගමය. නිලධාරීහු සිවිල් වෙස්ගෙන තිඹිරිගම කරක් ගැසූහ. ඒ ප්‍රියන්ත ගමේ සිටින්නේ දැයි දැනගන්නටය.

"ඕකා දැන් අවුරුදු තුන හතරක් තිස්සේ මේ පැත්ත පළාතේ එන්නෙ නැහැ."

"ඒ කියන්නේ මිනිහා කොහේද ඉන්නේ"

"මිනිහා කසාද බැඳලා ඉන්නෙ නම් බටලීයේ පැත්තෙන්... සමහර විට ඒ ගෑනිගේ ගෙදර ඉන්න පුළුවන්"

නිලධාරීහු නොයෙකුත් උපාය මාර්ග යොදා ගනිමින් ප්‍රියන්ත පිළිබඳ තොරතුරු එසේ සොයා ගත්හ. ඒ අනුව තවත් කණ්ඩායමක් බටලීයට ගියහ. ඒත් ඔවුන් ප්‍රියන්තගේ බිරියගේ නිවෙසට ගියේ නැත.

"අපි එහෙ ගියා නම් එයාගේ ගෑනි පොලිසියෙන් ඇවිත් තමුසෙව හෙව්වා කියලා ප්‍රියන්තට කියන නිසා අපි වටින් පිටින් ප්‍රියන්ත ඒ ගෙදරට යන එනවද කියලා හොයලා බැලුවා. එතැනදී අපිට දැනගන්න පුළුවන් වුණා අවුරුදු ගාණකින් මිනිහා බටලීයේ ගෑනි බලන්න ඇවිත් නැති බව."

"පස්සේ තවදුරටත් හොයලා බලද්දී මූට තවත් ගෑනියෙක් කඩවත පැත්තේ ඉන්නවා කියලා තොරතුරක් ලැබුණා. ඒ තැනත් හොයාගෙන ඒ ගෙදරට යන්නේ නැතිව අපි වටපිටින් මිනිහා ඒ ගෑනිව බලන්න යන එනවද කියලා බැලුවා. එහෙදිත් අපිට දැනගන්න ලැබුණේ ගිය දෙසැම්බර්වලින් පස්සේ මිනිහා ඒ ගෙවල් පැත්තේ ඇවිත් නැහැ කියලයි."

ඒ අනුව නිලධාරීන්ගේ සැකය වැඩි විය. රුවන් කුමාරගේ ඝාතනයත් සමඟ ප්‍රියන්ත ගමෙන් අතුරුදන් වීමත් බිරින්දෑවරුන්ගේ නිවෙස්වලට නොපැමිණීමත් නිසා රුවන් කුමාරගේ ඝාතනයද ප්‍රියන්ත විසින් සිදුකර ඇති බවට නිලධාරීහු නිගමනය කළහ. එහෙත් ප්‍රියන්ත සොයා ගැනීමට නිලධාරීන්ට නොහැකි විය. ඒ අතරතුර ඔහු වෙනත් වරදකට හිරේ විලංගුවේ වැටී ඇත්දැයිද නිලධාරීහු සොයා බැලූහ. ඒත් ඒ බවක් අනාවරණය නොවීය.

මෙලෙස මාස දෙකක්ම කොට්ඨාස අපරාධ විමර්ශන නිලධාරීහු ප්‍රියන්ත පසුපස පැන්නූහ. එහෙත් ඔහු සොයාගත නොහැකි විය.

"අපි ඒත් අතහැරියේ නැහැ. ප්‍රියන්ත යන එන තැන්, ගැවසෙන තැන්වල එළිවෙනකම් රැක්කා. මෙන්න මෙතැනට අද බූරු ගහන්න එනවා කියලා තොරතුරු ලැබුණාම අපේ නිලධාරීනුත් බූරු ගහන්න යන අය වගේ ඒ තැන්වලට ගිහින් පාන්දර වෙනකම්ම හිටියා. මූ කොයි මොහොතේ හරි ඒවි කියලා. ඒ වගේම ඒ බූරු පිටිවල ඉන්න ඔත්තුකාරයෝ එක්ක සම්බන්ධකම් පවත්වාගෙන ගියා. ඒ වගේම මිනිහගේ ටැලිෆෝන් එකේ ඩීටේල් රිපෝට් එකක් අරගෙන මිනිහා කොහේද ඉන්නේ, යන්නේ එන්නේ කියල මාස දෙකක්ම හෙව්වා."

ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයා කීවේය. මෙලෙස හතර වටේ ඔත්තුකරුවන් දමමින් දුරකථන විශ්ලේෂණ වාර්තා ඔස්සේ සැකකරු සිටින ස්ථාන නිරීක්ෂණය කරමින් සිටි කොට්ඨාස අපරාධ විමර්ශන නිලධාරීන්ට පසුගියදා ඔත්තුවක් ලැබිණි.

"සර්... ප්‍රියන්ත අද පාන්දර අම්මව බලන්න තිඹිරිගමට යනවා අපි දැක්කා" ලැබුණු තොරතුර අනුව නිලධාරීන් වහා ක්‍රියාත්මක විය. ඒ වන විට වේලාව අලුයම පහට ආසන්නය. ලැබුණු ඔත්තුව අත්නොහළ නිලධාරීහු වහා තිඹිරිගමට ගොස් මඟ රැක සිටියදී ප්‍රියන්තව අතටම අල්ලා ගැනීමට සමත් වූහ.

"අනේ සර්... මම අම්මා බලන්න ආවේ... මට යන්න දෙන්න..."

"අම්මව පස්සේ බලන්න පුළුවන්. වරෙන්කෝ යන්න. උඹත් එක්ක අපිට ගනුදෙනුවක් තියෙනවා බේරගන්න" එසේ කී නිලධාරීන් ප්‍රියන්තව කුදලාගෙන ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශනයට රැගෙන ආවේය.

"මෙහෙට ගෙනාවේ මොකටද කියලා දැන් දන්නවනේ. දඟලන්නේ කරන්නේ නැතිව ඇත්ත කියපන්"

"මොකක්ද සර්..."

"මොකක්ද නෙමේ... රුවන් කුමාරට උඹ මොකද කළේ..."

"එතනදී තමයි මූ කිව්වේ "රුවන්ට හොඳට සල්ලි තිබුණු නිසා ඒවා කොල්ලකන්නයි ගෙදරට පැන්නේ කියලා"

රුවන් කුමාරගේ ඝාතනයෙන් පසු හලාවත, බටගහදෙණිය ප්‍රදේශයේ මිතුරකුගේ නිවෙසක මොහු සැඟව සිට ඇති බවද පොලිසිය අනාවරණය කරගත්තේය.

"මට අම්මා විතරයි ඉන්නේ. තාත්තා මැරිලා අවුරුදු හතක් වෙනවා. මම ඉස්කෝලේ ගියේ දෙවැනි වසරට විතරයි. පොඩි කාලේ ඉඳලම යාළුවන්ගේ ගෙවල්වල එක එක වැඩ කළා. තාත්තා ජීවත්වෙලා ඉන්න කාලේ තාත්තාත් එක්ක පොල් ගස් බඳින්න ගියා.

අවුරුදු 18දී තමයි කලල්පිටියේ කොම්පැනියක වැඩට ගියේ. එතැන අවුරුදු 5ක් විතර වැඩ කරනකොට වැඩ කරන කෙනෙක්ට ගහලා රුපියල් 4,000ක් ගත්තා කියලා මාව අයින් කළා. ඊට පස්සේ තමයි රස්සාවක් නැතිව ඉන්නකොට හොරකම් කරන්න පටන් ගත්තේ. මුලින්ම කපුගම සිල්ලර බඩු කඩයක් කඩලා රුපියල් 700ක් ගත්තා. නිට්ටඹුව පොලිසියෙන් ඒකට මාව අල්ලගෙන හොරකම් නඩු 8ක්ම මට දැම්මා. මට ඇප තියන්න කෙනෙක් හිටියේ නැහැ. ඒ නිසා මම ඒ නඩු ඔක්කොටම වරද පිළිගත්තා. අත්තනගල්ල උසාවියෙන් අවුරුදු 10ක් අච්චු කළා."

ප්‍රියන්ත සිය අතීතය පොලිස් නිලධාරීන් ඉදිරියේ එසේ පැවැසීය. මිතුරකුගේ දියණියක් වූ සුමුදු නමැති තරුණියක් සමඟ පෙමින් වෙළී පසුව ඇය හා විවාහ වීමෙන් අනතුරුව දියණියන් දෙදෙනකුද සිටින බවද ඔහු කීවේය.

කෙසේ වෙතත් වසර හයමාරක කාලයක් බන්ධනාගාරගතව සිටි ප්‍රියන්ත යළි නිවෙසට පැමිණියද හිරේ සිටියදී හමුවූ මිතුරන් අමතක කළේ නැත.

"හිරේ ඉන්නකොට හිතවත් වුණු යාළුවෝ ටිකක් හිටියා. එළියට ගියාම අපි එකතු වෙලා වැඩක් කරමු කියලා අපි කතා කරගත්තා."

පස්සේ එයාලා එළියට ආවට පස්සේ අපි ගේම් දෙක තුනක් ගැහැව්වා. රබර් ෂීට් කඩයකට ඇතුළු වෙලා මුදලාලි බය කරන්න හදනකොට තුවක්කුව පත්තුවෙලා මුදලාලිගේ පුතාට වෙඩි වැදිලා මැරුණා. අපි මුකුත් ගන්නේ නැතිව පැනලා ආවා. කෑගල්ලේ යුනිට් එකට අපි අහුවුණා. මහර හිරගෙදර අවුරුදු තුනක්ම හිටියා."

මෙලෙස ඔහු විසින් සිදුකළ කොල්ලකෑම් හා තවත් මිනිස් ඝාතනයක තොරතුරු ඔහු හෙළිකළ අතර ඒ සම්බන්ධයෙන් වසර ගණනාවක් සිර දඬුවම් විඳ ඇති මොහු හිරෙන් නිදහස්ව පැමිණ ඇත්තේ ඉකුත් වසරේ අප්‍රේල් මාසයේය. කිරිඳිවැල, හලාවත හා ගම්පහ අධිකරණවල මොහුට එරෙහිව ඇති නඩු තවමත් විභාග වෙමින් පවතී.

ඕවා නෙමේ රුවන් කුමාරට මොකද වුණේ කියලා කියපන්කෝ..."

ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයා ප්‍රියන්තට කීවේය.

"2016 ඉඳන් වේවැල්දෙණිය, පොල්වත්තේ රුවන්ගේ ගෙදර තමයි වැඩිපුර බූරු ගැහැව්වේ. අවුරුදු 7ක්ම ඒ පැත්තේ බූරු ගැහැව්වා. කඩවත ගෑනිගේ ගෙදර ඉඳලා තමයි එහෙ ආවේ ගියේ."

"රුවන්ට ගොඩක් සල්ලි තියෙනවා. රත්තරන් බඩු ගොඩක් දාගෙන ඉන්නේ. හෙට අනිද්දාට අලුතෙන් වෑන් එකකුත් ගන්නයි ඉන්නේ. රුවන්ට වැඩක් දීලා සල්ලි ටිකයි, රත්තරන් බඩු ටිකයි ගමු කියලා අපි කතා කරගත්තා..."

ඒ දවස්වල වැඩියෙන්ම බූරු ගැහැව්වේ රුවන්ලාගේ ගෙදර. කලින් දවසක ගිහින් මම යාළුවන්ට රුවන්ගේ ගෙදර පෙන්නුවා.

එදා හයියෙන් වහිනවා. වැස්ස අඩු වුණේම නැහැ. රෑ 12ට විතර අපි රුවන් කුමාරගේ ගෙදරට ආවා. එතකොටම කරන්ට් එක ගියා. මම හිතුවා පියුස් එක ගියා කියලා. රුවන්ගේ පවුලයි, අම්මයි කෑගහන්න පටන් ගත්තා. එයාලා කෑ ගහන නිසා වැඩේ අවුල් වුණා. අපි දුවමු කිව්වා. දුවන්න හදනකොටම එළියට එද්දී කවුදෝ මාව අල්ල ගත්තා. මම බේරෙන්න පිහියෙන් ඇන්නා. මාව අල්ලගෙන හිටියේ රුවන්. ඒ පිහිය අපේ අම්මගෙ ගෙදර දර මඩුවේ හංගලා තියෙනවා."


ප්‍රියන්ත පොලිස් නිලධාරීන් හමුවේ කියන්නට විය. ඔහුගේ ප්‍රකාශය මත රුවන් කුමාරට ඇනින ලද උල් පිහියද සොයාගත හැකි විය. ඔහුගෙන් ප්‍රශ්න කිරීමේදී රුවන් කුමාර සතු මුදල් හා රන් ආභරණ කොල්ලකෑමට පැමිණි සෙසු තිදෙනා ගැනද ප්‍රියන්ත අනාවරණය කළේය. නිලධාරීන් ඔවුන් ගැන සොයා බලද්දී හෙළි වූයේ එම තිදෙනා වෙනත් අපරාධවලට පොලිසිවලට කොටුවී මේ වන විට බන්ධනාගාරගතව සිටින බවය.

වසර පහකට ආසන්න කාලයක් නොවිසඳී තිබූ රුවන් කුමාර ඝාතනයේ සුලමුල මෙසේ අනාවරණය කරගෙන එම ඝාතනයේ මහ මොළකරුද කොටුකර ගැනීමට නිලධාරීන්ට හැකිවීම ඉහළ නිලධාරීන්ගේ පැසසුමට ලක්විය.

බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්, නියෝජ්‍ය පොලිස්පති මහින්ද දිසානායක, ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඉන්දික ද සිල්වා සහකාර පොලිස් අධිකාරි තුසිත කුමාර යන මහත්වරුන්ගේ උපදෙස් මත ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සුමිත් ගුණවර්ධන ප්‍රමුඛ උප පොලිස් පරීක්ෂක උදයශාන්ත, සැරයන්වරුන් වූ පුෂ්පානන්ද (2926), ධනපාල (55460), සෙනෙවිරත්න (55466), කොස්තාපල්වරුන් වූ වීරතුංග (81544) හා පොලිස් සැරයන් රියැදුරු විජේසේන (22146) යන නිලධාරීහු මෙම විමර්ශනයට එක්ව සිටියහ.

**පොලිස් විමර්ශන අනුව ලිපිය සකස් විය.**

■ **කීර්ති මෙන්ඩිස්**





ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඉන්දික ද සිල්වා


ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සුමිත් ගුණවර්ධන

කොළඹ 07, රොස්මිඩ් පෙදෙසේ, අංක 101 හි පිහිටි සීමාසහිත සිලෝන් නිව්ස්පේපර්ස් පෞද්ගලික සමාගම විසින් ජා ඇල, මිනුවන්ගොඩ පාරේ, 302/1/A හි පිහිටි සිය මුද්‍රණාලයේදී මුද්‍රණය කරනු ලැබ ප්‍රසිද්ධ කරන ලදී.

# මේක අපි දුක් විඳලා හදපු ආණ්ඩුව

# ගොඩක් අයට ඒක මතක නැහැ

## පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසුමන වීරසිංහ



**අර්බුදකාරී අවස්ථාවක හැසිරෙන විධිය ආණ්ඩුව දන්නේ නැහැ**

**69 ලක්ෂය දැන් අපි එක්ක ඉන්නවද කියන එක ප්‍රශ්නයක්**

**විවේචනය කළාම එළවනවා නම් එය බරපතළ තත්ත්වයක්**

**වාසු,විමල්, උදය සාමූහික වගකීම් කඩ කළේ නැහැ**

**දේශපාලන සෞඛ්‍ය තත්ත්වය අයහපත් නිසා පළාත් පාලන ඡන්ද කල් දැම්මා**

**ආණ්ඩුවට මොකක්ද මේ වෙලා තිබෙන්නෙ?**

මට නම් සිතෙන්නෙ ආණ්ඩුව තවමත් තමන්ගේ මූලික වගකීම අවබෝධ කරගෙන නෑ කියලයි. අර්බුදකාරී අවස්ථාවක හැසිරෙන්නෙ කොහොමද කියලා ආණ්ඩුව දන්නෙ නැහැ. ආර්ථික අර්බුදය ගැන වුණත් නිසි වැටහීමක්, නිසි සාකච්ඡාවක්, නිසි කියවීමක් නැහැ. එපමණක් නෙවෙයි ආණ්ඩුවට මේ අර්බුදයෙන් සාමූහිකව ගොඩඒමේ වුවමනාවක් තිබෙනවා කියලා පේන්නෙත් නෑ. ඒකෙන් වෙන්නෙ අර්බුද ඇතුළේ තවත් අර්බුද නිර්මාණය වීම. තිබෙන අර්බුදවලට අමතරව නිර්මාණය කරගත්තු අර්බුද ටිකකුත් තිබෙන බවක් තමයි පෙනෙන්නේ.

**පවතින අර්බුදවල යථා ස්වභාවය මිනිස්සුන්ට නොකියා ඉඳීම තුළ නෙවෙයිද මේ ගැටලු තීව්‍ර වෙන්නෙ?**

හරියටම හරි. 1917 සෝවියට් විප්ලවය ජයගත්තාට පසුව 1918 පළමුවැනි ලෝක යුද්ධය පටන් ගන්නවා. ලෙනින්ට විශාල අරගලයක් කරන්න සිදුවුණා ජර්මන් සමූහාණ්ඩුවට විරුද්ධව. ඔහු ඒ අසීරු මොහොතේදී ජනතාව ආමන්ත්‍රණය කරලා ජනතාවට ඇත්ත ඇති සැටියෙන් කියලා

**අගමැති ඉවත් වුණොත් බරපතළ දේශපාලන අර්බුදයක් එනවා**

ජනතාවගේ උදවු ඉල්ලුවා. සෑම පවුලකින්ම යුද්දෙට සොල්දාදුවෙක් යොමු කරන්නත් ආහාර පැත්තෙන් කැපකිරීම් කරන්නත් ජනතාව පෙලඹුණේ ඉන් අනතුරුවයි. දැවැන්ත රතු හමුදාවක් නිර්මාණය කරලා දැවැන්ත ජර්මානු අධිරාජ්‍යට විරුද්ධව අරගල කරන්න ලෙනින්ට පුළුවන් වුණේ ඉන් අනතුරුව.

ඒ වගේ අපිටත් පුළුවන් නම් ජනතාව දැනුවත් කරන්න ඔවුන්ගේ සහයෝගය අපිට ලබාගන්න පුළුවන්. නමුත් අද වෙද්දි අපිට ඡන්දය දුන් 69 ලක්ෂයක ජනතාවත් අපි එක්ක ඉන්නවද කියන එක ප්‍රශ්නයක්. ඒ නිසා ජනතාවට ඇත්ත කීම රාජ්‍යයේ ප්‍රධාන වගකීමක්. ගෑස් ප්‍රශ්නය, පොහොර ප්‍රශ්නය ආදී ප්‍රශ්න බොහොමයක් ප්‍රශ්න ඇති වුණේ ජනතාවට ඇත්ත නොකියා සිටීම තුළ.

**පොහොර ප්‍රශ්නයේදි විෂය භාර ඇමැතිවරු හැසිරුණු ආකාරය සහ ක්‍රියාකලාපයන් සාධාරණීකරණය කරන්න පුළුවන්ද?**

මෙතෙන්දි මුලින්ම කියන්න ඕනා රාජ්‍ය සහ ආයතන මට්ටමින් සංවිධානාත්මක, සැලසුම්සහගත ප්‍රවේශයක් නොවීම තුළයි මෙවැනි අර්බුදයක් හට ගත්තේ කියන එක. ජනාධිපතිතුමා කාබනික පොහොර විෂයට අදාළ අමාත්‍යාංශ, ආයතන පත්කරලා මේ කටයුත්ත පටන් ගත්තෙ සද්භාවයෙන්. නමුත් එතුමාට ඒ සඳහා අවශ්‍ය සහයෝගය නොලැබුණු බව එතුමාම පැවැසුවා. අදාළ ඇමැතිවරු සහ නිලධාරීන් කාබනික පොහොර නිෂ්පාදනය කරන ප්‍රමාණය මෙපමණයි කියලා සංඛ්‍යාලේඛන සේරම බොරු වුණා. ඒ නිසා තමයි අවසානයේ කාබනික පොහොර ආනයනය කරන්න තීන්දු කළේ. ඒක හදිස්සියේ කලබලයෙන් කරපු නිසයි ඔය නැවේ ප්‍රශ්නෙ ඇති වෙන්නෙත්. සාමාන්‍යයෙන් සාම්පල් පරීක්ෂා කරලයි ණයවර ලිපි විවෘත කරන්නෙ. ඒක හරියට කරගන්න බැරිවෙන්නෙ සැලසුමක් නොතිබීම සහ කලබලය තුළ.

**නමුත් ශෂීන්ද්‍ර රාජපක්ෂ කිව්වා ඒ පොහොර සිංගප්පූරුව හොඳයි කියලා භාරගනිද්දි අපේ අය නරකයි කියලා ප්‍රතික්ෂේප කළේ ඇයි කියන එක ගැන විමර්ශනයක් කරන්න අවශ්‍යයි කියලා?**

කෘෂිකර්ම අමාත්‍යවරයා ප්‍රමිති ආයතනය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අදාළ ආයතන කිව්වා ලංකාවට ගෙනාපු පොහොරවල ගුණාත්මක සංඝටක නෑ අහිතකර සංඝටක තමයි තිබෙන්නෙ කියලා. ඒ නිසානෙ හරවලා යවන්නෙ. නමුත් සිංගප්පූරුවෙන් කිව්වා ඒ පොහොර ගුණාත්මකයි කියලා. මේ සමාගම ලෝකයේ බොහෝ රටවල්වලට පොහොර යවන සමාගමක්. මෙතැනදී වුණේ හදිස්සිය සහ කලබලය තුළ අපේ රටට අවශ්‍ය ගුණාත්මක සංඝටක මොනවාද කියලා ඔවුන්ට නොපැවැසීම. ඒ නිසයි මේ ගැටලුව පැනනැඟුණේ.

**වගා හානිවලට වන්දි දෙන්න රජය පොරොන්දු වුණා. නමුත් ඒකත් දැන් නොදෙන තැනට ගිහින් නේද?**

මිනිස්සුන්ගේ සැකයක් තිබුණා කාබනික පොහොර යෙදුවම වගාවට හානිවෙයි. පලදාව අඩුවෙයි කියලා. තේ වගාව සම්බන්ධයෙන් ගත්තම තේ ගසට විශාල නයිට්‍රජන් ප්‍රමාණයක් ඕනා. කාබනික පොහොරවලින් 100%ක් ඒක සම්පූර්ණ කරන්න බෑ. පළමුවැනි සති දෙක තුළ අපි කිව්වා වැවිලි කර්මාන්තයට කාබනික පොහොරවලින් පමණක් 100%ක් ඉස්සරහට යන්න බෑ කියලා. එතකොට රජය කිව්වා කාබනික පොහොර යොදලා වගාවට යම් හෝ හානියක් වුණොත් වන්දියක් දෙන්නම් කියලා. නමුත් මේ කන්නයේදී කාබනික පොහොර හම්බුණේ සීමිත ප්‍රමාණයයි. නමුත් අදාළ අමාත්‍යාංශය දැන් කියන්නෙ වෙන කතාවක්. ඔවුන් කියූ ආකාරයට ඔවුන් කියපු පොහොරම භාවිත කරලා අස්වනු අඩුවුණා නම් විතරයිලු වන්දි දෙන්නේ. මේක තව සති දෙක තුනක්, ඇතුළත විශාල අර්බුදයක් බවට පත්වෙයි. පොහොර ඉල්ලලා අරගලයක් ඇතිවුණා වගේම ඒකෙම දෙවැනි කොටස විධියට පොහොර වන්දි ඉල්ලලා අරගලයකුත් ඇති වෙයි.

**ඔබ නියෝජනය කරන හවුල්කාර පක්ෂවල පක්ෂ නායකයන් තිදෙනෙක්ට සාමූහික වගකීම් කඩ කළ බවට චෝදනා නැඟුණා. දැන් කට්ටිය බයවෙලාද ඉන්නෙ?**

සාමූහික වගකීම් කඩකිරීමයි, විවේචන ඉදිරිපත් කිරීමයි කියන්නෙ දෙකක්. කැබිනට් මණ්ඩලය යම් තීන්දුවක් ගත්විට එම තීන්දුව වෙනුවෙන් පක්ෂ විපක්ෂ බව නොතකා පෙනී සිටීම තමයි සාමූහික වගකීම කියන්නෙ. ඒ කියන්නෙ බහුතරය කැමැත්තෙන් පිළිගන්නා දේ වෙනුවෙන් පෙනී සිටීම. නමුත් වාසුදේව, විමල්, ගම්මන්පිල සහෝදරවරුන්ගේ ක්‍රියාව සාමූහික වගකීම කඩකිරීමක් නෙවෙයි. ඔවුන් අධිකරණයට යන්නේ කැබිනට් මණ්ඩලයේ සාකච්ඡාවට බඳුන් නොවුණු සාමූහිකව තීරණයක් නොගත් කාරණයක් මුල් කරගෙන. ඒ නිසා ඒ ක්‍රියාව සාමූහික වගකීමට බැඳෙන්නේ නෑ. නමුත් විවේචනය කියන්නෙ වෙනත් දෙයක්. කවුරු හෝ ආණ්ඩුව විවේචනය කළා කියලා එළවනවා නම්, පහරදෙනවා නම් ඒක බරපතළ තත්ත්වයක්. මොකද මේක බහුවිධ මත දරන කණ්ඩායම්වලින් සැදුණු සන්ධානයක්. ඒ නිසා බහු මත විවේචන ඉවසා සිටීම සන්ධානයක දියුණු ලක්ෂණයක්.

**නමුත් ඉතින් ඉවසනවා වෙනුවට කරන්නෙ පීඩාවට පත්කිරීම සහ පන්නා දැමීම නෙවෙයිද?**

ආණ්ඩුව තුළ විධිමත් සංවාදයක් නැති නිසයි මෙහෙම වෙන්නෙ. මම කැබිනට් මණ්ඩල සාමාජිකයෙක් නෙවෙයි. නමුත් මේ අර්බුදකාරී තත්ත්වය වෙනුවෙන් පෙනී සිටින්නට කැබිනට් මණ්ඩලයටත් ඉඩ ලැබෙන්නෙ සීමිතව. ආණ්ඩු පක්ෂ කණ්ඩායම් රැස්වීම් නොපවත්වා ඉඳලා දැන් මාස දෙකකට වැඩියි. විධිමත් රැස්වීමක් පැවැත්වුවේ අවස්ථා දෙකක පමණයි. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන හවුල්කාර පක්ෂ

**ඉදිරියේදී බිහිවෙන්නේ සන්ධාන ආණ්ඩුවක්; ඒක මොන පක්ෂයෙන්ද දැන්ම කියන්න බෑ**

එක්කත් විධිමත් සාකච්ඡාවක් නෑ. සාකච්ඡා, සංවාද නැති නිසා තමයි ඇතුළේ අය, වෙනත් පාර්ශ්ව සහ එළියේ කතා කරන්නෙ. මෙන්න මේ දුර්වල තැන් හඳුනාගෙන සක්‍රිය කරන්න පුළුවන්නම් ගොඩක් ප්‍රශ්න විසඳගන්න පුළුවන්. අනෙක් කාරණය තමයි දෙල්කඳ පොළේදි කරපු කතාවක් නිසා සුසිල් ඇමැතිවරයාව ඉවත් කළා කියලා මම නම් විශ්වාස කරන්නෙ නෑ. ඔහු දිගින් දිගටම දරපු ස්ථාවරයක් තිබුණා. නමුත් ඒ ස්ථාවරයේම සිටින තවත් ඇමැතිවරු සිටිනවා. පොහොට්ටුව ඇතුළෙ නිමල් ලාන්සා වගේ අය ඉන්නවා.

**කවුරු ගියත් අපිට බහුතරය තියාගන්න පුළුවන් කියලයි පොහොට්ටුවේ අය කියන්නෙ?**

බහුතරය කියන්නෙ 113නෙ. කට්ටිය කඩාගෙන ගියොත් වෙන්නෙ 2/3 අහිමිවීම විතරයි. දැනටත් ඒක ශ්‍රීලපොජපෙට තිබෙනවා. නමුත් ඒක කොපමණ කල් තිබෙයිද කියලා මට සහතික දෙන්න බෑ. ආණ්ඩුවෙන් පිරිසක් ගියොත් ඒ වෙනුවට කට්ටිය ගන්නත් පුළුවන්. එන්නත් පුළුවන්. නමුත් එක් දෙයක් හොඳින් තේරුම් ගත යුතුයි. මේක පක්ෂ සහ සංවිධාන ගණනාවක එකතුවකින් සැදුණු සන්ධානයක්. කවුරු හෝ පෞද්ගලිකව කල්පනා කරලා අපිට තනිව ගමනක් යන්න පුළුවන් කියලා හිතනවා නම් ඒක දිගු ගමනක් වෙන එකක් නම් නෑ.

**ශ්‍රීලනිපයට යන්න කියන එක සදාචාරසම්පන්න නැහැ**

**හවුල්කාර පක්ෂ ශ්‍රීලනිප එක්ක එකතු වෙලා වෙනම ගමනක් යන්න වගේ නේද අරඅඳින්නේ?**

ශ්‍රීලනිපට යන්න කියන එක කිසිසේත්ම සදාචාරසම්පන්න නෑ. ජනාධිපතිවරණයේදී ඔවුන් එකතු වීමත් අපිට විශිෂ්ට ජයක් ලැබීමට එක් හේතුවක් වුණා. ඒ නිසා මේ මොහොතේ යන්න කියනවාට වඩා දේශපාලන සංගායනාවක් කිරීම අවශ්‍යයි. හැමදාම කරන්නෙ විවේචන විතරයි. ස්වයං විවේචන නැහැ. 1956න් පසුව හැමදාම බිහිවුණේ සභාග ආණ්ඩු. තනි පක්ෂ බලය ගත්තු අවස්ථා නැහැ. ඉදිරියේදීත් බිහිවෙන්නෙ සභාග සන්ධාන ආණ්ඩුවක්ම තමයි. ඒක මොන පක්ෂයෙන්ද මොන පිරිස්වලින්ද කියලා දැන්ම තීරණය කරන්න බැහැ.

**අගමැතිවරයා ඉවත් කොට ඒ තනතුරට බැසිල් රාජපක්ෂව පත්කිරීමට සූදානමක් ඇති බවත් ඊට අදාළ කටයුතු කෙරෙන කාර්යාලයක් කෝට්ටෙ ප්‍රදේශයේ තිබෙන බවටත් තොරතුරු වාර්තා වුණා?**

ආණ්ඩුව දම්වැලක් නම් ඒ දම්වැල එකතු කරන් ඉන්න ප්‍රධාන පුරුක තමයි අගමැතිතුමා. අගමැතිතුමාගේ මැදිහත්වීම් මත තමයි ආණ්ඩුව සහ හවුල්කාර පක්ෂවල එකමුතුව රැඳිලා තිබෙන්නෙ. එතුමාගේ දේශපාලන ඉතිහාසයත් එක්ක සංසන්දනාත්මකව බලන විට වර්තමානයේ එතුමාගේ දේශපාලන මැදිහත්වීම්වල යම් අඩුවක් තිබෙන බව ඇත්ත. නමුත් අගමැතිතුමා ඉවත් වෙනවා කියන කතාව අසත්‍යක් කියලා අගමැති කාර්යාලයෙන්ම දන්වා තිබුණා.

**යම්හෙයකින් අගමැති ඉවත් වුණොත් ආණ්ඩුවට මොකක් වෙයිද?**

එතුමාව ඉවත් කළොත් හෝ ඉවත්වුණොත් බරපතළ දේශපාලන අර්බුදයක් ඇතිවෙයි. මේ එකමුතුව විසිරිලා යයි. හරියට පුවක් වල්ලක් බිම වැටුණා වගේ. එතුමා ඉතා සවිඥානික දේශපාලනඥයෙක්. එතුමාගෙ දායකත්වය අපිට අනාගතයේදීත් අවශ්‍යයි.

**කොවිඩ් නිසා ආණ්ඩුවට මුකුත් කරගන්න බැරි වුණා. ඒ නිසා ජනමත විචාරණයක් පවත්වලා කාලෙ දිගු කරගත්තොත් හොඳයි කියලා සමහරු කියනවා. මොකද ඒ ගැන හිතන්නෙ?**

රාජ්‍ය පාලකයෙක් බවට පත්වුණාම සෑම දෙයක්ම සර්ව සම්පූර්ණයෙන් මල් වට්ටියක තියලා ලැබෙන්නෙ නෑ. කොවිඩ් නිසා කාලයක් අපරාදේ ගියා තමයි. නමුත් රාජ්‍ය නායකයා දක්ෂ වෙන්න ඕනා අර්බුද ගැටලු කළමනාකරණය කරගන්න. කොවිඩ් ප්‍රශ්නයේදී එතුමා අති සාර්ථකව කටයුතු කළ බව ඇත්ත. නමුත් අනෙක් අර්බුද සේරම නිර්මාණය කරගත්තු ඒවා. නමුත් ගිය කාලය ජනමත විචාරණයකින් ගන්නවද කියන එකේදී ඒ සඳහා ඉඩක් සමාජයෙන් ලැබෙයිද කියන එක ප්‍රශ්නයක්. මට හිතෙන විධියට නම් ජනමත විචාරණයක් තියා කිසිම ඡන්දයක් තියා ගන්නවත් සුදුසු පරිසරයක් මේකෙ නෑ.

**ඇත්තටම ඇයි ආණ්ඩුව මේ වෙලාවේ පළාත් පාලන ආයතනවල කාලය දීර්ඝ කළේ?**

පළාත් පාලන මැතිවරණය කල්දාන්න ගැසට් එකක් ගැහුවා. මේ වෙලාවේ ඒක කරනවා හැරෙන්න වෙන උත්තරයකුත් නෑනෙ.

**නමුත් ආණ්ඩුව මිනිස්සුන්ට උත්තරයක් දෙන්න ඕනා?**

අයහපත් සෞඛ්‍ය තත්ත්වය තමයි ප්‍රධානම කාරණාව මම හිතන්නෙ.

**කොවිඩ් තත්ත්වය එච්චර බරපතළ නම් පාසල්, විශ්වවිද්‍යාල අරියිද? අනික මේ ආණ්ඩුව කොවිඩ් තියෙද්දිත් ඡන්ද කරපු ආණ්ඩුවක්නෙ?**

ඔව් ඔබ කියන එක හරි. රටේ කොවිඩ් වගේම ආණ්ඩුවේ දේශපාලන සෞඛ්‍ය තත්ත්වයත් හොඳ නෑ. දේශපාලනමය වශයෙන් එළියේ තිබෙන්නේ ආණ්ඩුවට හිතවාදී මතයක් නෙවෙයි. පොළවේ පය නොගහන අයට ඒක තේරෙන්නෙ නෑ. නමුත් ගම්වල මිනිස්සු එක්ක ජීවත්වෙන අපිට තේරෙනවා ඇත්ත තත්ත්වය. එළියේ බරපතළ ප්‍රශ්න ගණනාවක්ම තිබෙනවා. ඒවා කළමනාකරණය කරගන්න ආණ්ඩුවට යම් කාලයක් අවශ්‍යයි. ඒ නිසා කල්දාන්න ඇති.

**වතු කම්කරුවන්ට කන්නවත් නැහැ - 1,000 හැමෝටම ලැබෙන්නේ නැහැ**

**පරදිනවට බයවෙලා ඡන්ද කල්දාන එක අනුමත කරන්න පුළුවන්ද?**

කිසිසේත්ම නැහැ. ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය විධියට ඡන්ද කල්දාන එක අපි කිසිසේත්ම අනුමත කරන්නෙ නැහැ. යහපාලන කාලෙ මැතිවරණ කල් දාලා වුණු දේවල් අපි දැක්කා. විසුරුවා හැරලත් පළාත් පාලන මැතිවරණ පැවැත්වුවේ නෑ. නමුත් මෙතැනදී එතරම් අගතියක් වෙන්නෙ නෑ. මොකද කාලය දික් කළා විතරනේ. ඒ නිසා අවිච්ඡින්නව පවත්වගෙන යන්න පුළුවන්.

**හදිස්සියේ කරපු කැබිනට් සංශෝධනයෙන් මොකක්ද ආණ්ඩුව බලාපොරොත්තු වෙන්නෙ?**

ඔය කියන හරි සංශෝධනය තවම ආවේ නෑ. ඒක අද හෙටම එයි. ව්‍යවස්ථාව අනුව පත්කරන්න පුළුවන් කැබිනට් ඇමැතිවරු 40ක් සහ රාජ්‍ය, නියෝජ්‍ය 30ක් වගේ ප්‍රමාණයක්. ඒ නිසා හොඳම සහ දක්ෂ අය පත්කිරීම තරමක අභියෝගයක්. මේ ගතවුණු වසර එකහමාර දිහා සාමාන්‍ය මනුෂ්‍යයෙක් විධියට බැලුවම මට නම් ඔය පත්කරපු කැබිනට් ඇමැතිවරුන්ගෙන් බහුතරයක් වැඩක් කළාද කියන එක ගැන ප්‍රශ්නයක් මතුවෙනවා. කීයෙන් කී දෙනාද තමන්ගේ රාජකාරිය හරියට කළේ. නමුත් රාජ්‍ය ඇමැතිවරුන්ගෙන් බහුතරයක් රටේ අරමුණු වෙනුවෙන් වැඩ කළා. ජනාධිපතිතුමාටත් මේවා ගැන යම් අදහසක්, සමාලෝචනයක් ඇති. ඒ නිසා මේ තීරණය ගන්නට ඇති. ඉදිරියේදී සිදුකෙරෙන සංශෝධනයත් ජනාධිපතිතුමාගේ අභිමතය මත සිදුවේවි.

**සහන පැකේජය ගැන මොකද සිතන්නෙ. හැබැයි ඉතින් මේකත් බොහොම අසාර්ථක වැඩක් කියලයි මිනිස්සු කියන්නෙ?**

අපි පසුගිය කාලයේ දිගටම ඉල්ලුවේ පහළ ආදායම් ලබන අය වෙනුවෙන් යමක් කරන්න කියලා. අය-වැයෙන් මිලියන 15,000ක සහන මල්ලක් ලබාදීමට යෝජනා වුණා. ඒක ඉතාම හොඳ යෝජනාවක්. එයට ප්‍රමුඛත්වය දීලා එය කඩිනම් කරන්නම ඕනා. නමුත් මේවා දිගුකාලීන පිළියම් නෙවෙයි. රටේ මුදල් ආදායම් උපදින්නෙ නැත්නම් රට තුළ මුදල් අච්චු ගහන්න වෙනවා. භාණ්ඩාගාර බිල්පත්වලට සාපේක්ෂව තමයි ඒක සිද්ධ වෙන්න ඕනා. එහෙම නොවී මුදල් අච්චු ගහන්න ගියාම උද්ධමනය වැඩි වෙනවා.

**නුගේගොඩ රැලිය නොතිබුණා නම් අද කියවෙන ප්‍රබල නම් අතුගෑවෙනවා**

**වතු කම්කරුවන්ගෙ ප්‍රශ්නය කවදද විසඳෙන්නේ. රුපියල් 1,000ක් දෙන්නෙ කිලෝ 25ක් කැඩුවොත් විතරයි. මේ මිනිස්සු ගැන ආණ්ඩුව බලන්නෙ නැද්ද?**

වතු කම්කරුවන්ගෙ ප්‍රශ්නය බරපතළ කාරණාවක්. මම නියෝජනය කරන දෙණියාය වගේ ප්‍රදේශවල මේ ගැටලුව වැඩියෙන් දකින්න පුළුවන්. අපේ ප්‍රාදේශීය සභාවෙ සභාපතිතුමා කිව්වා වතු කම්කරුවන්ට කන්නත් නෑ කියලා. රුපියල් 1,000 වැඩිකරපු එක ප්‍රායෝගික උත්තරයක් වුණේ නෑ. දලු කිලෝ 22ක් කැඩුවොත් තමයි රුපියල් 1,000 ලැබෙන්නෙ. මේ දවස්වල පොහොර ප්‍රශ්නෙත් එක්ක තේ අස්වනුත් අඩුයි. අනෙක් කාරණය වතු සමාගම් සිතාමතාම වැඩ කරන දින ගණන 22 දක්වා අඩු කොට තිබෙනවා. ඒ නිසා බොහොම සුළු පිරිසකට තමයි 1,000 හම්බෙන්නෙත්. පවතින බඩු මිල එක්ක ඒ මුදලෙන් ජීවත් වෙන්නත් බෑ. ඔවුන් ඉතාම ඛේදනීය අඩියකට තමයි වැටිලා ඉන්නෙ. ඉන්දියානු දමිළ වතුකම්කරුවන් ලංකාවට ඇවිත් වසර 200 සම්පූර්ණ වෙනවා 2023ට. ඉතින් ඔවුන් ගැනත් ආණ්ඩුව බලන්නම ඕනා. තිරිඟු පිටි ලබාදීම ඇත්තටම ඔවුන්ට යම් සහනයක් වුණා. ඔවුන් වෙනුවෙන් ඊටත් වඩා වැඩි මැදිහත්වීමක් වෙන්නම ඕනා.

**රටේ මිනිස්සු හදාගත්තු රත්රන් බඩු උකස් කරනවා. ආණ්ඩුව භාණ්ඩාගාරයේ තිබෙන රන් සංචිත මුදල් කරනවා?**

කවුරු මොන කතා කිව්වත් අපි ඉන්නෙ බරපතළ ආර්ථික අර්බුදයක කියන එක පිළිගන්න ඕනා. ඒක ජනතාවට නොකියන එක තමයි තිබෙන ලොකුම ගැටලුව. ගෙදරක ආර්ථික ප්‍රශ්න ආවම, වත්කම් හිඟවුණාම ගෙවල්වල මිනිස්සු කරන දේම තමයි දැන් ආණ්ඩුවටත් කරන්න වෙලා තිබෙන්නෙ. අපිට විදේශ සංචිතවල ලොකු හිඟයක් තිබෙනවා. ඒ වෙනුවෙන් යම් උපාය උපක්‍රම ක්‍රියාත්මක කරන්න වෙනවා. රන් සංචිත මුදල් කිරීමත් එවැනි එක් උපක්‍රමයක්. නමුත් ආණ්ඩුව මේ විදේශ සංචිත අර්බුදයට සාධනීයව පිළිතුරු දෙමින් සිටිනවා. ඉතිහාසයේ වැඩිම අපනයන ආදායම හිමි වර්ෂය බවට මේ වසර පත්වීමට නියමිතයි. වැවිලි, ධීවර, සංචාරක සහ කර්මාන්ත ක්ෂේත්‍රවල කැපීපෙනෙන වෙනස්කම් වී තිබෙනවා. මේවා තවත් ශක්තිමත් කරන්න පුළුවන් නම් රටේ මූලික අවශ්‍යතාවලට සරිලන ඩොලර් ටික නිෂ්පාදනය කරගන්න පුළුවන්. පොහොර අර්බුදයක් තිබියදීත් මෙරට වැවිලි ක්ෂේත්‍රය නොවැටී පවත්වාගන්න පුළුවන් වෙලා තිබෙනවා. ආනයන සීමා කොට තිබියදී කර්මාන්ත ක්ෂේත්‍රයේ නව දේවල් සිදුකරමින් සිටිනවා. නරක දේවල් අතරේ හොඳ දෙවල් ටිකකුත් සිදුවෙමින් තිබෙනවා. නමුත් කවුරුත් ඒවා ඉස්මතු කරන්නෙ නෑ.

**රාත්‍රියේ අස්සන් කරපු තෙල් ටැංකි ගිවිසුම ගැන මොකක්ද අදහස. කියන තරම් ලොකු දෙයක් මේකෙන් සිද්ධ කරන්න පුළුවන් වෙයිද?**

මේ ගිවිසුම ගැන තවම අපිට පැහැදිලි අවබෝධයක් නෑ. කැබිනට් අමාත්‍යවරයා කරපු පැහැදිලි කිරීම ගැන පමණයි තවම දන්නෙ. ඉදිරියේදි ඇමැතිවරයා මේක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරයි. නමුත් ඉන්දියානු මාධ්‍ය මේක වාර්තා කරලා තිබුණේ ඔවුන්ට වාසිදායක විධියට. කොහොම වුණත් මොන ගිවිසුම් ගහලා අපේ සන්තකයට වැඩි කොටසක් ගත්තට වැඩක් නෑ නිසි පරිදි ආයෝජනයක් කරලා ප්‍රයෝජන ගත්තේ නැත්නම්. මේ ගැන විවිධ මත දැක්වීම් කළත් මම

**ලාභ ඉලක්ක කරගෙන තෙල් සංයුතිය වෙනස් කරනවා නම් ඒක සාපරාධී අපරාධයක්**

විශ්වාස කරනවා උදය ගම්මන්පිල අමාත්‍යවරයා රටට අහිතකර දෙයක් කරන එකක් නෑ කියලා.

**කලින් ගෑස් සංයුතිය වෙනස් කරලා ලොකු විනාශයක් කළා. දැන් තෙල් සංයුතියත් වෙනස් කරලා කියන්නෙ ඇත්තද?**

ගිනිපෙනෙල්ලෙන් බැටකාපු මනුස්සයා කණාමැදිරි එළියටත් බයයි. ගෑස් සංයුතිය වෙනස් කිරීම නිසා ඇතිවුණු ව්‍යසනය නිසා මිනිස්සු දැන් තෙල් ගැනත් බියෙන් ඉන්නෙ. ඇත්තටම ගෑස් අර්බුදය ඇති කරගත්තු එකක්. මෙතැනදිත් ලාභය ඉලක්ක කරගෙන ප්‍රාථමික ආකාරයෙන් තෙල් සංයුතියත් වෙනස් කරනවා නම් ඒක සාපරාධී අපරාධයක්.

**ඉස්සරහට දිගටම කළුවරේ ඉන්නත් වෙයිද?**

මේ සේරම අර්බුද එන්නෙ හරියට පෙරහරක් වගේ එකක් පිටිපස්සේ එකක්. ඉදිරියේදී ඇති වීමට නියමිත නියං සහ වියළි කාලගුණ තත්ත්වයත් සමඟ මේක තවත් අර්බුදයකට යන්න පුළුවන්. එවිට ගල් අඟුරු දැවිතෙල් වැනි බලශක්ති ප්‍රභවයන්ට යන්න වෙනවා. නමුත් ඒවාට ප්‍රමුඛත්වය දෙන්න බෑ ඩොලර් නැති නිසා. විදුලිබල අමාත්‍යාංශයේ සාමාන්‍යාධිකාරි කිව්වා මේ අර්බුද සියල්ල කෘත්‍රිමව නිර්මාණය කළ ඒවා කියලා. බලශක්තිය කියන්නෙ ලොකු වෙළෙඳ මාෆියාවක්. අර්බුදයක් රටේ හැදෙනවිට අපිට සිද්ධ වෙනවා පෞද්ගලික අංශයෙන් මිලදී ගන්න. පසුගිය කාලෙ ජල විදුලි නිෂ්පාදන කටයුතු වුණු නිසා මේ තත්ත්වය වැඩිය දැනුණේ නෑ. නමුත් දැන් මාෆියාව සක්‍රිය වෙමින් පවතිනවා. රජය මේකට වහාම ක්‍රියාත්මක වෙන්න ඕනා. මේ වෙනුවෙන් කාර්ය සාධක බළකායක් හදලා හරි සෘජු මැදිහත්වීමක් කරන්න ඕනා.

**පාර්ලිමේන්තුවේ අශ්ලීල හැසිරීම් දැන් ප්‍රාදේශීය සභාවලටත් ගිහින් නේද? ඇයි පක්ෂ නායකයො - ආණ්ඩුව මේවා ගැන අවධානය යොමු නොකරන්නෙ?**

ආර්ථික අර්බුදයක් ආවම එය ක්‍රමිකව දේශපාලන අර්බුදයක් බවට පත්වෙනවා. එය පාලනය කරන්න බැරිවුණාම සමාජ අර්බුදයක් වෙනවා. දැන් අපි ඉන්නෙ දේශපාලන අර්බුදය සමාජ අර්බුදයක් බවට පත්වෙන ගන්ධබ්බ අවධියක. පාර්ලිමේන්තුව කියන්නෙ රටේ තිබෙන උත්තරීතර ආයතනයක්. නමුත් පාර්ලිමේන්තුවේ ඇතැම් හැසිරීම් පිළිබඳව අපිට බරපතළ විවේචනයක් තිබෙනවා. මේවාට ආණ්ඩුව විතරක් නෙවෙයි විපක්ෂයත් වගකියන්න අවශ්‍යයි. ඒ නිසා මෙවැනි හැසිරීම් පාලනය කිරීමට අදාළ පක්ෂ නායකයන් වගබලාගත යුතුයි.

**මේ විධියටම නම් ඉස්සරහටත් වැඩ කටයුතු සිද්ධ වෙන්නෙ ආණ්ඩුවේ සහ ඔබලාගේ දේශපාලන අනාගතයට කුමක් වෙයිද?**

මේක අපි ඉතාම දුක්විඳලා හදපු ආණ්ඩුවක්. අපි ඒ වෙනුවෙන් කොපමණ දුක් වින්දද කියන එක බොහෝදෙනෙක් දන්නවා. නමුත් ඒක දැන් ඔවුන්ට මතක නෑ. සැටලිම ගහනකන් හිටපු මිනිස්සු නෙවෙයි නේ ගෙදර පදිංචි වෙන්නෙ. මේකත් අන්න ඒ වගේ තමයි. මේ ආණ්ඩුව හදන්න මැදිහත් වුණු කණ්ඩායම් සම්බන්ධයෙන් නිසි අවබෝධයක්, අවධානයක් නැතිව අද කටයුතු කරන ආකාරයක් තමයි පෙනෙන්නේ. ඒ තත්ත්වයන් වහාම වෙනස් වෙන්න ඕනා. 2015 පෙබරවාරි 18දා නුගේගොඩින් රැලිය නොතිබෙන්න මේ රටේ දේශපාලන වංශ කතාවම වෙනස් වෙන්න තිබුණා. නුගේගොඩ රැස්වීම අද බොහොමයක් දෙනෙක් අමතක කරලා. නුගේගොඩ රැලිය නොවෙන්නට අද ඔය දේශපාලනය තුළ කියවෙන ප්‍රබල නම් පවා අතුගෑවිලාම යන්න තිබුණා. මේ ජනවරම ලැබෙන්නේ බහුවිධ මත දරන කණ්ඩායම් අරන් ගිය මතත් සමඟයි. මේ යන විධියෙන් විතැන් වෙලා නිවැරදි වෙන්න තවමත් අපිට කල් තිබෙනවා. නමුත් එය වහාම දේශපාලන සංගායනාවක් සමඟ කරන්න අවශ්‍යයි.

■ **අරුණි මල්ලවආරච්චි**

● **ඡායාරූප - අමිත තෙන්නකෝන්**

# කඹලෑ යක්ෂයාට දෙන දඬුවම් ගැන පත්තිනි මෑණියන් සිහිනෙන් කී රහස




පසුගිය සතියේ සිද්ධ කඹලෑ මුල් සූනියම් දෙවියන්ගේ කතා පුවත අවසන් වූයේ වඩිග යකු අල්ලා ගැනීමට මන්ත්‍රාචාර්යවරුන් ගත් උත්සාහයෙනි. මෙතැන් පටන් දිග හැරෙන්නේ රෞද්‍ර වඩිග යක්ෂයා නව අරහාදී බුදුගුණ බලයෙන් දේවත්වයට පත්වූ ආකාරය සහ දෙවියන්ට සිදුකරන පුද පූජාවන් පිළිබඳවයි.

**යකුන් නිදහස් වෙයි**

රිදී පොටවල්, රන් පොටවල්, තඹ පොටවල්වලින් බැඳ ඇති අපූරු මන්ත්‍ර පොත අතට ගත් ගොපොල්ලන්ට එය ලිහා බලනතෙක් නිම්හිම් නැති විය. එකිනෙක බැමි ලිහී යනවාත් සමඟ මන්ත්‍ර පොත ගැහෙන්නට විය. පොතට බලගතු ආරූඪයක් පැමිණ ඇති බව දුටු ගොපොල්ලෝ බියෙන් පලායන්නට වූහ.

එතෙක් බලගතු මන්ත්‍රවල ජපයෙන් පොතට බන්ධනය වී සිටි වඩිග, ඔඩ්ඩි, සූනියම් යන තිදෙනාම ලද සැණින් මන්ත්‍ර පොතෙන් පිටතට පැන ගත්හ. භාරතයේ ජීවත් වන සමයේ තිදෙනකු ලෙස ජීවත් වුවත් මන්ත්‍ර පොතින් තිදෙනා පිටතට පැන්නේ එක් ආත්මයක් සහ එක් බලවන්ත බලවේගයක් පරිද්දෙනි. ඔඩ්ඩිස සිද්ධ කඹලෑ මුල් සූනියම් දේවතාවුන් ලෙස එම ඒකාත්මික වූ බලවේගය හඳුන්වයි.

ගොපල්ලාව ගලෙහි ගොපලුකම් කරමින් සිටි ගොපලුවන්ගේ මැදිහත් වීමෙන් නිදහස් වූ බැවින් මෙම යක්ෂයා ගොපලු ඔඩ්ඩිස ලෙසින්ද හඳුන්වයි. කෙසේ හෝ ජනප්‍රවාදයට අනුව මෙම යක්ෂයා කඹලෑ යක්ෂයා ලෙස ප්‍රකටව ඇත්තේ කබලෑවෙන් පිටත් වූ නිසාත් කඹ දමා හෝ අල්ලා ගැනීමට නොහැකි වූ නිසාත්ය. යකුන්ගේ පිටව යෑමෙන් හිස් වූ මන්ත්‍ර පොත පසුව ගොපල්ලන් විසින් කුඹල්කරුවන්ට භාර දෙන්නට වූහ. කුඹල්කරුවෝ එය කුඹල්වල ගමේ ප්‍රධාන වෙල් යායේ තිබූ රූස්ස නුග ගසක බෙනයක තැන්පත් කොට පුද පූජාවන් පැවැත්වූහ. ඒ බව කවියෙන් මෙසේ දක්වා ඇත.

**දෙමින් එපොත බඩහැල බිලිඳුන්ගේ**
**ගොසින් ඒ නුග මුල තේවා කරන්නේ**
**තෙදින් ඒ යක් සෙන් පිරී වරමින්නේ**
**නමින් කුඹල්වල නම් සලසන්නේ**

නිදහස් වූ කඹලෑ යකු සතුට සමරයි බොහෝ කාලයක් මන්ත්‍රවල බන්ධනයට හසුව වේදනාවට හා පීඩාවට ලක්ව සිටි යක්ෂයාට මෙය අපූර්වතම අස්වැසිල්ලක් විය. යක්ෂයාගේ සතුට කොතරම් වීද යත් ඔහු ඉහළ අහසට නැගෙමින් පිම් 18ක් පැනගෙන පැනගෙන යන්නට විය. අදටත් ඒ පිම් 18 පැනපු ස්ථාන නින්දගම් වශයෙන් දක්නට ලැබෙයි. එම නින්දගම් 18න් කඹලෑ පියසේ වැඩ වසන්නට කඹලෑ දෙවියන් වැඩි රුචියක් දක්වා ඇත.

**මෙකී මෙගම් ලැබෙන දෙව් එමවිට**
**වැකී ඉන්න ලොබවී කබලෑවට**
**රැකී නොයෙක් කෝවිල්වල වැඩසිට**
**මෙකී සියල ගම් කඹලෑ සුරිඳුට**


යනුවෙන් එය දක්වා ඇත්තේ මේ ආකාරයෙනි.

මන්ත්‍ර පොතෙන් නිදහස් වුවද යක්ෂයාට තම අතීතයෙන් නිදහස් වීමට නොහැකි විය. මන්ත්‍රකරුවන් තමාව මන්ත්‍ර පොතට සිර කළ ආකාරය, තමාව මැරීමට කුමන්ත්‍රණ කෙරූ ආකාරය ඔහුට නිරන්තරයෙන් සිහිපත් විය. එනිසාම යකුගේ සිතට ඇති වූයේ වෛරයකි. ඒ වෛරය නිසාම ඔහු නැවත මිනිසුන්ගේ ග්‍රහණයට නතුවේ යැයි සිතන්නට විය. ශක්තිමත් පිරිමින් සිටියහොත් තමා අල්වා ගනිවි යැයි සිතූ යක්ෂයා ගම්මානයෙහි පිරිමි දරුවන් මරා දමන්නට සැලසුම් කළේය. උපදින උපදින පිරිමි දරුවන් රහසේ මරා දමන්නට පටන් ගත් යක්ෂයා කාන්තාවන්ට පිරිමි දරුවන් බිහිවීම වැළැක්වීම සඳහා වින කරන්නට විය. මෙය ගම් වැසියන්ට මහත් වූ පීඩාවක් විය. තමන්ගේ නිවෙස්වල සිටි පිරිමි දරුවන් හිටි අඩියේ අතුරුදන් වීම නිසා ගම්මු කලබලයට පත්ව සිටියහ.

අතුරුදන් වන පිරිමි දරුවන්ගේ මෘත ශරීර ගම අසල කැලෑබද පෙදෙසකින් හමුවන්නට විය. එය කොල්ලන් වැළලූ පිටිය ලෙස හැඳින්වූ අතර ඇඹව විහාරයට මීටර් 500ක් පමණ දුරින් එම පෙදෙස අදටත් දක්නට ලැබේ.

**යකු නැවත අල්ලා ගැනීමට සැරසෙයි**

යක්ෂයාගේ ගැහැට තවදුරටත් ඉවසාගත නොහැකි වූ ගම්මු නැවත යක්ෂයා බන්ධනයට ලක්කරන ක්‍රමයක් ගැන සොයන්නට වූහ. ග්‍රාමීයව විසූ මන්ත්‍රකරුවන් සොයාගෙන



ගොස් කාරණය කියුවද එම කිසිදු මන්ත්‍රකරුවකුට යක්ෂයා අල්ලා ගැනීමට නොහැකි විය. උත්සාහ කළ, සැලසුම් කළ සියලු මන්ත්‍රකරුවන්ට ජීවිතයෙන් වන්දි ගෙවීමටද සිදුවිය. එනිසා තවදුරටත් මන්ත්‍රකරුවන්ගේ පිහිට පැතීම නිෂ්ඵල බව වටහා ගත් ගම්මු වෙනත් විකල්ප මාර්ග සොයන්නට වූහ. ඔවුන්ගේ මතකයට නැඟෙන්නේ මහා බලසම්පන්න වූත් මතු බුදු බව ප්‍රාර්ථනා කරන්නා වූත් පත්තිනි මාතාවන්ය. දේවතාවියට පුද පූජා පැවැත්වූ ගම්මු "අනේ අපේ පිරිමි දරුවන් මේ යක්‍ෂයාගෙන් බේරා දෙන්න, අපිට යක්‍ෂයාගෙන් සිදුවන කරදර නවත්වා දෙන්නැයි" කියමින් දේවතාවියට කන්නලව් කළහ.

**පත්තිනි මෑණියන් සිහිනයට පැමිණෙයි**

කන්නලව්වෙන් පසුව දිනක් දෙකක් ගත වනවිට අපූරු හාස්කමක් සිදුවිය. කබලෑව ගමේ සිටි සිල්වත් රාල හෙවත් රාජපද්ම මුදියන්සේ රාත්‍රියේ දුටු සිහිනයකට පත්තිනි මෑණියන් වැඩම කළාය.

"සිල්වත් රාල, මං කියන දේ හොඳින් අසාපන්, මං දෙන උපදෙස් හරියට පිළිපැදපන්" යනුවෙන් පතිනි මවුන් සිල්වත් රාලට පවසන්නට විය. එය උපදෙස් මාලාවකි. සිල්වත් රාලද අප්‍රමාණ වූ භක්තියෙන් හිස සලා එය පිළිගත්තේය.

"ඇඹව පන්සලේ බෝ ගස අද්දර ගල් තලාවක් තිබෙනවා. එතැනට ගොස් ගුරුකම් වෙනුවෙන්ම වෙන් වූ නව ගුණ වැල් හත් පොටක් අරගෙන නව අරහාදී බුදු ගුණ ලක්‍ෂ වාරයක් ජප කොරාපිය. හැබැයි මේවං කරන්න කලින් ලුණු නොදාපු කිරිබත් කාලා යන්න ඕනා. එතකොට තමයි යක්‍ෂයාගේ යක්‍ෂ කුයිල හරියටම නහයට දැනෙන්නේ. මෙන්න මේ ටික හරියටම කරගෙන යනකොට වළං ගේන බඩහැල මනුෂ්‍යයකුගේ වේශයෙන් යක්‍ෂයා එතැනට පැමිණේවි. ඒ වනවිටම නව අරහාදි බුදු ගුණවලින් බලගන්වපු නවගුණවැල් හත්පොටම යක්‍ෂයාගේ බෙල්ලට දමාපන්. එතකොට යක්ෂයා මට්ටු වෙනවා." ගමේ කරදරත් අහවර වෙනවා" යනුවෙන් පවසා පත්තිනි මෑණියන් සිහිනයෙන් අතුරුදන් වූවාය.

**සිල්වත් රාල පන්සලට යයි**

පත්තිනි මෑණියන් සිහිනෙන් කී පරිදි ලුණු නැති කිරිබතක් කෑ සිල්වත් රාල නව ගුණවැල් හතපොටක්ද රැගෙන ගල්තලාව මත බද්ධ පර්යංකයෙන් වාඩි වූවේය. බුදු ගුණත් දේවාශීර්වාදයත් සිහිකොට සිල්වත් රාල නව ගුණවැල් හත්පොට අතෙහි දරාගෙන "ඉතිපිසෝ, භගවා, අරහං ආදී ලෙසින් නව අරහාදී බුදු ගුණ මතුරන්නට විය. ලක්‍ෂ වාරය සම්පූර්ණ වීගෙන එනවිටම වළං කඳක් කර තබාගත් මනුෂ්‍යයකු ඔහු අසලට පැමිණියේය. මිනිස් වෙසක් මවා ගත්තද කුයිලයෙන් මේ නම් යක්‍ෂයාම බව සිල්වත් රාලට අවබෝධ විය.

මූත් හදන්නේ මාව අල්වා ගන්න. ඉඳින් මම හොඳ වැඩක් කරන්නම් යැයි යක්‍ෂයා වළං කඳ පොළවේ ගසා සිල්වත් රාලට ගර්ජනා කරන්නට විය. කත් ලීය අතට ගෙන පයින් පොළවට ඇන්න යක්‍ෂයා මාව යටත් කරන්න තෝ කවුදැයි දත් විළිස්සා පාමින් අසන්නට වූවේය. කත් ලීය ඇනුණු ස්ථානය පැළී විවර වී ජලධහරාවක් අහසට විදින්නට විය.

එම ස්ථානයේ අදටත් ළිඳක් දක්නට ඇත. එම ළිඳ තනා ඇත්තේ යකු කත් ලීයෙන් සිදුරු කළ ස්ථානයේ බව ජනප්‍රවාදයේ සඳහන් වේ. අදටත් එම ළිඳෙන් කාන්තාවන්ට නෑමට හැකියාවක් නැත. මන්දයත් ඔවුන්ට ලෙඩ දුක් ඇතිවන හෙයිනි.

යකු රෞද්‍රව කෑ ගසනවිට බියට පත් වූ සිල්වත් රාල දිගින් දිගටම බුදු ගුණ සිහිකරන්නට විය. එවිට මනුෂ්‍ය වේශයෙන් සිටි යක්‍ෂයාගේ පෙනුම කෙමෙන් වෙනස් වන්නට විය. හිස කෙස් හැඩපලු ගෙතුණු, රතු වූ ඇස් ඇති භයංකර යක්‍ෂයෙක් තමා ඉදිරියේ සිටිනවා දුටු සිල්වත් රාලට උන් සිටිතැන් අමතක විය. කෙතරම් බිය වූවාද කිවහොත් යක්‍ෂයාගේ බෙල්ලට දැමීමට හැකි වූයේ නව ගුණ වැල් හත් පොටින් තුන් පොටක් පමණි. අනෙක් හතර පොට කැඩී විසිවී යන්නට විය.

**බුදු ගුණට යකු මෙල්ල වේ**

යක්‍ෂයාගේ ගෙලට නව ගුණවැල් තුන් පොට වැටෙනවාත් සමඟම යකුගේ රෞද්‍රත්වය, ප්‍රචණ්ඩත්වය කෙමෙන් අඩු වන්නට විය. එය දුටු සිල්වත් රාලගේ සිතට ඇති වූයේ මහත් වූ චිත්ත ප්‍රීතියකි. බුදු ගුණට මෙල්ල වූ යක්‍ෂයා එසැණින් සන්සුන් බවට පත්විය.

මෙල්ල වූ කඹලෑ යකු වෙතට පත්තිනි මෑණියන් පැමිණියාය.

යක්ෂයාගේ කෙස් වැටියෙන් අල්වා ගත් පත්තිනි මාතාවන් යක්ෂයාට අවවාද සහිත අනුශාසනාවක් කරන්නට වූවාය.

"තමන්ගේ බලය වටහාගෙන මින් ඉදිරියට කුසල්ම පමණක් කරන්න මේ තැන් සිට අධිෂ්ඨාන කරන්න ඕනෑ" ඒ අවවාදය තම සිත්හි දැඩි සේ දරාගන්නට පොරොන්දු වූ කඹලෑ යකුට පත්තිනි මෑණියන් 'කඹලෑ වාහල බණ්ඩාර' ගෞරව නාමය ලබා දීමට කටයුතු කළාය.

එතැන් පටන් දහස් සංඛ්‍යාත ජනී ජනයාගේ වැඳුම් පිදුම් ලබන්නට කඹලෑ මුල් සූනියම් දෙවියන්ට අවස්ථාව හිමි විය. පත්තිනි මෑණියන් ලබා දුන් රාජ ඔඩ්ඩිස බලයෙන් අද දක්වාම කටයුතු කරමින් සිටියි. උන්වහන්සේ දැක බලා ගෙන වැඳ පුදාගෙන යෑමට පැමිණෙන බොහෝ දෙනකු පවසන්නේ ඇඹව පූජා භූමියට ඇවිත් දෙවියන් දිහා බලා ප්‍රාර්ථනාව කියලා ගියත් ඇතියි කියාය. අදටත් එම විශ්වාසය, ප්‍රාතිහාර්යයන් එසේමය.

මිනිසුන්ගේ සිත්සතන්හි කබලෑව ඇඹව ගම්භාර සිද්ධ කබලෑ මුල් සූනියම් මහා දේවාලය පිළිබඳව අදටත් ඇත්තේ මහත් වූ භක්ත්‍යාදරයකි. ගෞරවයකි.

**දේවත්වය පත් වූ යක්ෂයා**

අඹ වැවේ සිල්වත් රාල කඹලෑ යකු දමනය කිරීම උදෙසා පිරිත් කිරීමට යොදා ගත් භූමියේ පැවැති බෝධීන් වහන්සේ ආශ්‍රය කරගනිමින්. අබිනව කඹලෑ දෙවිඳුන්ගේ ප්‍රධාන වාස භූමිය සකස් වී තිබේ.

අඹ වැව සිල්වත් රාල රෞද්‍ර යක්ෂයා දමනය කිරීමෙන් පසුව ඔහුගේ නාමයත්, හිතුවක්කාර යක්ෂයා දේවත්වයට පත් වීමේ පුවතත් දසත විහිදී ගියේය. බ්‍රහ්මචාරී ජීවිතයක් ගෙන ගිය අඹවැව සිල්වත් රාල මෙම භූමිය මුල්කරගනිමින් තම ආධ්‍යාත්මික ජීවිතය පවත්වා ගෙන ගොස් ඇත.

කඹලෑ යකුගෙන් ඇති වූ පීඩාව නිසා නින්දගමේ මිනිසුන්, යකු දෙවියකු ලෙස එක එල්ලේම පිළිගැනීමට බිය වූහ. යකුගේ කරදරය යළි ගම් වැසියන්ට පැමිණෙතැයි ඔවුන් සිතූ මුත් කල්යත්ම ජන ජීවිතය සාමාන්‍ය තත්ත්වයට පත්විය.

මෙසේ කාලය ගත වනවිට නින්දගමෙහි වඳුරු වසංගතයක් ඇති විය. සිදුවූ පීඩාවන්ගෙන් මිදීමට විවිධ දේ කළද ඒ සියල්ලක්ම අසාර්ථක විය. ඉන්පසුව ගම්වැසියෝ අඹ වැව සිල්වත් රාලට මේ මේ බව සැල කළහ. ඔහුගේ මඟපෙන්වීම යටතේ කඹලෑ දෙවියන්ගේ වාසභූමිය වූ බෝධීන් වහන්සේ අසලට පැමිණ දෙවියන්ට දුක කියමින් කන්නලව් කළේය.

එහි ප්‍රතිඵලයක් ලෙස වසංගතය නිමා වී සශ්‍රික දිවිපෙවෙතක් ගෙවීමට ගම්මුන්ට හැකි වී තිබේ.

වසංගතය දුරුවීමෙන් පසු කඹලෑ සිද්ධ සූනියම් දෙවියන්ට කෘතඥතාව පළ කිරීමට බෝධීන් වහන්සේ පාමුල දේවාභරණ සහිත දේවාලයක් ඉදි කළේය. මේ සඳහා මූලික වී ඇත්තෙ අඹවැව සිල්වත් රාලය.

කාලයාගේ ඇවෑමෙන් ගැමියන්ගේ ජීවන රටාවේ සහ සිතුම් පැතුම්වල වෙනස්කම් ඇති විය. කෝට්ටේ රාජධානි සමයේ දකුණු ඉන්දියාවේ සිට තෙලිඟු මන්ත්‍රිකරුවන්, වෙළෙඳුන්, සංචාරකයන්, සාස්තරකරුවන් යාචකයන්, සරණාගතයන් වැනි විවිධ පිරිස් මෙරටට පැමිණ පදිංචි වූහ.

තෙලිඟු මන්ත්‍රකරුවන් පිරිසක්ද සත්කෝරලයට පැමිණියේ මන්ත්‍ර පොතේ සහ වඩිග යකුගේ ප්‍රබලත්වය දන්නා නිසාය. යක්ෂයා නිදහස් වූ බව ඔවුන්ට දැනගන්නට ලැබිණි. එබැවින් ඔවුන්ගේ මන්ත්‍ර ප්‍රබලකොට භාවිත කිරීමට තෙලිඟු රටට රැගෙන ගියේය. තෙලිඟු මන්ත්‍රකරුවන්ගෙන් සිංහල ගැමියන්ද මන්ත්‍ර ගුරුකම්, හදි හූනියම් ආදී ගුප්ත ශාස්ත්‍රද වඩිග යකුගේ ප්‍රබලත්වයද ඉගෙන ගන්නට විය. කඹලෑ යකු ලෙස තමන් මෙපමණ කාලයක් අදහා ඇත්තේ ඉතාම ප්‍රබලයකු බවද ඔවුහු වටහා ගත්හ. නව අරහාදී බුදුගුණ බලයෙන් යක්ෂයා දෙවියකු බවට පත් වුවද යක්ෂ ගති සම්පූර්ණයෙන් නසන්නට නොහැකි විය. යකුගේ පැවැති ප්‍රබල රෞද්‍ර වෛරී සිතුවිලිත්, මන්ත්‍ර පොතෙහි බලපෑමත් මෙයට හේතු විය. අදටත් කඹලෑ සිද්ධ සූනියම් දෙවියන් මාස දොළසේ පුර පක්ෂයේ දේවාත්ම ස්වරූපයෙන්ද මාස දොළසේ අව පක්ෂයේ යක්ෂාත්ම ස්වරූපයෙන්ද පෙනී සිටින්නේ එහෙයිනි.

ඓතිහාසික කඹලෑ මහා දේවාලයෙහි චාරිත්‍ර පිළිබඳව අවධානය යොමු කිරීමේදී චාරිත්‍ර ප්‍රධාන ශීර්ෂ තුනක් යටතේ සාකච්ඡා කෙරේ.

**දිනපතා පවත්වන චාරිත්‍ර**
**සතිපතා පවත්වන චාරිත්‍ර**
**වාර්ෂිකව පවත්වන චාරිත්‍ර** වශයෙනි.




මෙම සියලු චාරිත්‍ර ඓතිහාසිකව පැවත ගෙන එයි. කාලයත් සමඟ යම් යම් වෙනස්කම් සිදු වුවද දේවාලයෙහි චාරිත්‍රයන් සිදුකිරීමේ ප්‍රධාන වගකීම පැවරී ඇත්තේ ප්‍රධාන විහාරාධිපති හිමියන්ට සහ ප්‍රධාන කපු මහත්වරුන්ටය. මෙම සියලු පුද සිරිත් බෞද්ධාගමික සම්ප්‍රදායට අනුකූලව සිදුකෙරේ. මෙම චාරිත්‍ර විධිවල විශේෂ කරුණු කිහිපයක් ඇත.

දේවාලයෙහි චාරිත්‍ර ඉටු කිරීමට කුල හතක් ඇත. ඔවුන්ගේ වගකීම වන්නේ විහාරස්ථානයේ සහ දේවාලයේ තේවා කටයුතු කිරීම, බෙර දවුලු වාදනය, දේවාලයෙහි මුරුතැන් පිසීම, දේව පූජාවලට අවශ්‍ය පැණි හකුරු සකස් කිරීම, දේවාලයට පාවාඩ දැමීම හා පිරුවට සැපයීම, දේවාලයට ආභරණ තනා දීමද, සිත්තර ඇඳීම හා පිළිම නෙළීම ආදියයි. සීතාවක පළමු වැනි රාජසිංහ රජුගෙන් මෙම කුලයන්ද සමඟ කබලෑව ගම්වරයක් ලෙස ලැබුණු බව විශ්වාස කෙරේ. දිනක් රජුගේ අගමෙහෙසියට රෝගී තත්ත්වයක් ඇති විය. විවිධ මන්ත්‍රාචාර්යවරුන් ලවා රෝගය සුව කිරීමට උත්සාහ දැරුවද එය අසාර්ථක විය. ඉන්පසුව රජුට කඹලෑ දෙවියන්ගේ හාස්කම් ගැන දැනගන්නට ලැබීමෙන් පසුව එහි මහා දේවාලයෙහි දීගල්ල රාලව මාලිගයට කැඳවා බිසව සුවකර දෙන මෙන් ඉල්ලා ඇත. දේව ආශීර්වාදයෙන් බිසව සුවපත් කිරීමට දීගල්ල රාලට හැකිවිය. ඉන් සතුටට පත්වූ රජතුමා දෙවියන්ට සේවය කිරීම උදෙසා කුල හතද සමඟින් කබලෑව ගම්වරයක් ලෙස පූජා කර ඇත. එදා පටන් ඔවුන් දේවාලයෙහි සේවයට බැඳුණු අතර ඔවුන්ටම ආවේණික වූ පිදවිලි හතක්ද ක්‍රියාත්මක විය.

එනම්,

**01. අනුමැති පිදවිල්ල**
**02. නවන්දන්න පරමාචාරී පිදවිල්ල**
**03. රදා පිදවිල්ල**
**04. ශිල්පපති පණික්කිලා ඇතුළු නැකැත් හේවා පිදවිල්ල**
**05. වහුම්පුර පිදවිල්ල**
**06. බඩහැල පිදවිල්ල**
**07. බත්ගම පිදවිල්ල ලෙසයි.**

මෙම සියලු කුල නියෝජනය කරමින් සියලුම තේවාවන් සිදුකරන්නේ අනුමැති රාල විසිනි.

පුරාණ කබලෑව මුල් සූනියම් දේවාලයෙහි වසර 177කට වඩා පැරැණි දේව පිළිරුවක් දක්නට ලැබේ. එය නිර්මාණය කර ඇත්තේ බරිගොඩ ගුරුන්නාන්සේ විසිනි. දිනපතා පවත්වන චාරිත්‍ර හීල් තේවාව, මහ තේවාව, සැන්දෑ දුරයේ තේවාව සහ මහ තේවාව ආදිය ඉටු කරයි. දිනපතා පවත්වන චාරිත්‍ර අතර දෛනික තේවා ඇතුළුව කෙම්මුර දින වතාවත් හා පොදු කටයුතු සම්පූර්ණ කෙරේ. සතිපතා පවත්වන චාරිත්‍ර අතර දෛනික තේවා ඇතුළුව කෙම්මුර දින වතාවත් සහ පොදු කටයුතු සම්පූර්ණ කෙරේ. කෙම්මුර දින ආරම්භය උදෑසන 10.10ට මූලික පහන් ආලෝකය දල්වා රාත්‍රි 10.10ට සම්පූර්ණ වී නැවත අලුයම 5.33 දක්වා වතාවත් සිදුවීම පැරැණි චාරිත්‍රයයි. වාර්ෂිකව පවත්වන චාරිත්‍ර ලෙස අලුත් සහල් මංගල්‍යය, ප්‍රධාන දොර වැසීම, දොර ඇරීමේ උත්සවය, පොල් අතු බැඳීමේ හා පිළිසකර කිරීමේ මංගල්‍යය, අලුත් අවුරුදු උත්සවය, ඇසළ පෙරහර ආදී උත්සව අදාළ වේ. කඹලෑ දෙවියන්ට මුරුතැන් බත සැපැයීමට වසර 235 ලිඛිතව බත සපයන කුඹුරක් ඇත. එය කෝවිල කුඹුරයි. වෙල්යායේ අනෙක් කුඹුරු අතරින් පළමුව අස්වද්දන්නේ සහ බැතලන්නේ මෙම කුඹුරයි. මෙය දෙවියන්ට සිදුකරන වතාවකි.

ඓතිහාසික වශයෙන් ගොඩනැගුණු චාරිත්‍ර ධර්ම පද්ධතියක් ඇති, වර්ෂ 265ක ලිඛිත ඉතිහාසයක් ඇති කබලෑව, ඇඹව ගම්භාර සිද්ධ කඹලෑ මුල් සූනියම් දේවාලයේ ඉතිහාසය ගම්පොළ රාජ්‍ය යුගය වනතෙක් දිවයයි.

■ **සටහන – දුමිඳු ලංකා බණ්ඩාර**



**ඇඹව ශ්‍රී සුධර්මාරාම කණුකැටිගෙදර ශ්‍රී පුෂ්පාරාම උභය විහාරාධිපති, විද්‍යා විනෝද මහා පිරිවෙනෙහි නියෝජ්‍ය පරිවේණාධිපති, ශාස්ත්‍රපති පණ්ඩිත පූජ්‍ය ඉරුදෙණියායේ සිරිරතන හිමි**



# පොහොට්ටුවේ හාල්පාරු මන්ත්‍රීවරු බැසිල්ගේ අරමුණ දන්නේ නෑ

## සමගි ජන බලවේගයේ රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂා විතානගේ



**මෛත්‍රීපාල වගේ දේශපාලන කුණු ගොඩවල් පැත්තකට දැමිය යුතුයි**

**දේශපාලකයන්ට කලින් මාධ්‍ය හැදෙන්න ඕනෑ**

**බැසිල්ව වීරයෙක් කරන්නේ අං ආපු අය**

**සජබටවත්, ජවිපෙටවත් මේ අර්බුදයට තනියම විසඳුම් සොයන්න බෑ**

**තරුණයන් කියන්නේ 30ට අඩු අය: දේශපාලන ක්‍රමය විනාශ වෙන්න වයසත් හේතුවක්**

**නාමල්ගෙත් හීනයක් තියෙනවා ජනාධිපති වෙන්න. තාත්තා අගමැති, බාප්පා ජනාධිපති. කැබිනට් එකෙත් හතර පස් දෙනෙක් ඉද්දි මේ ප්‍රශ්නෙ විසඳන්න බැරි නම් එළවලා දාන්න ඕනේ**

**පරණ දේවල් එළියට දාලා ආණ්ඩුව අද ජවිපෙට ගහනවා**

**දිස්ත්‍රික්කේ දිනන්නේ නැතිව සංවිධායක කමින් වැඩක් නැති නිසා ඉල්ලා අස්වීමේ ලිපිය දුන්නා**

**සංවිධායක තනතුරුවලට කාගේ හරි නමක් දාලා ඡන්දෙට යවන එකට මන් විරුද්ධයි**

**පක්ෂයෙන් මට කුඩම්මාගේ සැලකිලි ලැබුණා**

**තාත්තාගෙන් පුතාට යන දේශපාලනය කැඩිය යුතුයි**

**ආණ්ඩුවට මඟහැරෙන කොටස් ඉටු කරන්නේ විපක්ෂ නායකතුමා**

**ඔබ සහ පක්ෂය අතර තිබූ විරසකකම් ඉවරද?**

අපි පක්ෂය එක්ක කිසිම විරසකයක් තිබුණෙ නෑ. අපිට මතයක් තියෙනවා. මේ රටේ දේශපාලනය එකම ආකාරයට කළ පක්ෂ දෙකක් තිබුණෙ. ඒ පක්ෂ දෙකෙන් වෙනස්ව අලුත් පක්ෂයක් ලෙස ජනතාව අතරට යන්න කියන කාරණාවෙ අපි හිටියා. ඒ කාරණයේදී සමහර අපේ හිටපු ජ්‍යෙෂ්ඨ ඇමැතිවරු ඊට විරෝධය දැක්වූවා. සමහර විරෝධතා සාධාරණ නෑ. ඒ හරහා එක එක මත ගැටුම් ඇතිවීම විනා විපක්ෂ නායක සමඟ හෝ පක්ෂය සමඟ කිසිම තරහක් තිබුණෙ නෑ.

**ඔබ ඔය කියන ජ්‍යෙෂ්ඨයන් කවුද?**

රත්නපුර දිස්ත්‍රික් මන්ත්‍රීවරයෙක් විදිහට මට ප්‍රශ්නයක් තිබුණා. ඒ රත්නපුර දිස්ත්‍රික්කයේ එ.ජා.ප.යට දිනන්න බැරි වුණා. ස.ජ.බ. විදිහටත් අපි විශාල පරාජයක් ලැබුවා. මේක ජයග්‍රහණය කරා යන්න නව වැඩසටහනක් දිස්ත්‍රික්කයේ සංවිධානය කළ යුතුයි. පහුගිය මැතිවරණයේ වැඩිම මනාප ලැබූ මන්ත්‍රී ලෙස මම පක්ෂයට යෝජනාවලියක් ඉදිරිපත් කළා. ඒ යෝජනා හරි සාධනීයයි. එකක් ඉන්න ආසන සංවිධායකලා පුළුවන් තරම් ශක්තිමත් කරන්න ඕනෑ. ආසන සංවිධායකලා නැති තැනට කාගේ හරි නමක් දාලා ඊළඟ මැතිවරණයට දාන එකට මම විරුද්ධයි. ඒ වෙනුවට මම යෝජනා කළා ශ්‍රී ල.නි.ප. හිටපු කැබිනට් ඇමැතිවරයා ජයතිස්ස රණවීර එක්ක සාකච්ඡා කරලා එතුමා පක්ෂයට ගන්න. නායකතුමත් එකඟ වෙලා තියෙද්දි දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමියක් ඊට විරුද්ධ වෙලා ඒක මඟ හැරුණා. ඊට අමතරව තව ව්‍යාපාරිකයෝ විශේෂයෙන්ම දේශපාලනික වශයෙන් වසර ගණනාවක් බළංගොඩ මැතිවරණ කොට්ඨාසයට ශක්තිය දුන් ධර්මදාස සිල්වා, ගුරුසිංහ, විජය නිල්මිණි හිටපු පළාත් සභා මන්ත්‍රීතුමියගේ පුත් අසංක විජය නිල්මිණි කියන නායකයන්ට ආසන සංවිධායක හෝ දිස්ත්‍රික් සංවිධායක ධුර දී ඒ ජවය එකතුකර කණ්ඩායමක් ලෙස රත්නපුර දිස්ත්‍රික්කය දිනන වැඩපිළිවෙළක් ඉදිරිපත් කළා. ඒ සියල්ලට අපේ මන්ත්‍රීතුමියගෙ විරෝධය ආවා. මම කල්පනා කළා කොළොන්න ආසනයේ සංවිධායක ලෙස ඉඳලා වැඩක් නෑ දිස්ත්‍රික්කය දිනන්නෙ නැතිව. ඒ හින්දා ආසන සංවිධායකකමින් ඉල්ලා අස්වීමේ ලිපිය දුන්නේ. මහලේකම්වරයාට ඒ ලිපිය දුන්නෙ. හිතුවෙ නැති විදිහට ඒකට විශාල මාධ්‍ය ප්‍රචාරයක් ආවා.

**ඔබ එවැනි ලිපියක් මහලේකම්වරයා අතට දුන්නෙ නෑ කියලා ඔහු ප්‍රකාශ කර තිබුණා?**

ඔහුගේ අතටම ලිපිය ලබා දුන්නා. එදා නිකම්ම දවසක් නෙවෙයි කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමක් තිබූ දවසක්. ඒ දිනයේදී ඔහුගේ අතට මා ලිපිය භාර දුන්නා.

**ඔබේ පක්ෂ මහලේකම්වරයාගෙන් මේ ගැන විමසූ විට ඔහු ප්‍රකාශ කළා දරුවෝ වැරැදි කළාට මවුපියෝ දරුවන් අත්නොහරින බව. ඔබට ඒ ගැන මොකද හිතෙන්නේ?**

අපි දරුවෝ විදිහට අම්මා තාත්තා කියන දේ අහගෙන ඉන්න කැමතියි. හැබැයි අම්මා තාත්තා එක දරුවකුට එක විදිහකටත්, අනිත් දරුවාට තව විදිහකටත් සලකනවා නම් පවුලේ ප්‍රශ්න ඇති වෙනවා.

**ඔබ කියන්නේ පක්ෂයෙන් ඔබට කුඩම්මාගේ සැලකිලි ලැබුණු බවද?**

ඔව්. ඒ මොහොතේ මට කුඩම්මාගේ සැලකිල්ලක් දැනුණා. මම මෙපමණ අවංක සද්භාවයෙන් ක්‍රියාකරද්දි එහෙම වෙන්න බෑ. මනාප යුද්ධයක් තියෙන්නේ තව අවුරුදු 4කින්. නමුත් ඊට පෙර මට අවශ්‍ය වුණේ මනාපය ලැබෙන කටයුතු සැලැස්වීම. මේ යෝජනාව සාධනීයයි කියලා නායකතුමා පිළිගත්තත් අනිත් අය මේකට විරුද්ධ වෙනවා නම් ඒ ගැන කතා කරලා වැඩක් නෑ. දැන් ප්‍රශ්නය සමනයට පත් වෙලා තිබෙනවා. නායකතුමා පොරොන්දු වෙලා තියෙනවා ඒ සියලු දෙනාට දිස්ත්‍රික්කයේ සියලුම දෙනාගේ සහාය ගන්න කියලා.

**ඔබේ නායක සජිත් ප්‍රේමදාස සමඟත් ඔබ සහ මන්ත්‍රී චමින්ද විජේසිරි යම් යම් විරසකයන් ගැටුමක් ඇති වූ බව පසුගිය දිනවල වාර්තා වුණා. උදාහරණයක් ලෙස ඔබලා ඒ දිනවල පාර්ලිමේන්තු ආවෙත් නෑ?**

ඒවට බලපෑවේ වෙන කිසිම ප්‍රශ්නයක් නෙමේ. මේ කියපු හේතුව මත අපේ ඒ මත ගැටුම තියෙන්නේ. සම්ප්‍රදාය තුළ ඉන්න එපා කියලා මම කියන්නෙ. කණ්ඩායම් රැස්වීම තුළ තමයි මේක මතු වුණේ. ඒකෙන් ජ්‍යෙෂ්ඨයන්ට තමයි හානිය.

**ඔබ හිතනවද ජ්‍යෙෂ්ඨයන් නැතුව මේ තරුණ අය සමඟ පමණක් ඉදිරියට යෑම සාර්ථකයි කියල?**

පැහැදිලිවම ඕනෙම පක්ෂයක ජ්‍යෙෂ්ඨ, හිටපු මන්ත්‍රීවරු සහ ඇමැතිවරුන්ගේ අදහස් එක්ක තමයි යන්න ඕනේ. හැබැයි ඒ අදහස අලුත් වෙන්න ඕනේ. ජ්‍යෙෂ්ඨයන්ගේ අදහස් සාම්ප්‍රදායික විය යුතු නැහැ. ඒ ජ්‍යෙෂ්ඨයන්ට තරුණ කණ්ඩායමේ ජවයත් එක්ක තමයි ඉදිරියට යන්න පුළුවන්. මොකද එහෙම නැත්තම් අපි පරණ විදිහට යනවා. උදාහරණයක් ලෙස එක්සත් ජාතික පක්ෂය පරාජය වීමට හේතුව එ.ජා.ප.ය කිසිම වෙලාවක අලුත් වුණේ නැතිකම. තාත්තාගෙන් පුතාට යන දේශපාලනයක් තිබුණා. ඒ වගේ උදාහරණ ඕනෑ තරම් තිබුණා. තාත්තා මැරුණාට පස්සේ පුතාට, දුවට හරි බිරියට හරි දෙනවා. මේ රටේ දක්ෂ දේශපාලනඥයකු බිහිවීමට නම් ඒ ක්‍රමය කැඩිය යුතුයි. පක්ෂය තුළ දක්ෂයන්ට එන්න විවෘත වෙන්න ඕනැ. මගේ පවුලෙ දේශපාලනයට සම්බන්ධ කවුරුත් නෑ. මට දේශපාලනයට ගැළපෙන නංගිලා දෙන්නෙකුයි, මල්ලි කෙනෙකුයි ඉන්නවා. ඒ කිසිම කෙනෙක්ට දේශපාලනයට එන්න ඉඩ දෙන්නෙ නෑ මන්. ඒ මගෙ ප්‍රතිපත්තිය. ගමේ නායකයො හදන්න කටයුතු කරනවා. රත්නපුර තරුණ කණ්ඩායම් හැදූ එකම කෙනා මන්.

**ඔබේ නායක සජිත් ප්‍රේමදාස කෘත්‍යාධිකාරී මණ්ඩලයේදී ඇතැම් තීන්දුවලට එකඟ වෙන්නේ නැහැ කියලා විවේචනයක් තිබෙනවා. ඔහු සාමාන්‍ය සීමාව ඉක්මවා කටයුතු කරන්නද හදන්නේ?**

ඒක සම්පූර්ණයෙන්ම මාධ්‍ය විසින් හදපු බොරුවක්. කවුරුහරි කෙනෙක් කරපු මුලාවක්. මම කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකයෙක් මමත් හැමදාම ඒකට සහභාගි වෙනවා. එදා කෘත්‍යාධිකාරී මණ්ඩලය ඉක්මනින්ම නවත්තලා රනිල් වික්‍රමසිංහ මහතා යනවා. ප්‍රශ්න විසඳෙන්නෙ නෑ. නමුත් සජිත් ප්‍රේමදාස මහතා පැය ගාණක් සාකච්ඡා කරනවා. එතැනදි සමහරු කියනවා අපි දැන් පාරට බැහැලා ඒකාබද්ධ විපක්ෂය කරපු දේම කරන්න ඕනේ කියලා. සජිත් ප්‍රේමදාස මහතා කියන්නෙ උද්ඝෝෂණ, විරෝධතා කිරීමට පෙර අපි තව කළ යුතු දේවල් කරන්න ඕන කියලා. එතුමා කියන්නේ විපක්ෂයක කාර්යභාරය හුදු විරෝධතාවයම නොවෙයි කියලා. දැන් ඒක එතුමා පෙන්වනවා. එතුමා මේ රටේ රෝහල් පද්ධතියට යම් ශක්තියක් දෙනවා. ස.ජ.බ. 'හුස්මක්' යටතේත් අපේ වැටුප් යම් ප්‍රමාණයක් අඩු කරගෙන කටයුතු කරනවා. දානපතියන්ගේ ලැබෙන ආධාර පරිත්‍යාග කරනවා. දුප්පත් පාසල්වල තොරතුරු තාක්ෂණය වෙනුවෙන් පරිගණක කාමර නිර්මාණය කරනවා. මේවා ආණ්ඩු පක්ෂයකින් කළ යුතු යුතුකම්. ආණ්ඩුවේ මඟහැරෙන කොටසක් එතුමා ඉටු කරමින් ඉන්නවා. අපි (15) වැනිදා ඉඳලා පටන් ගන්නවා මේ රටේ දේශපාලනික වශයෙන් රටේ ජනතාව බලාපොරොත්තු වන සැබෑ විපක්ෂයේ කාර්යභාරය යනුවෙන් වැඩසටහනක්.

**එදා ඔබ ඔබේ ඉල්ලා අස්වීමේ ලිපිය දුන් පසු ඊට අල්ලසක් වශයෙන්ද සමගි ජන බලවේගයේ විහිදුම් බළගණය ඔබට ලබා දුන්නේ?**

විහිදුම් බළගණය මට ඊට පෙර ලැබී තිබුණෙ. සමගිය විහිදුම් බළගණයට පෙර මට පක්ෂයේ තරුණ බලවේගය තුළ වැඩ කරගෙන යන්න ආරාධනා ලැබුණා. නමුත් මම තරුණ බලවේගය භාරගන්න කැමැති වුණේ නැහැ. මොකද තරුණයන් කියන්නේ අවුරුදු 30ට අඩු අය. ඔවුන් ශක්තිමත් පදනමක් තියෙන දේශපාලනික වශයෙන් ශක්තිමත් කොටසක්. එතැන දේශපාලන වශයෙන් මතයක් නිර්මාණය කරන්න පුළුවන්. ඉන් දේශපාලන අත්දැකීම් නිර්මාණය කරන කොටසක් තමයි ශක්තිමත් තරුණ ජවය. ඒ යෝජනාවත් මා විසින්ම හඳුන්වා දුන්නේ. අපේ නායකතුමාගේ අදහසක් අනුව යොදා අපි මේක ආරම්භ කළේ. මේක ක්‍රියාත්මක වෙන්න අවශ්‍ය වටපිටාව හැදෙයි.

**ඔබ තරුණයෙක් හැටියට සලකන්නේ 30ට අඩු අය. නමුත් අපේ රටේ දේශපාලනයෙ නිරත පුද්ගලයන් බහුතරයක්ම 50ට 60ට වැඩි අය. ඔබ කියන දේ ප්‍රායෝගික නෑ නේද?**

මම කියන්නේ ඇත්තටම අපේ රටේ මේ තියෙන දේශපාලන ක්‍රමය විනාශයට හේතුව මේ වයස. මේ රටේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්ට හිත හදාගන්න පුළුවන් නම් අවුරුදු පහකින් පස්සෙ ගෙදරට වෙලා ඉන්න, ඒක තමයි විය යුත්තෙ. එක දිගටම දේශපාලනයේ ඉඳලා ජනතා දේපළ මංකොල්ලකනවා. රට හැදෙන්නෑ. අවුරුදු 20න් පාර්ලිමේන්තුවට දාන මිනිහා අවුරුදු 70ක් ඉඳලා එළියට යන්න බලන්නේ. හරියට බැලුවොත් අවුරුදු 30ට අඩු අය අපේ පාර්ලිමේන්තුවේ නෑ. තරුණ ඔළුවලට තමයි නවමු අදහස් එන්නෙ. එහෙනම් පාර්ලිමේන්තුවේ තාරුණ්‍ය කියන කාරණාවට එහා ගිහින් කතා කළොත් අවුරුදු 65 දක්වා රාජ්‍ය සේවය දීර්ඝ කරා නම්, දේශපාලන කාල සීමාවත් අවුරුදු 65 දක්වා කෙටි කළොත් ප්‍රශ්න අඩුයි. හිතන්න මේක ජීවිතේට ඔය තියරිය සංශෝධනය කරන්නෙ නෑ. නමුත් වෙන්න පුළුවන් නම් දෙයක්. අඩුම ගාණේ අවුරුදු තිහට අඩු දහ පහළොස් දෙනෙක් පාර්ලිමේන්තුව නියෝජනය කළා නම් හොඳ තත්ත්වයක්. අද වෙද්දි 70ට වැඩි පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 60ක් ඉන්නවලු. මේ අයට වැඩක් කරන්න පුළුවන්ද?

**එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතාගේ දේශපාලන ක්‍රියාකාරිත්වය අද උඩට මතුවී තිබෙනවා. ඒක ඔබ දකින්නේ කොහොමද?**

රනිල් වික්‍රමසිංහ මහතා උඩට ඇවිත් කියලා අදහස් කරන්නේ ඔහු විශ්‍රාම යන ලැයිස්තුවේ උඩට ඇවිත් තියෙනවා කියන එකද.

**රනිල් වික්‍රමසිංහ මහතාගේ දේශපාලන ක්‍රියාකාරිත්වය, ඒ වගේම ඔහු රාජ්‍ය උත්සවවලට මැදිහත් වීම් වැනි ක්‍රියාකාරකම් ගැන මා අදහස් කළේ?**

මේ වෙනකොට රාජ්‍ය උත්සවවලට ආණ්ඩුවේ මැති ඇමැතිවරුන්ට යන්න බැරි තත්ත්වයක් තියෙන්නෙ. ගියත් ඉතා පරීක්ෂාකාරීව මේ ආර්ථික අර්බුදය එක්ක යා යුතුයි. ඒ හින්දා රාජ්‍ය උත්සව හෝ මේ රටේ තියෙන ප්‍රධාන උත්සවවලට රනිල් වික්‍රමසිංහ මහතා ආරාධිතයෙක් විදිහට සම්බන්ධ වෙන්න පුළුවන්. රනිල් වික්‍රමසිංහ මහතා ගැන මට තියෙන කියවීම ඔබේ කියවීමට වඩා වෙනස් එකක්. ඒ තමයි රනිල් වික්‍රමසිංහ මහතා මේ රටේ කොයිම වෙලාවකවත් පැත්තකට දා යුතු නායකයෙක් නෙවෙයි. හැබැයි රනිල් වික්‍රමසිංහ මහතාට මේ රටේ කවදාවත් තමන්ට ලැබෙන බලයෙන් සහන සලසන්න බෑ. රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න හැකියාවක් තියෙන කෙනෙක් නෙමෙයි. මේ දෙක කවදාවත් ගැළපෙන්නෙ නැතුව නායකයකුට සාර්ථක වෙන්න බෑ. මේ රටේ ඉහළ තලයේ වැඳුම් පිදුම් කරන චරිතයක් හැටියට නම් රනිල් වික්‍රමසිංහ මහතා හොඳයි. හැබැයි රටේ ප්‍රශ්නයක් ආවහම එයාට තමයි මොළේ තියෙන්නෙ කියලා කිව්වට ප්‍රායෝගිකව ඒක ක්‍රියාත්මක වෙන්නෙ නෑ. එහෙම වුණා නම් 2015 රජයෙන් පසු ගෝඨාභය මහත්තයා ඇවිල්ල මේ රට මේ තරම් කඩාවැටීමකට ලක් කරන්නේ නෑ.

**වික්‍රමසිංහ මහතා තුන්වැනි බලවේගයක් තනන බව කියනවා?**

තුන්වැනි බලවේගයක් කියලා කෙළින්ම කියන්නේ එතුමා පිළිගන්නවා මේ රටේ ආණ්ඩුවක් තියෙනවා. සජිත් ප්‍රේමදාස ප්‍රමුඛ විපක්ෂයක් තියෙනවා. එතුමා තනි මන්ත්‍රීවරයෙක් ලෙස ජ.වි.පෙ. එක්ක සටනක්නෙ එතකොට තියෙන්නෙ. ඒක වැරදි කතාවකුත් නෙවේ. මොකද ජ.වි.පෙ. මන්ත්‍රීවරු ඉන්නෙත් තුන්දෙනයි. එතුමා ඒ අය එක්ක ගියොත් හතරයි. රනිල් වික්‍රමසිංහ කියන සාධකය ගැන හිතලා දේශපාලන තීන්දු ගන්න බෑ. රනිල් වික්‍රමසිංහ හොඳ ඩීල් ගේම්වලට. දක්ෂ නම් එතුමාට මීට වඩා මහ දෙයක් කරන්න තිබුණා. මගේ අදහස ඕක නෙවේ. මේ රටේ තුන්වැනි බලවේගයවත් දෙවැනි බලවේගයවත් කියන කාරණය නොවෙයි ඇත්තටම අපිට පුළුවන් මේ කුණුවෙලා නරාවළේ වැටිලා තියෙන දේශපාලන චරිත ටිකයි ඔය සන්දර්ශන හෝ තමන්ගේ බලය හෝ අන් අයගේ බලය රැකගන්න දඟලන ඔය මෛත්‍රීපාල සිරිසේන මහත්තයා වගේ දේශපාලන කුණු ගොඩවල් පැත්තකට දාලා මේ රටට ආදරේ කරන මිනිස්සු ටිකක් එක වේදිකාවට ඇවිත් රාජපක්ෂලාට ඇඟිල්ල දික් කරලා අන්න ඒ වේදිකාව තුළ නැති වූ සාධාරණය නැවත හිමි කරදෙන්න පුළුවන් නම් රට ඉදිරියට යයි. ස.ජ.බ.ටවත්, ජ.වි.පෙ.ටවත් කාටවත් තනියෙන් මේ අර්බුදයට විසඳුම් හොයන්න බෑ. පොදු වේදිකාවක් සැදිය යුතුයි. රනිල් වික්‍රමසිංහ මහත්තයා තමන්ගෙ කඩා වැටිච්ච දේශපාලනයට යම්කිසි ඔක්සිජන් ටිකක් එකතු කරන බලවේගයක් හදන එක වරදක් නෑ ඔහුගෙ පෞද්ගලික දේශපාලන න්‍යාය පත්‍රයට අනුව. නමුත් රටක් විදිහට ඒකෙන් කිසිම වැඩක් නෑ.

**මේ මොහොතේ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ආණ්ඩුවට ප්‍රබල චෝදනා එල්ල කරමින් ඉන්නවා. ඒකත් ඔබ කියන ඩීල් එකක්ද?**

දේශපාලනඥයන්ට එහා ගිය මාධ්‍යයක් ගැන කතා කළ යුතුයි. ඔබත් මේ රටේ ප්‍රධාන මාධ්‍ය ආයතනයක් නියෝජනය කරනවා. මේ රටේ මාධ්‍ය තුළ ඉතා අශිෂ්ටසම්පන්න තරගයක් තියෙනවා. ඒ තමයි මොකක් හෝ දෙයක් වාර්තා කරලා අංක එකට පත්වීමට. ඒ අශිෂ්ටසම්පන්න මාධ්‍ය විසින් නිර්මාණය කරනවා මේ රටට අවශ්‍ය පුද්ගලයා කවුද කියලත්. ගෝඨාභය රාජපක්ෂ මහතාත් මාධ්‍යයෙන් වීරයෙක් කළේ. ගෝඨාභය රාජපක්ෂ නිර්මාණය කරන්න කඩේ ගිය මාධ්‍ය ආයතන සියල්ල මේ මහා මාධ්‍ය මංකොල්ලයට වගකිවයුතුයි. අද රනිල් වික්‍රමසිංහ මහතා පුම්බන්නේත් මාධ්‍යමයි. ගෝඨාභය රාජපක්ෂ කඳවුරට විරුද්ධව සජිත් ප්‍රේමදාස කඳවුර නැඟිටිනවා නම් ඒක පහත් කරන්න හොඳම දේ තමයි සජිත් ප්‍රේමදාස මාධ්‍යයෙන් බිමට දාලා තමන්ට ඕන විකල්ප චරිතයක් උස්සනවා. උදාහරණයක් ගන්නම්. අද ජනතා විමුක්ති පෙරමුණ ගන්නකෝ. ජනතා විමුක්ති පෙරමුණ ගැන මට තියෙන්නේ වෙනස් කියවීමක්. ජනතා විමුක්ති පෙරමුණ ගැන මෙච්චර කල් කතා නොකරපු 88 - 89 කාලයේ දේවල් අද ආණ්ඩුව එළියට දාලා ජ.වි.පෙ.ට ගහනවා. ආණ්ඩුව දන්නවා ජනතා විමුක්ති පෙරමුණටත් මේ මොහොතේ ජනතා අවධානය යොමු වී තිබෙනවා කියලා. ඒ හින්දා ජ.වි.පෙ.ට ගහනවා. ආණ්ඩුව කඩා වැටෙන වෙලාවේ ආණ්ඩුවට තියෙන විරෝධය වෙන පැත්තකට තල්ලු කිරීමට තමයි මෙහෙම උත්සාහ ගන්නේ. මේ දේශපාලනඥයෝ හැදෙන්න කලින් මේ රටේ සැබෑ මාධ්‍යයක් හැදෙන්න ඕනෑ. අශිෂ්ටසම්පන්න මාධ්‍ය වෙනස් වූ දවසක මේ රට ලස්සන වෙයි. හැබැයි ස්වාධීන මාධ්‍යකරණයක් අපිට කවදාවත් දැක ගන්න පුළුවන් වෙයි කියලා මං හිතන්නේ නෑ.

**ඒ වගේම පළාත් පාලන මැතිවරණය කල් දැම්මා. මේ කල් දැමීම තුළ මොකක්ද දකින්නෙ සහ ඊට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද?**

පුරවැසියෙක් හැටියට අපිට පුළුවන් ආණ්ඩුවට විරුද්ධව අපේ විරෝධතාව ජනතාවට ඉදිරිපත් කරන්න. මොකද ඡන්දය නිසි කලට පැවැත්වීම රටේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක්. ආණ්ඩුවක් ලෙස ආණ්ඩුවේ බලධාරීන් ගත් තීන්දුව හරි. මොකද ඔවුන් දන්නවා මේ මොහොතේ ඡන්දයක් තිබ්බොත් දිනන්න තියා හයෙන් පහක බලයට වඩා යටගිය බලයක් ආණ්ඩුවට ලැබෙන්නෙ කියලා. ඡන්දය කල් දැමීම ආණ්ඩුව ගැන හිතලා ගත් තීන්දුවක්. හැබැයි ඡන්දෙ පැවැත්වීම වෙනුවෙන් ජනතාව සමඟ දැඩි විරෝධය අපි ආරම්භ කරනවා. ආණ්ඩුව ඡන්දෙකට ගියොත් රාජපක්ෂලාගේ අවසාන දේශපාලනය බව අනිවාර්යයෙන් ඔප්පු වෙනවා.

**ගෑස් සම්බන්ධ ප්‍රශ්නය තවම බලපා තිබෙනවා. දිගින් දිගටම පිපිරීම් වෙනවා. මෙහෙම රටක් නිර්මාණය වුණේ කොහොමද?**

ගෑස් සම්බන්ධ ගැටලුව ගැන මම විශ්වාස කරන්නෙ ලසන්ත අලගියවන්න ඇමැතිවරයා කියන කතාවම ඇති මේකට සම්පූර්ණ උත්තරයක් හොයන්න. එතුමා කියනවා ගෑස් පිළිබඳ ප්‍රශ්නය පැනනඟින ප්‍රධානම ප්‍රශ්නයට හේතුව ගෑස් සංයුතිය කියලා. සංයුතිය වෙනස් කිරීම හරහා ජීවිත නැති වීම, මිනිසුන්ගේ දේපළ අහිමි වීම, මිනිසුන් තුවාල වෙලා අසරණ බවට පත්වීම වෙලා තියෙනවා. සංයුතිය වෙනස් වෙනවා නම් වෙනස් කළේ කවුද කියලා හොයන එක මහා දෙයක් නෙමෙයි. මේකට ජනාධිපති කොමිෂන් සභා පත් කරන්න ඕනෙත් නෑ. ලිට්රෝ සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම ගත යුතුයි. අඩුම තරමෙ මේ අය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා සටහනක්වත් ලබා ගන්න උත්සාහයක් නොගැනීම හා මේ පිළිබඳ පරීක්ෂණයක් නොකිරීම තුළ ගෑස් ගැන කතා කරලා වැඩක් නෑ. රාජ්‍ය මැදිහත්වීමක් මේ ගෑස් ක්‍රියාවලිය තුළ තියෙනවා. තනිකරම සල්ලිත් එක්ක ගැට ගැහුණු ගනුදෙනුවක් මේ. දේශපාලකයන්ගේ අනුදැනුම නැතිව මේ වගේ ගෑස් පිපිරීමක් වෙන්නේ කොහොමද. අපි තාක්ෂණික කාරණා හොයල බැලුවා. සංයුතිය වෙනස් කිරීම හරහා යම් කිසි ලාභයක් ගෑස් ටැංකියට ලැබෙනවා. ඒ ලාභය යන්නේ කොහාටද කියලා තවම ගණන් කියන්න බෑ. මොකද තාක්ෂණික කාරණා කිහිපයක් මීට බැඳිලා තියෙනවා. නමුත් අපිට පැහැදිලියි. මේ ලාභය අරමුණු කරගෙන තමයි ගෑස් සමාගම් එක්ක යම් කෙනෙක් හෝ කණ්ඩායමක් සම්බන්ධ වෙලා තියෙන්නෙ. මං හිතන්නෙ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මීට ස්වාධීන පරීක්ෂණයක් කරයි. මේ තුළ කාගේ හරි බලපෑමක් මත වෙන වෙන සිල්ලර දේවල් සිද්ධ වෙනවා. ප්‍රමිති ආයතනය කියලා එකක් තියෙනවා මෙලෝ වැඩක් නෑ. මේ ප්‍රමිති ආයතනය හරියට ක්‍රියාත්මක නම් මේ වෙද්දි ගෑස් ප්‍රශ්නය විසඳිලා. පොඩි මිනිහාගේ පාන් රාත්තලේ දිනේ පැන්නහම අල්ලලා කූඩු කරනවා. දඩ ගහනවා. හැබැයි මේ මහා සාපරාධී ක්‍රියාව කරපු කිසිම කෙනෙක්ගෙන් අඩුම තරමේ විමසීමක්වත් කරන්නේ නැතුව මේ රටේ පොලිසිය නිශ්ශබ්දව ඉන්නව නම්, ඒ වෙනුවෙන් කටයුතු නොකරනවා නම් අපි ඒ ගැන ප්‍රශ්න කරනවා.

**මීට පෙර බැඳුම්කර, සීනි, සුදුළූනු වැනි කුප්‍රකට ගනුදෙනු සිදුවුණා. හැබැයි එකකින්වත් කිසිදු පුද්ගලයකු චූදිතයෙක්ට දඬුවම් දෙනවා අපි දැක්කේ නෑ. ඒ වගේම දැන් ගෑස් අර්බුදය හා විදුලි අර්බුදය ගැනත් ආණ්ඩුවේ ඇමැතිවරුන් කියන්නේ දැඩි කුමන්ත්‍රණයක් ඒ තුළ පවතින බව. ඇත්තටම මොකක්ද වෙන්නේ?**

මං දැක්කා නාමල් රාජපක්ෂ මහත්තයා කියනවා විදුලි අර්බුදය කුමන්ත්‍රණයක් කියලා. ඒකට පියවරක් ගන්න ඕනි, හොයන්න ඕනේ කියලා. නාමල් රාජපක්ෂ මහත්තයාගේත් හීනයක් තියෙනවා මේ රටේ ජනාධිපති වෙන්න. තාත්තා අගමැති, බාප්පා ජනාධිපති, කැබිනට් මණ්ඩලයෙ හතර පස්දෙනෙක් ඉද්දි මේ වගේ ප්‍රශ්න විසඳන්න බැරි නම් එළවලා දාන්න ඕනේ. එවැනි ආණ්ඩුවක මෙහෙම කුමන්ත්‍රණ කරලා මේ ප්‍රශ්නෙට උත්තරයක් වන බැරි නම් මේ හැත්ත බුරුත්තම එළවලා දාන්න ඕන. ඇමැතිවරු මන්ත්‍රීවරු මේ මං කතා කරන මාත් එක්කම සේරම එළවලා දාන්න ඕන. මොකද හේතුව මේ රටේ අහිංසක මිනිස්සු මහා අර්බුදයකට ගෙනත් දාලා මේ වගේ පාර්ලිමේන්තුවක් රටේ තිබිලා වැඩක් නෑ. එහෙම අත පිහදාගන්න බෑ. ඔබ කියූ සීනි වංචාව, මහ බැංකු වංචාව හා කරළියට මතුවෙන පාස්කු ප්‍රහාරය මේ වගේ සිද්ධි සියල්ලම වෙනුවෙන් චූදිතයන්ට දඬුවම් නෑ. එදා රන්ජන් රාමනායක සහෝදරයා කියූ කාරණාව තමයි ඇත්ත. මේ ඔක්කොම යාළු මිත්‍රයෝ. මංකොල්ලකාරයො. වෙනස තියෙන්නෙ අඩු වැඩි වශයෙන් එක කණ්ඩායමක් වැඩිපුර හොරකම් කරනවා අනිත් කණ්ඩායම ටිකක් අඩුවෙන් හොරකම් කරනවා. තමන් බේරෙන්න අනිත් හොරා අල්ලන්නෙ නෑ. මොන හේතුවකටවත් ආණ්ඩුව මහ බැංකු මංකොල්ලයට දඬුවම් දෙන්නෙ නෑ. රටේ ජනතාව අසරණයි. ජනතාව පව්. රටේ ජනතාව මේ තොරතුරු දැනගන්න කොට වෙන්න තියෙන දේවල් ටික වෙලා ඉවරයි. ඔය තියෙන තුනෙන් දෙකේ බලය අරන් අඩුම තරමේ මේ ජනතාවට වගකියන පාලකයෙක් හැදුවා නම් මිනිස්සු ඒ ගැන හරි හොඳ කියයි. 19 වැනි සංශෝධනයේ තිබූ ප්‍රජාතන්ත්‍රවාදී ගුණාත්මක භාවයන් වළපල්ලට දාලා 20 හරහා බලය රඳවා ගන්න උත්සාහ කළොත් තවත් රටක් විදිහට අපි නන්නත්තාර වෙලා බංකොලොත් වෙලා කොහෙන් නවතියිද දන්නෙ නෑ. අපිට මේ රටේ ප්‍රශ්නය ගොඩින් බේරා ගන්න බෑ. ජනතාව සමඟ බිමින් බේරාගන්න සූදානම්. අපි ඒකට නායකත්වය දෙනවා. අපි ජනතාව අපහසුතාවට පත් කරන්නේ නෑ. මේ ප්‍රශ්න තදින්ම අද ජනතාවට දැනිලා තියෙනවා. ඒ වගකීම ඉටුකරගන්න රටේ ජනතාව පෙරට එන්න.

**බැසිල් රාජපක්ෂ ඇමැතිවරයා මහ මොළකරුවෙක් ලෙස හඳුන්වනවා. ඔහුට දේශපාලනිකව දැවැන්ත කළ මනාකාරිත්වයක් තිබෙනවා කියලත් කියනවා. ඔහු රාජ්‍ය සේවකයන්ට යමක් දුන්නා වගේම දේශපාලනඥයන් බිලිබා ගන්නටත් ඔහුට යම් හැකියාවක් තියෙනවා කියලා කියනවා. දිනෙක ඔබේ තරුණ කණ්ඩායමත් ඒ වගේ බිලි බෑමකට හසු කරගන්න හැකි වෙයිද?**

බැසිල් රාජපක්ෂ මහත්තයා ගැන වර්ණනා කරන අය බලන්න ඔළුව අතගාලා ඔළුවෙ මොනාහරි ඇවිත්ද කියලා බලන්න ඕනෑ. පොදුජන පෙරමුණේ හාල්පාරු මන්ත්‍රීවරුන් දන්නෙ නෑ බැසිල් රාජපක්ෂ මහත්තයාගේ අරමුණ මොකක්ද කියලා. බැසිල් රාජපක්ෂ කියන්නේ අඩුම තරමේ තමන් ඉපදුණු රට, අම්මා වදපු භූමියේ පුරවැසිකම ප්‍රතික්ෂේප කරලා වෙන භූමියක පුරවැසිකමට ආදරේ කරන කෙනෙක්. එහෙව් කෙනෙක් මේ රටට ආදරේ කරයිද, බැසිල් රාජපක්ෂ මහතා යමකට ආදරය කරන්නේ තාවකාලික දේශපාලන වාසි බලාපොරොත්තුවෙන් පමණයි. බැසිල් රාජපක්ෂට කඩේ ගිය අයට මොනවද දීලා තියෙන්නෙ බලන්න. අර තිස්ස කුට්ටිආරච්චි කියන මන්ත්‍රීවරයාට දීලා තියෙනවා බී.එම්.ඩබ්ලිව්. එකක්. බැසිල් රාජපක්ෂට හෝ කාට හෝ කඩේ යෑම වෙනුවෙන් මස් කට්ටක් සූප්පු කරන්න දෙනවා නම් එතැන දේශපාලනයක් තියෙනවද. වරදාන වෙනුවෙන් ඕනෑම දෙයක් කියන්න කට අරිනවා නම් ඒ දේශපාලනඥයා පන්නලා දාන්න ජනතාව කටයුතු කළ යුතුයි. ඒක මටත් පොදුයි.

■ සංවාදය - අනුරාධා හේරත්



# ආතරයිටිස් සුව කරන බලගතු ඔසුවක්

# නිදහසේ පියාගෙ පරපුරෙන් එන හෙළ වෙද විස්කමක ඇසින් දුටු ඇත්ත

නිදහස් ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය ඩී.එස්. සේනානායකයනුත් ප්‍රවීණ සාහිත්‍යවේදී දිවංගත සෝමවීර සේනානායකයනුත් ළඟම ලේ ඥාතීන් බව සමහර විට ඔබ නොදන්නා කාරණයක් විය හැකිය. ඩී.එස්.ගේ පියාත්, සෝමවීර සේනානායකයන්ගේ ආතාගේ ආතාත් එක කුස උපන් සහෝදරයන් වීම මේ ළඟ ඥාති සම්බන්ධයයි. ඩී.එස්.ලා ජනතාවට සේවය කිරීමේ දේශපාලනයෙන් පරතෙරට ගිය අතර සෝමවීරයන්ගේ නෝනිස් සේනානායක ආතලා සිංහල පාරම්පරික වෙදකමේ දස්කමින් පරතෙරට ගොස් සිටියේය.

අදත් අවිස්සාවේල්ලෙන් එපිට තල්දුව, බැළවාන ගම්මානයට වී වසර සිය ගණන් පැරණි පුස්කොළපොත් පරිහරණය කරමින් වෙදකමේ යෙදෙන ඔවුන්ගේ විස්කම්වල ඇසින් දුටු සාක්ෂි ගැනයි මේ කතාව.

අවිස්සාවේල්ල නගරය පසු කොට කි.මී. 2ක් පමණ කෑගල්ල - යටියන්තොට මාර්ගයේ යනවිට තල්දුව නගරය හමුවෙයි. තල්දුව නගරය මැදින් වමට ගුරුගල්ල - අමිතිරිගල මාර්ගයේ කි. මී. 03ක් පමණ ගිය විට හමුවන්නේ සුන්දර වෙල්යායෙන් හා රබර් වතු යායෙන් අලංකෘත වූ බැළවාන ගම්මානයයි. අප කියන බැළවාන 'සිරි වෙද මැඳුර' ජීවක අසපුව පිහිටා ඇත්තේ මේ ගම්මානයේය. වසර 100කටත් වැඩි ඒ වෙද පරම්පරාවේ වත්මන් පුරුක පැරකුම් සේනානායක වෙදැදුරාණන්ය. ඔහු ප්‍රවීණ සාහිත්‍යවේදී දිවංගත සෝමවීර සේනානායකයන්ගේ සහ කෘෂිකර්මය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු වන ගාමිණී සේනානායකගේ බාල සහෝදරයාය. මේ තිදෙනාගේම පියා බැළවාන වෙද පරම්පරාවේ මුල් පුරුකක් වන වෛද්‍යාචාර්ය මාටින් නෝනිස් සේනානායකය.

මෙතැන සිදු කෙරෙන වෛද්‍ය කර්මය අනුහස් ලබා ඇත්තේ ආතරයිටිස් හා අංශභාග රෝගීන් සුවපත් කිරීම වෙනුවෙනි. විශේෂයෙන්ම මඳක් වියපත් වන විට වැඩි වශයෙන් කාන්තා පාර්ශ්වය මුහුණ දෙන ආතරයිටිස් රෝගය හා ඊස්ට්‍රජන් හෝමෝනය හීන වීමෙන් හටගන්නා රෝග ඇතුළු යම් යම් ආබාධ සම්බන්ධයෙන් ඉපැරණි පුස්කොළ පොත් පරිහරණය කරමින් නිපදවන පර්යේෂණාත්මක රහස් බෙහෙත්ද මෙම වෙද පරම්පරාව සතු වෙයි. ඒ පුස්කොළ පොත්වල හෙළිදරව් කිරීම් අනුව එය රජවරුන් විසින් තම අගමෙහෙසියන්ට පමණක් දුන් වටිනා බෙහෙතක් බව සේනානායක වෙද පරම්පරාවේ මුතුන්මිත්තන් කියා තිබේ. අගමෙහෙසියට පමණක් දීමේ හේතුව වන්නේ අන්තඃපුර කාන්තාවන්ට දුන් අවස්ථාවල ඔවුන් අතර රජු දිනා ගැනීම සඳහා යම් යම් නොසන්සුන්තා ඇති වීම යැයි මේ මුතුන්මිත්තන් කියා ඇති රහසකි.

උලකුඩය දේවියට පුත් රුවනක් ලබා දෙන්නැයි යදිමින් ශ්‍රී රාහුල හිමියන් කෝට්ටේ යුගයේදී දෙවිනුවර ශ්‍රී උපුල්වන් දෙවියන් වෙත සැළලිහිණි සන්දේශය රචනා කළේය. දේවිය පුත් රුවනක් වැදුවාය. ඒ කොත්මලේ වෙද පරම්පරාවේ අනුහසිනි.

මාතර යුගයේ ජනප්‍රිය කිවිඳියක වූ ගජමන් නෝනා වැදූගෙයි සන්නියට බිලිවී බලවත් අසහනයෙන් පෙළෙන විට පිහිට වූයේ සිංහල පාරම්පරික වෙදකමය. ඉංග්‍රීසි වෙදකමේ අදත් පිළියමක් නැති එය සුව කිරීම වෙනුවෙන් ඇය දෙණිපිටියේ නුග රුක අසල දේවාලයක්ද කරවූ බව කියනු ලැබේ. ගජමන් නෝනාට පිහිට වූයේ පොල්අතුමෝදර වෙද පරම්පරාවේ අතීත මුතුන්මිත්තන්ය.

දුටුගැමුණු රජතුමා සොළී ආක්‍රමණිකයාට එරෙහිව කඳවුරු බැන්දේ රුහුණු පුරවරයේය. එතැන් සිට අති විශාල දුරකතර ගෙවා රජරටට පැමිණි වීරෝදාර සේනාවේ මුලින්ම වැඩම කළේ පිරිත් සජ්ජායනය කරන භික්ෂූන් වහන්සේ බවට ඉතිහාසය සාක්ෂි දරයි. එම යුද පෙරමුණේ පසුපසින්ම පැමිණියෝ කවරහුද? ඔවුහු නම් බේත් හේත් කළමනා රැගත් දේශීය වෙද බළකාය ය. මඟදී හමුවන ප්‍රහාරයන්ගෙන් හා දුෂ්කරතාවලින් පීඩා ලබන කැපුම් කෙටුම් කැඩුම් බිඳුම්වලට ලක්වන රණ ශූරයන් යුද පෙරමුණේ හිස් උඩින්ම පසුපසට යවා සටන් ගමනේ අතරතුරම ඔවුන් ක්‍රමිකව සුවපත් කොට නැවත පෙරමුණට එවීමේ වගකීම භාර ගත්තේ මේ වෙද බළකාය ය. එය සහමුලින්ම මහ රජ ගැමුණුගේ මෑණියන් වූ විහාර මහා දේවියගේ අදහසක් යැයි කියනු ලැබේ. පැරැණි ශ්‍රී ලංකාවේ රජ කුල ස්ත්‍රීන් ඒ තරම් පැරණි වෙදකම කෙරෙහි විශ්වාසය තැබූ බවටත් පිහිට ලැබූ බවටත් ප්‍රකටය.

කාලයා විසින් අවාසනාවන්ත ලෙස අපේ හැම ඓතිහාසික උරුමයකම වටිනාකම හෑල්ලු කර තිබෙන අද වැනි යුගයක මෙවැනි දේ පිළිබඳ කතා කරන්නට අපි උත්සාහ කරමු. තල්දුව, බැළවාන වෙද පරපුරේ පැරකුම් සේනානායක වෙදැදුරාණන් එවන් එක් තෝරා ගැනීමකි.



''හෙළ වෙදකමේ ආතරයිටිස් (Arthritis) රෝගය හඳුන්වන්නේ සන්ධි ප්‍රදාහය ලෙස. ඒ කියන්නේ සන්ධිවල ඉදිමුම. එය සන්ධි, පේශි, බන්දනී සහ පටක කෙරෙහි බලපාන රෝගයන් හැඳින්වීමට යොදන තනි වචනයක්. මෙය අද සමාජයේ සුලබ රෝගයක් බවට පත් වෙලා. ප්‍රධාන වශයෙන් ආතරයිටිස් රෝග වර්ග 40ක් පමණ තිබෙන බවට අප හඳුනාගෙන තිබෙනවා. ඒ අතරින් රූමැටොයිඩ් ආතරයිටිස් රෝගය සුව කිරීමට දීර්ඝ කාලීන ප්‍රතිකාර අවශ්‍යයි. සාමාන්‍යයෙන් ආතරයිටිස් හට ගැනීමට ප්‍රධාන වශයෙන්ම හේතු වන්නේ වයස්ගතවීම. වයස අවුරුදු 40න් පසු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම මේ තත්ත්වය ඇති වෙන්නට ඉඩ තිබෙනවා. කාන්තාවන්ට මෙය වැලඳීමේ ප්‍රවණතාව වැඩියි. බොහෝ විට ඔබ උදෑසන නිදි ඇඳෙන් බසින විට විළුඹේ වේදනාවක් ඇති වෙනවා නම් ටික දුරක් ගියාම එය නැතිවී යන ස්වභාවයක් තිබෙනවා නම් එය ආතරයිටිස් රෝගයේ පෙරනිමිත්තක් ලෙසට හැඳින්විය හැකියි."

''මාසික ආර්තව ක්‍රියාවලිය නතර වීමෙන් පසු කාන්තාවන්ට බොහෝ සෙයින් මේ රෝගය ඇතිවීමේ හැකියාව තිබෙනවා. එය නතර වීමත් සමඟ ශාරීරිකව ඇයගේ ඊස්ට්‍රජන් හෝමෝන නිෂ්පාදනය හීන වීමයි මෙයට ප්‍රධාන හේතුව. ඒ වගේම විවිධ හේතු මත අඩු වයසින් ගර්භාශය ඉවත් කළ කාන්තාවන්ටද මේ තත්ත්වය ඇති වෙන්න පුළුවන්. ඊස්ට්‍රජන් හෝමෝනය කාන්තාවන්ට අත්‍යවශ්‍ය හෝමෝනයක්. පැරණි පුස්කොළ පොත්වල 'අම්බු' යන වචනය භාවිත කරන්නේ මේ හෝමෝනය හැඳින්වීම සඳහා බව



## රජ බිසොවුන්ට පමණක් දුන් රහස් බෙහෙතක්

අපගේ හැදෑරීමයි.

විශේෂයෙන් කාන්තාවන්ගේ එදිනෙදා ජීවිතයේ කටයුතුවල ක්‍රියාශීලී බව ඇති කිරීම, ප්‍රබෝධවත් බව, උනන්දුව, සමේ පැහැය, හිසකෙස්වල දීප්තිමත් බව හොඳින් පවත්වා ගැනීමට මේ හෝමෝනය අවශ්‍යයි. එය හීන වීමෙන් ඇයට නිතර කේන්ති යෑම, නොසන්සුන්කම, වරින් වර ශරීරයේ රස්නය ඇති වී දහදිය දැමීම, සිතේ කනස්සලු ස්වභාවය වගේ දේ ඇති වෙනවා. ආතරයිටිස් රෝගයෙන් නොපෙළුණත් මෙවැනි රෝග තත්ත්වයන් ඇති කාන්තාවන්ට එයින් මිදීමට සුවිශේෂී ඖෂධ වර්ග අප සතුව තිබෙනවා. ඒක තමයි ඉපැරණි ඖෂධ වට්ටෝරුවක් අනුව සැකසූ 'විලාසිනී රසායනය.' ආතරයිටිස් රෝග ලක්ෂණ නොතිබුණත් ඊස්ට්‍රජන් හෝමෝනය අඩුවීම නිසා පෙර සඳහන් කළ රෝග ලක්ෂණ ඇති වනිතා පක්ෂයට දීර්ඝ කාලීන භාවිතයට සුදුසු මහඟු ඖෂධයක් විලාසිනි රසායනය."

විශේෂ ක්‍රමයට සෑදූ උදුනක මුහුදු හක් බෙල්ලන් පුලුස්සා ගත් හස්ම සමඟ තවත් ඖෂධ වර්ග එකතු කර නිපදවන 'සංඛවටිය'ද පාරම්පරික බෙහෙතකි. ආතරයිටිස්වලින් හටගන්නා කැල්සියම් ඌනතාව සමනය කරන්නට 'සංඛවටිය' යොදාගනී."

අප දෑසින්ම දුටු මේ වෙද මැඳුරේ තෙල් බෙහෙත් නිපදවීමේ ක්‍රියාවලිය ඈත අතීතයේ පාරම්පරික වෙද ගෙදරක සොබාව සිහි ගන්වන්නක් විය. නිහඬ අසපුවක් බඳු එහි පරිසරය හා පිහිටීම යනෙන පිරිසගේ සිත නිවාලයි. ගහකොළින් ගැවැසුණු වෙද නිවෙසේ රෝගීන් පරීක්ෂා කරන කුටිය හා ඖෂධාලයට අමතරව ඖෂධ නිපදවන ගෘහයක් තිබේ. එය සහමුලින්ම කටුමැටියෙන් තනන ලද්දකි. එහි මැටියෙන්ම තැනූ උස් දර පෝරනුවකි. ඒ බෙහෙත් උණු කිරීම සඳහාය. ආයුර්වේදයේ නියමය පරිදි එය තඹ කල්දේරමකි. මේ බෙහෙත් ගෘහයේ සුවඳද පරිසරයද ගතට හා මනසට ප්‍රබෝධවත් ජීවයක් ගෙනදෙන්නක් සේ හැඟේ.


විවිධ නම්වලින් මෙන්ම ප්‍රචාරණ උපක්‍රම මඟින්ම උත්කර්ෂයට නංවන ලද තෙල් බෙහෙත් බහුල අද වෙළෙඳපොළ දෙස බලන විට තල්දුව වෙද මැඳුරෙහි තෙල් හිඳගන්නා ව්‍යායාමය පුදුම සිතෙන තරම්ය.

පාරම්පරික වට්ටෝරුවකට අනුව අංශභාග හා ආතරයිටිස් රෝගීන් සඳහාම නිෂ්පාදනය කෙරෙන මෙම තෙලෙහි වට්ටෝරුව පහසු එකක් නොවේ. එළකිරි, තලතෙල්, භාතාවාරිය යුෂ ඇතුළු දේශීය කොළ පොතු වර්ග සමඟ ඉන්දියාවෙන් ආනයනය කරනු ලබන වටිනා ඖෂධ වර්ග 67ක් එහි අඩංගුය. එක් වරකට සිඳගත හැක්කේ තෙල් බෝතල් 25ක් පමණි. ඒ සඳහා අවම වශයෙන් දින 14ක කාලයක් වැය වෙයි. එය බොහෝ සෙමින් සියුම්ව කළ යුතු කාර්යයකි. අවසන් අවස්ථාවේ තෙලෙහි පදම තබන විට සේවකයන් කොපමණ සිටියද වෙදැදුරාණන්ම එයට මැදිහත් වන්නේ එය අත්දැකීමෙන් කළ යුතු කාර්යයක් නිසාය. තෙල් සාදන්නේ ඒ වෙනුවෙන්ම සකස් කළ දර ළිපේ තබන ලද තඹ භාජනයකය. ගින්දර දමන්නේ නෙලුම් පොහොට්ටුවක ප්‍රමාණයෙනි. මෘදු පාක, සම පාක, කර පාක ලෙස තෙලක පාක අවස්ථා 03කි. බීමට දෙන තෙල් වර්ග මෘදු පාක අවස්ථාවෙනුත් ශරීරයෙහි ගල්වන තෙල සම පාක අවස්ථාවෙනුත් ළිපෙන් බා ගත යුතු වෙයි. තෙලක් කර පාක අවස්ථාවට පත් වූයේ නම් එම තෙලෙහි ගුණ හීන වේ. එනම් තෙල පිච්චෙන තත්ත්වයට පත් වී ඇති බවයි.

තෙලක් සිඳින විට ඒ ඒ අවස්ථාවෙහි නිසි පදම හඳුනා ගැනීමට මීටරයක් හෝ වෙනයම් උපකරණයක් නැත. එය කර්මාභ්‍යාසයෙන්ම දැනගෙන කළ යුතු කාර්යයකි.

ළිප අසලම බඳින ලද ජල ටැංකියකි. තෙල ළිපෙන් බාන්නේ ඒ ජල ටැංකියටය. තඹ හැළිය පිටින්ම ජල ටැංකියට බහාලන්නේ තෙල ක්ෂණිකව නිවී යා යුතු නිසාය. තඹ හැළිය සීතල වීම නිසා තෙල ඉක්මනින් නිවෙයි. නැත්නම් රත් වූ භාජනයේ තෙල තැබීමෙන් එය කරවිය හැකි බැවිනි. එසේ වුවොත් එහි ගුණ නැත. මේ නිෂ්පාදනය ඉතා සියුම් ක්‍රියාවලියකි. හිතු හිතු විධියට වෙළෙඳපොළට දමා විකිණීමට තරම් තෙල් නිෂ්පාදනය කළ නොහැක්කේ ඒ නිසාය. එසේ සකස් කරන තෙල් වර්ග සහ කුඩු වර්ග ක්‍රමානුකූලව අසුරනු ලබන්නේ තැටිගත කරන ලද පිරිත් සජ්ජායනා මධ්‍යයේ ඖෂධ ගෘහයේම පසෙකින් ඇති කොටසකය. එය පළපුරුදු ගැමියන් පිරිසක් අතින් සිදුවෙයි.

''මෙවැනි ස්වරූපයේ රෝගී තත්ත්වයන් බොහෝ විට අපට වියපත් වන විට අත්විඳින්නට සිදු විය හැකියි. එවැනි අවස්ථාවක ඔබ වෛද්‍යවරයෙක් සොයාගියාම ඔහු කියනව නම් ඔබට තිබෙන්නේ ආතරයිටිස් රෝගය මේක සුව කළ නොහැකියි, වේදනාව අඩුවෙන්න


දිවංගත අග්‍රාමාත්‍ය ඩී. එස්. සේනානායක


වෛද්‍ය පැරකුම් සේනානායක

බෙහෙත් දීම පමණක් කළ හැකි කියල ඔබ පත්වන තත්ත්වය කුමක්ද? එහෙත් අපේ දේශීය වෛද්‍ය ක්‍රමයෙන් ආතරයිටිස් සුව කළ හැකි බව මා ඉතා විශ්වාසයෙන් කියන්නෙ. වේදනා නාශක මතම යැපිය යුතු නැහැ. මේ වේදනා නාශක පසුකාලීනව රෝගීන්ට අයහපත් ප්‍රතිඵල උදාකරනව.

මෙහි ප්‍රධාන ලක්ෂණ ගත්තොත් සන්ධියක හටගන්නා වේදනාව සහ මොළොක් වීම, සාමාන්‍ය පරිදි සන්ධි චලනය අපහසු වීම, සන්ධි ඉදිමුම, රත්වීම සහ රතුවීම, උදේ කාලයේ ඇතිවන සන්ධිවල දරදඬු ගතිය වගේ ලක්ෂණ තිබෙනවා. අනෙක් අතට සන්ධි වේදනාව සමඟ ඇතිවන සිරුරේ බර අඩුවීම, ශාරීරික දුර්වලත්වය සහ බෙලහීන වීම, තුනටියේ ඇතිවන වේදනාව. මේ වගේ රෝග ලක්ෂණ සති දෙකකට වඩා කල් අල්ලා තිබෙනව නම් වහාම වෛද්‍යවරයෙක් වෙත යා යුතුයි.

මෙවැනි රෝගියෙක් අප වෙත ආවොත් ප්‍රතිකාර කරනවා. ඒ විතරක් නොවෙයි මොනම තත්ත්වයේ තිබුණත් කොටින්ම දණහිස් සන්ධියේ සැත්කම් නියම කළ රෝගීන් පවා අප සුවපත් කර තිබෙනවා. තෙල් ආලේප කිරීමේ පවා විධිමත් ආයුර්වේදීය ක්‍රමවේදයක් තිබෙනවා. ආතරයිටිස්වලට බටහිර වෙදකමේ බෙහෙත් නැහැයි කියන එක නොවේ ප්‍රශ්නය. දේශීය වෙදකමෙන් නිසැකයෙන්ම සුවපත් කරනවා කියන එකයි වැදගත්..."

මේ ව්‍යායාමය සඳහා බැළවාන වෙද මැඳුර බෙහෙත් සපයා ගන්නේ දැරණියගල, කිතුල්ගල, කොටියාගල, සිරිපා අඩවිය වැනි වනගත ප්‍රදේශවල වනාන්තරවලට වැදී බෙහෙත් සොයා සපයන අයගෙනි. අනෙක් අතට ගල්ගමුව, අනුරාධපුර, අන්දරවැව වැනි ප්‍රදේශවල වනාන්තරවලින් ආයුර්වේද සංස්ථාවට අමුද්‍රව්‍ය සපයන සැපැයුම්කරුවන්ට ඇණවුම් කොට හිමිදිරි පාන්දරින්ම අමිතිරිගල පාරේ ගොස් ඔවුන්ගේ ලොරිවලින් ඒවා ලබා ගන්නේ අත්තනගල්ල රජමහා විහාරය අසලදීය.

ඒ කටයුතුවලට සහ ඖෂධ නිෂ්පාදනය කිරීමට සතියේ වැඩි කාලයක් වෙන් කරන වෙද මහතා රෝගීන්ට ප්‍රතිකාර කරන්නේ සෙනසුරාදා, ඉරිදා සහ බදාදා දිනවල පමණි. 071 8393252 මඟින් පැරකුම් සේනානායක වෙද මහතා සමඟ ඔබට සම්බන්ධ විය හැකිය.

ආයුර්වේදය වනාහි සිදුහත් තවුසාණන් සත්‍ය සොයා වනගතව සිටි ඈත යුගයේ පටන් එන දායාදයකි. සිත දියුණු කළ පැරණි සෘෂිවරුන් සහ යෝගීන් වෙතින් පහළ වූ උතුම් ව්‍යායාමයකි. සංසාර මිදීම සොයා වනගතව කළ පරිශ්‍රමයේදී බුද්ධත්වයට ළං විය නොහැකි එහෙත් සිත දියුණු කළ ධ්‍යානලාභී සෘෂිවරු එකල තමන් ජීවත් වූ වනගත පරිසරයේ ගහ කොළ මුල් පොතු පැළෑටි ආදියෙන් යම් යම් පර්යේෂණ කරන්නට වූහ. පසු කලෙක එය විවිධ අයුරින් එක් එක් කාලවලදී පුස්කොළ පොත්වල සටහන් කරන්නට ඇත. ඒ අනුව ආයුර්වේදය වනාහි මිනිස් වර්ගයාගේ සංසාරගත දුකට පිළියම් සොයා ඔවුන් කළ ඥාන ගවේෂණය අතරදී මිනිසාගේ ලෙඩ රෝගාදී ශරීරගත දුකට පිළියම් සොයා ස්වභාවධර්මයා සමඟ කළ මහානුභාව සම්පන්න පර්යේෂණයේ අග්‍රඵලයක් ලෙස බිහිවූ වටිනා ශාස්ත්‍රයකි.

■ තිස්ස කොරතොට



# ගෑස් නහුතෙට නගින කාලේ දුප්පත් මැටි වළඳට හොඳ කලක්

## වසර 35කට පසු අලෙවියේ වර්ධනයක්

## බුරුතුපිටින් කර්මාන්තකරුවන් සොයාගෙන ගම් වදින ව්‍යාපාරිකයන්

"ගෑස් ප්‍රශ්නත් එක්ක ළිප්වල ඉල්ලුම වැඩිවුණා. දැන් ළිප්වලට ලොකු ඉල්ලුමක් තියෙනවා. මාස දෙකකට ඉස්සර ඩබල් ළිපක තොග මිල රුපියල් 180යි. දැන් රුපියල් 450යි.

ගාල්ල, මාතර, අනුරාධපුර, කොළඹ, මිනුවන්ගොඩ රටේ හැම තැනකින්ම බඩු හොයාගෙන මිනිස්සු එනවා" කියමින් සිනහමුසු මුහුණින් යුතුව අප සමඟ කතාවට මුලපිරුවේ ධම්මිකා ජයකොඩි මහත්මියයි. ඇය කුඹුක්ගැටේ, තිත්තවැල්ල ගම්මානය තුළ මැටි කර්මාන්තයේ යෙදී සිටින කාන්තාවකි.

ගෑස් පිපිරීම් මත ජනතාවගේ සිත්වල හටගත් බිය හේතුවෙන් ළිප් භාවිතය ඉහළ ගොස් තිබේ. මේ නිසා ධම්මිකා ඇතුළු තිත්තවැල්ල ගම්මානයේ වාසය කරන බොහෝ පිරිසකගේ අතමිට සරු වී ඇත.

"පහුගිය කාලේ නම් අපිට ප්‍රශ්න සහ ගැටලු ගොඩක් තිබුණා. භාණ්ඩ අලෙවි කරගන්න බැරි එක, හරි හමන් මිලක් නැති එක, අමුද්‍රව්‍ය හොයාගන්න අමාරුකම වගේ ප්‍රශ්න ගොඩක් තිබුණා. නමුත් දැන් අපේ හස්ත කර්මාන්තයට නව පණක් ලැබුණා කියලා අපිට හිතෙනවා" ධම්මිකා මහත්මිය වැඩිදුරටත් කීවාය.

වළං, ළිප්, මල් පෝච්චි සහ විසිතුරු භාණ්ඩ ඇතුළු භාණ්ඩ නිෂ්පාදනය කිරීම මෙම ගමේ වෙසෙන බහුතර පිරිසකගේ ප්‍රධාන ආදායම් මාර්ගය වී තිබේ. ඔවුන් විසින් නිෂ්පාදනය කරන එම භාණ්ඩ ඉබ්බාගමුව - මඩගල්ල මහා මාර්ගය අයිනේ තනාගත් කුඩා ප්‍රදර්ශනාගාරවල තබාගෙන අලෙවිය සිදුකරයි.

වළං කර්මාන්තයට සීමා වී තිබූ තිත්තවැල්ල ගම්මානයට නව පණක් ලැබී ඇත්තේ මීට වසර 35කට පමණ පෙර ඔවුන් විසින් ළිප් නිෂ්පාදනය කිරීම ඇරඹීමත් සමඟය. තිත්තවැල්ල ගම්මානයේ ඉතිහාසය පිළිබඳ සිහිපත් කළ අනුලා නන්දනී මහත්මිය මෙවැනි කතාවක් කීවාය.

"මේ ගම්මානේ ළිප් හදන්න පටන් අරගෙන අවුරුදු 35ක් විතර වෙනවා. ඊට කලින් වළං තමයි අපි හැදුවේ. නමුත් ළිප් හදන්න ගත්තට පස්සේ තමයි මේ ගම බලාගෙන ඉද්දී දියුණු වුණේ. මිනිස්සු ගෙවල් දොරවල් හදලා යාන වාහන ගත්තේ ළිප හදන්න ගත්තට පස්සේ තමයි. මේ දවස්වල ළිප් වැඩියෙන් විකිණීමත් එක්ක ගමේ හැමෝගෙම අත මිට සරුවෙලා තියෙනවා. මගේ ජීවිත කාලේදී දැකපු ඉහළම මිල තමයි මේ දවස්වල තියෙන්නේ. සමහරු පුච්චලා නැති අමු ළිපත් අරන් යනවා."

**මැටි භාණ්ඩ නිෂ්පාදකයකු වන අජිත් ප්‍රේමලාල් මහතා 'මව්බිම' හමුවේ ප්‍රකාශ කළේ මෙවැනි අදහසකි.**

"පහුගිය කාලේ තිබුණු ප්‍රශ්න නිසා හුඟක් අය මේ රස්සාව දාලා වෙන වෙන දේවල්වලට ගියා. හොඳටම රස්සාව කරපු මිනිස්සු පවා කර්මාන්තය අතඇරියා. අපිත් කරන්න වෙන දෙයක් නොතිබුණු නිසා අමාරුවෙන් තමයි අල්ලගෙන හිටියේ. ඒ නිසා මේ ශිල්පය ගැන දන්න අය දැන් හුඟක් අඩුයි. මේකට යොමුවෙලා මේ ගැන ඉගෙනගන්න උනන්දුව තියෙන තරුණයොත් හරි අඩුයි. නමුත් මම නම් කියන්නේ මේක හිතු හිතූ ගණන් හොයන්න පුළුවන් හොඳ රස්සාවක් කියලා."

**මීළඟට අප සමඟ අදහස් දැක්වූයේ ධම්මිකා මහත්මියගේ සැමියා වන සරත් කුලතුංගය.** මෙම කර්මාන්තයට අදාළ ගැටලු සහ ඉල්ලීම් දිනාගැනීම වෙනුවෙන් ගමේ මූලිකත්වය ගෙන ක්‍රියා කරන්නේද සරත්ය. ඔහු මෙම අරගලයේ යෙදී සිටින්නේ දිගු කාලයක සිට නිසා මාධ්‍යවේදීන් සමඟද ඔහුට ඇත්තේ සමීප සම්බන්ධයකි.

"ව්‍යාපාරිකයෝ, කාන්තාවෝ ඇතුළු විශාල පිරිසක් ළිප් ගෙනියන්න එනවා. ඒ නිසා මැටි කර්මාන්තයට හොඳ වෙළෙඳපොළක් ලැබිලා තිබෙනවා. වැඩිම ඉල්ලුම තියෙන්නේ ළිප්වලට තමයි. ඉල්ලන තරමට බඩු දෙන්න අපිට බෑ. ගමේ සියලුමදෙනාම මේ දවස්වල වැඩ. ඒත් තියෙන ඕඩර් දෙන්න අමාරුයි. අඟුරු ළිප, දහයියා ළිප, ඩබල් ළිප වගේ ළිප් වර්ග කිහිපයක්ම අපි ළඟ තියෙනවා.

කාලෙකට පස්සේ අපේ බඩුවලට හොඳ මිලක් ලැබිලා තිබෙනවා. අපිව දිරිමත් කරන්න රජය මඟින් යන්ත්‍ර සූත්‍ර දීලා, මඩු හදලා දීලා විශාල විදිහට උදවු කරනවා."

දැඩි ඩොලර් අර්බුදයකින් මාතෘ භූමිය බැටකමින් ඇති අවස්ථාවක, එක් රුපියලක්වත් පිටරටකට යානොදෙමින්, අපේ දේවල්වලට තැනක් ලබාදෙමින් තිත්තවැල්ල ගම්මානයේ ජනතාව කරන සේවාව අතිමහත්ය. ගෑස් අර්බුදය සමඟ මතුවී ඇති ඉල්ලුම සැපැයීමට ඔවුනට විශාල බාධාවක් වී ඇත්තේ පළපුරුදු හා පුහුණු සේවකයන් නොමැතිකමය. එම නිසා මැටි කර්මාන්තය පිළිබඳව දැනුම සහ පළ පුරුද්ද සහිත සේවක පිරිස් බිහිකර ගැනීම පිණිස කඩිනම් හා ඉක්මන් වැඩපිළිවෙළක් නිර්මාණය කිරීම පිණිස රජයේ අවධානය යොමුවනු දැකීම තිත්තවැල්ල ගම්මානයේ ජනතාවගේ බලාපොරොත්තුව වී තිබේ.

■ කුරුණෑගල - විජේසිංහ වැලිකන්ද





## අපූරු නැකැත

පුතු තෙහැවිරිදි වියට එළැඹි දිනවල ඔහුට අකුරු කියැවීමට නැකැත් වේලාවක් සාදවා ගෙන එන්නැයි බිරිය මට ඇවිටිලි කරන්නට පටන් ගත්තාය.

මම තරමක් ප්‍රකට දෛවඥයකු හමු වීමි. ඔහු දරුවාට අකුරු කියැවීමට සුබ දිනයකුත් නැකැත් වේලාවකුත් ලියා දී ඊට අදාළ පුද පූජාවලට වුවමනා දේවල් පිළිබඳ ලේඛනයක් ද දුන්නේය.

දෛවඥයා දුන් ලේඛනයට අනුව අකුරු කියැවීමේ නැකැත යෙදී තිබුණේ මාසයේ 18 වැනිදාකටය. එය මට ප්‍රශ්නයක් විය.

රජයේ සාමාන්‍ය රැකියාවක නිරත වී සිටි මගේ වැටුප් දිනය යෙදුණේ සෑම මසකට 25 වැනිදාටය. ඒ හැර මාසයේ 10 වැනිදාට අත්තිකාරම් මුදලක් ලබාගත හැකි විය. ඒ අතරතුර කාලය ගෙවී ගියේ ආර්ථික අමාරුකම්වලිනි.

අකුරු කියවන පුංචි උත්සවයට යන වියදම සොයා ගැනීමට මට අමාරු විය. අතමාරුවක් කර ගන්නේ කාගෙන්දැයි මම කල්පනා කරන්නට වීමි. අතමිට තිබූ හිතවතකු ගැන පවා හිතා ගැනීමටවත් බැරිවූයේ ඔවුන්ද මා වැනිම වූ හෙයිනි.

මෙබඳු හදිසියකට ගැනීමට මුදලක් ඉතිරිකර නොගන්නේ ඇයි දැයි මම මගෙන්ම අසා සිටියෙමි. උපයන සියලු දේ ජීවත්වීමට වැය වන කල යමක් ඉතිරි කර ගන්නේ කෙසේදැයි මසිත මගෙන් පෙරළා ප්‍රශ්න කළේය.

දෛවඥ මහතා කී හැටියට ඔහු නැකැත හදා දුන් දිනය හා වේලාව බලගතු එකක් විය. එබඳු නැකැතක් යෙදෙන්නේ ඉතා කලාතුරකින් බවද ඔහු කීවේය. එහෙත් මා වැටී සිටි ආර්ථික අමාරුකම් නිසා දුකෙන් වුව එය වෙනස් කරගත යුතු විය.

නැකැත් පත කෝ යැයි මා බිරිය අසනු ඇත. නැකැත් චාරිත්‍ර අකුරටම ඉටුකළ යුතු යැයිද ඇය කියනු ඇත. දෙන්නා දෙපැත්තට අදින විට ගැටුමක්ද ඇති විය හැකිය. එහෙයින් තනිවම ප්‍රශ්නයට මුහුණ දිය යුතු යැයි මම ඉටා ගතිමි.

හිටි හැටියේ මට කල්පනාවක් ආවේය.

සාමාන්‍ය බිත්ති ලිතක් සොයා ගත් මම මාසයේ 28දාට යෙදුණු අකුරු කියැවීමේ සුබ දිනයක් තෝරා ගතිමි. රාහු කාලය මඟහැර හොඳ යැයි හිතුණු වේලාවක් අකුරු කියැවීමට යොදා ගතිමි.

ඉන්පසු මිතුරකු ලවා දෛවඥයකුට සමාන ලොකු රවුම් අකුරින් දිනයද වේලාවද ලියවාගෙන පුද පූජාවලට අවශ්‍ය දේද වෙනම ලියවා ගතිමි. අවසානයේ ආයතන ප්‍රධානියා හමුවට ගොස් දින කිහිපයක නිවාඩුවක්ද අනුමත කරවා ගතිමි.

අදාළ මාසයේ 25 වැනිදා මාසයේ වැටුප ගත් මම අකුරු කියැවීමට වුවමනා සියලු දේද රැගෙන ගෙදර ගියෙමි.

නැකැත් දිනය උදා විය. බිරිය දරුවා වේලාසනම අකුරු කියැවීමේ මංගල්‍යයට සූදානම් කළාය.

මා තෙරුවන් නැමැද පුද පූජාද පවත්වා නිම කළ විට මගේ නැකැත් වේලාව උදාවිය.

"දැන් සුබ වෙලාව හරි. හා දැන් ඔයා පුතාට අකුරු කියවන්ඩ පටන් ගන්ඩ!"

මා පුද පූජා පවත්වන ආකාරය බැතිමත්ව බලා සිටි බිරියට මම කීමි.

"ආ එන්න පුතා! අපි දැන් අකුරු කියවමු." යි කී බිරිය හෝඩි පොත අතට ගෙන දරුවා ඇකයට ගත්තාය.

දරුවා මගේ නැකැතට අකුරු කියාවිදෝසි යන සැකය මසිතෙහි වැඩිණි. මම ඔවුන්ගෙන් ටිකක් ඈතට ගියෙමි. මට දරුවාගේ අනාගත අධ්‍යාපනය ගැන බියක් දැනිණි. මගේ හදවත ගැහිණි.

"පුතේ මේක 'අ' යන්න. දැන් මං 'අ'යන්න කියලා කියනකොට ඔයත් 'අ'යන්න කියන්න.! හොඳයි ඔන්න මං කියවනවා. 'අ'යන්න "බිරිය කියනු මට ඇසිණි.

'අ'යන්න දරුවා හඬ නගා කීවේය.

මම විස්මයෙන් ඔහු දෙස හැරී බැලුවෙමි.

'අ' යන්න

'ආ'යන්න

'ඈ'යන්න ...."

දරුවා දිගටම කියන්නට වූයේය. මගේ හිතේ සතුට උතුරා ගියේය.

මවත් සමඟ මුළු හෝඩියම කියවා නිම කළ දරුවා සිනාසෙමින් මවෙත දිව ආවේය.

මම ඔහු සෙනෙහසින් වැලඳ ගතිමි.

අකුරු කියැවීම ජයග්‍රාහීව අවසන් වූයේ ඒ ආකාරයෙනි.

දරුවා අවුරුදු පහෙන් පාසල් ගියේය. ඔහු වසරින් වසර පන්තියෙන් පන්තිය ඉහළ යද්දී ඔහුගේ අධ්‍යාපනය පිළිබඳ මසිතෙහි සැඟ වී තිබූ අස්ථාන බිය කෙමෙන් හිස ඔසවන්න වූයේය. මා හැදූ නැකැත මටම වධ දෙන්නට වූයේය.

මගේ සැකය දෙදරා ගියේ දරුවා ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වූ දවසේය. පාසලෙන් ශිෂ්‍යත්ව විභාගය සමත්වූ දරුවන් සිවුදෙනා අතර ඔහුද සිටීම විශේෂ කාරණයක් විය.

ඊළඟට ඔහු අ.පො.ස. (සා.පෙළ) විභාගය සියලු විෂයයන්ට විශිෂ්ට සාමාර්ථ සහිතව සමත් වූයේ මගේ සැකය බොරු කරවමිනි.

ගණිත අංශයෙන් උසස් පෙළද ඉහළින් සමත් වූ ඔහු මොරටු විශ්වවිද්‍යාලයේ ඉන්ජිනේරු පීඨයට ඇතුළත් වූ දා මගේ හිතේ යම් සැකයක අල්පමාත්‍රයක් හෝ වී නම් එය මුළුමනින්ම පහව ගියේය.

නොබෝදා ඔහු කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ පැවැති උත්සවයකදී පරිගණක ඉන්ජිනේරු උපාධිය ලබා ගත්තේ ඒ උත්සවයේ ආරාධිත අමුත්තන් රාශිය අතර සිටි මා බිරියගේද මගේද නෙතු සතුටු කඳුළින් පුරවමිනි.

අප පුතු උපාධි ලෝගුව ලා සිය උපාධිය ලබාගන්නා මොහොතේ වසර විසිතුනකට ඉහත මගේ නැකැතට ඔහු මවත් සමඟ අකුරු කී ආකාරය සලරුවක් සේ මසිත මැවී ගියේය.

දරුවා අකුරු කියැවූ නැකැත මා හැදූ එකක් බව බිරියවත් තවම දන්නේ නැත. ඇය ඒ බව දැනගනු ඇත්තේ නෙළුම්විලෙහි මේ කතාව පළ වූ පසුය. ඊට කම් නැත. දැන් අප ජයගෙන හමාරය.

***දූනගහ නැ/පල්ලියපිටියේ ආර්.ඩී. විජේසිරි මහතා විසින් යොමු කරන ලද ලිපියක් ඇසුරෙනි.***

# මව්බිම නෙළුම්විල

ගුණසිංහ හෙට්ටිආරච්චි

**නෙළුම් සුවඳය. එහෙත් පිපෙන්නේ මඩෙහිය. සත්පුරුෂයන්ද එබඳුය. සමාජය නමැති මඩෙන් මතුවන ඔවුහු මිනිස්කම නමැති සුවඳින් ලෝකය සුවඳවත් කරන්නෝය.**

**නෙළුම්විල සැකසෙන්නේ එබඳු උතුම් මිනිසුන් පිළිබඳ සත්‍ය කතාවලිනි. මෙය ඔබට විවෘතය, තැපැල් මඟින් ඔබ එවන කතා ප්‍රතිනිර්මාණය වී එහි පළවනු ඇත. ඔබ කැමැති නම් පමණක් ඔබේ නම, ගම පළවනු ඇත. ඔබට අවශ්‍ය නම් ඔබේ අනන්‍යතාව සඟවා සිටිය හැකිය. එහෙත් ඔබ එවන ආවරණ ලිපියේ ඔබේ නම, ගම, දුරකථන අංකය ලියා එවිය යුතුය.**

**ලිපිනය -**
**'මව්බිම' නෙළුම්විල**
**ඉරිදා මව්බිම කර්තෘ මණ්ඩලය**
**අංක 101, රොස්මීඩ් පෙදෙස**
**කොළඹ 07.**

## මව් වරුණ

"ඕං පුතේ, මං දැන් හදන්නේ ඔයාලගේ අම්මා පුංචිම පුංචි සන්දියේ කරපු හපන්කමක් ගැන කියන්න" එසේ කී අපේ අත්තා හෙවත් අපේ අම්මාගේ පියා සුදු, මහත, පියකරු කතක වූ අපේ අම්මා දෙස බැලුවේ "කියන්නද? එපාදැයි" හෙට්ටු කරන්නාක් මෙනි. අම්මා හිනාවතින්ම නිහඬව පසු වූවාය.

"අනේ කියන්න අත්තේ. කියන්න!" කියමින් අපි ඇවිටිලි කළෙමු.

"ඒ කාලේ මං මෙයාව ඉස්කෝලේ එක්කගෙන යන්නේ කෝච්චි පාර දිගේ. මං ඒ කාලේ කෝච්චි පාරේ ඕවර්සියර් කෙනෙක්නෙ. උඩරට කෝච්චි පාර හැදුණොත් ඔය කාලෙනේ. අපි හිටියෙත් බණ්ඩාරවෙල, ඕබඩඇල්ලේ. දවසක් උදේක මං මෙයාගේ අතිනුත් අල්ලගෙන ඔහොම යනකොට මේං බොලේ කෝච්චිය හොස් හොස් ගගා දුම් දම දමා අපි ඉස්සරහට එනවා. මෙයා බයවෙච්චි පාර මගේ අතක් ගසලා දාලා අඬාගෙන කැලේට දිව්වා! බයේ ගල් පතුරක් යට හැංගිලා ඉන්දැද්දි මං මෙයාව හොයාගත්තෙ හරිම අමාරුවෙන්!"

එදායින් පසු අම්මාගේ පාසල් ගමන සදහටම නැවතිණි. අම්මා බදුල්ලේ හෙලවත්තට පැමිණ ඇත්තේ මාපියන් සමඟ විවාහ වූ පසුය.

බදුලු විදුහලේ විදුහල්පතිවරයාගේ බිරිය සමඟ වූ අම්මාගේ හිතවත්කම ඇරැඹී ඇත්තේ ඔය කාලයේය. දෙදෙනා පින් දහම් කර ඇත්තේ එකටය. දිනක් දිවා අහරින් පසු අම්මා පුරුදු පරිදි කෙටි නින්දේ ගැලී සිටියාය.

"පුතේ, අම්මා ඉන්නවාදැ"යි අසමින් ඒ නෝනා අපේ ගෙදර ආවාය.

"අම්මා නිදි"යි මම කීමි.

"එහෙනම් සද්ද කරන්න එපා!"යි කී ඇය හෙමිහිට ඇඳ ළඟට ගොස් එක වරම අම්මා බදා ගත්තාය. ගැස්සී ඇහැරුණු අම්මා දඟලද්දී දෙදෙනාම පෙරළී බිම වැටුණාහ.

මම මහ හයියෙන් සිනාසීමි.

විදුහල්පති යුවළගේ පුංචි පුතුද 'තාර ගුළි' ඉල්ලාගෙන අපේ අම්මා හමුවීමට ඒමට පුරුදුව සිටියේය. ඔහු ඒ නමින් හැඳින්වූයේ අම්මා හැදූ කිතුල් හකුරුය.

දවසක් හොරෙන්ම පැමිණි ඔහු බඳුනක වූ සැබෑම තාර සියොළඟ තවරාගෙන ගෙදර ගොස් තිබිණි. ගා ගත්තු තැනටම ගිහින් හෝදගෙන එන එකයි ඇත්තේ, කියමින් විදුහල්පති බිරිය කෝටුවක් අතට ගත්තෙන් දරුවා හඬාගෙනම අපේ ගෙදර ආවේය.

අපේ අම්මා ලාම්පු තෙල් හා ඒ තාර පැල්ලම් සියල්ල පිසදමා දරු පැටියා පිරිසුදු කර රෙද්දකින් ඔතා වඩාගෙන ගොස් මවට බාර දුන්නා.

අපේ අම්මාගෙන් සංග්‍රහයක් නොවිඳි බත් වේලක් නොකෑ කෙනකු නොවූ ගාණය.

මගේ පාසල් මිතුරියෝද බොහෝවිට අපේ ගෙදර ඒමට පුරුදුව සිටියහ. ඔවුන් කෑමට ගෙනැවිත් තිබූ පාන් ඉවත දමා සියතින්ම පිසින ලද රසවත් බත්වේලක් ඔවුනට පිරිනැමීම අම්මාගේ පුරුද්ද විය.

මුතියංගණ රජමහ වෙහෙරේ කරඬුව වැඩමවූ අලියා ගෙන යන ලද්දේ අපේ වත්ත ළඟිනි.

තමා හැදූ ලොකු හකුරු බෑයක් කෙසෙල් ඇවරියක්ද සමඟ ඌට කැවීමට අම්මා පුරුදුව සිටියාය. ඒ සංග්‍රහය විඳීමට අලියාද පුරුදුව සිටියේය.

අලියා අපේ වත්ත කිට්ටුවට එද්දී ඇත්ගොව්වා වූ කිරිවංසේට ඌ මේච්චල් කර ගැනීමට බැරි වූයේ ඌ අපේ අම්මාගේ රසවත් සංග්‍රහය භුක්ති විඳීමට ආසාවෙන් සිටි නිසාය. අලියාට එසේ සංග්‍රහ කිරීම අම්මාගේ සතුටටද හේතුවක් විය.

ඇත්ගොව්වාගේ මරණයෙන් පසු අපේ අම්මා ඔහුගේ බිරියටද දිගටම උපකාර කළාය.

මේ සංග්‍රහශීලි බව නිසාම අපේ අම්මා හැඳින්වුණේ 'හෙලවත්තේ දෙවියන්' ලෙසය.

අපේ අම්මාට ලෙඩක් දුකක් හැදුණේ නැති ගාණය. එනිසාම ඇය කිසි දිනෙක රෝහලකට ගොස් නැත. උන්දෑ නිදුක් නිරෝගීව වසර අනූඅටක් හිතේ සතුටින් විසුවාය.

***බදුල්ලේ, ඇළුගොල්ලේ, විශ්‍රාමික ගුරු අනුලා රණසිංහ මහත්මිය විසින් යොමු කරන ලද ලිපියක් ඇසුරෙනි.***

## ඔවදන් රුවන

මහවැලියේ ජල පාලක තනතුරක් ලැබූ යොවුන් මගේ නවාතැන බවට පත් වූයේ කිරලෝගම නිවාස ව්‍යාපෘතියේ එක් ගෙදරකි. අපි තනිකඩයෝ අට දෙනෙක් එහි විසුවෙමු.

සාමාන්‍යයෙන් තරමක් මත් වූ විට මගේ හැසිරීම අමුතු වීගෙන එන බව මම දැන සිටියෙමි. පිටට පෙනුණේ මා රළු පරළු වන අයුරකි.

අපේ නවාතැන්ගෙයිරාල වූයේ තලාවේ චන්ද්‍රරේය. මා තරමක් සැහැසි වූ විට ඔහු දැක්වූයේ බිය මුසු ගෞරවයකි.

චන්ද්‍රරේ හෝ ඔහුගේ සගයකු නොසිටි දිනවල අහරක් හෝ කටගැස්මක් හරියකට හදා ගැනීමේදී අපි මහත් ගැටලුවකට මුහුණ දුනිමු.

දිනක් චන්ද්‍රරේ මට විහිළුවකට මෙන් පොඩි අවවාදයක් දුන්නේය.

"සර් උයන්ට පුරුදු වෙන්ට !

රසට මිහිරට කන්ට පුළුවන් වෙයි.

කසාද බැන්දම ගෙදර සමාදානෙත් රැකෙයි."

මට ටිකක් කේන්ති ගියේය.

"සමාදානෙ ඇතිවෙන්නෙ කොහොමද ඕයි?"

"ඇයි සර් එතකොට ලුණු අඩුයි, මිරිස් වැඩියි, රහ මදියි කියල නෝන එක්ක ඔට්ටු අල්ලන්ට බෑ නොයැ? තමන්ගෙත් බාගයක් දෝසෙ තියෙනවනෙ!" යි කී ඔහු "හැක්! "හැක්!" ගා හිනාවීගෙන යන්නට ගියේය.

චන්ද්‍රරේ විහිළුවෙන් වුව දුන් උපදේශය මගේ හිතට තදින් වැදිණි. මම ඒ ගැන හිතන්නට වීමි.

මට අපේ අම්මා ඉවූ රස අහර මතක් විය. ඇය අපේ තාත්තාට වුවමනා වුවමනා හැටියට අමුතු - අමුතු කටගැස්ම හදා දුන් හැටි මතක් විය. ලුණු ඇඹුල් රස නොබලා ඕනෑම ව්‍යංජනයක් රස නහර පිනා යන පරිදි පිසීමේ හැකියාව අම්මාට ලැබී තිබිණි.

මම නිහඬවම අහර පිසීමට පටන් ගතිමි.

පසු කලෙක මට උසස් රැකියාවක්ද ලැබිණි. ඉන්පසු මම විවාහ වීමි.

බිරිය සමඟ අහර පිසීමට පුරුදු වූ මම දර පැළීමට මෙන්ම ඈ මෙන් වළං හේදීමටද නිහතමානී වීමි.

එක්ව රසට ඉවූ අහර එක්ව රසකර බුදීම පවුල් දිවියේ සුගතියට හේතුවෙයි. එවන් පවුල් දිවියක ඇත්තේද අම රසයකි.

තරුණ කාලයේ එප්පාවල පුරා පාපැදියෙන් කරක් ගැසූ මට අද ඒ හයිය නැත. මා අද වැඩි කාලයක් ගත කරන්නේ හාන්සි පුටුවේ හෝ ඇඳේය.

මගේ දරුවෝ ඉහළ තැන්වල පසුවෙති. ලොකු දූ වෛද්‍යවරියකි. ඊළඟ දූ හෙදියකි. බෑනාවරු වෛද්‍යවරුය. අද මම වායුසමනය කළ වාහනවලින් නගරයේ සැරිසරමි.

කේන්තිකාරයකු ලෙස කලක් ලෝකයා හඳුනාගෙන සිටි මා සාර්ථක මිනිසකු හැටියට පරිවර්තනය වූයේ අර පුංචි මිනිසා දුන් සරල උපදෙසින් බව ඔහුට ගෞරවය පිණිස ලියා තබමි.

***රඹුක්කන සරත් විජයානන්ද මහතා විසින් යොමු කරන ලද ලිපියක් ඇසුරෙනි.***

